# සම්මත සත්‍ය හා පරමාර්ථ සත්‍ය
## හෙවත්
# දැනුම හා දැක්ම

**පූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමි**

ප්‍රථම මුද්‍රණය - 2014 ජූලි

ISBN 978-955-51707-3-4

සකලවිද හිමිකම් කතුවරයා සතුය.

**ප්‍රකාශනය :**

පූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමි
අතුකෝරළවත්ත,
වටරැක,
පාදුක්ක.

වෙබ් අඩවිය : www.srisaddharmaya.blogspot.com

**මුද්‍රණය :**

සුරේන්ද්‍ර ග්‍රැෆික්ස්, මාතර
දුරකථනය : 041-2227688
ෆැක්ස් : 041-2223802
විද්‍යුත් තැපෑල: surencom@sltnet.lk

## පටුන


| | පිටු අංක |
|---|---|
| අටුවා කතා හා එහි ඉතිහාසය | 4 - 23 |
| බුදු දහම මාර්ග චරියාවකි ආගමක් නොවේ | 24 - 49 |
| බුදු දහම, බුද්ධාගම හා නවීන විද්‍යාව | 50 - 93 |
| පින හා කුසලය | 93 - 111 |
| තිරෝකුඩ්ඩ සූත්‍රය | 111 - 122 |

## අටුවා කථා හා එහි ඉතිහාසය

මිහිඳු මා හිමියන් එදා ලංකා පුරයට (අනුරාධපුරයට) වැඩම කරමින් කරන ලද අතිමහත් ශාසන ශෝධන මෙහෙවර මගින් හෙලබිමේ උතුරු කුරු දීපය නමින් පෙරකල හැඳින් වු යක්‍ෂ ගෝත්‍රිකයන් බහුලව විසූ එවකට ඉන්දීය සම්භවයක් ඇති රජුන් රජකල රාජ්‍ය තුල සිදුවූයේ බලවත් වෙනසකි. මෙසේ සිදු වූ වෙනස්කම් සංස්කෘතික, ආගමික, ධාර්මික හා සාහිත්‍යමය වශයෙන් මෙන්ම ශිල්පීයමය වශයෙන් ද විවිධාකාරයෙන් වර්ගීකරණය කරමින් පෙන්වාදිය හැකි වුවත් මෙහිදී මා බලාපොරොත්තු වන්නේ ඒ සියල්ලම සලකා බලන්නට නොව ආගමික වශයෙන් හා බුද්ධ ධර්මය පැත්තෙන් සිදු වූ වෙනස්කම් පිළිබඳව යම්කිසි විග්‍රහයක් ඉදිරිපත් කරන්නටය.

මිහිඳු මාහිමියන් එදා අනුරාධපුරයට පැමිණෙන්නට පෙර පැහැදිලි ලේඛන කලාවක් අනුරාධපුරයේ නොතිබුනු බව අද ඒ පිළිබඳව මත ප්‍රකාශ කරන බොහෝ උගතුන්ගේ මතයයි. නමුත් අනුරපුර ප්‍රදේශයේ ලේඛන ගන්වා ලියා තිබූ අතීත බොහෝ දේ දැනටමත් කරන ලද කැනීම්වලදී හමු වී ඇත. එසේ ලංකාපුර රාජ්‍යයේ (අනුරපුර) දියුණු ලේඛන කලාවක්, අක්‍ෂර මාලාවක්, සාහිත්‍යයක් එදා නොතිබුණත් නොපැවතියත් මේ හෙළ බිමේ අනිත් ප්‍රදේශවල විශේෂයෙන්ම දේව හෙලය නමින් එදා ප්‍රසිද්ධ වූ ජන්බුද්විපයේ මිහිඳු හිමියන් පැමිණෙන්නටත් පෙර (නැගෙනහිර රුහුණේ හා කඳුරටේ) ඉතාමත්ම දියුණු ලේඛන කලාවක්, සාහිත්‍යයක් හා ශිල්ප ක්‍රම වලින් පෝෂිත වූ සංස්කෘතියක් පැවති බවට අද වන විට මතු වී ඇති බොහෝ සාක්ෂිවලින් ඔප්පු වී ඇත.

මිහිඳු මාහිමියන් බුද්ධ ධර්මය රැගෙන ලංකා පුරයට (අනුරාධපුරයට ) පැමිණියේ මෙම දේව හෙළයේ එදා අගනුවර වූ (රජගල) (අදනම් අම්පාර දිස්ත්‍රික්කයේ) රජගහ නුවර සිටය. මේ බව පැහැදිලිවම මහාවංශයේ සඳහන් වන්නේ ජන්බුද්වීපයේ රජගහනුවර සිට ලංකාපුර රාජධානියට මිහිඳු හිමියන් සමඟ පිරිස පැමිණි බවය. මහාවංශය පවසන මේ අතීත සිදුවීම සම්පූර්ණ සත්‍යයකි. එවකට ජන්බුද්විපය ලෙසින්

හැඳින්වූයේ බුදුන් ජන්මය ලැබූ අද රජගල පිහිටි දේව හෙළයටය. එය එදා ජනපද රාශියකින් යුතු වෙනම රාජධානියකි. මගධ රාජ්‍යය ඉන් එකකි. මගධයේ අගනුවර වූයේ රජගහ නුවරයි. අද එය අම්පාර රජගල ආශ්‍රිත විශාල ප්‍රදේශයක් ලෙසින් හඳුනා ගෙන ඇත. එදා මගධ රටේ අගනුවර වූයේ රජගහ නුවරයි. එදා මගධ රට වූයේ අද අම්පාර බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වලින් සමන්විත විශාල ප්‍රදේශයකි. මේ දිස්ත්‍රික්ක වල විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ රජගල, සමන්ගල, නුවරගල, පුලුකුණාව, නිල්ගල, බුද්ධංගල, නජ්ජංගල හා පියන්ගල ආශ්‍රිතව අද දක්නට ඇති අති පුරාණ අති මහත් බෞද්ධ නටඹුන් හා පුරාවස්තු ආශ්‍රයෙන් අපට එදා මේ ප්‍රදේශ වල පැවැති ශ්‍රී විභූතිය හා සංස්කෘතික දියුණුව ගැන හිතා ගත හැකිය.

බුදුපියාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසුව වසර 700ක් පමණම දිගු කාල පරාසයක් තුල එනම් ක්‍රි.ව. පළමුවන සියවස දක්වාම මුළු ලොවටම ථෙරවාදී බුද්ධ ධර්මය ඉගැන් වූ මූලස්ථානය වූයේ මගධරට රජගහනුවරයි. පළමුවන හා දෙවන ධර්ම සංගායනාවන් පැවැත්වූයේද මෙම අම්පාර දිස්ත්‍රික්කයේ රජගලදීය. මෙරට ඉතිහාසය ලියු මහා වංශයේ පැහැදිලිවම මේ බව සඳහන් වේ. අනුරාධපුරයේ මහා විහාරය, ථෙරවාදීන්ගේ ආගමික මූලස්ථානය වූයේ රජගහ නුවරට (අම්පාරේ) මේ තත්වය අහිමි වීමෙන් පසුවය. යම්කිසි ස්වාභාවික විපතකින් එනම් නියඟයකින්, සුනාමියකින් හෝ ජල ගැල්මක් හෝ විශාල ගින්නක් වැනි දෙයක් හේතු කොට ගෙන මුළු නැගෙනහිර පළාතම වාගේ විනාශ වී ඒ පළාත ජන ශූන්‍ය තත්වයකට පත්වීමත් සමඟම මෙතෙක් ථෙරවාදී මූල ස්ථානයව පැවැති රජගහනුවර විනාශ වීම නිසා මේ මූලස්ථානය අනුරාධපුරයට මාරු වී ගිය බව ඉතාමත්ම පැහැදිලිය. දැන් රජගලදී කරගෙන යනු ලබන කැනීම් වලින් සොයාගත් බොහෝ කරුණු අනුව හා අදටත් ඉතිරි වී ඇති නශ්ඨාවශේෂ වලින් පෙන්නුම් කරන ආකාරයට රජගහනුවර (අම්පාරේ) එදා පැවැති විශාල භික්ෂු මධ්‍යස්ථාන, පිරිවෙන් දේශණ ශාලා, කටාරම් කොටා ඇති විශාල ගල්ලෙන් ආදියෙන් මේ බව මනාව පැහැදිලි වෙයි. රජගල, සමන්ගල, නෑල්ල, පුලුකුණාව හා ඒ අවට



ප්‍රදේශවල අදටත් දැක බලා ගත හැකි ගල්ලෙන් සමූහය තුන් දහසක් පමණය.

එදා භාරත දේශයෙන් අම්පාරේ රජගහනුවරට පැමිණි මිහිඳු කුමාරයා ඇතුළු සංඝමිත්තා, සුමනා, සුනන්දා ආදි ගිහි රජ කුමර කුමාරියන් රජගලට පැමිණියේ එදා රජගහ නුවර තිබූ පිරිවෙන් වලින් හා විද්‍යාස්ථාන වලින් පිරිසිදු බුදුදහම ඉගෙන ගෙන ධර්මාවබෝධය ලබා ගන්නටය. මෙසේ ධර්මාවබෝධය ලබා ගත් පසුව පැවිදි වී මඟඵල ලබාගත් බව මහාවංශයේ හා දීපවංශ කථා වලින් ඉතාමත්ම පිරිසිදු ලෙස පැහැදිලිවන කරුණකි.

රජගලින් හමු වූ සෙල්ලිපිවලින්ද මිහිඳු මා හිමියන් පිරිනිවන් පා වදාළ පසුව තැන්පත් කරන ලද භෂ්මාවශේෂ වලින්ද, පසුව කල කැනීම් වලින්ද තවමත් සොයා නොගත් අති මහත් සාක්ෂිවලින් ද මනාව ඔප්පුවන දේ නම් මිහිඳු මා හිමියන් අනුරාධපුරයට වැඩම කලේ අම්පාර රජගල පිහිටි බෞද්ධ පිරිවෙන් සංකීර්ණයේ සිට බවයි. මිහිඳු හිමියන් අනුරාධපුරයට වැඩම කර තම යුග මෙහෙවර සම්පූර්ණ කිරීමෙන් පසුව නැවතත් ජීවිතයේ ඉතිරි කාලය ගත කර පිරිනිවන් පා වදාලේත් අම්පාර රජගල (රජගහනුවරදී) බව රජගලින් හමු වී ඇති සෙල්ලිපියක සටහන් කර තිබීම කාටවත්ම වෙනස් කල නොහැකි සත්‍යයකි.

අම්පාර දිස්ත්‍රික්කයේ රජගල, පියන්ගල, සමන්ගල, නිල්ගල, නුවරගල, පුළුකුණාව, බුද්ධංගල, නෑල්ල ආදී අක්කර දසදහස් ගණනක් ප්‍රදේශයන් තුල පැතිරී ඇති පුරාවස්තු අනුරාධපුර යුගයටත් පෙර යුගයකට (එනම් බුද්ධ යුගයට) අයත් බව දැනටම සනාථ කර සහතික කර ඇත. මේ අති මහත් පුරාවස්තූන් මගින් අපට කියා පාන්නේ අපේ සත්‍යයම ඉතිහාසය කෙසේ හෝ යටපත් කර දමා ඇති බවයි. හෙළබිම නියම නිවැරදි උරුමය සොයා යන තරුණ විද්වතුන් නැගෙනහිර පළාතේ අම්පාර, මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ඇති මේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු වැදගත් නටඹුන් හා ඒ ඒ ස්ථාන පිළිබඳව නිවැරදි තොරතුරු, කාලවකවානු හා වෙනත් අදාල සාධකද සමගින් සොයාගන්නට අවංකවම උත්සාහ දැරිය

යුතුය. මේ ප්‍රදේශය මහාවංශයේ එදා ලියා සටහන් කල ජන්බුද්වීපයයි. මගධ රාජ්‍යයයි. රජගහනුවරයි. අපේ ගෞතම බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී මුල්ම වසර විසිපහක් පමණාම කාලයක් වැඩ සිටියේ රජගහනුවරයි. අද එහි නම රජගල බවට පරිවර්තනය වී ඇත.

මිහිඳු මාහිමියන් අනුරපුරයට වැඩම කරන්නට පෙර මේ හෙළබිමේ පැහැදිලි හා දියුණු අක්ෂර කලාවක් හෝ සංස්කෘතියක් හෝ නොතිබුනු බව අපේ උගත් වියත් යයි කියා ගන්නා බොහෝ පණ්ඩිතයන් මෙන්ම බෞද්ධ භික්ෂූන්ද අද පුන පුනා ප්‍රකාශ කරති. නමුත් ලෝකයේ වෙනත් කිසිදු රටක එවකට නොපැවති තරම් දියුණු භාෂා සාහිත්‍යයක් අක්ෂර කලාවක් හා සංස්කෘතියක් එවකට අප රටෙහි පැවැති බවට බොහෝ සාක්ෂි ඇත. මිහිඳු හිමියන් අනුරපුරයට පැමිණෙන්නට කලින් හෙළ බිමේ අනෙකුත් ප්‍රදේශවල එවන් දියුණු අක්ෂර කලාවක් හා සංස්කෘතියක් පැවැති බව දැන් ඔප්පු වී ඇත. මිහිඳු මා හිමියන් විසින් අනුරපුරයට ගෙන ආ සියළු දියුණු අක්ෂර කලාවන් හා අනෙකුත් අංගෝපාංගයන් මිහිඳු හිමියන් විසින් ලබා ගත්තේත්, ඉගෙන ගත්තේත් රජගල රජගහනුවර එදා පැවැති විද්‍යාස්ථාන හා පිරිවෙන් වලින් මිස භාරත දේශයෙන් නොවන බවද අද වනවිට මනාව ඔප්පු කර ඇත. ඒ බව අපේ බෞද්ධ උගත් වියත් ගිහි පැවිදි අය පිළිනොගැනීම ඒ අයගේම කරුමයකි.

හෙළ බසින් ලියා තිබූ මුල්ම හෙල මහාවංශය ලියූ මහාවංශ ගත්කරු තම වීරයා ලෙස තෝරා ගත්තේ දුටුගැමුණු මහ රජතුමායි. දුටුගැමුණු මහරජුගේ පියා රුහුණේ උපන් මහානාග පුරයේ රජකළ හෙළනාග පරපුරට අයිති පැරණි නාග හෙලයෙකි. දුටුගැමුණු මහරජුගේ මව නැගෙනහිර ප්‍රදේශයේ පාලකයෙකුව සිටි දේව හෙලයේ දේව රජ පරපුරට අයත් කැලණිතිස්ස රජුගේ දියණියයි. මෙසේ නැගෙනහිර හා රුහුණේ එදා පාලනය බාරව කටයුතු කළ මුල් හෙල රජ පරපුර දෙකක් ඒකාබද්ධ කරමින් උපන් කුමරා වූ දුටුගැමුණු රජු මලය රටට කඳු රටට හා ඌවටද ගොස් එහි සහායද ඇතිව සේනා සංවිධානය කරගෙන එවකට අනුරාධපුරයේ (උතුරු කුරු දීපයේ) පාලනය බාරව සිටි පරදේශී රජුන් (විජයගේ පටන් එළාර දක්වාම අනුරපුර රාජධානියේ රාජ්‍ය පාලනය බාරව



සිටියේ පරදේශි භාරතීය රජවරුන්ය) පළවා හැර රට එක්සේසත් කර දේශීය පාලනයක් රටේ ස්ථාපිත කළහ.

දුටුගැමුණු මහ රජතුමා මෙසේ විදෙස් බලවේග පළවාහැර රට එක්සේසත් කලා මෙන්ම, රටේ මතු අනාගතයට තදින්ම බලපෑ ප්‍රධාන කරුණු කාරණා කිහිපයක් ද මේ සමඟම වෙනස් කරන්නට යෙදුනි.

1. රටේ මෙතෙක් පැවැති නැගෙනහිර අගනගරය (රජගහනුවර) අනුරාධපුරයට මාරුකර අලුතින් පාලන මධ්‍යස්ථානයක් අනුරාධපුරයේ පිහිටුවා උප රජවරුන් යටතේ ඈත එපිට ප්‍රදේශයන් පාලනය කරන්නට පටන් ගැනීම.

2. රටේ මෙතෙක් පැවැති මුල්ම විද්‍යා කලා ශිල්ප හා බුද්ධ ධර්මය ඉගැන්වූ මධ්‍යස්ථානයක් වූ රජගහනුවර හා රිටිගල ජේතවනාරාමය වැනි වෙනත් වැදගත් නගරවල පිහිටි පුස්තකාලවල ලියා තැන්පත් කර තිබූ පරිහරණය කරමින් තිබූ බොහෝ පොත්පත් ත්‍රිපිටකය හා හෙළ අටුවා වංශකථා ඇතුළු බොහෝ ආගමික පොත්පත් මෙන්ම අනෙකුත් වැදගත් පොත්පත් සියල්ලමද අළුතින් තැනූ අනුරාධපුර නගරයට ගෙන්වා ගෙන එහි සත්මහල් පුස්තකාලයක්, ප්‍රාසාදයක් කරවා එහි තැන්පත් කිරීම.

3. රටේ විවිධ ප්‍රදේශ වල විශේෂයෙන් නැගෙනහිර හා රුහුණේ ප්‍රදේශවල ජීවත් වූ මිනිසුන් වැද පුදා ගත් ගෞතම බුදුපියාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා සියල්ලම පාහේ අනුරාධපුරයට වැඩම කරවා විශාල දාගැබ් ඉදිකර ඒවායේ තැන්පත් කර මිනිසුන්ට අනුරපුරයේදී අටමස්ථානයම වඳින්නට සැලැස්වීම. මේ නිසා මීට පෙර නියම නිවැරදි අටමස්ථානය ලෙස සැලකූ බුද්ධ ශක්තියට අනුගත වූ උතුම් ස්ථානයන් යටපත් වී අභාවයට ගියහ. මෙතෙක් කල් බෞද්ධ ජනතාව අතරේ ප්‍රසිද්ධව තිබූ උත්තරාරාමය, කපිලාරාමය, කුසිනාරාරාමය, ඉසිපතනාරාමය, වේළුවනාරාමය, ජේතවනාරාමය, සළුමිණි සෑය හා සමන්ගිර අභාවිතයට ගොස් අනුරාධපුරයේ නව අටමස්ථානයක් ඉදිකිරීමද සිද්ධ විය.

4. සිවු හෙලයේම බෞද්ධ විශ්ව විද්‍යාලය ලෙසින් මෙතෙක් කල් පෙරදිග ලෝකයේම පතලව පැවති රජගහනුවර පිහිටි මූලික බෞද්ධ විහාර, පිරිවෙන් හා විද්‍යාස්ථාන සංකීර්ණය වෙනුවට අනුරාධපුරයේ මහා විහාරය, ලෝවාමහාපාය හා රුවන්වැලි සෑය ඇතුළු වෙහෙර විහාර පිරිවෙන් ගොඩ නංවා බෞද්ධ විශ්ව විද්‍යාලය අලුත් අගනුවරට එනම් අනුරාධපුරයට ගෙන යාමද මෙහිදී සිදුවිය.

බාහිර පරසතුරු ආක්‍රමණවලින් හා බාහිර සංස්කෘතික හා ආගමික බලවේග වලින්ද මෙතෙක් කලක් ස්වභාවිකවම ආරක්‍ෂාවී පැවති රජගල රජගහනුවර පිහිටි බෞද්ධ විද්‍යා ශිල්පීය මධ්‍යස්ථානය අනුරාධපුරය වැනි බාහිර ලෝකයකට විවෘත වූත් අනාරක්‍ෂිත වූත් ස්ථානයකට ගෙන ගියහ. අනුරාධපුරයට ගෙන ගිය රාජ්‍ය පාලන මූලස්ථානය වසර 800කට 900කට පසුව නැවතත් ආපසු පොළොන්නරුවට ගෙනෙන්නටත් සිදු විය. මීටත් වඩා අනුරාධපුර රාජධානියට නිරන්තරවම විදේශීය දේශපාලනික ආක්‍රමණ හා සංස්කෘතික හා ආගමික බලවේගවල ආක්‍රමණයන් මේ වසර 900ක කාලපරාසයක් පුරාම තදින්ම දැනෙන්නට විය. මේ නිසා සිදු වූ බලවත්ම විනාශය නම් නිවන් දකින්නට උපකාර වන සේ මෙතෙක් පිරිසිදුව පැවැති බුද්ධ ධර්මය, අදහන ආගමක් බවට පරිවර්ථනය වීමයි. බුද්ධ පරිනිර්වානයෙන් පසුව වසර 700ක් පමණ දිග කාලයක් ආරක්‍ෂා වී පැවති රජගහනුවර රජගල බෞද්ධ විශ්ව විද්‍යාලය අභාවයට ගොස් ඒ ස්ථානය ජනශූන්‍ය ස්ථානයක් බවට පත්වීම සිදුවී දැනට වසර 1900ක් පමණ දිගු කාලයක් ගත වී ඇත. මේ නිසා බෞද්ධ ලෝකයාට මගධ රට රජගහනුවර හා එහි තොරතුරු සියල්ල නාම මාත්‍රයක් පමණක් විය. ජන්බුද්වීපය ඉන්දියාවට පවරා දුන් සුද්දන් විසින් මගධ දේශයත් රජගහනුවරත් යන සියල්ලමත් ඉන්දියාවට බලෙන්ම පවරා දුන්හ. ඉන්දියාවේ එතෙක් භාවිතා කල බොහෝ නම් ගම් සුද්දන් විසින් වෙනස් කරමින් අළුත්ම ඉතිහාසයක් ඉන්දියාවට නිර්මාණය කර දුන්හ.

අනුරාධපුරයේ මහා විහාරයට ථෙරවාදී බෞද්ධ විශ්ව විද්‍යාලය මාරු කරන්නට පෙර එනම් බු.ව. 685- 705 ත් පමණ වන තෙක්ම දේශීය හා විදේශීය උගතුන් මෙන්ම සාමාන්‍ය රටවැසියන්, භික්ෂූන් වහන්සේලා මෙන්ම



සිවු හෙළයේම කුලවතුන්ද උගතුන්ද උසස් බෞද්ධ අධ්‍යාපනයක් ලැබුවේ රජගහනුවර පිහිටි බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයෙනි. අනුරාධපුරයේ හෝ උතුරු මැද, බටහිර, වයඹ පළාත් වල හෝ වෙනත් මෙවන් දියුණු බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඒ අතීත යුගයේදී පැවැතියේ නැත. ඉන්දියාවේත් අජන්තා, වෙල්ලෝරා ආදී බෞද්ධ විශ්ව විද්‍යාලයන් ආරම්භ කරන ලද්දේ ද මීටත් පසුව ආ යුගයකය. එනම් බුද්ධ වර්ෂ 800 තරම් පසුකාලයකදීය. ඉන්දියාවේ පසුකාලීනව ආරම්භ කරන ලද මෙම බෞද්ධ විශ්ව විද්‍යාලවල පිරිසිදු ථෙරවාදී බුද්ධ ධර්මය කිසිවිටෙකත් ඉගැන්වූයේ නැත. ඒ වෙනුවට ඉගැන්වූයේ උපනිශද්, ජෛන, හා මහායාන බෞද්ධ දර්ශණයයි. ඒ නිසා අනුරාධපුරයේ මහා විහාරයේ බු.ව. 700දී පමණ ස්ථාපිත කළ බෞද්ධ විශ්ව විද්‍යාලය ඒ මුල්ම යුගයේදී අනෙකුත් බෞද්ධ විද්‍යායතනයන්ට වඩා වෙනස් මෙහෙවරක් බෞද්ධ ලෝකයාට ඉටු කල බව පැහැදිලිය. කෙසේ වෙතත් අම්පාරේ රජගල - රජගහනුවර පිහිටුවා තිබූ බුදුන් දවස පටන් වසර 700ක් පමණ දිගු කාලයක් තුලම උතුම් බුද්ධ ධර්මය පිරිසිදු ලෙසින් උගැන් වූ ඒ ඉපැරණි අධ්‍යාපන මධ්‍යස්ථානය වැනි දියුණු තත්වයේ අධ්‍යාපන ආයතනයක් ඉන්පසුව කවදාවත්ම ලොව බිහි නොවීය.

අද ලෝකයේ බොහෝ දියුණු විශ්ව විද්‍යාලයන් ඇත. අද හෙළ බිමේද විශ්ව විද්‍යාල වල බෞද්ධ දර්ශණය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය හා බෞද්ධ සාහිත්‍යය ඉගැන්වුවත් එදා රජගහනුවර පිහිටි බෞද්ධ විශ්ව විද්‍යාලයේ ඉගැන්වූවා මෙන් පිරිසිදු බුද්ධ ධර්මය ඒවායේ උගන්වනවා යැයි කිව නොහැකිය.

අනුරාධපුරයේ මහාවිහාරය මුල්කොට ගෙන එදා ආරම්භ කළ ඒ දෙවන බෞද්ධ විශ්ව විද්‍යාලය තුළද මුල්ම යුගයේ මෙන් අධර්මවාදී , අවිනයවාදී දේ ඉගැන්වූයේ නැත. මේ යුගය වන විටත් ඉන්දියාව තුළ ප්‍රචලිත වෙමින් පැවති මහායානික අදහස්, වෛතුල්‍යවාදී අදහස්, හලාහල විෂමෙන්, ථෙරවාදින් විසින් බැහැර කළහ. එසේ නමුත් කල්යත්ම මහා විහාරික භික්ෂූන්ටද ඉන්දීය බලපෑම් ඇතිවීම නිසාත් මහායාන බුද්ධාගමේ බලපෑම් ඇති වූ නිසාත් ග්‍රාම්‍යවූත්, හීන වූත්, පෝතුජ්ජනික වූත් බොහෝ දේවල් ක්‍රමානුකූලව ජනප්‍රිය දේ ලෙසින් විෂය නිර්දේශයට ඇතුලත් කළ

නිසා ඉගෙන ගන්නට ලැබුණි. මේ අනුව නිර්මල බුදුදහම යටපත් වී භක්තියෙන් අදහන බුද්ධාගමක් හෙලබිමේද ජනප්‍රිය වී ප්‍රචලිත වන්නට මහා විහාරික අධ්‍යාපන ආයතන තුලද පසුකාලීනව මෙසේ සිදු වූ බොහෝමයක් වෙනස්කම්ද හේතු වූ බව පෙන්වා දිය යුතුය.

බු.ව. 915 දී පමණ බුද්ධඝෝෂ හිමියන් කලිඟු රටේ සිට අනුරපුර මහා විහාරයට පැමිණ මහාවිහාරික භික්ෂුන් මුළා කොට පිරිසිදු හෙළ අටුවා ලබාගෙන හෙළ අටුවා පාළියට පරිවර්ථනය කරන්නට පටන් ගත්හ. මේ යුගය වන විටත් නිවන් අවබෝධ කර ගන්නට උපකාර වන පරිදි හෙළ අටුවා වලින් පැහැදිලි කර විග්‍රහ කර ඉගැන් වූ නිර්මල බුදු දහම භක්තියෙන් අදහන බුද්ධාගමක් බවට පත් කර ගන්නට අවශ්‍ය සියළු විධිවිධාන සූක්ෂම ආකාරයෙන් යොදා තිබූ බවත් එය ඉතා සූක්ෂම ලෙසට හා මහාවිහාරික නායක කාරකාදීන්ගේ සිත් ගන්නා පරිදිත් සිද්ධ වූ බවත් ඉතාමත්ම පැහැදිලිය. හෙළ අටුවා වල පැහැදිලිවම සඳහන්ව තිබූ නිර්මල විමුක්ති මාර්ගය වෙනස් කරමින් මහායාන බුද්ධාගමෙහි පිළිගත් මූලධර්මයන්ට අනුව වෙනස්කම් ඇති කර ගනිමින් මහා විහාරික අධ්‍යාපන ආයතනයේ මෙතෙක් පැවැති ආකල්ප හා පරමාර්ථයන් වෙනස් මඟකට යොමු කරවන්නට මෙසේ හෙළ අටුවාවන්හි කරන ලද පරිවර්ථනයන් බලවත්සේම හේතු වූ බව මින් පසුකාලීනව සිදු වූ වෙනස්කම් දෙස විමසිලිමත්ව බලන කල ඉතාමත්ම පැහැදිලිය. හෙළ අටුවා, බුද්ධඝෝෂ හිමියන් පාලියට පරිවර්ථනය කිරීමේදී විශාල වශයෙන් තම මතයන්ට ගැලපෙන පරිදි වෙනස්කම් කල බව බුද්ධඝෝෂ හිමියන්ම තම ලේඛනවල පැහැදිලිවම සඳහන්කර ඇත.

බුද්ධඝෝෂ හිමියන් හෙළ බිමට පැමිණෙන්නටත් වසර කිහිපයකට කලින් ඉන්දියාවේ චෝල රාජ්‍යයේ කාවේරියේ සිට අනුරාධපුර මහා විහාරයට පැමිණි “බුද්ධදත්ත නැමැති මහායානික හිමිනමක්ද” හෙළ අටුවා ලබා ගන්නටත් මහායාන බුද්ධාගම මහා විහාරය තුළ පතුරුවන්නටත් බලවත් උත්සාහයක් දැරූ නමුත් එය මහා විහාරිකයින් විසින් ව්‍යර්ථ කර බුද්ධදත්ත හිමියන්ව ආපසු උරගපුරයට(චෝලදේශයට) හරවා යවන්නටත් ක්‍රියා කළහ.



බුද්ධඝෝෂ හිමියන් අනුරාධපුරයට පැමිණෙන්නට කලින් ඉහත සඳහන් කළ බුද්ධදත්ත හිමියන් ද හමු වී තමාට සිදු වූ දේවල් පිළිබඳව සියළු තොරතුරු ලබාගෙන යලිත් නොවරදින ආකාරයට සූක්ෂම ලෙසින් තම මෙහෙවර ඉටු කර ගන්නට ක්‍රියාකල බවත් බුද්ධඝෝෂ උත්පත්ති කථාවෙහි පැහැදිලිවම සඳහන්වේ. මේ නිසා මෙය තරමක් දුරට සිතා මතා කල් යල් බලා කරන ලද කුමන්ත්‍රනකාරී වැඩපිලිවෙළක් බව පැහැදිලිය.

ඉන්දියාවේ මහායානිකයින්ගේ බලපෑම්වලින් නිර්මල බුද්ධ ධර්මය රැක ගන්නට මහාවිහාරිකයින් විසින්ද විවිධ ක්‍රමවේදයන් හා උපක්‍රමයන් යොදා තිබූ බවත් ඉතාම පැහැදිලිය. මහා විහාරයට පැමිණි බුද්ධඝෝෂ හිමියන් ව මහාවිහාරිකයින් විසින් එකවරම පිළිගත්තේ හෝ විශ්වාස කළේ හෝ නැත. මේ අනුව බුද්ධඝෝෂ හිමියන්ව පරීක්ෂා කරන්නට මහා විහාරිකයින් විසින් පරීක්ෂණ කිහිපයක්ම පැවැත්වූ බවද ලිඛිත සාක්ෂි වලින් පැහැදිලි වේ. පතංජලි ආගම පිළිබඳවත්, සිංහල හා පාලි භාෂාවන් පිළිබඳවත්, උපනිශද් හා හින්දු ධර්මය පිළිබඳවත්, මහායාන බුද්ධාගම පිළිබඳවත්, හසල දැනුමක් ලබා සිටි වේදයෙහි පරප්‍රාප්ත බ්‍රාහ්මණයෙකු වූ බුද්ධඝෝෂ හිමියන් විසින් අවසානයේදී මහාවිහාරිකයින්ව තම මතයට නම්මවා ගන්නට සමත් වීය. මේ අනුව එවකට මහා විහාරයේ ආරක්ෂා සහිතව තැන්පත් කර තිබූ වැදගත් ම හෙළ අටුවා පොත් ලබා ගත් බුද්ධඝෝෂ හිමියන් ඒවා පාළි බසට පරිවර්ථනය කර ලියා තැබීය. මේ අනුව මහාවිහාරිකයින්ගේද එකඟත්වය ඇතිව මහා විහාරයේ පොත්ගුලෙන් ලබා ගත් මහා අට්ඨ කථා (මූලට්ඨ කථාව) පාළි බසට පරිවර්ථනය කරමින් විශුද්ධි මාර්ගය ඇතුළු පොත් 17ක්ම බුද්ධඝෝෂ හිමියන් විසින් පාලි අට්ඨ කථා යනුවෙන් රචනා කලහ.

බුදුපියාණන් ජීවමානවම වැඩ සිටි යුගයේදී මාගධී බසින් දේශනා කරන ලද බුද්ධ භාෂිතය ඒ දින වල පටන්ම හෙළ බසින් අට්ඨ කථා ලෙසින් ලියා තබා හෙළදිව වැසියන්ගේ ධර්ම ඥාණය වඩා වර්ධනය කර ගැනීමට උපකාර වන සේ පරිශීලනයට ලබා දීමේ වැඩපිළිවෙලක් රජගහනුවරදී ක්‍රියාත්මකව පැවතුනි. මේ සඳහා මූලිකවම ක්‍රියාකලේ මහා ප්‍රාඥයින්වහන්සේ කෙනෙකු ලෙසින් ගෞතම බුදුපියාණන් විසින්ම

නොයෙක් වර සඳහන් කළ මහා කච්චායන මහාප්‍රාඥයින් වහන්සේ ඇතුළු මඟඵලලාභී ආර්යයන් වහන්සේලා පිරිසකි. පසු කලෙක රජගහනුවර රජගල බෞද්ධ විශ්ව විද්‍යාලයේ බුද්ධ ධර්මය උගත් බොහෝ බුද්ධ ශ්‍රාවකයින් වහන්සේලා එතැන් පටන් (බුද්ධ පරිනිර්වාණයේ පටන්) වසර 700ක් පමණ දිගු කාලයක් තුළදීම මේ හෙළ අටුවා බුද්ධ ධර්මය ඉගැනීම සඳහා පරිශීලනය කළ බවත් ඒවා නිවැරදි නිර්මල බුද්ධ ධර්මයම වූ බවත් පැහැදිලිය. මේ නිසාම හෙළ අටුවා පොත්පත්ද පර්යාප්ති ධර්මය යන කොටසට ගැනෙයි. මිහිඳු කුමාරයා රජගහනුවර - රජගල බෞද්ධ විශ්ව විද්‍යාලයට පැමිණි යුගය වන විටත් බුද්ධ ශ්‍රාවකයින් ලියා තිබූ, පරිශීලනය කරමින් තිබූ හෙළ අටුවා මිහිඳු හිමියන් ද පරිශීලනය කල බවත් රජගහ නුවර - රජගල සිට අනුරාධපුරයට වැඩම කළ වදාළ අවස්ථාවේදී මිහිඳු හිමියන් විසින් එවකට රජගහ නුවර පුස්තකාලයේ තැන්පත් කර තිබූ හෙළ අටුවා වලින් කොටසක්(පොත් කිහිපයක්) අනුරාධපුරයට රැගෙන ගිය බවත් මහාවංශයෙහිම පැහැදිලිව සඳහන්වෙයි. මිහිඳු මා හිමියන් අනුරාධපුරයට රැගෙන ගිය ඒ හෙළ අට්ඨ කථා ආර්යයන් වහන්සේලා විසින් හෙළ බසින් ලියූ හෙළ අටුවාවෝම විය. හෙළ අටුවා ලියුවේත් තැන්පත් කර තැබුවේත් හෙළදිව නැගෙනහිර ප්‍රදේශයේ පිහිටා තිබූ රජගහනුවර බෞද්ධ විශ්ව විද්‍යාලයේය. එසේ හෙළ අටුවා ලියා තබමින් හෙළදිව වැසියන්ට නිර්මල බුද්ධ ධර්මය දායාද කර ලබා දුන්නේ මාර්ග ඵලලාභී ආර්යයන් වහන්සේලා විසින්ය. මිහිඳු කුමාරයාද ඉන්දියාවේ කළිඟු දේශයේ සිට රජගහනුවරට- රජගලට පැමිණ වසර කිහිපයක් පුරාම මාගධි බස හෙළ බස හා හෙළ අටුවා ඉගෙන ගෙන නිර්මල බුද්ධ ධර්මයද තේරුම් ගෙන ඒ මඟ අනුගමනය කර මඟඵල ලබාගත්තේ අම්පාර රජගල පිහිටි බෞද්ධ විශ්ව විද්‍යාලයේදීය. රජගල පිහිටි විහාර ආරාම සංකීර්ණයේදීය.

ත්‍රිපිටක ධර්මය - බුද්ධ භාෂිතය - මාතුල අළුලෙනේදී හෙළ අකුරෙන් සිංහල භික්ෂූන් වහන්සේලා විසින් ලේඛන ගත කරන්නට යෙදුනේ බු.ව 456 දී ය. එතෙක් කල් කටවචනයෙන් වනපොත් කර ගනිමින් පරම්පරාවෙන් පරම්පරාවට ත්‍රිපිටක ධර්මය පවත්වාගෙන ආවේද සිංහල බෞද්ධ භික්ෂූන් වහන්සේලාය. තවත් වසර 450 කට පමණ පසුව බු.ව.



915දී පමණ බුද්ධඝෝෂ හිමියන් හෙළ අටුවා පාලි භාෂාවට පරිවර්ථනය කරන්නට යෙදුනි. මෙසේ හෙළ බසින් හෙළ අකුරින් එදා ලියූ මුල්ම හෙළ අටුවා සීහලට්ඨ කථා කිසිවෙකුත් අනුරාධපුරයේදී හෝ මහා විහාරයේදී හෝ ලියූ ඒවා නොවේ. මේසා විශාල හෙළ අටුවා ප්‍රමාණයක් ලියන ලද්දේ රජගහනුවර - රජගල පිහිටි බෞද්ධ විශ්ව විද්‍යාලයේදීය. මේ එකද හෙළ අටුවාවක් හෝ අනුරාධපුර මහා විහාරයේ දි ලීවා නම් මහා වංශයේ ඒ බව පැහැදිලිවම සටහන්කර තබනු ඇත. නමුත් මහා වංශයේ විවිධ තැන් වල හෙළ අටුවා පිළිබඳවත් විවිධ දේ සඳහන් වෙතත් ඒවා ලියූ අය ගැන හෝ තැන් ගැන හෝ ලියා තබා නැත. ඒවා මහා විහාර පුස්තකාලයේ තැන්පත් කර තිබූ බවත් ඇතුන් හත් දෙනෙකුගේ බරට සමාන බරකින් යුතු පුස්කොළ පොත් එහි තැන්පත් කර තිබූ බවත් සඳහන් වේ. මේ පොත් වලින් වැඩි හරියක්ම හෙළ අටුවා වූ බවත් මහා වංශයේම ලියා තබා ඇත.

විශුද්ධි මාර්ගය ඇතුළු පාලි පොත් 17ක් බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන තුරාවටම රජගහනුවරදී හෝ අනුරපුර මහා විහාරයේ දී හෝ පාලි භාෂාවෙන් අටුවා ලියා තැබූ බවක් කිසිතැනක සඳහන් නොවේ. නමුත් ත්‍රිපිටකය නමින් ලියූ සියළු ත්‍රිපිටක පොත් ලියා තැබූ භාෂාව වූයේ මාගධී භාෂාවයි. මූල මාගධී භාෂාවට අකුරු නැති නිසා මුල්ම යුගයේ මාගධී භාෂාවෙන් දේශණා කර තිබූ බුද්ධ ධර්මය ඒ භාෂාව වෙනස් නොකරම සිංහල හෙළ අකුරු භාවිතා කරමින් මාගධී පදවැල් ලියා තැබූහ. මෙසේ වසර 450ක් පමණ දිගු කාලයක් කටපාඩම් කරගෙන වනපොත් කරගෙන පවත්වා ගෙන ආ බුදු දහම මතකයේ රදවා ගැනීමේ පහසුව සඳහා ඒ මාගධී පදවැල් පේළි ලෙසින් සකස් කර ගෙන පෙළ ගස්වා තිබුණි. එසේ පෙළ ගැස් වූ දහම් පද, පෙළ දහම ලෙසින් පසුව භාවිතයට පැමිණියහ. මේ මාගධී පෙල, පසුව පාලි බවට පත්විය.

. පෙළ දහම ලෙසින් වනපොත් කරගෙන කටපාඩම් කරගෙන වසර හාරසිය පනස්ගණනක්ම පරම්පරාවෙන් පරම්පරාවටම පවත්වාගෙන ආ දහම කිසිවිටකත් වෙනස් නොවීය. එය එතෙක් දිගු කලක් යන තුරු ලේඛන ගත නොකරන්නටත් හේතු තිබුනි. මාගධී භාෂාවට අකුරු නැතිකම ඉන් ප්‍රධානම හේතුවයි.

හෙළ බිමේදී හෙළ අකුරින් සිංහල භික්ෂුන් වහන්සේලා විසින් ත්‍රිපිටකය ලේඛන ගත කලාට පසුව ආ යුගයකදී ඒ අභාෂයෙන් ඉන්දියාවේද සංස්කෘත අකුරෙන්ද, චීන රටේදී චීන අකුරෙන්ද වෙනත් වෙනත් රට වලදී ඒ ඒ රටේ භාවිතා කළ භාෂාවේ අකුරෙන්ද මෙම මාගධී ශබ්ද සංඥා ලේඛන ගත කළහ. එහිදී මාගධී භාෂාවෙන් දේශණා කරන ලද මුල් බුද්ධ දේශණාව ආරක්ෂා විය.

මුල්ම වරට හෙළ ද්වීපයේදී ත්‍රිපිටක ධර්මයට අර්ථ දක්වමින් හෙළ අටුවා හෙළ අකුරෙන් පොත් වල ලියා තැබුවාට පසුව ඉන්දියාවේදී විවිධ මහායානික බෞද්ධ විද්වතුන් විසින් ද විවිධාකාර වෙනස්කම් සහිතව ත්‍රිපිටකයටම අර්ථ කථා ලියන ලදී. සංස්කෘත බසින් (චන්දස්වලින්) ඉන්දියාවේදි ලියූ බොහෝ අර්ථ කථා පදනම් කොට ගෙන මහායාන දර්ශනයක් හා මහායාන බුද්ධාගමක්ද ඉන්දියාවේදී ස්ථාපිත වීය. මුල්ම ත්‍රිපිටකයට අයත් වන නිර්මල බුදුදහම විග්‍රහ කිරීමට පමණක් මුල් යුගයේ හෙළ බසින් හෙළ අර්ථ කථා ලියා තිබුණි. බුද්ධක නිකායට ඇතුලත් වන බොහෝ පාළි පොත්පත් බුද්ධ පරිනිර්වාණයෙන් පසුව විවිධ උගතුන් විසින් විවිධ අවස්ථාවලදී ලියා තැබූ පොත් පත්ය. මුල් ම හෙළ අටුවා හැටියට ගැනෙන්නේ පුස්කොලවල ලියාතිබූ පොත්පත්ය. මේ අතර වැදගත් ම හා ප්‍රකට අටුවා පොත්පත් ලෙසින් සඳහන් වන කිහිපයක්ම ඇත. මේවා හෙළ අටුවා, සීහලට්ඨ කථා ලෙසින් ප්‍රචලිතය.

1. මහා අට්ඨ කථා = මූලට්ඨ කථා
2. මහා පච්චරිය අට්ඨ කථා = බුදු කැලි අටුවා
3. කුරුන්දි අට්ඨ කථා
4. සංඛේප අට්ඨ කථා
5. පොරාණ අට්ඨ කථා
6. පුබ්බාචරිය අට්ඨ කථා



පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ උගතුන් මෙන්ම අනෙකුත් විද්වතුන් හා පර්යේෂකයින්ද විසින් අද වන විට ප්‍රකාශ කරනු ලබන ආකාරයට මේ හෙළ අර්ථ කථා, සීහල අර්ථ කථා ලියන ලද්දේ ක්‍රි. ව. 3 , 4 හෝ 5 වන සියවස් වලදී පමණය. නමුත් මේ මතය පහසුවෙන්ම අනාථ කළ හැකි මතයකි. බුද්ධඝෝෂ හිමියන් හෙළ අටුවා පාලියට පරිවර්ථනය කළේද මේ ක්‍රි.ව. 4ත් 5ත් යන කාල වකවානුවේදීය. එනම් බු.ව. 915 දී පමණ මහානාම රජු රාජ්‍ය පාලනය කල කාලයේදීය.

බුද්ධඝෝෂ හිමියන් මෙන්ම ඊට පෙර හෙළ බිමට පැමිණි බොහෝ ඉන්දියානු හා චීන සංචාරකයින් විසින්ද ක්‍රි.ව.4 වන සියවස වන විටත් මේ රටේදීම ලියවී තිබුණු හෙළ අටුවා ගැන හොඳ දැනුමක් ලබා තිබුණි.

බුද්ධඝෝෂ හිමියන් හෙළ බිමට පැමිණෙන්නට පෙර වාසය කළේ කළිඟු රට පතංජලී හින්දු ආශ්‍රමයකය. මෙම පතංජලී ආශ්‍රමයට හෙලබිමෙන් පැමිණි අභයගිරිවාසී බෞද්ධ භික්ෂූන්ගෙන් බුද්ධඝෝෂ හිමියන් හෙළ බස හා හෙළ අටුවා මෙන්ම පාලි බසද මනා කොට ඉගෙන ගත්හ. එසේ ඉගෙන ගත් බව පැහැදිලිවම ඔප්පු වන්නේ හෙළ බස ගැන යමක් නොදැන හෙළ අටුවා ගැන යමක් නොදැන එක් වරම අහසින් කඩා වැටුණු අයෙකුට සිංහල බසින් ලියාතිබූ හෙළ අටුවා පාලි බසට පරිවර්ථනය කළ නොහැකි නිසාය. මෙය ඉර්ධි ප්‍රාතිහාර්යයක් ලෙසින් පෙන්වන්නට බොහෝ අය උත්සාහ ගත්තත් මෙහි එවැන්නක් නැත. මෙහි සත්‍ය නම් හෙළ බිමට පැමිණෙන්නට පෙර බුද්ධඝෝෂ හිමියන් විසින් හෙළ බස, පාලි බස සහ හෙළ අටුවා වසර ගණනාවක් තුල හොඳින්ම අධ්‍යනය කර තම ගුරුවරයා වූ පතංජලී සමඟද මේ ගැන සාකච්ඡා කළ බවයි.

බුද්ධඝෝෂ හිමියන්ට හෙල අටුවා පරිවර්තනය කිරීමේ මෙම විශේෂ රාජකාරිය පවරන ලද්දේ මේ සඳහා ලැබූ විශේෂ පුහුණුවකින් ද පසුවය. මෙය වසර ගණනාවක් තුල සිද්ධ වූ ක්‍රියාදාමයන්, කුමන්ත්‍රණයන් සමූහයක ප්‍රතිඵලයන් ලෙසින් විනා අහම්බෙන් සිදූ වූවක් ද නොවේ.

මේ අනුව මිහිඳු හිමියන් එදා  අනුරාධපුරයට පැමිණෙන්නටත් පෙර කාලයක පටන්ම රජගහනුවර - රජගල බෞද්ධ විශ්ව විද්‍යාලයේදී මඟඵල ලාභී හෙළදිව වැඩ සිටි සිංහල ආර්යයන් වහන්සේලා විසින් අර්ථ, ධර්ම, නිරුක්ති, පටිසම්භිදා සහිත ව ලියා තිබූ නිර්මල බුද්ධ ධර්මය හෙළ අටුවා ලෙසින් ප්‍රචලිතව තිබුනි.

“දහමට සරිකොට හෙළුවෙන් පෙරකී” යනාදී වශයෙන් ලෝවැඩ සඟරාවේද මේ බව සඳහන් කර ඇත. මේ නිර්මල හෙළ අටුවා ඉගෙන ගෙන ධර්ම මාර්ගය අනුගමනය කරමින් “නිවනට සපැමිණි සඟ සැට නමක්” ගැන මේ කවියෙන් කියැවෙයි. බුද්ධඝෝෂ හිමියන් විසින් ලියා පලකල පාලි පොත් 17ම හෝ කියවා කිසිවෙකුටත් අදවන තුරුත් නිවන් මාර්ගය පහදා ගන්නට ලැබුනා යැයි කොතැනකවත් සඳහන් කර නැත. මතුවටත් මේ පාලි අටුවා කියවා නිවන් දැක ගත නොහැක.

ඊට හේතුව වූයේ නිර්මල බුද්ධ ධර්මය සඳහන් කරමින් ලියා තිබූ උතුම් හෙළ අටුවාවල සඳහන් පිරිසිදු ධර්මය  පාලි භාෂාවට පරිවර්ථනය කිරීමේදී කරන ලද වෙනස්කම් නිසාය. එසේත් නැතිනම් ධර්මය ආගමක් බවට පත් කළ නිසාය. ලෞකිකත්වය යහපත්  කරන්නට, දෙව් සැප බ්‍රහ්ම සැප, රජ සැප ලබන්නට මේ අලුතින්  ලියූ ධර්මය උපකාර වුනත් කෙළෙස් මුල් කපා දමා නිබ්බානගාමී මාර්ගයට පිවිසෙන්නට නම් උපකාර වූයේ නැත. මතුවටත් උපකාර වන්නේද නැත.

මිහිඳු මා හිමියන් අනුරාධපුරයට පැමිණෙන විට ත්‍රිපිටකය ද එහි රැගෙන ආවේය යන වැරදි මතයක් අද බොහෝ විද්වතුන් අතර මුල් බැසගෙන ඇත. නමුත් මිහිඳු මා හිමියන් වැඩම කළ යුගයට වසර එකසිය අසූවකට පමණ පසුව ආ යුගයකදි එනම් බු.ව. 456 දී වලගම්බා රාජ්‍ය පාලන යුගයේදී ත්‍රිපිටකය පළමුවන වරටම ලේඛන ගත කල බව කවුරුත් දන්නා ප්‍රසිද්ධ සත්‍යයකි. මිහිදු හිමියන් අනුරපුරයට වැඩම කර දේශණා කරන ලද සූත්‍ර ගණන පහළොවකට ආසන්න ගණනකට සීමා වී  ඇත. නමුත් ඒ දේශණා කරන ලද සීමිත වූ සූත්‍ර කිහිපයකින් නිවන් දකින්නට උපකාර වන සියලු ධර්මය පහදා සර්ව සම්පූර්ණ ලෙසින් දේශණා කල



සේක. ඊට අමතරව මිහිඳු හිමියන් බුදු දහම ඉගෙනගත් රජගහනුවරදි - රජගලදි ආර්යයන් වහන්සේලා විසින් ලියා භාවිතා කරමින් තිබූ සමහරක් හෙල අටුවා, පුස්කොල පොත් වශයෙන්ම අනුරාධපුරයට මිහිඳු හිමියන් ඇතුළු පිරිස විසින් රැගෙන ඇවිත් හෙළ අටුවාද හඳුන්වාදෙන ලදී. මේ අනුව අනුරපුර රාජධානියේ වාසය කල යක්ෂ ගෝත්‍රික හෙල ජනතාව  මේ හෙළ බස කියවන්නටත් දැන සිටිය බවද පැහැදිලිය.

මිහිඳු හිමියන් ඇතුළු පිරිස ඉන්දියාවේ  යම්කිසි තැනකින් පටන්ගෙන අනුරාධපුරයට පැමිණියේය යන මතය මේ මගින් සම්පූර්ණයෙන්ම නිශේධනය වන්නේය. මිහිඳු මා හිමියන් ලංකාපුරයට (අනුරපුරයට) පැමිණෙන කාල වකවානුව වන විට ඉන්දියාව තුල කොතැනකවත් නිර්මල බුදු දහමක් භාවිතයේ නොතිබිනි. මහායානිකයින් විසින් (මහා සාංඝිකයින් විසින්) නිර්මානය කරගත් මහායාන මත හා සංකල්පයන් සුළු වශයෙන් ඉන්දියාවේද පැතිර පවතින්නට හැකියාව තිබුනත් පිරිසිදු නිර්මල බුද්ධ ධර්මය කාවේරි නදියෙන් එපිට උතුරු ඉන්දියාව තුල නම් නොතිබිනි.

මහා වංශය පාලි භාෂාවෙන් ලියා තැබු  හෝ පරිවර්ථනය කර ලියූ මහානාම හිමියන්ද බුද්ධඝෝෂ හිමියන් මෙන්ම කාලිංග හෝ චෝල දේශයෙන් හෙලදිවට පැමිණ හෙළ බසින් ලියා තිබූ මහා වංශය මූලාශ්‍ර කොටගෙන පාලි බසින් මහාවංශයත් ලියා තැබීය. මුල්ම පාලි මහාවංශය (අද අපට කියවන්නට ඇති පොත) ලියා පළ කලේද  ක්‍රි.ව. 5 වැනි සියවසේදී පමණය.

බුද්ධඝෝෂ හිමියන් පාලි අටුවා පොත්පත් ලියුවාට පසුව  ආ ආසන්නම වර්ෂකදී  මහානාම හිමියන්ද පාලි මහාවංශය පරිවර්තනය කර ලියා තබා ඇති බව පෙනේ. මහාවංශ කර්තෘ මහානාම හිමියන්ද බුද්ධඝෝෂ හිමියන් කරන ලද මෙහෙවර දැන සිටියේය. ඉතාම ඉහලින් බුද්ධඝෝෂ හිමියන් වර්ණනා කරමින් අනුබුදු හිමියන් ලෙසින් හඳුන්වා දී ලියා තැබීමට තරම් පෙළඹුනේ මේ දෙදෙනාම එකම ආකාරයක රාජකාරියක් කිරීමට හෙලබිමට පැමිණි නිසාය.

බුද්ධඝෝෂ හිමියන් හා මහානාම හිමියන් අනුරපුරයේදී හෙළ පත පොත පාලි භාෂාවට පරිවර්ථනය කර ලියූ යුගයෙන් පසුවත් ඉන්දීය හා ලාංකික විද්වතුන් විසිනුත් විවිධ අවස්ථාවල විවිධ වූ අටුවා, ටීකා, ටිප්පනි ලියා පළ කරන ලදී. මෙසේ අර්ථ කථා (අටුවා) හෙළ බසින් හෝ පාලි බසින් හෝ ලියූ බොහෝ දෙනෙකුන් විසින් පදනම ලෙසින්, මූලාශ්‍රයන් ලෙසින් , භාවිතා කරන ලද්දේ එවකට ජනප්‍රියව පැවැති මුල්ම හෙළ අටුවා පොත්පත්ය.

මඟඵල ලාභී ආර්ය මහා සංඝරත්නය විසින් රජගලදී මනාව රචනා කරන ලද හෙළ බසින් ලියා තිබුණ මෙම හෙළ අටුවා පොත්, පාලි භාෂාවට පරිවර්තනය කිරීමේදි එම හෙල අටුවා පොත්වල සාරය පමණක් ගෙන තම දැනුම හා උගත්කමත් ප්‍රයෝජනයට ගනිමින් තමන් පිලිගත් පතංජලි මතවාදයන් ද පොත් තුලට ඇතුළු කළ බව බුද්ධඝෝෂ හිමියන් විසින්ම තම පොත්වල ලියා තබා ඇත.

මෙහිදි බුද්ධඝෝෂ හිමියන්ම ලියා තබා ඇති පරිදි පහත සඳහන් වන පරිදි යම් යම් වෙනස්කම් කරමින් මේ පාලි අටුවා පොත්පත් රචනා කල බව පැහැදිලිවම ලියා තබා ඇත.

1. "භාසාන්තරමේව හිත්වා"

මුල් හෙළඅටුවාව භාවිතා කළ බස් වහර වෙනස් කර පොත් ලිවීම සඳහා පාලි භාෂාව භාවිතා කිරීම.

2. " තං වජ්ජයිත්වාන පමාදං ලේඛං "

බුද්ධඝෝෂ හිමියන්ගේ දැනුමට අනුව වැරදි තැන් සොයා දැන ඒවා බැහැර කර ඒ වෙනුවට බුද්ධඝෝෂ හිමියන් නිවැරදි යැයි නිගමනය කළ මතයන් අලුතින් ඇතුළු කිරීම.

3. "විත්ථාරමග්ගං ච සමාසයිත්වා"

අනවශ්‍ය ආකාරයට සමහර තැන්හි ලියා තිබූ විස්තරයන් හෝ පුනරුක්ත දොස් බැහැර කර සංක්ශේපයෙන් ලිවීම.



4. "විනිච්චයං සබ්බමසේසයිත්වා "

අතීත කාලයට ගැලපුනත්, පොත් ලියන කාලයට නොගැලපෙන විනිශ්චයන් බැහැර කර කාලයට අදාල වන පරිදි සම්මත විනිශ්චයන් අලුතින් ඇතුලු කිරීම

5. "තන්තික්කමං කඤ්චි අවොක්කමිත්වා"

යුගයට කාලයට ගැලපෙන පරිදි ව්‍යාකරණ හා භාෂා රීති සංශෝධනය කර ලිවීම.

බුද්ධඝෝෂ හිමියන්ම ලියාතබා ඇති පරිදි මෙම කරුණු කාරණා දෙස බලන විට මෙම පාලි අටුවා පොත්පත් ලිවීම සඳහා මුල්ම හෙළ අටුවාවන් භාවිතා කලත්, හෙළ අටුවාවන්හි තිබූ මුල් ස්වරූපය (නිර්මල බව) බොහෝ දුරට කාලයට ගැලපෙන පරිදිත්, බුද්ධඝෝෂ හිමියන් පිළිගත් සම්මතයන්ට හා පතංජලි ආගමේ පිළිගත් සම්මතයන්ට ගැලපෙන පරිදිත්, වෙනස්කර ලියා තැබූ බව කාටත් පැහැදිලිය. මහා ප්‍රාඥයන් වහන්සේලා විසින් හෙළ දිව, හෙළබස හැදෑරූ සිංහල වැසියන්ට, ගැලපෙන පරිදි ලියා පළකර තිබූ, පරිශීලනය කරමින් තිබූ වසර අටසියයක් නමසියයක් පමණ දිගු කාලයක්ම හෙළදිවදී භාවිතා කරමින් පැවැති මෙම හෙල අටුවා බුද්ධඝෝෂ හිමියන් තම අභිමතය පරිදි විවිධාකාරයෙන් වෙනස්කම් කරමින් පාලි භාෂාවෙන් යලිත් අලුතෙන් රචනා කිරීම නිසා, හෙලබිම වැසියන්ට අදහන බුද්ධාගමක් පවත්වාගෙන යන්නට ඒ අටුවාවන් උපකාර වුවත්, නිබ්බාන මාර්ගය, විමුක්ති මාර්ගය වැසී යටපත් වන්නට නම් මේ කරන ලද වෙනස්කම් බලවත් සේම හේතුපාදක විය.

බුද්ධඝෝෂ හිමියන් විසින් ලියූ මෙම පාලි අටුවා පොත්පත් බොහොමයක්ම පෘතග්ජන පුද්ගලයින්ගේ සිත්ගන්නා පරිදි ජනප්‍රිය ආගමික සංකල්පයන්ද ඇතුලත් කරමින් ලියූ නිසා මේ අලුත් පාලි අටුවාව මහාවිහාරික භික්ෂූන්ගේද සිත් ගන්නට සමත්විය. මේ අනුව ලෞකික වශයෙන් බ්‍රහ්මත්වයට ළංවන්නට දෙව් මිනිස් සැප සම්පත් ලබන්නට හා බෝසත් පෙරුම් පුරන්නට සුදුසු වන පරිදි ථේරවාදී බුද්ධාගමද යලි වෙනස් කරගෙන සකස් කරගත්හ. මේ නිසාවෙන් කල්යත්ම මහාවිහාරික බෞද්ධ

මධ්‍යස්ථානය තුල පිහිටුවා තිබූ පිරිවෙන් වලත් බහුල වශයෙන්ම ජනප්‍රිය වූ හා විවිධාකාර විෂයයන් අළුතින් උගන්වන්නටත් පටන් ගත්හ.

හෙළ අටුවා යන ප්‍රචලිත නාමයෙන් හැඳින්වූ, බුද්ධ දේශණාවටම හෙළ බසින් ලියූ අර්ථකථා විශාල ප්‍රමාණයක් හෙළ දිව වැසියන් අතරේ මුල් යුගය තුල භාවිතා වෙමින් පැවැති බව අපේ විද්වතුන්, ඉතිහාසඥයින් හා බෞද්ධ පඬිවරුන් ද එකහෙළාම පිළිගන්නා දෙයකි. නමුත් අද වන විට අපට ඉතිරි වී ඇත්තේ මේ හෙල අටුවාවල නම් පමණකි. මේ හෙළ අටුවා මුලින්ම ලියුවේ කවුද? කර්තෘතුමන් එක පුද්ගලයෙක්ද පුද්ගලයින් සමූහයක්ද? ලියුවේ කවදාද? කොතනකදී මේවා ලියුවේ ද යනාදී කරුණු අදවන විටත් අපේ බෞද්ධ පඬිවරුන්ට නිරාකරණය කර ගන්නට බැරිවිය. අගක් මුලක් සොයාගත නොහැකි ප්‍රශ්ණ සමූහයකට ඔවුන් මුහුණ දෙන විධියේ ගැටළුවක් බවටද මෙය පත්වී ඇත.

බු.ව. 350ට ආසන්න කාලයකදී රුහුණේ මහානාග පුරයෙන් අනුරාධපුරයට පැමිණි දුටුගැමුණු රජතුමා විසින් රට එක්සේසත් කර මහා විහාරයේ පුස්තකාලයක් ගොඩ නැංවූ බවද(සත්මහල් ප්‍රාසාදයක්) මහා වංශය සඳහන් කරයි. දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කර රටේ සිවු හෙළයේම අගනගරය අනුරාධපුරයට ගෙන ගිය පසුව නැගෙනහිර රජගල හා රුහුණේ කෑගල්ලේ මෙන්ම රිටිගල ජේතවනාරාමයේද භාවිතා කරමින් පරිහරණය කරමින් තිබූ වැදගත් බෞද්ධ පොත් පත් සියල්ලම අනුරාධපුරයට ගෙන්වාගෙන එක්රැස් කර මහා විහාර පුස්තකාලයේ තැන්පත් කරන්නට යෙදුනු බව මහාවංශය පැහැදිලිවම සඳහන් කරයි. මෙසේ හෙළ අටුවා පොත්පත් මූලික වශයෙන්ම ගෙන්වූයේ රිටිගල පිහිටි ජේතවනාරාමයෙන් හා රජගල පිහිටි බෞද්ධ විශ්ව විද්‍යාලයෙන්ය.

එදා මහාවිහාරයේදීද පරිහරණය කරන ලද නිර්මල බුදු දහම ලියා තිබූ මෙම හෙළ අටුවා පොත්පත් අනුරාධපුරයේ මහා විහාරයේදී ලියූ බවක් කොතනකවත් මහාවංශයේ හෝ වෙනත් ලියවිල්ලක හෝ සඳහන් වන්නේ නැත. එසේ අනුරාධපුරයේදී හෝ මහා විහාරයේදී මේවා ලියන්නට යෙදුනේ නම් එහි කතුවරයාගේ නම හා ඒවා ලියන්නට මූලික වූ අනෙක් අයගේ නම්



ගම් ද අනිවාර්යයෙන්ම මහා වංශයේම සඳහන් කර තබනු ඇත. අපේ වැළලී ගිය හෙළ බොදු ඉතිහාසය මතු කර ගත් විට පමණක් ම මේ සියළුම ප්‍රශ්න වලට නිවැරදිවත් පිරිසිදුවත් පිලිතුරු ලබාගන්නටත් හැකිවනවා ඇත.

මහාවංශයේ- විශේෂයෙන්ම පුරාණ හෙළ බසින් ලියා තිබූ මුල්ම මහා වංශයේ - ලේඛන ගත කර තිබූ හැම වචනයක්ම හැම පදයක්ම මේ සිවු හෙළයට අදාල වූත් අයත් වූත් සිවු හෙළයේ මිනිසුන්ට අදාල වූත් නම් ගම් හා ඓතිහාසික සිදුවීම් පමණක්ම විය. ඒ අනුව මහා වංශයේ සඳහන් සියලු නම් ගම්, ඉතිහාසය, රජවරු සියල්ල සිවු හෙලයටම අයත් විස්තරයන්ම විය. ඒ යුගය වන විට භාරත දේශයේ හෝ සිවු හෙලයට බාහිර වූ වෙනත් දේශයක් ගැන හෝ ඉතිහාසය මේ රටේදී ලියා තබන්නට තරම් හෝ පුද්ගලයින් හා නම්ගම් ලියා තබන්නට තරම් හෝ උන්මාදයක් අපේ පැරණි හෙළගත්කතුවරයන්ට නොතිබුණි. පසුකලකදී හෙළ මහා වංශය පාලි භාෂාවට පරිවර්තනය කිරීමත්, දීපවංශය ආදී බොහෝ පොත් පත් පාලි භාෂාවට පරිවර්තනය කිරීමත්, හෙළ අටුවා පරිවර්ථනයත් සිදු වුයේ කලිඟු රටෙන් , චෝල පාණ්ඩ්‍යය වැනි දකුණු ඉන්දීය රටවලින් පැමිණි සිංහල හා පාලිභාෂා උගතුන් අතිනි. මේ නිසා අනුරාධපුර රාජධානිය රටේ අගනගරය ලෙස වැඩි දියුණු වන්නට පෙරත් මහා විහාරය ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයක් තත්වයට පත්වන්නට පෙරත් මිහිඳු හිමියන් අනුරාධපුරයට වැඩම වන්නට පෙරත් අපේ හෙළ දිවයින තුල ඉතාම වැදගත් දියුණු ඉතිහාසයක්, සංස්කෘතියක් , ලේඛන කලාවක් මෙන්ම ශිල්ප ශාස්ත්‍ර උගත් ජනතාවක්ද ජීවත්ව සිටියහ. ඒ, හෙළ දිවයිනේ නැගෙනහිර පලාතේ, රුහුණේ සහ උඩරට කඳුකර ප්‍රදේශවලය. ඒවාගේම අම්පාර රජගල(එදා රජගහනුවර ) පිහිටි ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාල මගින් විශාල විද්‍යාර්ථීන් පිරිසක් ලොවට බිහිකලා පමණක් නොව පොත්පත් විශාල රාශියක්ද හෙළ බසින් හෙළ අකුරෙන් ලියා ආරක්ෂා කර ගෙනද තිබුණි.

අම්පාර - රජගල - රජගහනුවර සිට යක්‍ෂ හෙලයේ අගනුවර වූ අනුරාධපුරයට වැඩම කළ මිහිඳු මා හිමියන් වහන්සේ අනුරාධපුර මහා විහාරය ආරම්භ කරමින් අනුරාධපුරයට ගෙන ගියේ පිරිසිදු ථෙරවාදී බුද්ධ ධර්මයයි. ඒ වකවානුව වන විට බුද්ධ ධර්මය ථෙරවාදී , මහායාන යන නම් වලින් නිකායයන් ලෙස බෙදී නොතිබුණත් අනුරාධපුර ප්‍රදේශයේ ක්‍රියාත්මකව පැවැති බුද්ධාගම ථෙරවාදී බුද්ධ ධර්මයට පටහැනි වූවක් විය. මේ අනුව මිහිඳු මාහිමියන් විසින් සිදුකරන ලද මෙහෙවරය වුයේ අනුරාධපුර රාජධානියට හා එහි ජනතාවට නිර්මල බුද්ධ ධර්මය යලි හඳුන්වා දීමයි. මිහිඳු හිමියන් විසින් බුද්ධාගමක් ගෙනාවාය යන මතය සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශණයකි. මේ අනුව මිහිඳු මා හිමියන් විසින් එදා කරන ලද උතුම් මෙහෙවර නිවැරදිව අගය කරන්නන් ආගමක් ගෙනාවාය, ආගමක් හඳුන්වා දුන්නාය යනුවෙන් කරුණු ලබන්නාවූ  වැරදි ප්‍රකාශ නොකිරීමට වග බලා ගත යුතුය.

නිවන් දකින්නට උපකාර වන පිරිසිදු මාර්ග චරියාව යලි හෙලයට හඳුන්වා දුන්නේ මිහිඳු මාහිමියන් විසිනි. වසර 280කට පෙර හෙළදිව වැසියාට නිවන් දකින්නට උපකාර වනසේ ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ දේශණාකර වදාල ධර්මය (මාර්ග චරියාව) අනුරාධපුර ප්‍රදේශයේ විසූ යක්ඛ හෙලයින් අතින් ගිලිහී අභාවයට ගොස් තිබූ යුගයක මෙම උතුම් මෙහෙවර කරන්නට උතුරු කුරු ද්වීපයට එනම් යක්ඛ හෙළ දේශයට පැමිණීම සිදු කළ බව කවුරුත් තේරුම් ගත යුතුයි.



**බුදු දහම මාර්ග චරියාවකි - ආගමක් නොවේ**

බුදුන් වහන්සේ දේශණා කර වදාළ උතුම් නිබ්බාන මාර්ග ප්‍රතිපදාව විග්‍රහ වන  බුද්ධ ධර්මය යනු පටිච්චසමුප්පාද ධර්මයයි. පටිච්චසමුප්පාද ධර්මය අවබෝධ කරගත යුතු වන්නේ චතුඅරිය සච්ච ධර්මයන් අවබෝධ කරගැනීම සඳහාය. තම පැවැත්ම (ජීවත්වීම) පිළිබඳව යථාභූත ඥාණ දර්ශණය දැක ගැනීමට ලැබෙන්නේ චතුඅරිය සච්චයන් යථාපරිදි අවබෝධ කරගැනීමෙන්ම පමණි. මෙය ඉගෙනුමක් හෝ දැනුමක් පමණක්ම නොවේ. දැනුම ඉක්මවා ලබාගන්නා දැක්මකි. (ජානතෝ පස්සතෝ)

නවීන විද්‍යාව මගින් හෝ උපනිෂද් දර්ශනය මගින් හෝ ජෛන ආගමේ එන ඇදහිලි තුලින් හෝ මෙම විමුක්ති ඥාණ දර්ශණය (දැක්ම) ලබාගත නොහැකිය. මේ අනුව බුද්ධ ධර්මය යනු කිසිසේත්ම අදහන ආගමක් නොවේ. දර්ශණයක්ද නොවේ. තමන්ම අනුගමනය කර තමන්ම අත්දැක ගත යුතු ඒකායන මාර්ග චරියාව පෙන්වාදුන් දහමකි. එය නිබ්බානගාමී මාර්ග ප්‍රතිපදාවයි. සසරට බැඳුණු බැමි සොයා බැමි දැක බැමි වලින් තමන්ම සහමුලින්ම මිදී නිදහස් වන්නට අනුගමනය කළයුතු හා උපකාර කරගත යුතු ප්‍රතිපදාවයි. ඒ ප්‍රතිපදාව පළමු කොටම නිවැරදිව අසා දැනගත යුතුය. අසා දැනගත් ප්‍රතිපදාව තමා විසින්ම පෞද්ගලිකවම අනුගමනය කර තමන්ම අත්දැක ගත යුතුය.

එදා පිරිසිදුව දේශණා කළ මාර්ග ප්‍රතිපදාව කල්යත්ම ආගමක් බවට පත්කර ගැනීමෙනුත් දර්ශණයක් බවට පත්කර ගැනීමෙනුත් සිදු වූ එකම ප්‍රතිඵලය උතුම්  නිබ්බානගාමී මාර්ග ප්‍රතිපදාව අභාවිතයට ගොස් නිවන වැසී යටපත් වී යාම පමණි.

අද අපි භක්තියෙන් අදහන, විශ්වාස කරන බුද්ධාගම යැයි සම්මතයෙන් නම් කරනු ලබන මේ ආගමෙහිදී කිසිසේත්ම නිවන් දැක ගැනීමේ මාර්ගයක් පෙන්වා දෙන්නේ නැත. ලෞකික වශයෙන් හොඳ යහපත් පැවැත්මක් දිගින් දිගටම පවත්වා ගෙන යාමට, අපායෙන් බේරෙන්නට, දෙව් මිනිස් සැප ලබන්නට නම් බුද්ධාගමද යම් තරමකට උපකාර වෙතත් ලෝකයෙන් එතෙර වී සදහටම සංසාර දුකින් මිදී නිදහස්

වන ලෝකෝත්තර නිබ්බානගාමී මාර්ගයක් නම් බුද්ධාගමේ හෝ වෙනත් මොනම ආගමක හෝ පෙන්වා දෙන්නේම නැත. උතුම් බුද්ධ භාෂිතයෙන් ණයට ඉල්ලා ලබාගත් පදවැල් බහුල වශයෙන්ම භාවිතා කරමින් ඒ පදවැල් වලටම ලෞකික වශයෙන් අර්ථ දක්වා, සකස් කර ගත් ආගම බුද්ධාගමයි. මහායාන බුද්ධාගම වේවා, ලාමා බුද්ධාගම වේවා, ථෙරවාදී බුද්ධාගම වේවා, මොනයම් හෝ අදහන බුද්ධාගමක හෝ වේවා එදා ගෞතම බුදුපියාණන් දේශණා කළ පෙන්වා වදාළ මාර්ගය, ප්‍රතිපදාව (මඣ්ජිමා පටිපදාව) අද ප්‍රායෝගිකව භාවිතා කරන්නේම නැත. ඒ ගැන දන්නේද නැත. මිනිසෙකු වී උපත ලත් කෙනෙකුට උතුම් නිවන් මාර්ගය දැක ගන්නට අද වන විට බලවත්ම බාධකයක් බවට පත් වී ඇත්තේද සම්මතයෙන් අදහන බුද්ධාගමමයි. ධර්ම මාර්ගය හා අධර්ම මාර්ගය යැයි ආන්තික බලවේගයන් දෙකම ලෝකය තුල සදහටම ක්‍රියාත්මක වෙමින් පවතී. විඤ්ඤාණ ශක්තියෙන්ම ක්‍රියාත්මක වන, විඤ්ඤාණ ශක්තියෙන්ම නිර්මාණය වූ, සත්ව පුද්ගල හා ද්‍රව්‍ය වස්තූන්, ලෝකය තුල ක්‍රියාත්මක වන්නේද මේ බලවේග දෙකම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ධර්ම මාර්ගය අනුගමනය කරන්නේත් අධර්ම මාර්ගය අනුගමනය කරන්නේත් මිනිසුන් ප්‍රධාන කොටගත් සත්ව පුද්ගයින් විසින්මය.

ධර්ම මාර්ගය අනුගමනය කරන සෑම මිනිසෙකු විසින් ම කරන කියන හිතන සෑම ධර්මානුකූල ක්‍රියාකාරකමක්ම ස්වභාවධර්මය පිරිසිදු කරන්නටත්, විශ්ව ශක්තිය යහපත් බලවේගයක් බවට පත්කරවන්නටත් බලවත්සේ උපකාරී වෙයි. ඒවාගේම අයහපත් ක්‍රියාකාරකම් කරන අධර්මයෙහි හැසිරෙන සෑම මිනිසෙකු විසින්ම, සත්වයෙකු විසින්ම කරන අයහපත් ක්‍රියා නිසා ස්වභාවධර්මය අස්වභාවික තත්වයට පත්කරන අයහපත් ඵල විපාක උරුම කරදෙන, විශ්ව ශක්තිය කිළිටි කරන බලවේගයක් ලෙසින්ද ක්‍රියාත්මක වෙයි. මේ ආකාරයට තම තමන් කරන, කියන, හිතන, හොඳ හෝ නරක යන දෙකම තම තමන්ටම ආපසු අයහපත් ඵල විපාක අපල උපද්‍රව හෝ යහපත් ඵල විපාක සැප සම්පත් හෝ ලෙසින් ආපසු උරුම වෙයි. යමෙක් විශ්ව ශක්තිය පිරිසිදු කරන ධම්මානුධම්ම ප්‍රතිපදාවෙහි හැසිරෙන්නේ නම් එවන් පුද්ගලයෙකු සංසාර බැම්වලින්ද මිදී



නිදහස් වෙයි. බාහිර ලෝකය සමඟ ඇති සියළු සම්බන්ධතා සහ ණය ගනුදෙනු වලින්ද මිදී නිදහස් වෙයි. එයම නිවනයි.

මේ ආකාරයට ප්‍රතිවිරුද්ධ ධර්මතාවයන් දෙකක්ම ක්‍රියාත්මක වීම හේතුකොට ගෙනම ලෝකයක්ද නිර්මාණය වී පවතී. ඒක පාක්ෂිකව හොඳ හෝ නරක හෝ යන බලවේග දෙකෙන් එක බලවේගයක් පමණක් ලොව පවතින්නට ක්‍රමයක්ද නැත. මේ නියත ධර්මතාවය යථාපරිදි තේරුම්ගත් ධර්මය දැකගත් ලොවිතුරා බුද්ධත්වයට පත්වන හැම බුදුවරයන් වහන්සේ කෙනෙකුන් විසින්ම හේතුඵල ධර්මය ලෝකයාට දේශණා කර වදාරති. මෙයම මාගධී බස් වහරින් පටිච්චසමුප්පාද ධර්මය ලෙසින්ද විග්‍රහකර පෙන්වීය.

අවිද්‍යාමූල පටිච්චසමුප්පාද න්‍යායය මගින් විග්‍රහකර විස්තර කර පෙන්වා දෙන්නේ දිගටම, දිගින් දිගටම ලෝකය පවත්වාගෙන යන්නට උපකාර වන, සමුදය උත්පාදනයවන ආකාරයයි. කුසල මූල පටිච්චසමුප්පාද ධර්ම න්‍යායය මගින් විග්‍රහ කර පෙන්වා දෙනු ලබන්නේ ලෝක පැවැත්මක් අවසන් කරන මඟයි. අපවැත්මට මඟයි. පැවැත්ම තුල පමණක්ම ලෝකයක් ඇත. දුකක් ද ඇත. නිවනේ පැවැත්මක් නැති නිසා ලෝකයක්ද නැත. පැවැත්මක් හෝ ලෝකයක් නැති නිසා නිවනේ දුකක්ද නැත. එසේ නම් සත්ව පුද්ගලයින් විසින් විඳවනු ලබන අනේකාකාරවූ දුකෙන් මිදෙන්නට එකම ක්‍රමය ලෝකෝත්තර නිවනයි.

බුද්ධාගමද ඇතුළු හැම ආගමකම මතුකර පෙන්වා දෙන්නේ ලෞකික වූ තාවකාලික සුවයකි. අපායෙන් බේරෙන්නට මෙන්ම දෙව්ලොව හා බ්‍රහ්ම ලෝකවල සැප සම්පත් විඳින්නට හෝ බෝසත් පෙරුම් පුරමින් පාරමිතා පුරමින් කල්ප කාලාන්තරයක් බෝධිසත්ව සැප විඳින්නටත් මඟ කියා දෙන්නේ බුද්ධාගම ඇතුළු ආගම් වලිනි. නමුත් බුද්ධ ධර්මයෙහි පෙන්වා දෙන ඒකායන මාර්ගය මිනිසෙකු වී උපතලත් මේ අවස්ථාවේදීම පහසුවෙන්ම කරගත හැකි සම්පූර්ණ කරගත යුතු ප්‍රතිපදාවකි. මේ අනුව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්නේ මාර්ග චරියාවයි. බුද්ධ ධර්මයට පසුකාලීනව ලියූ අර්ථකථනයන් නිසා එය දර්ශණයක් ලෙසින්ද ආගමක් ලෙසින්ද ව්‍යාප්ත වීම නිසා මේ උතුම් මාර්ග චර්යාව වැසී යටපත් වී ගියහ.

උපනිෂද් දර්ශණයත්, ජෛන ආගමත් යන දෙක සමඟ බුද්ධ ධර්මයද ඒකාබද්ධ කරන්නට භාරත දේශයේදී බලවත් උත්සාහයක් දැරූ අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් මහායාන බුද්ධාගම නමින් ආගමක්ද බිහිවිය. බුද්ධ ධර්මය යනු දර්ශණයක් නොවේ. භාරත දේශයේදී අසංගාචාර්ය තුමන් විසින් සංස්කෘත බසින් ලියූ “අභිධර්ම සමුච්චය” නැමති පොතෙන් උත්සාහ ගෙන ඇත්තේ උපනිශද් දර්ශණය හා සමඟ බුද්ධ ධර්මය ඒකාබද්ධ කරන්නටයි. පසු කළෙකදී හෙලබිමේදී ලියූ “අභිධර්ම අට්ඨ කථා” හා “අභිධර්මාර්ථ සංග්‍රහය” යන පොත් දෙකටම අසංගාචාර්ය තුමාගේ පොත්වලින් හා වෙනත් වෛතුල්‍යවාදී සංස්කෘතික පොත් වලින්ද යම් ආකාරයක බලපෑමක් ඇති වීම නිසා පසුව බුදු දහම “දර්ශණයක්” ලෙසින් හදාරන්නට පටන් ගත්හ. නමුත් බුදු දහම යනු දර්ශණයක් නොවේ. බුදු දහම යනු ප්‍රායෝගිකවම අනුගමනය කරමින් ක්‍රියාවට නඟමින් අත්දැක ගත යුතු ප්‍රතිපත්ති සමූහයකි. මාර්ග ප්‍රතිපදාවකි. අද පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේත් අනෙකුත් විශ්ව විද්‍යාලවලත් උගන්වන බෞද්ධ දර්ශණය, බෞද්ධ සංස්කෘතිය ආදි විෂයයන් පිරිසිදු බුදු දහමම නොවේ. බුදුන් වහන්සේ එදා දේශණාකරන ලද මාගධී පදවැල්ම ප්‍රයෝජනයට ගනිමින් පසුකාලීනව පෘථග්ජන පණ්ඩිතයින් විසින් ඒ පදවැල් වලට ලියූ ලෞකික අර්ථ කථා සමූහයකි. මේ අර්ථ කථා ඉන්දියාවේදී සංස්කෘත භාෂාවෙනුත්, හෙළ බිමේදී පාලි හා හෙළ භාෂා වලිනුත් ලියූබව පෙනේ. බුද්ධ භාෂිතයේ ඉදිරිපත් කල නිවන් දකින්නටම උපකාර වන මාර්ග චර්යාව සහමුලින්ම යහපත්ව එය දර්ශණයක් ලෙසින් දැන ඉගෙනගෙන උපාධි ලබාගෙන ලෞකිකත්වය තුල තව තවත් අතරමං වන්නටම මේ අර්ථ කථා මුල්විය.

පිළිවෙතින් පෙළ ගැසීමට උපකාර වන ලෙසින් දේශණා කර වදාළ මජ්ඣිමා පටිපදා නමින් පෙන්වූ මාර්ග ප්‍රතිපදාව (බුද්ධ ධර්මය) මෙසේ වෙනස් කරගන්නට යෙදුනේ එක් අතකින් එය ආගමක් ලෙස භක්තියෙන් හා විශ්වාසයෙන් අදහන්නට පුරුදු වීම නිසාත්, අනිත් අතින් අභිධර්මය නමින් විෂයයක් ලෙසින් බෞද්ධ දර්ශණය ලෙසින් විද්‍යාස්ථානවල උගන්වන්නටත් පටන් ගැනීමත් සමඟය. දැනුම වඩා වර්ධනය කරගන්නට අභිධර්මය හා බෞද්ධ දර්ශණය උපකාර වෙතත් නිවන් දැකගන්නට නම් එයම බලවත්ම බාධකයක් බවටත් පත්වී ඇත. එයට හේතුව ලෞකික වූ උපනිෂද් දර්ශණය



බෞද්ධ දර්ශණය ලෙසින් “අභිධර්ම සමුච්චය” නැමැති පොතෙන් එලි දැක් වූ හෙයිනි. සංස්කෘත භාෂාවේ වචනයක් වූ “දර්ශණය“ සහ මාගධී භාෂාවේ එන “දස්සනේන පහාතබ්බා” “දස්සනීයානං” ආදී පදවල අර්ථය එකක්ම නොවේ. සංස්කෘත භාෂාවේ එන “දර්ශණය” යනු දැනුමකි. නමුත් බුද්ධ භාෂිතයේදී භාවිතා කළ දස්සනේන“දස්සනීයානං” ආදී වශයෙන් පෙන්වූයේ දැක්මකි. මේ නිසා බුද්ධ දේශණාව හා උපනිෂද් දර්ශණය වරදවා එකක්ම යැයි පටලවා ගැනීමේ හේතුව නිසාම අදවන විට “විදර්ශනා භාවනාව” විදර්ශනා භාවනා මධ්‍යස්ථාන” ආදී වශයෙන් බුද්ධ ධර්මයට නොගැලපෙන බොහෝ අරුත් සුන් වූ පදවැල් සිංහල බෞද්ධයින් විසින්ම භාවිතා කරමින් සිටී.

විපස්සනා, අනුපස්සනා යනුවෙන් බුද්ධ දේශනාවේ පෙන්වා වදාළ භාවනා ක්‍රමයන් පසු කලෙකදී “විදර්ශනා භාවනා” යන වචනයට මාරු කර ගත්තේද මේ උපනිෂද් දර්ශනයේ බලපෑමක් නිසාමය.

වර්තමානයේදී ගිහි පැවිදි, උගත් වියත්, බෞද්ධ අබෞද්ධ කාගේත් අති මහත් සැළකිල්ලකට හසුවන්නේ බෞද්ධ දර්ශණය නමින් හැඳින්වෙන අභිධර්මයත් බුද්ධාගම නමින් හැඳින්වෙන පුද පූජා , වැඳුම් , පිදුම්, යැදුම් පැතුම් යන පිළිවෙත් සහිත වූ ඇදහිල්ලන්ය. විමුක්ති මාර්ගය පෙන්වා වදාළ බුදු දහම මෙසේ යටපත් වී ඒ වෙනුවට අධ්‍යයනය කරණ බෞද්ධ දර්ශණයකුත් භක්තියෙන් අදහන බුද්ධ ආගමකුත් නිර්මාණය විය.

පොල්වත්තේ බුද්ධදත්ත මා හිමියන් විසින්ද, ඊ.ඩබ්. අධිකාරම් මහතා විසින්ද, තවත් ආකාරයකින් මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් විසින් හා වල්පොල රාහුල හිමියන් විසින් ද මේ වැරදි මතුකර පෙන්වා දී බෞද්ධයාගේ දහම් මඟ විවෘත කර දෙන්නට මෑත අතීත යුගයකදී බලවත් උත්සාහයක් ගත්තද අප අදහන ආගමේ බොහෝ වැරදි හා අඩුපාඩු පෙන්වා දුන්නද ඒ ප්‍රයත්නයන් සම්මත ආගමික බලවේගයන් විසින්ම කඩා බිඳ දමා අකාමකා දමන ලදී. අද වන විට ඒ අයුරින් පෙන්වා දුන් සියළු අඩුපාඩු, විවේචන පොතට පමණක්ම සීමා වී ඇත. එදා ඊ. ඩබ්. අධිකාරම් මහතා, මාර්ටින් වික්‍රමසිංහ මහතා, පොල්වත්තේ බුද්ධ දත්ත මාහිමියන් වහන්සේ, වල්පොල රාහුල හිමියන් ආදීන් විසින් පෙන්වා දුන් දේ මගින් බුදු

දහම මාර්ග ප්‍රතිපදාවක් ලෙසින් විවෘත කර දෙන්නට උත්සාහ ගත්තද ඒ සියළු ප්‍රයත්නයන් අසාර්ථක වන්නට ද බලවත්ම හේතුවක්ද තිබුනි.

වර්තමානයේදී විශ්ව විද්‍යාලවල හා අනෙකුත් විද්‍යාස්ථානවල උගන්වන  බෞද්ධ දර්ශණයත් හුදී ජනයා භක්තියෙන් අදහන බුද්ධාගමත් යන දෙකම නියම බෞද්ධයෙකු වන්නට උපකාර නොවන බව පුන පුනා කියමින් කොතැනක හෝ වරදක් සිදු වී ඇති බව ඔවුන් විසින් පෙන්වා දුන්නත් ඒ වරද නිවැරදි කර නියම නිවැරදි මාර්ගය පෙන්වා දෙන්නට තරම් නිවැරදි මාර්ග චරියාව විවෘත කර දෙන්නට තරම් එදා ඔවුන් සමත් නොවීම මෙයට හේතුවයි.

වරද වරද හැටියට පෙන්වා දීමත්, වැරදි දේ දිගින් දිගටම ක්‍රියාත්මක වීමෙන් දහම් මාර්ගය වැසෙන බව පෙන්වා දීමත්, නිවැරදි මාර්ගය පෙන්වා දී නිවැරදි මාර්ග ප්‍රතිපදාව නිරාවරණය කරදීමත්, ප්‍රායෝගිකවම ඒ නිවැරදි මාර්ගයේ ගමන් කරන්නට කියා දීමත් යන පියවරයන් හතරම සම්පූර්ණ නොවූ අවස්ථාවකදී නියම බුදු දහම (මාර්ගය) විවෘත වන්නේද නැත. මෙයද චතුඅරිය සච්චයන් අවබෝධ කර ගැනීමමය.

| | | |
|---|---|---|
| 1. | වරද | - දුක්ඛ අරිය සච්චං |
| 2. | වරද දිගින් දිගටම කරමින් පවත්වාගෙන යාම | - දුක්ඛ සමුදය අරිය සච්චං |
| 3. | වරද නිවැරදි කර මාර්ගය නිරාවරණය කරදීම | - දුක්ඛ නිරෝධ අරිය සච්චං |
| 4. | නිවැරදි  මාර්ගය හෙලි පෙහෙලි කරදී නිවැරදි මඟ අනුගමනය කරන්නට අවශ්‍ය ප්‍රතිපදාව ආදර්ශයෙන්ම පෙන්වීම | - දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා (මාර්ග) අරිය සච්චං |

අද විද්‍යා ආයතනවල බෞද්ධ දර්ශණය ඉගෙන ගන්නේ (අධ්‍යයනය කරන්නේ) උගත්කම හා බුද්ධිමත්කම ලබා ගන්නටය. එසේත්



නැතිනම් ලෞකිකත්වය තුල මහන්තත්වයක් ලබාගෙන රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය මහාචාර්ය ආදී ලෞකික තාන්න මාන්න උපාධි තනතුරු ලබා ගන්නටය. එසේ නැතිව චතුරාර්ය සත්‍යයන් අවබෝධ කර ගන්නට නම් නොවේ. ඒවාගේම අද භක්තියෙන් බුද්ධාගම අදහන බොදුනුවන් යැයි කියාගන්නා අය ආගම අදහන්නේ අපායේ යාමෙන් වැළකෙන්නට (විරමනය) හෝ දෙව් මිනිස් රජ සිටු සැප මතු මතුත් ලබා ගන්නටය. අද බුද්ධාගම ලෙසින් උගන්වන දෙයෙහි හරය පරමාර්ථය විග්‍රහ කළ යුතු වන්නේ මේ ආකාරයෙනි.

එදා බුදුපියාණන් පෙන්වා වදාළ විමුක්ති මාර්ගය නම් වූ පිරිසිදු පරමාර්ථ ධර්මය වෙනස් වී වචනයට පමණක්ම සීමා වී බුද්ධාගමක් ලෙසින් අදවන විට බෞද්ධයින් විසින් භක්තියෙන් අදහනු ලබති. ඒ බව පහසුවෙන් යමෙකුට තේරුම් ගන්නට බැරි වන ආකාරයෙන්ම බුදු දහමද විකෘති කර අර්ථ ගන්වා ඇති බවත් පෙන්වා දිය යුතුමය. බුදුපියාණන් පිරිනිවන් පා වදාළ ඒ යුගයේ පටන්ම හෙලබිමේදී හා ඉන්දියාවේදී ලියූ බොහෝ අර්ථ කථා (අටුවා ටීකා ටිප්පනි) නිසා සිදුවූයේ විමුක්ති මාර්ගය වැසී යටපත්ව ගොස් ලෞකික අර්ථ සාධනය සඳහා පමණක් ලෞකික අර්ථ සාධනය ඉටු කර ගන්නට අවශ්‍යවන පරිදි ආගමක් හා දර්ශණයක් නිර්මානය වීමයි.

බොහෝ ගිහි පැවිදි උගතුන් හා විද්වතුන් අද මුල් තැන ලබා දෙන්නේ බෞද්ධ දර්ශණය නම් වූ මේ අභිධර්ම විෂයයටය. මේ නිසාම මාර්ග ප්‍රතිපදාව වැසී යටපත්විය. නිබ්බානගාමී දේශණාවක්වන බුදු දහම දර්ශණයක් බවටත් පත් විය.

මෙහි නියත ප්‍රතිඵලය වූයේ චතු අරිය සච්චයන් අවබෝධ කර ගන්නට මුල් යුගයේදී බොහෝ පිරිසකට උපකාරී වූ මාර්ග චරියාව භාවිතයෙන් ඉවත්වීමයි. උගත් වියත් ගිහිපැවිදි බෞද්ධ දෙපිරිසම බෞද්ධ දර්ශණය කරපින්නාගත් අතර අනිත් අතින් පෘතග්ජන ගැමි බෞද්ධයින් පුද පූජා, දේව ඇදහිලි වැනි භක්ති මාර්ගයක් වෙතට යොමු විය. මේ අනුසාරයෙන් “බුද්ධ” ,“බෞද්ධ ” වැනි මාගධී පදවල නිවැරදි පිරිසිදු ධර්ම අර්ථය පවා තේරුම් ගන්නට  බැරි වූ ගිහි පැවිදි බුද්ධාගම්කාර පිරිසක් අද වන විට අප රටේහි දී ද දැක ගන්නට ලැබෙයි.

ආරණ්‍යවාසී, වනවාසී හෝ න්‍යායවාදී ගිහි පැවිදි බෞද්ධ උගතුන් මෙන්ම විනයවාදීන්ද මාර්ග චර්යාවෙහි හැසිරීම වෙනුවට අභිධර්මය අධ්‍යයනය කරන්නට හෝ ධුතාංග පමණක් රකිමින් අන්තවාදී ලෙසින් ක්‍රියාකරමින්ම මග වරදවාගෙන  නිවන් දකින්නට උත්සාහ ගනිමින් සිටිති. අද වත්මන් යුගය වනවිට බෞද්ධ දර්ශණය හා අභිධර්මය ඉගෙන ගන්නේත් උගන්වන්නේත් නිවන් දකින්නට බුදු දහම උපකාර කර ගන්නා අදහසකින් නොව උගතෙකු වී උපාධි ලබාගෙන රැකියාවක් ලබාගෙන මහාචාර්යවරයෙකු පණ්ඩිතයෙකු හෝ විහාරාධිපති කෙනෙකු උගතෙකු වීමේ පටු ලෞකික පරමාර්ථයෙනි. කෙසේ වෙතත් මොනවා ඉගැන්වූවත් මොනවා ඉගෙන ගත්තත් අද බෞද්ධ දර්ශණය නමින් උගන්වන විෂය මාලාව තුල හෝ අභිධර්මය නමින් උගන්වන පදවැල් තුල හෝ විමුක්තිය සඳහා උපකාරවන ප්‍රායෝගික මාර්ග චර්යාවක් නම් ඇත්තේම නැත. **නිවන් දැකීම යනු තමා විසින්ම තමා තමා තුලින්ම තමාම දැක ගත යුතු මාර්ග චර්යාව මිස පොත පතකින් හෝ පදවැල් සමූහයක් ඉගෙන ගැනීමෙන් හෝ දැක ගත හැකි එකක් නම් නොවේ.** "සංසාරයි" කියා තමන්ම තීරණය කරගෙන ජීවිත පැවැත්ම දිගටම පවත්වා ගෙන යන්නට ක්‍රියාකරන තුරු යලි යලිත් (පුනබ්බවෝ) සම්බන්ධතාවයක් ඇති කර ගැනීමෙන් සසරට බැඳෙන බැමි නිර්මාණය කර ගනිමින් සංසාර ගමනේම යෙදෙති.

මේ අනුව සංසාර රෝගය පිලිබඳව විග්‍රහ කරන ලද බුද්ධ දේශණාවක් වූ සංදේශණාව වැරදියට අර්ථ ගැන්වීය. සංස්කෘත භාෂාව උගත් බෞද්ධ ගිහිපැවිදි දෙපිරිසම සුන්දර, සුංගාරත්වය කෙරෙහි මිස අධ්‍යාත්මික විමුක්තිය කෙරෙහි නැඹුරු නොවීය. එවන් උගතුන්ට මාර්ග චර්යාව පිළිබඳව අමතක විය.

ඉතාමත් සරලවුත්, සිංහල හෙළ බෞද්ධයාට තේරුම් ගන්නට පහසු වන ආකාරයට සුගමවුත් ගාම්භීර අර්ථ සහිත වූත් සංදේශණාව, එනම් බුද්ධ ඥාණ පද හතරෙන් කරණ ලද "සං විග්‍රහය" , උගත් පෘථග්ජන බෞද්ධ පිරිස විසින් යටපත් කර දමන ලදී. "සංදෙස්සේති , සංමාදපේති, සමුච්පේදේති, සංපහංසේති " යන පද හතරෙන් චූලහත්ථිපදෝපම සූත්‍රය ඇතුළු ත්‍රිපිටකයේ එන සූත්‍ර සිය ගණනකදී විග්‍රහ කරන ලද "සංදේශණාව"



බෞද්ධයාට තේරුම් ගන්නට බැරිවන ආකාරයටම ලෞකික වශයෙන් අර්ථ ගන්වා බුදුදහම (මාර්ග චරියාව) අභාවයට පත් කරන ලදී.

මෙම බුද්ධ ඥාණ පද හතරම තවත් සූත්‍ර ධර්ම බොහොමයකදී "සංතිටඨති, සංනිසීදියති, ඒකෝධි භාවං, සම්මාධියති" යන සංපද හතරෙන්ද බුද්ධ දේශණාවේදී විග්‍රහ කර ඇති බවත් පෙන්වා දිය යුතුමය.

මේ මොන ආකාරයෙන් හෝ විග්‍රහ කර පෙන්වා දී ඇත්තේ "සං" සාර යැයි (පංචස්කන්දය උපාදානය කර ගන්නා) හැමවිටකම සම්බන්ධතාවයක් බැම්මක් සකස් වී සසරට බැඳෙන ආකාරය පෙන්වා දීමත්, එවැනි සම්බන්ධතා වලින් මිදී නිදහස් වීමට අනුගමනය කළ යුතු මාර්ග චරියාව පෙන්වාදීම පිළිබඳවත්ය. මාර්ග චරියාව අනුගමනය කළ යුත්තේ සමුදය නිරෝධ කිරීමටය. සමුදය යනු සංධි වීමයි. සං උත්පාදනය වීමයි. සම්බන්ධතාවයක් උපත ලැබීමයි. මේ සන්ධි විසන්ධි කල හැක්කේත් සංඛාර- විසංඛාර කළ හැක්කේත්  සමුදය නිරෝධ කිරීමෙන්ම පමණි. සමුදය නිරෝධ කිරීමට උගත්කම බුද්ධිමත්කම බලවත් බාධකයකි.

සම්බන්ධතාවය ඇතිවන්නේ, සමුදය උපතක් ලබන්නේ ප්‍රියදේට ඇලීමෙන් , අප්‍රියදේට ගැටීමෙන් හා ප්‍රිය අප්‍රිය අතර  මැන මෝහයෙන් මුලා වීමෙනි. මෙයම රාගය, ද්වේශය, හා මෝහය යන පද තුනෙන්ම විග්‍රහ කර පෙන්වීය. මේ අනුව මාගධී  භාෂාවේ, බුද්ධ දේශණාවේ  "සං" යන පදයෙන් විග්‍රහ කලේ රාග, ද්වේශ, මෝහ යන ගති තුනේම  එකතුවක් පිළිබඳවයි. මේ ගති තුනම සිතකම පහලවන එකටම ක්‍රියාත්මක වන සිතක් කිලිටිවන ගති තුනකි. මතු පැවැත්ම නිර්මාණය වන්නේ රාග බව, ද්වේශ බව හා මෝහ බව සිතක් තුල උපදින හේතුව නිසාමය. සමුදය යනු මතු සසර බැම්මක් සම්බන්ධතාවයක් උත්පාදනය වීම යනුයි. මෙයම "සං භවං" "සංභූතං" යන  මාගධී පද වලින්ද බුද්ධ දේශණාවේම විග්‍රහ කර ඇත.

"ධම්මෝ සංදිට්ඨිකෝ" තත්වයට පත්විය හැක්කේ මේ ආකාරයට තමාගේම සිතේ උපදින "සං" දැක ගැනීමෙන්ම පමණි. "සමුදය" නිරෝධ කළ හැක්කේ "ධම්මෝ සංදිට්ඨිකෝ" යන්න යථාපරිදි තේරුම් ගත් කෙනෙකුටම පමණි. "යං කිංචි සමුදය ධම්මං සබ්බත්තං නිරෝධ ධම්මං"

යන බුද්ධ වචනය (ධම්මචක්ක පවත්තන සූත්‍රය) තේරුම් ගත හැකි වන්නේද "ධම්මෝ සංදිට්ඨිකෝ" යන්න තේරුම් ගෙන, සමුදය නිරෝධ කළ හැකිය, සමුදය නිරෝධ කළ යුතුය, යන්නද යථාපරිදි තේරුම් ගත් කෙනෙකුටම පමණි. සමුදය යනු රාගයෙන්, ද්වේශයෙන් හා මෝහයෙන් සංසාර සම්බන්ධතාවයක් අලුතින් නිර්මාණය කරගෙන සසර පැවැත්ම දිගින් දිගටම පවත්වාගෙන යාමයි.

චතු අරිය සච්චයන් අවබෝධ කර ගැනීමට සංදේශනාවේ එන බුද්ධ ඥාණ පද හතරම නියත වශයෙන්ම උපකාර කර ගත යුතුය. සංදේශනාව යනු බුද්ධ දේශණාවයි. සංවර, සංසිඳීම සම්මා (සං+මා)යනු ත්‍රිශික්ඛාවන්ය. මෙයම සීල, සමාධි, පඤ්ඤා ලෙසින්ද විග්‍රහ කරනු ලබයි. මේ අනුව සංවර විය හැක්කේ සතර සංවර සීලයේ පිහිටා තමාම ක්‍රියා කිරීමෙනි. සංසිඳවිය හැක්කේ සමථ විපස්සනා භාවනා වැඩීමෙනි, සම්මා තත්වයට පත්විය හැක්කේ සිතේ මුල් බැස ගෙන පවතින රාග මුල්, ද්වේශ මුල්, මෝහ මුල් සිතෙන් උදුරා දමා යලි සමුදය බිහි නොවන ආකාරයටම තම සිත පිරිසිදු කර ගැනීමෙනි. සංසාර සම්බන්ධතාවන්ගෙන් සහමුලින්ම මිදී නිදහස් වීම සම්මා (සං + මා) යන්නෙහි ධර්ම අර්ථයයි.

වෛදික උපනිෂද් දර්ශණය ආත්මවාදයක් ලෙසින් පෙන්වූ බුදුපියාණන් වහන්සේ එදා ආත්මවාදය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළහ. ආත්මවාදය බැහැර කළ බුදුන්වහන්සේ අනෙක් අන්තය වූ අනාත්ම වාදයක් නම් වූ "දෘෂ්ඨියක" පිහිටා ධර්මය දේශනා කළේද නැත. මේ අනුව අද බුද්ධාගමේ අධිකාරී බලය දරන්නන් හා බොහෝ උගතුන් පුන පුනා ප්‍රකාශ කලත් බුද්ධ ධර්මය කිසිසේත්ම අනාත්ම වාදයක්ද නොවේ. ආත්ම වාදයක්ද නොවේ. ආත්ම වාදය මෙන්ම අනාත්ම වාදය යන අන්තවාදී දෘෂ්ඨීන් දෙකම බැහැර කළ බුදුපියාණන් වහන්සේ හේතුඵල ධර්මය නම් වූ පටිච්චසමුප්පාද ධර්මය බුද්ධ ධර්මය ලෙසින් ලෝකයාට දේශණා කළහ. මේ අනුව බුදු දහම අනාත්ම වාදයක් නොවන බවත් අනාත්ම වාදය නමින් දෘෂ්ඨි වාදයක් උන්වහන්සේ හෝ කිසිම ආර්යයන් වහන්සේ කෙනෙක් හෝ දේශණා නොකල බවත් මෙහිදී අවධාරණයෙන්ම පෙන්වා දිය යුතුයි. නමුත් අද සම්මත බුද්ධාගමෙහි අනාත්ම සංකල්පයක් පිළිගැනීම දෘෂ්ඨිගත වීමකි.



අනාත්මවාදය කරපින්නා ගත් මහායාන බුද්ධාගම්කාර උගතුන් එදා බමුණුවාදය සුන්බුන් කරන්නට උපකාර කරගත් අවියක් ලෙසින් මෙසේ අනාත්මවාදය උපයෝගි කර ගත්තේ මධ්‍යකාලීන ඉන්දියාවේදී මිස හෙළදිවදී නම් නොවේ. මේ අනුවත් පෙන්වා දිය යුත්තේ බුදු දහම දෘෂ්ඨියක් හෝ දර්ශණයක් හෝ ආගමක් හෝ වාදයක් හෝ නොව මාර්ග ප්‍රතිපදාවක් බවයි.

නාගාර්ජුනපාදයන් වහන්සේ මෙන්ම අසංගාචාර්යයන් වහන්සේද විසින් එදා ඉන්දියාවේදී බුදු දහමේ එන පදවැල්ම පදනම් කරගෙන අනාත්ම වාදයක් සහ බෞද්ධ දර්ශන වාදයක් (අභිධර්මයක් ලෙසින්) නිර්මාණය කර ගත් බව පැහැදිලිවම පෙන්වා දිය යුතුයි. තර්කයට ගලපා තර්කයට ගැලපෙන අයුරින් බමුණාන් පරාජය කරන්නටත් මෙසේ බුද්ධාගම උපකාර කරගත් නමුත් විමුක්ති මාර්ගය වැසී යටපත් වී අභාවයට යන්නටද එයම හේතුපාදක විය. ඉන්දියාවේදී සංස්කෘත උගතුන් විසින් මේ ආකාරයට ලෞකික පරමාර්ථයන් පෙරදැරි කොටගෙන ලෝකෝත්තර නිවන් මාර්ගය යටපත් කර දමමින් අධ්‍යයනයට සුදුසු විෂයයක් ලෙසින්, බෞද්ධ දර්ශනයක් ලෙසින් බුද්ධාගමක් නිර්මාණය කර ගත්හ. අද වන විට බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ මෙන්ම අනෙකුත් දේශීය හා විදේශීය සියළුම විද්‍යායතන වලත් උගන්වන්නේ පිරිසිදු පිවිතුරු මාර්ග චරියාව නොව, මහායාන බුද්ධාගමේ උගතුන් විසින් නිර්මාණය කර දුන් අනාත්ම වාදී දර්ශනය හා උපනිෂද් දර්ශණය පාදක කොටගත් බෞද්ධ දර්ශණ වාදයකි.

මෙය බුදු දහම යැයි පැවසීම හෝ මාර්ග චරියාව යැයි කියාපෑම හෝ උතුම් බුදු දහමට කරනා බලවත්ම නිග්‍රහයකි. මේ අනුව පිරිසිදු බුදු දහම යනු දැනුම ඉක්මවා ගිය දැක්මකි. මේ දැක්ම තමා විසින්ම තමා තුලින්ම පසක් කොට දැකගත යුතුය. අත්දැක ගත යුතුය. "ජානතෝ , පස්සතෝ , අරහතෝ, සංමා සම්බුද්ධස්ස" යනුවෙන් මෙය ධර්ම විග්‍රහයේදී පෙන්වා දී ඇත.

බුද්ධ භාෂිතයේ දේශණාකර වදාල සමහර පදවැල් පමණක් නොව තමන්ම ගලපා ගත් තර්ක විතර්කයන්ද මුල්කොට ගනිමින් අනාත්මවාදය

ඔප්පුකරගන්නට උත්සාහ කළ නාගාර්ජුන පාදයන් වහන්සේ සත්ව පුද්ගලයින් , ද්‍රව්‍ය වස්තූන් පමණක් නොව පරමාණුව කියා දෙයක්ද නැතැයි ඔප්පු කරන්නටද වෙර දැරීය. බුදුපියාණන් දේශණාකර වදාළ මේ උතුම් ධර්මය අනාත්ම වාදයක් නොවන බව දැක ගත හැකි වන්නේ "අනිච්ච දුක්ඛ අනත්ත" තේරුම් ගැනීමෙන්මය.

ඇත, නැත, යනු අන්ත දෙකකි. බුදු දහමෙන් පෙන්වා දුන්නේ ඇත, නැත යන්න මායාවක් බවයි. "නිච්චසේ, සුඛසේ, අත්තසේ" උපාදානය කරගෙන පවත්වා ගන්නට, නවත්වා ගන්නට බැරි ධර්මතාවය බුදු දහමෙන් පෙන්වා දුන්හ. ඒ අනුව මේ පැවැත්ම තුල විඤ්ඤාණයෙන් සාදා සකස් කරගත් සියලුම සංඛාර - සංඛත - නිච්චසේ, සුඛසේ, අත්තසේ පවත්වා ගත නොහැකිය. නවත්වා ගත නොහැකිය. ඒ නිසාම "සබ්බේ සංඛාරා අනිච්චාතී , සබ්බේ සංඛාරා දුක්ඛාතී, සබ්බේ ධම්මා අනත්තාතී" යනුවෙන් දහමෙහි පවසා ඇත. මෙහි අර්ථය ඇත, නැත යන්න නොවේ. එමෙන්ම මෙහි අර්ථය නිත්‍යයි, අනිත්‍යයි, සැපයි, දුකයි, ආත්මයි, අනාත්මයි යන්නද නොවේ.

සිතකම උපත ලබන "ඉච්ච" = කැමැත්ත මුල් කොටගෙනම උපත ලබන්නාවූ නිච්ච, සුඛ , අත්ත යන ක්‍රියාකාරීත්වය නිසාම අවිද්‍යා මූලයෙන් සිතකම පටිච්ච සමුප්පාද ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙයි. කැමැත්තට බැඳීම සම්බන්ධවීම පටිච්ච වීමයි. පටිච්චවීම හේතුව කොටගෙන සම්බන්ධතාවයක් සිතේ උපත ලබයි. ඒ සං උත්පාද ධර්මයයි. සමුදය = සං උත්පාදනය = සං භවං = සං භූතං ආදී මාගධී භාෂාවේ මේ පද සියල්ලෙන්ම පෙන්නුම් කළේ සංසාර සම්බන්ධතාවයක් උපත ලබන නිර්මාණය වන ආකාරයයි. සමුදය ආදී පද හතරෙන්ම පෙන්වූයේ ඵලයකි. විපාකයකි. සමුදය වීමට හේතුව පටිච්චවීමයි. පටිච්ච නොවූයේ නම් සමුදය බිහි නොවේ. පටිච්ච වන්නේ, කැමැත්තෙන්ම බැඳෙන්නේ, ඇසෙන් දකින රූපයට, කනෙන් අසන ශබ්දයට, නාසයට දැනෙන ගඳ සුවඳට, දිවට දැනෙන රසයට, කයට දැනෙන පහසට හා මනසට දැනෙන ධම්මයටයි. පටිච්ච වීමට හේතුව ඉන්ද්‍රිය සංවරය නැතිකමයි. අසංවර කමයි. සීලය අවශ්‍ය වන්නේ සංවර වීම සඳහාය. තමාගේම ඇස, කණ,



නාසය, දිව, කය, මන යන ඉන්ද්‍රියයන් හය මිස වෙන කිසිවක් මෙහිදී සංවර කර ගත නොහැකිය.

තවත් බාහිර කෙනෙකුගේ ඇස කණ ආදී ඉන්ද්‍රියයන් ඔබට සංවර කරන්නට හෝ අසංවර කරන්නට හෝ නොහැකිය. ඔබේ ඉන්ද්‍රියයන් සංවර හෝ අසංවර කරන්නටද වෙන කාටවත්ම නොහැකිය. මේ ධර්මතාවය තේරුම් ගතයුතුය. මෙය සංවර, සංසිඳීම හා සංමා යන ත්‍රිවිධ සික්ඛාවන්ය.

බුදුන් වහන්සේ පෙන්වා වදාළ මාර්ග චරියාව සම්පූර්ණ කරගත හැක්කේ ඉන්ද්‍රිය සංවර සීලයෙනි. ප්‍රත්‍යය සංවර සීලයෙනි. ප්‍රාතිමොක්ඛ සංවර සීලයෙනි. ආජීවක පාරිශුද්ධ සංවර සීලයෙනි. මේ සතර සංවර සීලය වැඩීමෙන්ම අනුක්‍රමයෙන් සමථ විපස්සනා වැඩී සම්මාපත්තියට පත්විය හැකිය. ප්‍රඥාව ලැබීමෙන් සම්මා අංග සම්පූර්ණ කරගත හැකිය. බුදුපියාණන් දේශණාකර වදාල මෙම මාර්ග චරියාවෙන් ඈත්කර සම්මත බෞද්ධයාව අතරමං කලේ අභිධර්මය බෞද්ධ දර්ශණය හා අනාත්ම වාදය කරපින්නා ගැනීම නිසා එක අතකිනුත්, පුද පූජා ඇදහිලි හා යාඥා සහිත භක්තියෙන් අදහන ආගමක් අනෙක් අතිනුත් බෞද්ධයාට උගැන්වීමෙනි.

බුදුපියාණන් එදා මාගධි භාෂාවෙන් දේශණා කරණ ලද ධර්මය සහ හෙල අටුවා ලෙසින් හෙල අකුරින් සිංහල ආර්යයන් වහන්සේලා, භික්ඛුන් විසින් ලියා තිබූ පර්යාප්ති ධර්මය කල්යත්ම සංස්කෘත ආදී ඉන්දිය භාෂාවලට පරිවර්ථනය කළහ. පසුකාලයකදී අර්ථ කථා ලියූ බොහෝ විද්වතුන් විසින් හෙල අටුවා පාලියට හා සංස්කෘත භාෂාවලටත් පරිවර්ථනය කළේය. සංස්කෘත හා පාලි භාෂාවලින් ලියා තිබූ අර්ථ කථා තෙවනුවට යලිත් වරක් සිංහල බසටත් පරිවර්ථනය කරගෙන භාවිතයට ගත්හ. මේ අයුරින් බුද්ධ භාෂිතය පාලියට සංස්කෘතයට හා සිංහලට මෙන්ම චීන, ජපන්, ටිබෙට්, බුරුම, තායි ආදී භාෂා වලටත් මෑත යුගයේදී ඉංග්‍රීසි හා ජර්මන් ආදී අපරදිග භාෂාවන්ටත් පරිවර්තනය කරගෙන අධ්‍යයනය කරන්නට පටන් ගත්හ. මෙසේ විවිධ යුගයන්හීදී විවිධ උගත් වියත් පණ්ඩිතයින් විසින් පිරිසිදු බුද්ධ දේශණාව වෙන වෙන භාෂාවන්ට පරිවර්ථනය කර ලේඛනගත කිරීමේදීත් ඒ ඒ ලේඛකයන්ගේ දැනුම මති මතාන්තර මෙන්ම දැඩිව ගත් ආගමික මති මතාන්තරයන් ද ඇතුළු කරමින්

ලියූ නිසාත් පිරිසිදු මාර්ග චර්යාව දර්ශනයක් බවට පත්වූහ. බුදුපියාණන් වහන්සේ එදා උතුම් බුද්ධ ධර්මය දේශණාකර වදාළ පිරිසිදු පරමාතීය වූ “දෙව් මිනිසුන්ව සසර දුකින් සදහටම මුදවා නිදහස් කිරීම” යන්න වචනයට පමණක් සීමාවීමට වර්තමානයේ භාවිතා කරන අභිධර්මය, බෞද්ධ දර්ශණය, අනාත්ම වාදය හා බුද්ධාගම මෙන්ම බෞද්ධ සංස්කෘතිය යන සියලුම විෂයයන් අයහපත් ලෙසින්ම බලපෑ බව ඉතිහාසයෙන් මනාව පැහැදිලි වන්නකි. මේවා විෂයයන් වශයෙන් හදාරන්නට අධ්‍යයනය කරන්නට කටපාඩම් කරන්නට පමණක් සීමා විය. මේ අනුව ග්‍රන්ථධූරයට නැඹුරු වී විපස්සනා ධූරය සහමුලින්ම අභාවයට ගියහ.

නවීන විද්‍යාව මෙන්ම අද බෞද්ධ දර්ශණය යැයි, අභිධර්මය යැයි, විද්‍යා ආයතනවල උගන්වන විෂයයන්ද තර්කයෙහිම පිහිටා පිලිගත යුතු සාපේක්ෂ සත්‍යයය පදනම් කරගත්තකි. නාගාර්ජුන පාදයන් වහන්සේ බුද්ධ ආගමෙහි හරය රැක ගන්නට අනාත්ම වාදය හා බෞද්ධ දර්ශණය ඉදිරිපත් කිරීම නිසා තර්කය  නැමැති අවිය බෞද්ධයින් අතට ලබාදී ඇත. නමුත් බුද්ධ දේශණාවේ පෙන්වා දෙනු ලබන පරමාර්ථ දැක්ම,  අතීන්ද්‍රිය ඥාණය මඟින් පමණක්ම සාක්ෂාත් කරගත හැකි පරමාර්ථ සත්‍යය නම් වූ නිබ්බාන තත්වය අතක්කාවචර ධර්මයකි. තම සිතේ මෙතෙක් උපතලත් කෙළෙස් සිතුවිලි තමන්ම  දැක ගෙන සහමුලින්ම යලිත් කෙළෙස්  නො උපදින තත්වයටම සංඛාර නිරෝධ කර ගැනීමෙන් පමණක්ම සම්මා විමුක්තියටද පත්විය හැකිය. **මෙම සම්මා විමුක්තිය යන්න  වචන පදවැල් වලින් කියා තවත් කෙනෙකුට අවබෝධ කරවිය හැකි තත්වයක් නොවන නිසා එය ඉන්ද්‍රියගෝචර දහමක් නොවන අතීන්ද්‍රිය ඥාණයක් ලෙසින්ද පෙන්වා දිය යුතුය.**

මේ ධර්මතාවයන් පැහැදිලිවම තේරුම්ගෙන තමාම පිළිපැදිය යුතු මාර්ග චරියාව අනුගමනය කිරීම අත්හැර එය නොවටිනා දෙයක් ලෙසින් කල්යත්ම බැහැර කර දමන ලදී. සෝතාපත්ති මාර්ගය සකෘදාගාමී මාර්ගය, අනාගාමී මාර්ගය, අරහත් මාර්ගය යන සතර මාර්ගයන්ම සිතේ උපදින කෙළෙස් ප්‍රහාණය කරමින් පරිපූරණය කරගත යුතු මාර්ග චරියාවක් මිස, ප්‍රායෝගිකවම පිළිවෙතින් පෙළගැසිය යුතු දෙයක් මිස, අධ්‍යයනය කර දර්ශණයක් ලෙසින් විද්‍යායතනයකින් ඉගෙනගත හැකි



එකක් නොවේ. මෙහි තේරුම බාහිර පුද්ගලයෙකුගේ දැනුම ප්‍රයෝජනයට ගෙන ඒ බාහිරයෙන් ලද දැනුම මතම තමාගේ දැනුම දියුණු කර ගැනීමෙන් පමණක්ම නිවන් සාක්ෂාත් කරගත නොහැකිය යන්නයි. මේ සඳහා තමා තුලින්ම මතුකර ගත යුතු, එමෙන්ම ප්‍රායෝගිකවම තමාම පිළිපැදිය යුතු දැක්ම වන “යෝ පටිච්ච සමුප්පාදං පස්සති” යන දැක්ම අනිවාර්යයෙන්ම ලබාගත යුතුය. මේ දැක්ම “ධම්මෝ සංදිට්ඨිකෝ” යන මාගධි පදවලින් විග්‍රහ කරන දැක්මයි. එනම් හේතුඵල ධර්මයට බහා ගලපා බලා “සං පද හතරම” තේරුම් ගෙන බුද්ධ ඥාණ පද හතර තුලින්ම “ සංවර, සංසිඳවීම හා සංමාවීම” කරගත යුතුය.

අභිධර්මය, බෞද්ධ දර්ශණය, අනාත්ම වාදය මෙන්ම බුද්ධාගම යනදේ විෂයයන් ලෙසින් උගන්වන්නටත් අධ්‍යාපන ආයතනවල අධ්‍යයනය කරන්නටත් පටන් ගැනීමත් සමඟම “සං දේශණාව” අභාවයට ගොස් භාවිතයෙන් බැහැරවීම නිසා “නිවන” (නිබ්බාන) යන්න පැතුමක් පමණක්ම විය. අද සියලුම බුද්ධාගම්කාරයෝ  නිවන් ප්‍රාර්ථනා කරන, නිවන් යදින එපමණකින්ම සෑහීමට පත්වුන පෘථග්ජනයින් බවටත් පත් වූයේ මේ ආකාරයෙනි.

බුදු දහම අදවන විට පාවිච්චි කරන්නේ අරහත් ආදී මඟඵල ලබාගන්නා අටියෙන් නොවේ. පංචස්කන්දය උපාදානය කර ගැනීමෙන් ලබන සංසාර දුකෙන් මිදී නිදහස් වීමේ මාර්ග චරියාව ප්‍රගුණ කිරීම සඳහා නොවේ. උගතෙකු වී, වියතෙකු වී මහාචාර්ය ආචාර්ය උපාධි ලබාගෙන ප්‍රසිද්ධියට පත් වන්නට හා ලාභ සත්කාර ලබා ගන්නටය. මේ නිසා ග්‍රන්ථධූරය පිරීම මුල් තැනට පැමිණ විපස්සනා ධූරය පිරීම සහමුලින්ම අභාවයට ගියහ. බොහෝ දෙනෙකු අද බෞද්ධ දර්ශණය, අභිධර්මය හා බෞද්ධ සංස්කෘතිය ආදී විෂයයන් ඉගෙන ගන්නේ උගත්කම සඳහාය. රාජකීය පණ්ඩිත උපාධි ලබා ගැනීමටය. බණ කියන්නටය. දැනුම හා උගත්කම සඳහාය. මේ කිසිවකත් නිවන නැති බව ඔවුන් නොදනිති. පිළිවෙත් පිරීම, ධම්මචරියාවෙහි හැසිරීම පැත්තකට දමා දහම් දෙසීමෙන් ප්‍රසිද්ධිය, ප්‍රතිලාභ, කිර්ති ප්‍රසංසා ලබා ගැනීම මෙන්ම ලාභ සත්කාර ලබා ගැනීම සඳහාම ප්‍රමුඛ ස්ථානයක් දෙන ලදී.

## බුදු දහමෙන් පෙන්වා වදාල ධම්මානු ධම්ම පටිපදාව

බුද්ධ ධර්මය යනු ආගමක් හෝ දර්ශණයක් හෝ නොව මාර්ග චරියාව පෙන්වූ දහමකි. මාර්ග ප්‍රතිපදාවකි. ඒ මඟ පෙන්වූයේ සංසාර දුකෙන් මිදී විමුක්තිය ලබා ගැනීම සඳහායි. විමුක්ති ඥාණ දස්සනය සඳහායි. විමුක්ති ඥාණ දස්සනය ලබා ගැනීම සඳහා - චතු අරිය සච්චයන් අවබෝධ කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු අනුගමනය කළ හැකි මාර්ග චරියාව පෙන්වා වදාළ උතුම් බුද්ධ ධර්මය ආගමක් බවට පත්කර ගෙන බුද්ධාගම යන සම්ප්‍රදායික පදයකින් භාවිතයට ගැනීමත්, පෙර අපර දෙදිග ඇදහූ වෙනත් ආගම් සමඟ සැසඳීමට උත්සාහ ගැනීමත් සමඟම බෞද්ධ යන පදය පවා බලවත් අවුල් සහගත තත්වයකට පත්විය. බුදුන් දෙසූ පිරිසිදු ධර්මය කණපිට පෙරලාගෙන යැපීම සඳහා ව්‍යාපාර සඳහා ප්‍රසිද්ධිය ප්‍රචාරය සඳහා යොදාගන්නට පටන් ගැනීම මෙහි ප්‍රතිඵලය විය. මේ අවුල නිසා බුදු දහමේ පරමාර්ථය යටපත්ව ගොස් නිවන් මඟ වචනයට පමණක්ම සීමාවිය.

භක්තියෙන් හා විශ්වාසයෙන් ඇදහිය යුතු තවත් එක සම්මත ආගමක් ලෙසින් බුද්ධාගම යන නාමයෙන් හැදින්වීමටත්, දේවත්වයෙන්, බුද්ධ යන නම අදහන්නටත් පටන් ගනී. මෙයටත් වඩා බලවත්ම විනාශයක් වූයේ එදා පෙරදිග ප්‍රචලිතව පැවැති වෙනත් සම්මත ආගම් වූ වේද ආගම, ශිව ආගම, උපනිෂද් ආගම, ජෛන ආගම, හින්දු ආගම හා බමුණු ආගම් වල විශ්වාස කළ බ්‍රහ්මත්වය, දේවත්වය සහ භක්තියෙන් ඇදහූ තවත් බොහෝ ආගමික සංකල්ප ක්‍රමානුකූලව බුද්ධාගමටත් වැද්ද ගැනීමයි. පෙරදිග ආගම් වල එදා භාවිතා කරණ ලද වැදුම්, පිදුම්, යැදුම් හා පැතුම් බුද්ධාගමටත් ඇතුලත් කර ගැනීම නිසාවෙන් නිවන් අවබෝධ කරගන්නට - සසර දුකෙන් සදහටම මිදී නිදහස් වන්නට උපකාර වන සේ ප්‍රකාශ කළ මාර්ග චර්යාව - විමුක්ති මාර්ග ප්‍රතිපදාව - වචනයට පමණක් සීමා වී සම්ප්‍රදායික වශයෙන් හා භක්තියෙන් අදහන තවත් එක සම්මත ආගමක් බවට බුද්ධාගමද පත්විය. බුද්ධාගමක් නිර්මාණය කරගෙන භක්තියෙන් ආගමක් ඇදහීමේ නියත ප්‍රතිඵලය වූයේ මාර්ග චරියාව අභාවයට ගොස් විමුක්ති මාර්ගය වැසී යටපත් වී යාමයි.



අපි අද මෙසේ භක්තියෙන් අදහන, බුද්ධාගමේ විමුක්ති මාර්ගය අනුගමනය කිරීමක් හෝ මාර්ග චරියාව තේරුම්ගෙන චතුරාර්ය සත්‍යයන් අවබෝධ කර ගැනීමට උපකාර වන්නාවූ මජ්ඣිමා පටිපදාවක් හෝ කිසිසේත්ම භාවිතා කරන්නේද නැත. අද "මජ්ඣිමා පටිපදා" යන්න මැද මාවත මැදුම් පිළිවෙත යනුවෙන් වැරදියට පරිවර්තනය කරගෙන ඇත.

අපායෙන් බේරෙන්නට හා දෙව් මිනිස් සැප සම්පත් යලි යලිත් මතු මතුවටත් ලබා ගන්නටත් උපකාර වන පරිදි පින්කම් පමණක් කිරීමේ පිළිවෙතක් අද සම්මතයෙන් අදහන බුද්ධාගමෙහි ඇතැයි කිව හැකිය. අපායෙන් බේරීමත් දෙව් සැප රජසැප ලැබීමත් සසර දික්වෙන නිවන ආවරණය කරණ දේවල් බව දැනගත යුතුය. කාමලෝක වල සුගති ලෝක වල නිවනක් නැත. අපායෙන් බේරීම යහපත් වුනත් එතනත් නිවනක් නැත. තම සිතේම උපදින රාග, ද්වේශ, මෝහ යන කෙළෙස් ගති යලි නොඋපදින ලෙසින් (අනුත්පාද) කෙළෙස් මුල් උදුරා අස්කර දමා නිදහස් වීමම නිවනයි. මෙය කුසලස්ස උපසම්පදා යනුවෙන් බුද්ධ භාෂිතයේ පැහැදිලිව පෙන්වා දෙන ලදී.

මේ කොතනක වුවත් කොයි ලෝකයක වුනත් පැවැත්මක් පවත්වාගෙන යයි නම් එතැන නිවනක් නැත. නිවනේ පැවැත්මක් නැත. පැවැත්මේ නිවනක් ද නැත.

නූතන යුගයේ බටහිර රටවලදී උපත ලැබූ නවීන විද්‍යාව යැයි නම් කරණ විද්‍යාව සමඟ බුද්ධ ධර්මය සැසඳිය නොහැක. විජ්ජා උදපාදි, විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා ආදී වශයෙන් බුදු දහමේ පෙන්වූ විද්‍යාව සහ අප අද භාවිතා කරන නවීන විද්‍යාව අතර බලවත්ම වෙනස්කම් ඇත. බුද්ධ ධර්මය පරමාර්ථ ධර්මයකි. මෙහි විද්‍යාව යනුවෙන් (විජ්ජා උදපාදී, විජ්ජා අධිගතා) යනුවෙන් පෙන්වූයේ ජීවිත පැවැත්ම පිළිබඳව විනිවිද දැක යථාභූත ඥාණ දර්ශණය ලබාගෙන, චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමකි, යථාවාදී තථාකාරී බව දැකීමකි.

බුදුපියාණන් වහන්සේගේ පිරිනිවීමෙන් කලකට පසුව බුද්ධාගම යන නමින් අදහන ආගමක් නිර්මාණය කරගෙන එදා සම්මතයෙන්

භාවිතයේ පැවති වෙනත් ජනප්‍රිය ආගම් වල අංගයන් ද ඊට ඇතුලත් කරගෙන වැදුම් , පිදුම්, යැදුම්, පැතුම් සහිතව භක්තියෙන් අදහන තවත් අලුත් ආගමක් නිර්මාණය කරගත් බව සියළුම බෞද්ධයින් දැන්වත් සිතා බලා තේරුම් ගත යුතුය. බුදුපියාණන් වහන්සේ යනු ආගම් කර්තෘ කෙනෙකු නොවේ. ආගමක නිර්මාතෘන් වහන්සේද නොවේ. ධර්මයම ගුරුවරයා කොට, ධර්මයම මූලිකත්වයකලා සලකා ක්‍රියා කළයුතු මාර්ග චරියාවක් පෙන්වා වදාළ උත්තමයෙකි.

## මව්බස හා දැයේ ඉතිහාසය

රටක තරුණ පරපුර නිවැරදි නිවහල් චින්තනයේ පිහිටුවා ක්‍රියාකරන්නන් පිරිසක් බවට පත්කරවන්නට - එනම් ධම්මානුධම්ම පටිපදාවට යොමු කරවන්නට උපකාර වන්නා වූ බලවත්ම සාධකයක් වන්නේ කුඩා කල පටන්ම තම මව් බසත් , තම රටේ නිවැරදි ඉතිහාසයත් පිළිබඳව යථාවාදීව සිතන්නට සුදුසුසේ දැනුවත් කිරීමයි. දරුවන්ට නිවහල්ව නිදහස් ව සිතන්නට පුරුදු පුහුණු කරවීමයි.

අප ජීවත්වන මේ රට “සිවු හෙලයයි” එය පසුව සිංහලය විය. මේ රටේ මිනිසුන් භාවිතා කළ මුල්ම භාෂාවන් වූයේ මාගධී හා හෙල බසයි. අපේ සිවු හෙලය පිළිබඳව ඉතිහාසය අප මනාකොට දැන ගත යුතුය. ජන්බුද්වීපය, උතුරු කුරු දීපය, අපර ගෝයානය හා පූර්ව විදේහය යන සිවු දීපයන් සිවු හෙලය ලෙසින් එදා ඈත අතීතයේ දී හැඳින්විය. මහා වංශය, දීපවංශය , උත්තර වංශය හා වෙනත් වංශ කථා ලීවේ අපේ හෙලබිමේදීය. මේ සියලු පොත්වල ලියැවී ඇත්තේ අපේ සිවුහෙලයේ ඉතිහාසයයි. හෙළ උරුමයයි. මෙවන් වංශ කථාපොත් මුලින්ම ලියා පලකලේ හෙළ බසිනි. පසු කාලයකදී මේ හෙළ බසින් ලියා තිබූ පොත්පත් පාලි භාෂාවට පරිවර්ථනය කරන ලදී. අප රටේ මුතුන් මිත්තන් භාවිතා කළ පිරිසිදු හෙළ බස හා පිරිසිදු මාගධී බස යන භාෂාවන් දෙක කල්යත්ම සංස්කෘත භාෂාවෙන් හා වෙනත් භාෂාවලින් ණයට ගත් වචන භාවිතා කරන්නට පටන් ගැනීම නිසා සංකර තත්වයට පත්වූහ. මෙය අද ඊයේ සිදු වූවක් නොව අතීතයේ වලගම්බා යුගය හෝ ඊටත් පෙර පටන්ම සිදු වූ විපර්යාසයකි.



1954 දී ත්‍රිපිටකය සිංහලට පරිවර්තනය කළ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය යැයි පිළිගත් මණ්ඩලය උගතුන් වියතුන් බවට පත්වූයේ අපේ පිරිසිදු හෙල හා මාගධී භාෂාවන් දෙකටම සංස්කෘත වචන ආදේශ කරමින්ය. මේ උගතුන් වියතුන් භාවිතා කල භාෂාව ගැන නිවහල්ව හා නිදහස්ව සලකා බැලුවොත් ඔවුන් භාවිතා කළ වචන වලින් බහුතරයක් සංස්කෘත භාෂාවෙන් ණයට ගත් වචනයන්ය. මෙසේ විකෘති කරණ ලද්දේ හෙලබස පමණක්ම නොවේ. පිරිසිදු බුදු දහමද මේ අනුවම විකෘති කරන ලද්දේ වෙයි. සරල සුගම මාගධී හා හෙලබස් වහර වෙනුවට පරබසින් ගත් සංකීර්ණ, සුංගාරාත්මක, සංස්කෘත වචන යොදාගෙන ත්‍රිපිටකය සිංහලයට පරිවර්ථනය කර ඇති බව එය කියවන ඕනෑම කෙනෙකුට අද තේරුම් ගත හැකිය. මෙසේ සංකර සංස්කෘත පදයන් යොදාගෙන සිංහලයට ත්‍රිපිටකය පරිවර්ථනය කර ඇත්තේ පරිවර්ථකයින් විසින් තමන් ෂඩ්භාෂා පරමේශ්වරයින් බව පෙන්වන්නට මිස, සරල සුගම සිංහල අරුත් ලබාදී හෙළ දරුවන්ට දහම් මඟ පෙන්වා දෙන්නට නම් නොවේ. මේ පරිවර්ථනය නිසා සිදුවූ එකම දෙය සිංහල ත්‍රිපිටකය අද කියවන නවකයෙකුට සිංහල භාෂාවත්, බුද්ධ ධර්මයත් යන දෙකම තිත්ත කසායක් බවට පත්වීමයි. අංඩර දෙමල හෝ අපබ්භ්‍රංශ මෙන් ඒවායේ අරුත් තේරුම් ගන්නට බැරි තත්වයට පත් කරවීම මොන තරම් පාපයක් දැයි දැන්වත් ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය ලෙසින් ක්‍රියා කරන අමරපුර නිකායික මහ තෙරුන් වහන්සේලා කල්පනා කළ යුතුව ඇත. හෙළ දරුවන්ට සිංහල භාෂාව හා බුද්ධ ධර්මය තිත්ත කසායක් බවට පත් කරවන්නට මේ පරිවර්ථකයින්ගේ සංස්කෘත සංකර වචන යෙදීම බලවත් සේම හේතු භූත වූ බව දැන්වත් පිලිගත යුතුමයි. මේ ආකාරයෙන්ම මුලින්ම හෙළ අකුරින් හෙළ වියතුන් විසින් හෙළ බසින් ලියා තිබුණු මහා වංශය, දීප වංශය, උත්තර වංශය හා හෙළ අටුවා මෙන්ම අනෙකුත් වංශ කථාවලද අන්තර්ගතව ඇත්තේ අපේ රටේ නම්, ගම්, පුද්ගල නාම හා ස්ථාන නාමයන් මිසක වෙනත් පිටරටකට අදාළ තොරතුරු හෝ නම් ගම් පුද්ගල නාමයන් හෝ නොවේ. හෙළ බිමේදී සිංහල අකුරින් ලියූ සිංහල හාමුදුරුවන් ලියූ, අපේම මාගධී ත්‍රිපිටකය අපේම ඉතිහාසයේ කොටසකි. අපේම හෙළබිමේ කොටසක් වූ ජම්බුද්වීපයේ උපන් ගෞතම බුදුපියාණන් වහන්සේ විසින්

දේශනා කර වදාළ සිරි සද්ධර්මය වසර හාරසිය පනහක් පමණම දිගු කාලයක් කටවහරින් පවත්වාගෙන ආවේත්, කටවහරින් ගෙනා දහම ලේඛන ගත කරන ලද්දේත්, අපේම සිංහල හෙළ භික්ඛු සංඝයා වහන්සේලා විසින්මය.

මේ අනුව මහා වංශයේත්, දීප වංශයේත්, ත්‍රිපිටක පොත්වලත් සඳහන් වන සියළුම නම් ගම්, තොරතුරු , පුද්ගල නාම, ස්ථාන නාම ආදී සියල්ලම පැරණි හෙළ බිමේ භාවිතා කරන ලද ඒවා මිස වෙනත් රටක හෝ පරදේශක නම් ගම් නොවන බව හොඳින්ම තේරුම් ගත යුතුය. මේවා වෙනත් රටකට පවරා දී අපේ හෙල උරුමය අද මෙසේ විනාශ කර, යටපත් කර දමන්නට උත්සාහ කරන්නේ එදාත් බුද්ධ ධර්මයටත්, බුදුපියාණන් වහන්සේටත්, මේ රටටත් විරුද්ධ වූ මිත්‍යාදෘෂ්ඨික බමුණන් හා පරිබ්‍රාජකයින් විසින්මය. අද ඔවුන් වෙනත් වේෂයකින් මේ රටේම ඉපදී අපේම හෙල ඉතිහාසයත්, පිරිසිදු බුදු දහමත් විකෘති කර විනාශ කරන්නට විවිධාකාර ක්‍රියාකාරකම් කරන බවද තේරුම් ගත යුතුය. අපේ තරුණ පිරිස මෙන්ම ගිහි පැවිදි උගතුන් හා දේශපාලකයින් විසින්ද මේ පරම සත්‍යය තේරුම් ගෙන කටයුතු කළ යුතුමය.

මහාවංශය හා ත්‍රිපිටක පොත්වල මෙන්ම මේ රටේදී ලියූ අතීත පොත්පත් වලද සටහන් වී ඇත්තේ වෙනත් බාහිර රටකට අදාළ ඉතිහාසය යැයි විවිධාකාර තර්ක විතර්ක ඉදිරිපත් කරමින් අපේ සිවු හෙළයේ හෙළ උරුමය භාරතයට බාර දෙන්නට කටයුතු කළෝ 1850 - 1900 අතර පොත්පත් ලියූ ඉංග්‍රීසි ජාතිකයිනුත් ඔවුන්ව අනුගමනය කළ අපේම කළු සුද්දනුත් විසින්ය. එය ඔවුන් විසින් අපට කරන ලද බලවත් ම විනාශයකි. අපි අද සංකර, පරගැති ජාතියක් වී ඇත්තේ මෙවන් විනාශයක් හෙළ බසටත්, හෙල ඉතිහාසයටත් සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

විජය රජු මෙහි පැමිණෙන්නට පෙර මේ රටේ ඉතාමත්ම දියුණු ලේඛන කලාවක්, සංස්කෘතියක් හා ශිල්ප ශාස්ත්‍ර විධි මෙන්ම වාරි මාර්ග පද්ධතියක්ද මෙරට පැවතුනි. අද රජගල (අම්පාරේ) රිටිගල (සැවැත්නුවර) බුදුගල (කුසිනාරානුවර) වැනි ස්ථාන වල අපට දක්නට ලැබෙන පුරා වස්තු සියල්ලම විජය මෙරටට පැමිණෙන්නට පෙර අපේ හෙළ



දරුවන් විසින් කරවූ නිර්මාණයන් හි ශේෂ වූ දේ මිස විජය රජුගෙන් පසුකාලීනව කරවූ දේවල් නොවේ.

විජය රජු ඉන්දියාවේ සිට මෙරටට පැමිණෙන යුගය වන විට අනුරාධපුරය මුල් කරගත් උතුරු කුරු දිවයින ලේඛන කලාව, ශිල්ප ක්‍රම හා තාක්ෂණය අතින් එතරම් දියුණු නොවුවත් දිවයිනේ නැගෙනහිර හා රුහුණේ බොහෝ ප්‍රදේශවල ඉතාමත්ම දියුණු රාජ්‍යයන් පැවතුනි. අම්පාරේ රජගල (රජගහනුවර) මෙන්ම කොසොල් රට සැවැත්නුවර(අද රිටිගල) මෙයින් මුල් තැනක් ගත් රාජ්‍යයන් දෙකකි. එමෙන්ම කන්ද උඩරට ප්‍රදේශවලද සබරගමුවේද ඉතාමත් දියුණු මිනිසුන් ජීවත් වූහ. ගෞතම බුදුපියාණන් වහන්සේ වසර හතළිස් පහක්ම පාගමනින් ගමින් ගමට වැඩම කර දහම් දේශනා කළේ මේ හෙළදිව ජීවත් වූ හෙළ වැසියන්ටය.

හෙළ අටුවා පොත් පත් හා හෙළ වංශ කථා සියල්ලම ලියන්නට තරම් දියුණු ලේඛන කලාවක් පැවැති බවත් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන්නට තරම් දියුණු අක්ෂර රටාවක් හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් අපේ හෙලයන්ට තිබුණු බවත් අද බොහෝ උගතුන් විසින් අමතක කරදමා ක්‍රියා කරති. මේ අනුව අපේ තරුණ පරපුරේ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් මොට කරන්නට මෙවන් වැරදි සම්මත ඉතිහාසයක් බෙහෙවින්ම බලපෑ බව පැහැදිලිවම පෙන්වා දිය යුතුය.

අපේ කුඩා දරුවන්ටත්, තරුණ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ටත්, විශේෂයෙන්ම ගුරුවරුන්ටත් සිය බසත්, තම රට පිළිබඳව නිවැරදි ඉතිහාසයත් හොඳින්ම දැන ඉගෙන ගන්නට අවශ්‍ය දැනමුතුකම් ලබා දිය යුතුය. සුදු ජාතිකයින් හා කළු සුද්දන් විසින් නිර්මාණය කර අප පිට බලෙන් පැටවූ වැරදි ඉතිහාස කථාවන් දැන් වෙනස් කර ගත යුතුය. බටහිරින් මුදලට උපාධි තනතුරු හා මහාචාර්ය පට්ටම් ලබාගත් අපේ ඉතිහාසඥයින්, පුරාවිද්‍යාඥයින් මෙන්ම බෞද්ධ දර්ශනය පිළිබඳ උගතුන්ද දැන් නැවත සිතා බලා තමන් අතින් සිදු වූ වැරදි නිවැරදි කර ගන්නට කාලය පැමිණ ඇතැයි පෙන්වා දෙනු කැමැත්තෙමි. විශේෂයෙන්ම සම්මත , සම්ප්‍රදායික ආගමික සංකල්පයන්හි එල්ලී නොසිට සියළුම හෙළ

ජනයා බුදු දහම නිවැරදිව හදාරා මිනිස් ගුණ දහම් වඩා වර්ධනය කර ගන්නට ක්‍රියා කළ යුතුය.

අපේ පාසල් වල දරුවන්ට පහළ පන්ති වලදීම බුද්ධාගම හා බුදුදහම අතර වෙනසක් ඇති බව පැහැදිලිවම පෙන්වා දීමට දැන්වත් කටයුතු කලයුතුය. මේ බව වගකිව යුතු උගතුන් විසින් තේරුම්ගෙන පාලකයින්වද දැනුවත් කර කටයුතු කිරීම නැවත බුදු දහම නගා සිටුවන්නට කළ හැකි හා කළ යුතු වඩාත් වැදගත් ම කාර්යයි.

උතුම් බුදු දහම අදහන ආගමක් බවට පත් කලේත්, මාර්ග චරියාව බෞද්ධ දර්ශණයක් බවට වෙනස් කලේත් පරදේශීන් විසින්මය. අපේ හෙළයින් විසින් පරදේශකයින් කළ මේ වෙනස්කම් සතුටින්ම පිළිගෙන බුදු දහම සහ මාර්ග චරියාව භාවිතයෙන් ඉවත් කරන්නටත් ක්‍රියා කළහ.

භාරත දේශයේදී මහායානික බෞද්ධ උගතුන් විසින් සංස්කෘත බසින් ලියා පල කරන ලද පොත්පත් කියවීම වරදක් යැයි මට නොහැඟෙයි. ඒ පොත්පත් කියවන ගමන්ම අපේ හෙල බිමදී ලියු ත්‍රිපිටක ග්‍රන්ථයන්ද පරිශීලනය කරමින් පිරිසිදු බුදු දහම, මාර්ග චරියාවෙන් වෙනස් කර භක්තියෙන් අදහන ආගමක් බවට පත් කර ගත් ආකාරයත් හොඳින්ම තේරුම් ගතයුතුයි. භාරත දේශයේදී ලියූ සියළුම පොත්පත් වලට උපනිෂද් දර්ශණයත් ජෛන ආගමත්, වේද හා පුරාණ ග්‍රන්ථයනුත් අතිමහත් බලපෑමක් කර ඇති බවත් තේරුම් ගත යුතුයි. මෙවැනි දේව ආගම් වල බලපෑම නිසා පිරිසිදු බුදු දහම යටපත් වී  තවත් එක ආගමක් බවට පත්වීමේ ඉතිහාසය අප පැහැදිලිව ලියා එළි දක්වා මතු පරපුර දැනුවත් කළ යුතුමය.

අප රටේ දහම් පාසල්වල, පාසැල් වල මෙන්ම පිරිවෙන් වලද දරුවන්ට උගන්වන්නේ වැරදි ඉතිහාසයකි. වැරදි ආගමකි, වැරදි භාෂාවකි. බුද්ධ ආගම, බෞද්ධ දර්ශණය, බෞද්ධ සංස්කෘතිය යනුවෙන් අද අපේ පාසැල්වල හා විද්‍යායතනවල උගන්වන දේවල් තුල නැති එකම දෙයත් බුදු දහම පමණි. බටහිර රටවල් වලින් මෙන්ම ඉන්දියාවෙන්ද ණයට ගත් බොහෝ වැරදි දේ අද අපේ පාසැල් වල අපේ දරුවන්ට උගන්වති.



පිටරටින් ගත්තත් වැරදි දේ වැරදිමය. හරි දේ නම් හරිය. හරි වැරදි සොයා බලන්නට හේතුඵල දහමම භාවිත කළ යුතුය.

අපේ සමාජය පිරිසිදු වන්නේත්, පුරවැසියන් අවංක වන්නේත්, සිල් රකින පිරිසක් බවට පත්වන්නේත්, නියම නිවැරදි හේතුඵල දහම තේරුම් ගැනීමෙන්ම පමණි. බුදු දහමේ හරය එයයි. සූත්‍රයට , ධර්මයට බහා ගලපා බලා, විනයට සසඳා බලා ක්‍රියා කිරීම යන්නෙහි නියම අර්ථය මාර්ග චරියාවෙහි හැසිරීමයි.

වැරදි ආගමක් හා වැරදි ඉතිහාසයක් අපේ දරුවන්ට ඉගැන්වීම වහාම නවතා දමා නිවැරදි ඉතිහාසයත් නිවැරදි බුදු දහමත් උගන්වා හොඳ පුරවැසියන් බවට පත් කිරීම කාගේත් යුතුකම හා වගකීමක් වන්නේය.

## අභිධර්මය හා මාර්ග චරියාව

බුදුපියාණන් එදා දේශණාකර වදාළ බුදු දහම තුල මාර්ග චරියාවක් මිස අද  භාවිතා කරන අර්ථයෙන් අභිධර්මය යැයි කොටසක් වෙන්කර දේශණා කළේ නැත. සූත්‍රයට ධර්මයට බහා ගලපා බැලීම හා විනයට සසඳා බැලීම තුලින් සංවර වී , සංසිඳවා , සම්මා තත්වයට පත්වීමට අභිධර්මය යැයි කොටසක් අවශ්‍ය නොවේ. දෙවියන්ට පමණක් තේරුම් ගත හැකි දෙවියන්ට දේශණා කළ දෙයක් ලෙසින්ද  ගැඹුරු ධර්ම කොට්ඨාශයක් ලෙසින්ද අභිධර්මය යැයි පිටකයක් එක්කර ගත්තේ පසුකාලයකදීය . මුල් බුදු දහමේ  මෙවැනි දෙයක් වෙන්කොට පෙන්වා නැත.

මහා භාරතයේදී අසංගාචාර්යතුමා නැමැති මහායානික බෞද්ධ පඬිවරයා කිතු වසින් 3 වැනි සියවසේදී පමණ සංස්කෘත භාෂාවෙන් ලියූ “අභිධර්ම සමුච්චය” නැමැති පොත මේ අභිධර්ම කොටසේ ආරම්භය ලෙසින් පෙන්වා දිය හැකිය. පසුව හෙළ බිමේදී ද අභිධර්මාර්ථ සංග්‍රහය නමින් පොතක් ලියා අසංගාචාර්ය තුමා විසින් ඉදිරිපත් කල දේ යලි බෞද්ධ දර්ශනයට එකතු කර ගත්හ.

මේ පොත් දෙකම ලිවීමේදී ත්‍රිපිටකයේ එන සමහරක් මාගධී පදවැල් භාවිතා කරමින් ඒවාට උපනිෂද් දර්ශණයේ එන සමහර මතයන්ද එකතු කර ගත් බවත් පැහැදිලිවම පෙන්වා දිය යුතුය. විද්‍යායතනවලදී බෞද්ධ දර්ශනය අභිධර්මය ආදී වශයෙන් අද මෙම විෂයය උගන්වන්නට සුදුසු පරිදි සකස් කර ගෙන ඇත. මෙසේ උගත්කම දැනුවත්කම හා තර්කාන්විත බව රැකගන්නට මේ ආකාරයෙන් සකස් කර ගත් අභිධර්මය නිසා ග්‍රන්ථ ධූරය පිරීම සම්පූර්ණ කරගත්තත් මේ කාරණයම විපස්සනා ධූරයට - මාර්ග චරියාව සම්පූර්ණ කර ගන්නට බලවත් ම බාධකයක්ද විය.

හෙළදිව බෞද්ධයා මාර්ග චරියාවෙන් ඈත්වන්නටත්, නිවන් දැකීම ප්‍රාර්ථනාවකට පමණක් සීමා කර ගන්නටත් බලවත්සේම හේතු පාදක වූයේ මහායාන බුද්ධාගමෙන් ණයට ලබාගෙන භාවිතා කරන මේ අභිධර්ම විෂයය හේතුවෙනි. මෙකල බෞද්ධ ගිහි පැවිදි - උගත් වියත් කාගේත් බලවත් අවධානය යොමු වී ඇත්තේ මහායන බුද්ධාගමෙන් මතු කර පෙන් වූ බෞද්ධ දර්ශණය කෙරෙහි විනා පිරිසිදු බුද්ධ දේශනාවෙන් පෙන්වා වදාළ මාර්ග චරියාව කෙරෙහි නොවේ.

එමෙන්ම නූගත් ගැමි සම්ප්‍රදායික බෞද්ධ පිරිස විසින් තම අවධානය යොමුකර ඇත්තේ වැදුම් , පිදුම්, යැදුම්, පැතුම් කෙරෙහිය. භක්තියෙන් දෙවියන් අදහන්නාක්මෙන් ගැමි බෞද්ධයෝ බුදුන් අදහති. මේ අනුව බහුතරයක් නූගත් ගැමියන් තවත් දෙවි කෙනෙක් ඉදිරියේ යාඥා කරන ආකාරයටම නිවන ඉල්ලා බුදු පිළිම හා බෝ ගස් ඉදිරියේත් යදිති. වඳිති, පුදති, පතති.

බෞද්ධ දර්ශණය හා අභිධර්මයත් අනාත්ම වාදයත් කරපින්නාගත් උගත් වියත් බෞද්ධයින් පිරිස තම සිතුම්, පැතුම් මෙන්ම චරියා රටාවන් ඒ අයුරින් හැඩගස්වාගෙන වෙනමම ලෝකයක අතරමං වූහ.

මේ නිසා උතුම් බුද්ධ දේශණාවෙන් පෙන්වා වදාළ මාර්ග චරියාව, (ධම්මානු ධම්ම ප්‍රතිපදාව) විමුක්ති මාර්ගය සාක්ෂාත් කරගන්නට නොව ලෞකිකත්වය යහපත් කර ගන්නට පමණක් උපකාර වන සේ ආගමක් බවට පත්කරගෙන, නිවන් දැකීම ප්‍රාර්ථනාවකට පමණක්ම සීමා කර ගත්හ.



එසේත් නැතිනම් මතු බුදුවන්නට, මතු බුදු වන බුදුන් දැක නිවන් දකින්නට පමණක් ප්‍රාර්ථනා කරන පුරුද්දකටම පත්කර ගත්හ.

මේ අනුව බුදු දහමේ පෙන්වා වදාළ මඣ්ජිමා පටිපදා යන්නද මැද මාවතක්, මැදුම් පිළිවෙතක් බවට පරිවර්ථනය කර ගත්හ. පිරිසිදු බුදු දහමෙහි පෙන්වා වදාල මඣ්ජිමා පටිපදා යනු රාග මදයෙන්, ද්වේශ මදයෙන්, මෝහ මදයෙන් සහමුලින්ම මිදී නිදහස් වීම යන අර්ථය ලබා දෙතත් බුද්ධාගමේ මැද මාවත අර්ථයක් නැති ප්‍රතිපදාවක් නැති ප්‍රකාශයක් බවටත් අද පත්වී ඇත.

සමුදය උපත ලබන්නේ සිතකමය. සමුදය උපත ලබන්නට මුල් වූ හේතුව රාගයෙන් මත්වී , ද්වේශයෙන් මත්වී මෝහයෙන් මත් වී ක්‍රියා කිරීමයි. සමුදය නිරෝධ කිරීමට නම් අනිච්ච දුක්ඛ අනත්ත මෙනෙහි කර සිතේ හටගන්නා මත්වීමෙන් නිදහස් විය යුතුය. නිබ්බිදා, විරාග, නිරෝධා පටිනිස්සග්ග යනුවෙන් පෙන්වා වදාලේ මෙම මාවතයි. ප්‍රතිපදාවයි.

### **ආමිස පූජා සහ ආගම**

සාහිත්‍යය, මූර්ති ශිල්පය, චිත්‍ර කලාව, සංගීතය හා වෙනත් ආමිස වශයෙන් සිත සමථයට පත්කරවන තාවකාලික හා ලෞකික ක්‍රියාකාරකම් ඉගෙන ගෙන දැනුවත්වී එයින් පන්නරයක් ලැබීමෙන්ද යම්කිසි ආමිස සුවයක් ආස්වාදයක්, සහනයක් ලබාගන්නට මිනිසාගේ සිත ඉක්මන් වෙති. මේ මොහොතේ ලබන තාවකාලික ඉන්ද්‍රියයන් පිනවීමේ සුවයට පෘතග්ජන ලෝකයා ගිජු වෙති. මේ අයුරින් සිත තාවකාලිකව සුවයට පත්කරවන බොහෝ දේ සියළුම ආගම්වල බහුල වශයෙන්ම භාවිතා කරති. පෘතග්ජන සිතකට ගැලපෙන පරිදි කෑම බීම, නිවාස , ඇඳ ඇතිරිලි , මේස පුටු, නාන කාමර විසිත්ත කාමර මේ ආදී බොහෝ දේ ආමිස සුවය සඳහා ලෝකයා භාවිතා කරති. මේ සියල්ලම පසුව සංස්කෘතියක් ලෙසින් සම්මත වේ. හැඳි ගෑරුප්පු භාවිතා කරමින් ආහාර ගැනීම බටහිර සංස්කෘතියයි. පන් පැදුරේ, පිලේ නිදා ගැනීම සිංහල සංස්කෘතියයි. මේවා ආගම හෝ ධර්මය නොවුණත් ආගම ධර්මයන් හා මෙවැනි සංස්කෘතික අංග වෙන් කල

නොහැකිය. හැඳි ගෑරුප්පු භාවිතයෙන් පිඟානක ආහාර ගැනීම බෞද්ධ භික්ෂුවට නොගැලපෙන සංස්කෘතික අංගයකි. නමුත් මෙය පාපයක් හෝ අකුසලයක් වන්නේද නැත. අපේ පිළිගත් සම්මතයට අනුව බෞද්ධ භික්ෂුවක් පාත්‍රයෙහි අතින් දානය වැළඳිය යුතුය. පාත්තර වත මහා බ්‍රහ්මායු සූත්‍රයෙහි බුදුපියාණන්ම දේශණා කරන ලද ධර්මයක් ලෙසින් සටහන් කර ඇත. අපේ සංස්කෘතියට අනුව මේවා ගැලපෙන බව හෝ නොගැලපෙන බව හෝ තීරණය කරන්නේ ලෞකික මානයෙන් මිම්මෙන් මනින්නට පුරුදු පුහුණු වූ පෘතග්ජන පුද්ගලයින් විසින්ය. ලංකාවේ සිංහල ගෙදරකදී බෞද්ධ භික්ෂුවක් හැඳි ගෑරුප්පු වලින් දානය වළඳයි නම් එය බෞද්ධ සැදැහැතියෙකුගේ සිත කීරි ගැසෙන තරමේ අසංවර ක්‍රියාවකි. නමුත් පිටරටවලදී අපේම සිංහල බෞද්ධ භික්ෂූන් හැඳි ගෑරුප්පු වලින් දානය වළඳනවා මම දැක ඇත. මේ නිසා පාත්තරයක දානය වැළඳීම බෞද්ධ භික්ෂුවකට සුදුසු නිර්දේශිත දෙයකි.

මේ අනුව ආගමත් සංස්කෘතිකාංගයනුත් එකම ආරකට සකස් වෙයි. නමුත් බුද්ධ ධර්මය යනු හේතුඵල දහමට අනුව තීරණය වන්නකි. පටිච්ච වේ නම් සං උපත ලබයි. පටිච්ච නොවේ නම් සමුදය නොඋපදී. සං උපත ලබයි නම් සමුදය බිහිවේ නම් එය අධර්මයයි. සමුදය නිරෝධ වෙයි නම් පටිච්ච නොවේ නම් එතැන මාර්ග චරියාව ක්‍රියාත්මක වෙයි. අනිච්ච, දුක්ඛ, අනත්ත මෙනෙහි කළ යුතු වන්නේ පටිච්ච වීමෙන් මිදී නිදහස් වන්නටයි.

"සබ්බෙ සංඛාරා අනිච්චා
සබ්බෙ සංඛාරා දුක්ඛා
සබ්බෙ ධම්මා අනත්තා"

යන ධර්මතාවය නිතර සිහිපත් කළ යුතු වන්නේ පටිච්ච වීමෙන් වැළකීමටයි.



## බුදු දහම බුද්ධාගම හා නවීන විද්‍යාව

බුදු දහම = බුද්ධ ධර්මය යනු කිසිසේත්ම ආගමක් හෝ දර්ශණයක් හෝ නොව මාර්ග ප්‍රතිපදාවකි. උතුම් බුදුදහමින් මෙසේ මඟ පෙන්වූයේ සංසාර විමුක්තිය සාක්ශාත් කරගන්නටයි. මිනිසුන්ට විමුක්ති ඥාණ දර්ශණය ලබා ගන්නටයි.

විමුක්ති ඥාණ දර්ශණය ලබා ගැනීම යනු චතු අරිය සච්චයන් අවබෝධ කර ගැනීමමයි. මේ සඳහා අනුගමනය කලයුතු පිරිසිදු මාර්ග ප්‍රතිපදාව (මාර්ග චරියාව) පෙන්වා වදාළ උතුම් බුදු දහම, කල්යත්ම බුද්ධාගම යන නමින්ම සම්ප්‍රදායිකව අදහන තවත් එක සම්මත ආගමක් සේ භාවිතයට පැමිණීමෙන් වැරදි රාශියකටම මුල පිරුණි. පෙර අපර දෙදිගම ඇදහූ අදහමින් පවතින වෙනත් ආගම් සමඟ, බුදු දහම සැසඳීමට උත්සාහ ගැනීමත් සමඟම එය බලවත්ම අවුලකටද හේතු පාදක විය. මේ අවුල කොතරම් බලවත් වීද යත්, එදා බුදුපියාණන් දේශණාකර වදාළ මාර්ග චරියාව යටපත් වී ගොස් භක්තියෙන් හා විශ්වාසයෙන් අදහන තවත් එක ආගමක් මතු වීමයි. බුද්ධාගම යන නමින් හැඳින්වීමටත් වඩා, බලවත්ම විනාශයක් වූයේ එදා පෙරදිග ප්‍රචලිතව පැවැති වෙනත් බලවත්, පිලිගත් ආගම් වන වේද ආගම, ශිව ආගම, ජෛන ආගම හා උපනිෂද් දර්ශනය වැනි දේවවාදී ආගම්වල විශ්වාස කල, භක්තියෙන් ඇදහූ බොහෝ ආගමික මතිමතාන්තර හා සංකල්පයන්ද පසුකාලීනව, ක්‍රම ක්‍රමයෙන් බුද්ධාගමටත් වැද්ද ගැනීම නිසයි.

පෙරදිග ආගම්වල එදා ජනප්‍රියව භාවිතා කළ සම්මතයෙන් පිළිගත්, යාඥාක්‍රම, පැතුම් පැතීම, වැදුම් වැඳීම, මෙන්ම පුද පූජා පැවැත්වීමද, බුද්ධාගමටත් ඇතුලත් කර ගැනීම නිසා නිවන් අවබෝධ කර ගන්නට උපකාර වන සේ දේශණා කර වදාළ උතුම් විමුක්ති මාර්ග ප්‍රතිපදාව නමට පමණක්ම සීමා විය.

අද අපි සම්මතයෙන් අදහන මේ බුද්ධාගමෙහි, එදා දේශණාකර වදාළ බුදු දහමෙහි පෙන් වූ විමුක්ති මාර්ගය අනුගමනය කිරීමක් නැතිවා මෙන්ම, චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගන්නට උපකාර වන මඣ්ජිමා

පටිපදාවක්ද විග්‍රහ කර දේශණා කරන්නේ නැත. මැදුම් පිළිවෙත, මැද මාවත යනුවෙන් වැරදියට පරිවර්තනය කරගෙන අද භාවිතා කරණ මඣ්ජිමා පටිපදාව බුදුපියාණන් එදා දේශණා කළ දහමට ඉඳුරාම වෙනස් දෙයකි. වෙනස් විග්‍රහයකි.

අපායෙන් බේරෙන්නට සහ මතු මතුත් දෙව් මිනිස් සැප සම්පත් ලබමින් සංසාර ගමන දිගින් දිගටම යහපත් ආකාරයෙන් පවත්වාගෙන යන්නට උපකාර වන දහමක් - මාර්ග ප්‍රතිපදාවක් - අද බුද්ධාගමෙහිදී උගන්වයි. අපායෙන් බේරෙන්නට සහ දෙව් මිනිස් සැප සම්පත් ලබන්නට පිංකම් කරන ප්‍රාර්ථනා පතන, බෞද්ධයින් පිරිසක් බිහිකිරීම පිරිසිදු බුදුදහමේ පරමාර්ථය නොවේ. මතු බුදු බව පත පතා බෝධිසත්ව පෙරුම් පුරමින් පිංකම් කිරීම මහායාන බුද්ධාගමෙන් ලත් වැරදි ආභාෂයකි. එයද සංසාර පැවැත්ම පවත්වා ගෙන යන්නට සැකසූ උපායකි.

කාම ලෝක වල, සුගති ලෝක වල මතු මතුත් අතරමංවන ක්‍රමවේදයක නිවනක් නැත. රජ සැප, දෙව් සැප හෝ බ්‍රහ්ම සැප ලබන මේ කොතනකවත්ම නිවනක් නැත. ඒ සියළු සැප සම්පත් ද යම් දිනෙක අවසන් වී දුක නියත වශයෙන්ම උරුම වෙයි. මේ නිසා දෙව් මිනිස් සැප සම්පත් ප්‍රාර්ථනා කරමින් පින් දහම් කිරීම බුද්ධාගමට ගැලපුනත්, බුදු දහමට නම් නොගැලපෙයි. මේ කොතනක හෝ පැවැත්මක් පවත්වාගෙන යන්නට කටයුතු කරයි නම් එතැන නිවනක් නැත. නිවනේ පැවැත්මක් නැත. අජරාමර සැපතක්ද නැත. පැවැත්මේ නිවනක් ද නැත.

බටහිර රටවලදී මෑත කාලයකදී උපත ලැබූ නවීන විද්‍යාව යැයි නම් කරන විද්‍යාවත්, බුදු දහමේ විජ්ජා උදපාදී, විජ්ජා අධිගතා යනාදී පද වලින් අර්ථ ගන්වන විද්‍යාවත් කිසිසේත්ම සංසන්දනය කළ හැකි එකක් නොවේ. මේ අනුව නවීන විද්‍යාව හා බුදු දහම සංසන්දනය කරන්නට යාම පුහුදුන් ක්‍රියාවකි. බුද්ධාගම සහ නවීන විද්‍යාව සංසන්දනය කරන්නට යාම ඕනෑම කෙනෙකුට කල හැකිය. පෙර අපර දෙදිගම බොහෝ අතීතයේ විසූ උගතුන් මෙන්ම නූතන විද්වතුන් ද බුද්ධාගම හා නවීන විද්‍යාව සසඳන්නට මහත් වැර වෑයම් යොදා පොත්පත් ලියා ප්‍රසිද්ධ කර ඇත. නමුත් ඒ කිසිම



විද්වතෙකු බුදු දහමේ පෙන්වා දුන් "මාර්ග චරියාව" නිවැරදිවම අවබෝධ කර ගත් උගතුන් යැයි ප්‍රකාශ කළ නොහැකිය. මාර්ග චරියාව නිවැරදිව අවබෝධ කරගත් යමෙකු වේනම් ඔහු චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගත්තෙකුද වන්නේමය. මේ අනුව පෘතග්ජන පුහුදුන්, උගතුන්, වියතුන් බුද්ධාගම, බුද්ධ දර්ශණය හෝ බෞද්ධ සංස්කෘතිය හදාරා ඒ දැනුමෙන් ලියූ පොත්පත් නිවන් දකින්නට උපකාර වන්නේද නැත. ඒවා උගත්කම දැනුම, මානය, මමත්වය දියුණු කරගෙන ලෝකය තුල අතරමං වන්නට නම් බලවත් ලෙසම උපකාර වෙනු ඇත. තුන් ලෝකයෙන්ම එතෙරවීම නිවනයි.

**ලෝකෙන් උතුම් රට සිරි ලංකාවයි.**

"ලෝකෙන් උතුම් රට සිරි ලංකාවයි" යනුවෙන් ගායනා කරන පැරණි ගීතයක් ඔබත් අසන්නට ඇතැයි සිතමි. ඔබ මේ ගීතය ශ්‍රවණය කරන කොයි යම් මොහොතක හෝ මෙහි ඇති ගාම්භීර අර්ථය මෙන්ම පදවැල් වල ඇති අදහස් ගැනත් ගැඹුරින් සිතා බැලුවේද? මෙම පෘතුවිතලය තුල ඇති සිය ගණනක් වූ බලවත් හා දියුණු යැයි සම්මත රටවල් වලට වඩා මේ කුඩා රට උතුම්ම රට බවට පත්වන්නට මුල් වූ එකම විශේෂ හේතුවක් ඇත. මේ එකම හේතුව මේ දිවයින තුල බුද්ධ ශක්තිය පැවතීමයි. බුද්ධ ශක්තිය යනු බුදු දහමේ ශක්තියයි. "භව" උදුරා දැමීමේ ශක්තියයි.

බුදු දහම උපන්නේ මේ රටේය. මෙය බුදුන් උපන් දේශයයි යනුවෙන් පවසන්නේ අතීතයේ වර්තමානයේ මෙන්ම අනාගතයේත් යම් දිනයකද උතුම් බුදු දහම යලි මතුවන්නේද මේ මධ්‍ය මණ්ඩලය තුලින්ම වන නිසාය. මේ රට බුදුන් උපන් හෙල දීපයයි. ජන්බුද්වීපය යනු සිවුහෙලයෙන් එක දීපයක් ලෙසින් අතීතවංශ කථාවලත් අපේ කඩඉම් පොත්වලත් පැහැදිලිවම සටහන් කොට ඇත. (ජන්බුද්වීප කඩයිම් පොත කියවා බලන්න)

මේ රට "ප්‍රතිරූප දේශයයි" පුබ්බේත කත පුඤ්ඤතා ශක්තියෙන් යුතු, මඟඵල ලබන්නට සුදුසුකම් ලැබූ මිනිසුන් මෙන්ම, ජාත සෝතාපන්න

මිනිසුන්ද උපත ලබන්නේ මේ සිරි ලංකාව නමින් අද අප හඳුන්වන සිවු හෙලය තුලමය. බුද්ධ ධර්මය උපත ලැබූ, බුද්ධ ධර්මය ලේඛන ගත කර පවත්වා ගෙන යන , මතුවටත් චිරාත් කාලයක් පිරිසිදු බුදු දහම ආරක්ෂාවී පවතින උතුම් රට මේ සිරි ලංකාවයි.

ලෝකයේ බොහෝ රටවල මිනිසුන්ද අතීතයේදී බුද්ධාගම ඇදවූහ. අදටත් නාමික වශයෙන් බුද්ධාගම අදහන බොහෝ රටවල් ලෝකයේ පවතී. මේ හැම රටකම පවතින්නේ බුද්ධාගමක් මිස උතුම් බුදු දහම නොවේ. නිවන් දකින බුදු දහම වෙනත් රටක අතීතයේ පැවතුනේ යැයි කිව නොහැකිය. බුරුමය, තායිලන්තය, චීනය, කොරියාව, ටිබැටය, වියට්නාමය, ජපන් රට ආදී පිළිගත් සම්මත බුද්ධාගම අදහන බොහෝ රටවල් අද ලොව පැවතුනත්, නිවන් දකින්නට උපකාර වන නිවැරදි මාර්ග චරියාව පැහැදිලි කර දෙන උතුම් බුද්ධ ධර්මය කියා දෙයක් අද මේ කොයි රටක හෝ භාවිතයේ පවතින්නේද නැත. අතීතයේ ද භාවිතයේ පැවතියේ නැත. බුද්ධාගම යනුවෙන් සම්ප්‍රදායිකව භාවිතා කරන තවත් එක ආගමක් පමණක් මේ බෞද්ධ යැයි නම් කරන වෙනත් රටවල්වලද පවතී. මේ හෙළ බිමේ හැර වෙනත් එකද රටකවත් බුදු දහම හා බුද්ධාගම අතර ඇති පරමාර්ථීය වෙනස්කම් දැක ගන්නට හැකි තරමේ ඥාණ ශක්තියක් ඇති මිනිසුන් උපදින්නේද නැත. මේ කුඩාරට ලෝකයේ උතුම්ම උතුම් රට බවට පත් වන්නට හේතුපාදක වූ සියළුම කරුණුත්, ස්වභාවික පිහිටීමත් වෙනත් විවිධාකාර සාධකත් බුද්ධ ධර්මය නිසාම බුද්ධ ශක්තිය නිසාම අපට ලැබුණු දායාදයකි. වෙන මොන සම්මත ආගමක් ඇදහුවත් එය බුදු දහමේ ආශිර්වාදය ලබා ගන්නට බාධාවක් වන්නේද නැත.

එදා ගෞතම බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ යුගයේ මේ රටේ එකද බුද්ධාගම්කාරයෙකුවත් වාසය කලේ නැත. නමුත් බ්‍රහ්මජාල සූත්‍රයේ පෙන්වා දෙන පරිදි විවිධ ආගම් හැට ගණනක්ම එවකට මේ රටේ මුල් බැස ගෙන අදහමින් භාවිතයේ පැවතුනි. එදා බුදු දහම අසා නිවන් මගඵල ලබාගත් සියළු මිනිසුන් ඊට පෙර වෙනත් ආගමක් විශ්වාස කළ හා ඇදහූ මිනිසුන්මය. මේ අනුව බුදු දහම අනුගමනය කරන්නට සම්මත ආගමක් ඇදහීම බාධාවක් කරගත යුතු වන්නේද නොවේ.



**හෙළ බස, හෙළ ඉතිහාසය හා බුදු දහම**

රටක තරුණ පරපුර නිවැරදි නිවහල් චින්තනයක් කරා යොමු කරවන්නට නම් කුඩා කල පටන්ම දරුවන්ට තම මවු බසත් තම රටේ නිවැරදි ඉතිහාසයත් පිළිබඳව ඉගැන්වීම ජාතික අවශ්‍යතාවයකි. මේ රටේ මුල්ම දේශීය භාෂාවන් වූයේ මාගධි බසත් හෙල බසත්ය. මේ රටේ මුල්ම ඉතිහාසය වූයේ මහාවංශයේ සඳහන් වන පරිදි මහා සම්මත රාජ පරම්පරාවෙන් පැවත එන බුදුන් උපන් ජන්බුද්වීපයේ ඉතිහාසයයි. සිවු හෙලයේ ඉතිහාසයයි. විජය රජුගෙන් සිංහල ජාතිය බිහි වූ බව අමූලික බොරුවකි.

අපේ රටේ අතීත හෙලයින් භාවිතා කල මාගධී හා හෙල බස් වහර ක්‍රමයෙන් අසල්වැසි බලවත් රටෙන් ණයට ගත් සංකර සංස්කෘත භාෂාවෙන් හා වෙනත් පරභාෂාවන්ගෙන් ණයට ගත් බොහෝ වචන පසුව එකතුකර ගැනීම නිසා සංකර භාෂාවක් බවට පත් කර ගත් බවද දැනගත යුතුය.

1954 දී එතෙක් මාගධී බසින් පවත්වාගෙන ආ ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්ථනය කරන්නට රජයෙන්ම ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයක් පත්කළහ. මේ ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය සම්පූර්ණයෙන්ම වාගේ එදා අමරපුර නිකායට අයිති ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත විය. එදා ත්‍රිපිටකය සිංහලයට පරිවර්ථනය කල මේ උගත්, වියත් භික්ෂූන් වහන්සේලා ඒ සඳහා භාවිතා කල වචන වලින් සියයට හැටක්ම සංස්කෘත භාෂාවෙන් ණයට ගත් චංදස්වෛදික බසෙහි වචනයන්ය. මේ සංස්කෘත වචන සහිත කලවම් භාෂාව කිසිසේත්ම උතුම් බුද්ධ ධර්මය නිවැරදිව විග්‍රහ කරන්නට ගැලපෙන භාෂාවක් නොවේ. මාගධී පදවලින් එතෙක් කල් පවත්වාගෙන ආ පිරිසිදු ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්ථනය කිරීමේදී සිංහල දරුවෙකුට තේරුම් ගත නොහැකි ආකාරයට සංස්කෘත පදවැල් ඊට ඇතුලත් කලේ පරිවර්තකයින්ගේ ෂඩ් භාෂා පරමේෂ්ශ්වර දැනුම උලුප්පා පෙන්වන්නට මිස සරල, සුගම හෙල වහරට ගැලපෙන්නට නොවේ. සරල සුගම හෙල අරුත් ඇති වචන කොතෙකුත් අපට තිබුණත් පර බසින් ගත් සංස්කෘත සංකර පදයන් භාවිතා කරමින් ත්‍රිපිටකය සිංහලයට පරිවර්තනය

කලේ පරිවර්ථකයින්ගේ සංස්කෘත භාෂා දැනුම ඉස්මතු කර පෙන්වන්නට යැයි කෙලින්ම චෝදනා කල හැකිය. මෙයින් සිදු වූ නියත ප්‍රතිඵලයක් වූයේ සිංහලයට පරිවර්ථනය කල සිංහල ත්‍රිපිටකය කියවන  නවකයෙකුට ඒවා අපභ්‍රංස හෝ අංඩර දෙමළ මෙන් අර්ථයක් ධර්මයක් නැති, තේරුම් ගන්නට නොහැකි තත්වයට පත්වීමයි. මේ ආකාරයට පදපරම ලෙසින් ත්‍රිපිටකය සිංහල භාෂාවට පරිවර්ථනය කිරීමද බුදු දහමේ පෙන්වා වදාළ මාර්ග ප්‍රතිපදාව අභාවයට යන්නට බලවත්සේම හේතුවිය.

අපේම සිංහල වියතුන් ලියූ මහාවංශය, දීපවංශය හා වෙනත් හෙළ වංශ කථාවන්හි සඳහන්ව ඇති තොරතුරු වෙනත් රටකට අදාළ වූ දේවල් ලෙස නම් ගම් ලෙසින් පෙන්වා දී විවිධාකාර වූ තර්ක විතර්ක ඉදිරිපත් කරමින්, අපේ නිරවුල් හෙල ඉතිහාසය භාරතයට බාරදෙන්නට යාමද පහත් නින්දිත ක්‍රියාවකි. මේ වරදට මුල් වූයේ 1850-1900 අතර කාලය තුල අපේ ඉතිහාසය අලුතින් ලියා එලි දක්වන්නට උත්සාහ කළ ඉංග්‍රීසි හා වෙනත් විදේශීක ඉතිහාසඥයින් විසින් ලියූ දේවල් මෙන්ම පුරා විද්‍යාඥයින්ද විසින් ද ලියු දේවල්ය. ජෝර්ජ් ටර්නර්, ජේම්ස් ප්‍රින්සෙස්, කොඩ්රිංග්ටන්, කනින්හැම්, ගයිගර් පඬිතුමා, රිස් ඩේවිඩ්, එච්.සී.පී. බෙල් මෙන්ම ඒ ඉංග්‍රීසි මහත්වරුන් ගිය මගම අන්ධානුකරණයෙන් අනුගමනය කල අපේම කලු සුද්දෝද මේ විකෘති කිරීම් වලට වගකිව යුතුය. එය ඔවුන් විසින් අපට අපේ මතු පරපුරවලට කරන ලද බලවත්ම විනාශයකි.

මේ රටේදී ලියූ මහාවංශයේ දීපවංශයේ මෙන්ම අනිකුත් සියළුම වංශ කථාවන්හි එන  මහා සම්මත රාජ පරම්පරාවේ සිට සුද්දෝධන රජු දක්වා වූ සියළුම රජවරුන් මේ රටේ (සිවු හෙළය) රජකම් කළ රජුන්ය. රජවරුන්ගේ නම්ය. මේ රටේම විසූ හෙළ ගත්කතුවරුන් විසින්ම මුලින්ම ලියූ මේ අතීත පොත් පත් වල අතීතයේ භාවිතා කළ නම් ගම් වෙනත් රටක අයගේ නම් ගම් ලෙස වරදවා වටහා ගත්තේ විදේශික ගත්කතුරුවන් විසිනි. විජය රජු මෙහි පැමිණෙන්නට පෙරදීද මේ හෙළ බිමේ දියුණු සංස්කෘතියක්, ලේඛන කලාවක්, ශිල්ප ශාස්ත්‍ර මෙන්ම ඉතිහාසයක්ද අප සතුව තිබුණි. නමුත් ඒ අනුරාධපුරයේ නොවේ. නැගෙනහිර ප්‍රදේශවල, කන්ද උඩරට, සබරගමුවේ මෙන්ම රුහුනේ ප්‍රදේශවලය. එකල සිවුහෙළය



වශයෙන් සඳහන් කරනු ලැබුනේ ජන්බුද්වීපය , උතුරු කුරු ද්වීපය, අපර ගෝයානය හා පූර්ව විදේහයයි.

ත්‍රිපිටකය ලේඛන ගත කලේත් ත්‍රිපිටකයට කලින් මේ රටේදී ලියූ හෙල අටුවා පොත්පත් ලීවේත්, මේ හෙළ බීමේදීම බව අද වන විට බොහෝ ගිහි පැවිදි උගත් වියත් අයට පවා අමතකව ගොස් ඇත. මාගධී යනු මූල භාෂාවයි. ඒ මූල භාෂාවට අක්ෂරයන් නැත. මේ අනුව ගෞතම බුදුපියාණන් දේශණා කරන ලද උතුම් බුදු දහම වසර හාරසිය පනස් ගණනක්ම යනතුරු කටපාඩම් කරගෙන, වනපොත් කරගෙන පරම්පරාවෙන් පරම්පරාවට රැකගෙනවිත් ලේඛන ගතකලේ අපේම සිංහල හාමුදුරුවන්ය. සිංහල අකුරින්ය. පුස්කොල පොත්වල පන්හිදෙන් අකුරු ලියන කලාව අපේ හෙලදිව වැසියන්ට ඉන්දියාවෙන් පුරුදු පුහුණු කල දෙයක් නොවේ.

ත්‍රිපිටක ධර්මය ලේඛන ගත කිරීමේදී එවකට භාවිතා කරන ලද නම් ගම්, රාජධානි, පුරවරයන්, රජවරුන් , සිටුවරුන් මෙන්ම සියළු උපමා කථාත් මේ සිවුහෙළයට අදාලව එදා භාවිතා කරන ලද නම් ගම්ය. කල්යත්ම ඒ පැරණි නම් ගම්වලට අළුත් නම් ගම් පටබැඳ ගත්තද, ඒ සියලු පොත් පත් වලත් ලියවුනේ මේ සිවු හෙළයේ ඉතිහාස කථාවයි. එය කවදාවත් කාටවත් වෙනස් කළ නොහැකිය.

මේ අනුව අපේ තරුණ පාසැල් දරුවන් විශේෂයෙන්ම විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා තරුණ ගිහි පැවිදි සිසුන් විසින් සිය බසත්, සිය රට පිළිබඳව නිවැරදි ඉතිහාසයත් හොඳින්ම දැන ඉගෙන තේරුම් ගත යුතුය. අපේ රටේ ඉතිහාසය විකෘති කරලියු විදේශකයින් හා ඒ විදේශකයින්ගෙන් උපාධි ලබා ගන්නට අන්ධානුකරණයෙන් වැරදි දේ දිගටම අනුගමනය කරමින් දරුවන්ටත් වැරදි උගන්වන අපේ සමහරුන්ට දැන්වත් මේ කරුණු අවබෝධ කර දිය යුතුය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි පුරාවිද්‍යාව පිළිබඳව කටයුතු කරන බොහෝ පුද්ගලයිනුත් තම උපාධිය රැක ගන්නට දැන දැනම වැරදි දේවල් සනාථ කරන්නට ක්‍රියාකරන බවත් ඉතාමත්ම පැහැදිලි කරුණකි.

ඉන්දීය ගත්කතුවරුන් හා යුරෝපීය ගත්කතුවරුන් විසින් වරින්වර අපේ ඉතිහාසය ඔවුන්ට ගැලපෙන පරිදි ලියා අලුත්ම මතයන් ඉදිරිපත් කලත් අද වනවිට ඒ සියළු මතයන් අනාථ වන තැනට තොරතුරු හමුවෙමින් පවතී.

මේ ආකාරයටම අපේ තරුණ පරම්පරාවද බුද්ධාගම නම් වූ අදහන ආගමත් , බුදු දහමේ පෙන්වූ මාර්ග චරියාවත් යන දෙක අතර ඇති පරමාර්ථ වශයෙන් වූ වෙනස්කම් ගැනද අසාදැන ඉගෙන ගත යුතුය. අවබෝධයෙන් තේරුම් ගත යුතුය. අපේ හෙළබිම උපන් පුබ්බේත කත පුඤ්ඤතා ශක්තියක් ඇති හෙළ ජනයාට දේශණා කරන ලද මේ උතුම් මාර්ග ප්‍රතිපදාව ඇදගිල්ලක් බවට පත් කරන ලද්දේ පරදේශීන් විසිනි. විශේෂයෙන්ම භාරත දේශයේදී හා ටිබැටයේදී මෙන්ම වෙනත් පෙරදිග රටවලදීද පොතපත ලියා මහායානික හා තන්ත්‍රයානික මෙන්ම වෛතුල්‍යවාදී දේව ආගම් සංකල්ප සමඟ බුද්ධාගම සම්බන්ධ කර ගැනීමෙනි.

භාරතයේදී සංස්කෘත බසින් එදා මෙදා තුර ලියන ලද බොහෝ මහායානික බෞද්ධ පොත්පත් කියවා තේරුම් ගන්නටද අප උත්සාහ කළ යුතුය. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ආ යුගයේදී භාරතයේදී ලියන ලද සියළුම මහායානික පොත්පත් වලට ජෛන ආගමේ මෙන්ම උපනිෂද් දර්ශණයේද බලපෑම් තදින්ම ඇතුලත් වී ඇත. පුරාණ ග්‍රන්ථ වලින් ඇති වූ බලපෑමත් උපනිෂද් ග්‍රන්ථවල ආභාෂයත් දේව ආගම් නිසා ඇති වූ බලපෑම නිසාත් බුදු දහමට සිදුවූ හානිය බුදු දහමෙන් වෙන් කොට දැන හදුනා ගන්නට තරම් අපේ තරුණ පරපුර දක්ෂ විය යුතුය. නිදහස් නිවහල් චින්තන ශක්තියක් ඇති කර ගත යුතුයි. ආගමික බලපෑම් වලින් මිදී නිදහස් වන්නට ක්‍රියා කලයුතුය. භාරතයේ ප්‍රචලිතව පැවැති දේව ආගමික සංකල්ප නිසා පිරිසිදු බුදු දහම මාර්ග ප්‍රතිපදාවක තත්වයේ සිට භක්තියෙන් අදහන තවත් එක ආගමක් බවට පත් වූ අයුරු තේරුම් ගත යුතුයි. අධ්‍යනය කල යුතුය.

අපේ රටේ පාසල් වල දහම් පාසල්වල පිරිවෙන් වල පමණක් නොව උසස් විද්‍යායතන වල හා පාලි බෞද්ධ විශ්ව විද්‍යාලයේ පවා දරුවන්ට



උගන්වන්නේ නිවැරදි "බුදු දහම" නොවේ. බෞද්ධ දර්ශණය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය හා බුද්ධාගම යන විෂයන් තුල උතුම් "බුදු දහම" අඩංගු නොවේ. එහි ඇත්තේ වැරදි ඉතිහාසයකි. වැරදි භාෂාවකි. වැරදි ආගමකි. මේ විද්‍යායතන වල උගන්වන දේවල අනෙක් සියල්ලම තිබුණත් ඉගැන්නුවත් එහි නැති එකම දේ බුදු දහම පමණි. ඉන්දියාවෙන් හා පසුකාලීනව බටහිරෙන්ද ණයට ගත් බොහෝ දේ වැරදි සහිතව අද අපේ පාසැල් වලදී අපේ දරුවන්ට උගන්වති. අභව්‍යය, අද්භූත, ආශ්චර්යමත් බුද්ධ ඉතිහාසයක් දරුවන්ට උගන්වන බව දැන් දැන් බොහෝ දෙනා පිලිගනිති. මෙවැනි දෑ උගන්වා කුඩා කලම දරුවන්ගේ මනස විකෘති කරති.

අපේ සමාජය විශේෂයෙන්ම රටටම ආදර්ශමත් විය යුතු භික්ෂු සමාජය, අද මෙවන් ශෝචනීය තත්වයකට පත්වන්නට මුල් වූයේ අප අදහන බුද්ධාගම අද ව්‍යාපාරයක් තත්වයට පත් වීමයි. අද බොහෝ දෙනෙකු මහණ වෙන්නේ රැකියාවක්, ජීවන වෘත්තියක්, විදේශගත වීමක් හෝ පන්සල් දේපල පාලනයක් බලාපොරොත්තුවෙනි. දැන් දැන් දේශපාලන පරමාර්ථයක් ඇතිවත් නිලතල බලතල ලබාගන්නටත් බොහෝ දෙනෙකු මහණකමට පත්වෙති. ආගමේ නාමයෙන්ම විවිධාකාර වූ සංවිධාන, බලසේනා සංවිධාන ඇති කරගෙන පටු ආගමික ජාතික මෙන්ම දේශපාලනික අරමුණු ඇතිවද අද බෞද්ධ භික්ෂූන් පිල් බෙදී ක්‍රියා කරති.

අපේ සමාජය පිරිසිදු වෙන්නේත් පුරවැසියන් අවංක ලෙස ක්‍රියාකරන්නේත් සිල් රකින සමාජයක් බවට පත්වන්නේත් නියම නිවැරදි "ධම්මානු ධම්ම" ප්‍රතිපදාවම අනුගමනය කලොත් පමණි. මේ සඳහා බුදු දහමේ පෙන්වා වදාළ මාර්ග චරියාව තේරුම් ගෙන ජීවත්විය යුතුයි. දරුවන්ට කුඩා කල පටන්ම වැරදි ආදර්ශයක් ලබා දීමෙන් වැළකී නිවැරදි මඟ කියා දිය යුතුය.

බුද්ධ ධර්මය, හෙළ ඉතිහාසය හෙළ බස ආදී වශයෙන් පාසල් වල උගන්වන විෂයයන් පිළිබඳ නිර්දේශිත පොත්පත් ලියන අධ්‍යාපන බලධාරීන් ව පළමු කොටම දැනුවත් කළ යුතුය. ඔවුන්ට ආගම හා ධර්මය අතර ඇති වෙනස්කම් තේරුම් කර නොදී මේ සමාජය යහපත් මිනිසුන්

සහිත සමාජයක් බවට පත් කිරීම කළ නොහැකිය. හැම දේශපාලකයෙක්ම පටු හා පෞද්ගලික පරමාර්ථයන් අතහැර පොදුවේ යහපත් අවංක පරමාර්ථයන් සහිතව ක්‍රියාකරන්නන් බවට පත්කල යුතුයි.

## දර්ශණය, අභිධර්මය හා බුද්ධාගම

ආචාර්ය ඊ. ඩබ්ලිව් අධිකාරම් මහතා විසින් ලියූ "ලංකා ශාසන වංශය" නැමැති පොතේ එතුමා විසින් සඳහන්කර ඇත්තේ මෙසේය. "මාර්ග චරියාව යටපත් වී බුදු දහම අභාවයට පත්වන්නටත් අධ්‍යාපනය (ග්‍රන්ථ ධූරය) මහත් කොට සලකන්නටත් වූ හෙයින් බුද්ධාගමක්, බෞද්ධ දර්ශණයක් මෙන්ම අභිධර්මය නැමැති විෂයයක්ද අලුතින් උගන්වන්නට පටන් ගත්හ."

බෞද්ධ දර්ශණය බෞද්ධ සංස්කෘතිය හා අභිධර්මය ආදී වශයෙන් නිර්දේශකර විෂයයන් ලෙස මෙකල උගන්වන හා ඉගෙනගන්නා විෂයයන් අධ්‍යනය කිරීමෙන් පමණක් බුදු දහමේ පරමාර්ථය වශයෙන් පෙන්වා වදාළ මාර්ග චරියාව සම්පූර්ණ කර ගැනීමට ඒවා උපකාරයක් වන දේවල්ද නැතිනම් බාධකයක් වන දේවල් දැයි අපි විචාරාත්මකව සලකා බැලිය යුතුය. අද බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේත් මහා පිරිවෙන්වලත් වෙනත් විද්‍යාස්ථානවලත් රාජකීය පණ්ඩිත උපාධි සඳහාත් උගන්වන්නේත්, ඉගෙන ගන්නේත් අභිධර්මය හා බෞද්ධ දර්ශණය යනුවෙන් විෂයයන් දෙකකි.

බුදුපියාණන් වහන්සේ කිසිදිනක අභිධර්මය යැයි විෂයයක් අද භාවිතා කරන අර්ථයෙන් දේශණාකර නැත. දෙවියන්ට පමණක් තේරුම් ගත හැකි දෙවියන්ට පමණක් දේශණාකල ගැඹුරු ධර්මයක් ලෙසින් අදවන විට උගතුන් හදුන්වනු ලබන ආකාරයේ අභිධර්මයක් කිසිදිනක මාර්ග චරියාව දේශණාකල බුදුපියාණන් වහන්සේගේ බුද්ධ දේශණාවේ නම් අඩංගු නැත.

බුදුපියාණන් වහන්සේ පිරිනිවන් පා වදාරා වසර 700කට පමණ පසුව මහා භාරතයේ විසූ අසංගාචාර්යතුමා නම් මහායානික පඬිවරයා



විසින් රචනා කරන ලද සංස්කෘත පොතක් වූ "අභිධර්ම සමුච්චය" නම් වූ පොතෙන් මුල් වරට "අභිධර්මය විෂයයක්" ලෙසින් එළි දැක්වූහ.

මෙම "අභිධර්ම සමුච්චය" ආශ්‍රයෙන්ම ඊට පසුව ආ කාලෙකදී අභිධර්මාර්ථ සංග්‍රහය නමින් සිංහල බසින්ද පොතක් ලියන ලදී. අභිධම්ම අට්ඨ කථා නමින් පාළි බසින්ද අටුවා පොතක් හෙල බීමේදීම ලියා ඇත. මේ පොත් තුනම එකතු කරගෙන අදවන විට අභිධර්මය නැමැති විෂයය උසස් අධ්‍යාපන ආයතන වලදී උගන්වනු ලබයි. බෞද්ධ දර්ශණය නැමැති විෂයටත් භාවිතා කරන්නේ මේ පොත් පෙළ ඇතුළු තවත් පාලි අට්ඨ කථාපොත් කිහිපයකි. (විශුද්ධි මාර්ගය ඇතුළු අටුවා පොත් පෙල)

හෙලදිව බෞද්ධයා ක්‍රමයෙන් මාර්ග චරියාවෙන් හා ධම්මානුධම්ම ප්‍රතිපදාවෙන් පිරිහෙන්නට මෙන්ම ප්‍රාර්ථනාවකට පමණක් සීමා වන්නටත් හේතු වූයේත් මහායාන බුද්ධාගමෙන් ණයට ගත් බෞද්ධ දර්ශණයක්, අභිධර්මයක් හා බෞද්ධ සංස්කෘතියක් හෙලදිව බෞද්ධයින් විසින්ද පසු කාලීනව කරපින්නා ගැනීමයි. බෞද්ධ දර්ශණය, අභිධර්මය හා බෞද්ධ සංස්කෘතිය යන විෂයයන් තුනම විද්‍යාස්ථානවල ඉගෙනගෙන උගත්කමක්, උපාධියක් ලබාගන්නට උපකාර වන නමුත්, මාර්ග චරියාව සම්පූර්ණ කර ගන්නට නම් සංසාර දුකෙන් මිදී නිදහස් වන්නට නම් එයම බලවත්ම බාධකයක් වූ බවද ඉතාම පැහැදිලිය.

උගත් ගිහි පැවිදි දෙපිරිසම බුද්ධාගම යයි අද සළකන්නේ බෞද්ධ දර්ශණය අභිධර්මය, බෞද්ධ සංස්කෘතිය හා බෞද්ධ ඉතිහාසය යන විෂයයන් පන්ති කාමර තුලදී ඉගැන්වීමයි. අධ්‍යයනය කිරීමයි. හැදෑරීමයි. ග්‍රන්ථධූරය පිරීමයි. උගත් වියත් ගිහි පැවැදි ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයම තම සිතුම් පැතුම්, හැසිරීම් රටාවන් , චරියා රටාවන්ද, සිරිත් විරිත් ද මේ බෞද්ධ දර්ශණය හා සංස්කෘතිය අනුවම හැඩ ගසා ගන්නටත් උත්සාහ කළහ. මේ අනුව බුදුදහමෙන් පෙන්වා වදාල ප්‍රායෝගිකවම අනුගමනය කර, අත්විඳගත යුතු උතුම් විමුක්ති මාර්ගය මේ වැරදි දර්ශණය හේතු කොට ගෙනම අභාවයට පත් වූහ. මේ අනුව නිවන් පැතීම, පිංකම් කරමින් දෙව් මිනිස් සැප සම්පත් පැතීම, බෝසත් පෙරුම් පිරීම, මතු බුදුවන බුදුන් දැක නිවන් පැතීම යනාදී දේ බුද්ධාගම ලෙසින් පිළිගත්හ.

"මජ්ඣිමා පටිපදා" යන්න මැද මාවතක් , (Middle Parth) මධ්‍යම ප්‍රතිපදාවක් යන වැරදි අර්ථයෙන් තේරුම් කරන්නට පටන් ගත්හ. මේ මාගධී පද තුනෙහි අර්ථය තේරුම් ගන්නට බැරි වූ සීමිත බුද්ධාගම්කාරයෝ කවදාවත් හමු නොවන මැද මාවතක් හොයමින් සංසාර ගමනේ මංමුලා වී සිටිති.

**මජ්ඣිමා පටිපදා යනු මැද මාවත නොවේ.**

බුද්ධාගමේ අද සම්මතයෙන් විග්‍රහ කරනු ලබන ආකාරයේ උගන්වනු ලබන ආකාරයේ මැද මාවතක් හෝ මැදුම් පිළිවෙතක් හෝ ලෙසින් සම්මා අංග අට විග්‍රහ කිරීම සම්පූර්ණයෙන්ම වැරදිය, මජ්ඣිමා පටිපදා යනුවෙන් (ආර්ය අශ්ඨාංගික මාර්ගය = සම්මා අංග අට) උතුම් බුදු දහමෙහි විග්‍රහ කර පෙන්වූයේ මත්වීමෙන් (මදයෙන්) මිදී නිදහස් වන ප්‍රතිපදාව යන පිරිසිදු අර්ථයෙනි. රාග මතින්, ද්වේශ මතින්, මෝහ මතින්, මාන මතින් මිදී නිදහස් වන ප්‍රතිපදාව = මාර්ග චරියාව = මජ්ඣිමා පටිපදාව ලෙසත් සම්මා අංග අට ලෙසත් බුද්ධ දේශණාවේ පැහැදිලිව පිරිසිදුව දේශණා කර තිබියදීත් මැද මාවතක් සොයමින් අතරමං වීමට ක්‍රියා කිරීම බුද්ධාගමේ සම්මත පිළිවෙතයි.

"මා" යන මාගධි පදයේ තේරුම යමකින් සහමුලින්ම මිදී නිදහස් වීම (අනුත්පාද නිරෝධය) නැවත සිතේ කෙලෙස් නොඋපදින ලෙසින් මිදී නිදහස් වීම යන තේරුමයි. සිතකම උපදින, රාගයෙන් මත්වන ස්වභාවය , ද්වේෂයෙන් මත්වන ස්වභාවය, මෝහයෙන් මත්වන ස්වභාවය විග්‍රහ කළේ "මජ්ඣි" යන පදයෙනි. තමන්ගේම සිත රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් මත්වීම නිසාම මේ සංසාර දුක තමන්ම නිර්මාණය කර ගන්නා බව යමෙකු යථාපරිදි දැකගතහොත් පමණක්ම මේ මත්වීමෙන් මිදී නිදහස්ව සිත උපෙක්ඛා තත්වයට පත්කර ගත හැකිවෙයි.

"මජ්ඣිමා" ගම සූත්‍ර ධර්ම යනුවෙන් මජ්ඣිමා නිකායේ එන සූත්‍ර 152 ටම මාගධී භාෂාවෙන් නම් කර ඇත. (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ වල, මජ්ඣිමා නිකාය ග්‍රන්ථවල සංඥාපනය බලන්න) මජ්ඣිමා නිකායේ



පළවැනිම සූත්‍රයෙන් විග්‍රහවන්නේ "මා" යන පදය පිළිබඳවයි. මෙය මූලපරියාය සූත්‍රය ලෙසින් බුදු දහමේ විග්‍රහ කරදී ඇත. මේ අනුව මඤ්ඤතා තත්වය " මා මඤ්ඤති, න මඤ්ඤති" තත්වයට පත්කරන ක්‍රමවේදය(පරියාය)විග්‍රහ කලේ මූලපරියාය සූත්‍රයෙනි. මජ්ඣිමා නිකායේ එන සූත්‍ර ධර්ම සියල්ලම පෙළ ගසා ඉදිරිපත් කර ඇත්තේ මේ කාර්යය ඉෂ්ඨ සිද්ධ කර ගන්නට උපකාර වන පරිදි "මජ්ඣිමා ගම " ධර්මයන් හැටියටය. තවත් අතකින් විග්‍රහ කළහොත් "මජ්ඣිමා" යනු කෙලෙස් වලින් මිදී නිදහස් වීමය. කෙලෙස් උපදින්නේම සිතක් තුල මත්වීමක් ඇතිවන නිසාය. මත්වීම යනු "මද" ලෙසින්ද සිංහල බසින් සඳහන් කළ හැකිය. ප්‍රිය දේට ඇලෙන්නේ මත්වීම නිසාය. අප්‍රිය දේ සමඟ ගැටෙන්නේත් මත්වීම නිසාය. අදුක්ඛම අසුඛ අතර මනින්නේත් මුලාවන්නේත් මත්වීම නිසාය. එසේනම් සසරට බැදෙන සියළුම සම්බන්ධතා ඇති කරවන මූල හේතුව සිතේ උපත ලබන මත්වීමේ ස්වභාවයයි. මදයයි. මත්වීම නිසා සිත ඒ මත් වූ රූපයෙහි ඇලෙයි. හා වෙයි, බැඳෙයි. එය "තණ්හා" යන මාගධී පදයෙන් විග්‍රහ කර ඇත. (යායං තණ්හා පොනෝභවිකා) පුන පුනාම බිහිවන්නේ, උපදින්නේ මේ තන්හාව එක දිගටම සිතේ උපදින හේතුව නිසාමය.

"තණ්හා පච්චයා උපාදානං" යනු පංචස්කන්දයම උපාදානය කර ගන්නේ මේ මත්වීම නිසා ඇතිවන වේදනාවත්, වේදනාව නිසා උපදින තණ්හාවත්, තණ්හාව නිසා උපාදානය කර ගන්නට ඇති ආශාවත් නිසාය.

අවිද්‍යා මූලයෙන් විග්‍රහ කරන ලද මුළු පටිච්ච සමුප්පාද විග්‍රහයම සංසාර ගමනට පුද්ගලයෙකු සත්වයෙකු බැඳෙන, සම්බන්ධවන ආකාරය විග්‍රහ කරන්නකි. එය සිතේ මත්වීමක් මුල්කරගෙනම සිදුවෙයි. සිතේ ඇතිවන මෙම මත්වීමෙන් මිදී නිදහස් වීම සඳහා උපකාර කරගත යුතු ප්‍රතිපදාවන් බුදු දහම තුල මාර්ග චරියාවක් ලෙසින් විග්‍රහ කර දුන්හ. මේ මාර්ග චරියාව "මජ්ඣිමා ගම" සූත්‍ර ධර්ම වලින් විග්‍රහ කර දී ඇත. මෙය "මජ්ඣිමා" පටිපදාවයි. එනම් සිතේ උපදින රාග මදය, ද්වේශ මදය, මෝහ මදය, සහමුලින්ම කපා දැමීමට උපකාර වන්නා වූ මාර්ග ප්‍රතිපදාව මජ්ඣිමා පටිපදාවයි. (රාගක්ඛය, මෝහක්ඛය, ද්වේෂක්ඛය)

බුද්ධඝෝෂ හිමියන් විසින් ලියූ පොත්වල "මඣ්ඣිමා" ගම සූත්‍ර ධර්මයන් යනු "මැද" ප්‍රමාණයේ සූත්‍ර ධර්ම ලෙසින් වර්ග කර දක්වා ලියා මේ උතුම් ධර්මය පදපරම අර්ථයකට හැර වූ පසුව අපේ බොහෝ උගත් බෞද්ධයෝද එය අන්ධානුකරණයෙන් හිස්මුදුනින්ම පිළිගත්හ. ඒ අනුව මතින් මිදීම පැත්තකට දමා මැද අතරමං වන්නට ක්‍රියාකරන පිරිසක් බවට බුද්ධාගම අදහන්නන් පත්විය.

"මත්වීම" සිදුවන්නේ රා අරක්කු වැනි මත්පැන් බීමෙන් පමණක්ම යැයි උගන්වන බෞද්ධයින්ට පදපරම ලෙසින් බණ දේශනා කරන, දේශකයින්ද අද ඇත. සුරාමේරය මඣ්ඣිපමා දට්ඨානා වේරමනී" යනු සියළු මත්වීම් වලින් ප්‍රමාදයට පත්වන බව ප්‍රකාශ කළ තැනකි. මෙහිදී ප්‍රමාද වෙන්නේ නිවනයි. "රහ මෙර" යනු සිත ගත මත් කරවන - මදයට පත් කරවන සියලු හේතු විග්‍රහ කළ තැනක් මිස රා අරක්කු වැනි මත්පැන් නිසා පමණක් වන තාවකාලික මත්වීම පමණක්ම විග්‍රහ කිරීම නොවේ. රා අරක්කු නිසාද පුද්ගලයෙකුගේ ගත සිත දෙකම මත්වේ. නමුත් රාග මදය, ද්වේශ මදය, මෝහ මදය, මාන මදය, රූප මදය, ධන මදය, බල මදය, නිල මදය, යොබ්බන මදය, නිරෝගී මදය, කුල මදය, ආදී වශයෙන් සිතක හට ගන්නා සියළු "රහමෙර" හට ගන්නට හේතු පාදක වන කරුණු බුදු දහමේදී පැහැදිලිව විග්‍රහ කර දී ඇත. මේ සියලු මත්වීම් වලින් සිත මුදවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාව විග්‍රහ කලේ "මඣ්ඣිමා පටිපදා" යන බුද්ධ භාෂිතයෙනි. මෙය මැද මාවතක් ලෙසින් ගත්තේ බුද්ධාගමේදීය. උතුම් බුදු දහමේදි එය මදයෙන් (මත්වීමෙන්) මිදී නිදහස් වීමයි. ඇලපිල්ලක් නිසා "මද " මැද බවට පත් කර ගැනීම නිසා මිනිසුන්ට පහසුවෙන්ම සාක්ෂාත් කරගන්නට තිබූ නිවනට මඟ ඇහිරී ගිය බව කවුරුත් මෙහිදී කල්පනා කළ යුතුය. මැද මාවත, මධ්‍යම ප්‍රතිපදාව (Middle Parth) ආදී වැරදි ව්‍යවහාර පදයන් දැන්වත් අපි භාවිතයෙන් ඉවත් කළ යුතුයි.

ධම්මචක්කපවත්තන සූත්‍රයේ මඣ්ඣිමා පටිපදාව විග්‍රහ කලේ "සම්මා" අංග අටක් හැටියටය. මේ වචන දෙකේම "මා" යන පදයෙන් විග්‍රහ වන්නේ මත්වීමෙන් - මදයෙන් මිදී නිදහස් වීම යන අර්ථයයි. "සං" යන



පදයෙන් පෙන්වුයේ සංසාරයට බැඳෙන රාග මදය, ද්වේෂ මදය, මෝහ මදය යන කෙලෙස්ගති තුනේම එකතුව එක පදයකින් විග්‍රහ කර පෙන්වා දීමකි. මේ අනුව "සංමා" (සම්මා) යනු සංසාර ගමනට බැඳෙන බැම්ම සකස්කරන මත්වීමෙන් මිදී නිදහස් වීම යන අර්ථයයි. "අනේක ජාති සංසාරං " ගාථාවේදි විග්‍රහ කලේ පෘතග්ජන ලෝකයා අනේක ආකාරයෙන් සසර දුකට බැඳෙන්නේ සං (රාග, ද්වේෂ, මෝහ) සාරවත් සේ දකින නිසාය. මෙහි අසාරත්වය - නිස්සාර බව, අනාථ බව නොදකින තාක්කල් සසර ගමන නිර්මාණය කරගන්නේ මත්වීමට හේතුවන රාගයෙන් ද්වේශයෙන් මෝහයෙන් කටයුතු කරන හෙයිනි. සසරට බැඳෙන බාන සකස්කර ගන්නා හෙයිනි.

මේ අනුව බුදු දහමට අනුව "මඣ්ඣිමා පටිපදා" මඣ්ඣිමා ගම" සූත්‍ර ධම් ආදී පදවලින් අර්ථ ගැන්වූයේ සසරට බැඳෙන මදයෙන් මත්වීමෙන් මිදී නිදහස් වීමට අනුගමනය කළයුතු පිළිවෙතයි.

සම්මා අංග අටකින් විග්‍රහ කලේද සසරට බැඳෙන බැම් උපත ලබන, මත්වීමෙන් මදයෙන් මීදි නිදහස් වන, ප්‍රතිපදාව විග්‍රහ කිරීමටයි. "සම්මා " යන පදයෙන් අද බුද්ධාගමේදී විස්තර කරන්නේ හොඳ, යහපත්, නිවැරදි ආදී අර්ථයන් ගෙනහැර පෑමයි. මෙය ආගමකට ගැලපුනත්, බුදු දහමේදී පෙන්වා දෙන පරිදි මොන විධියේ හොඳ, යහපත් තැනක උපත ලැබීමත් සම්බන්ධවීමත් උපාදානය කරගැනීමක්ම ලෙසින් විග්‍රහ කරන නිසා "සම්මා" යනු සසරට සම්බන්ධ වන සියලු බන්ධන වලින් මිදී නිදහස් වීම ලෙසින් තේරුම් ගත යුතුය.

බුද්ධාගමක් අදහන්නාට "මාර්ග චරියාව" අමතකව ගියහ. විමුක්ති මාර්ගය හා නිවන් දැකීම යන්න ප්‍රාර්ථනාවකට පමණක් සීමා විය. අභිධර්මය හා බෞද්ධ දර්ශණය උපාධි ලබා ගෙන දැනුම වඩා වර්ධනය කරගන්නා අධ්‍යයන මාර්ගයක් පමණක්ම විය. රාගයෙන්, ද්වේශයෙන් හා මෝහයෙන් කටයුතු කරන, සංවර්ධනය ලෞකික වශයෙන් පමණක් ඉලක්ක කරගත්, බුද්ධාගම්කාරයින් පිරිසක් රටට උරුම කර දෙන්නට මේ සියල්ලම හේතුපාදක විය.

## ආගම හා සංස්කෘතිය

ආගමත් සමගම සංස්කෘතියක්ද රටක බිහිවෙයි. සාහිත්‍යය , චිත්‍ර කලාව, මූර්ති ශිල්පය, සංගීතය හා වෙනත් ලෞකික වූ ආමිස වශයෙන් සිත සමථයට පත්කරවන බොහෝ දෑ ඉගෙනගෙන දැනුවත් වී, එයින් පන්නරයක් ලැබ ගැනීමත් ලෞකික වශයෙන් ආස්වාදයක් ලබා ගැනීමත් ආගමක හා සංස්කෘතියක දියුණුවටද හේතුවෙයි. මෙසේ ලෞකික ආශ්වාදයක් සඳහා ගිජුවන පෘතග්ජන මිනිසාගේ සිතිවිලි හා ක්‍රියාකාරකම්ද සමාජ සම්මත හැසිරීම් රටාවද , චාරිත්‍ර වාරිත්‍ර ද ඒ ආගමට අනුකූලව හැඩ ගැසෙයි. මේ සියල්ලම සංස්කෘතිකාංග වශයෙන් ද අපි පොදුවේ නම් කරමු.

අප රටේත් බුද්ධාගමත් සමඟම පෙරහර, වෙසක් තොරන්, ආගමික උත්සව, කඨින පූජා පිංකම් මෙන්ම බුද්ධ රාජ මාලිගා තැනීමද මේ වන විට බිහි වී තිබේ. මේ හැර හැම ගමකම පිංකම් කරන මුවාවෙන් සල්පිල් පැවැත්වීම, නාට්‍ය පෙන්වීම, නාඩගම් නැටීම, සංගීත සංදර්ශනය පැවැත්වීම හා කවි බණ කීමද අද කර ගෙන යනු  ලබයි. ආගමික හා සංස්කෘතිකාංග ලෙසින් මේවා පොදු ජනයා අතරේ ජනප්‍රිය තත්වයටද පත් වී ඇත. මේ සියලුම සංස්කෘතිකාංග අද ආගමේ නාමයෙන්ම කරන දේවල්ය. ලෞකික හා භෞතික සංස්කෘතිකාංග වශයෙන් මේවා යම්කිසි සමාජමය වටිනාකමක් ගත්තද මේ සියල්ලම අද වන විට ව්‍යාපාරික තත්වයකට පත්වීම කණගාටුවට කරණකි.

මෝඩ ගැමි බෞද්ධයාව මුලා කරමින් පිංකමක් කරන මුවාවෙන්, බෝධි පූජාවක් කරන මුවාවෙන්, පන්සලේදී මුදල් එකතු කරන ව්‍යාපාරයක් කිරීම අද බහුලවම දකින්නට ඇත. බෝධි ප්‍රාකාරය තැනීම, චෛත්‍යයක් ඉදිකිරීම, වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඉදිරියට දමා පිංකමක් කිරීම, ධර්ම දේශණාවක් පැවැත්වීම අද වන විට සම්මත ක්‍රමයයි. නමුත් පන්සලේදී ධර්ම දේශණාවක් පැවැත්විය යුත්තේ මිනිසුන්ට "මාර්ග චරියාව" තේරුම් කරදී දහම් දැනුම ලබාදී චතුරාර්ය සත්‍යයන් අවබෝධ කර ගන්නට උපකාර වන ආකාරයෙනි. අද එකදු සම්මත පන්සලකවත් මේ



පිරිසිදු පරමාර්ථයෙන් බුදුදහම දේශණා කරන්නේ නැත. ධර්ම ඥාණය ලබාදීම දෙවන හෝ තුන්වැනි තැනට දමා ගොඩනැගිලි තැනීම පිලිම ඉදි කිරීම හෝ වෙනත් ලෞකික කාර්යයක් පෙරටු කොට ගෙන නමට පමණක් ධර්ම දේශණාවක් පවත්වන ක්‍රමයක් රට තුල ප්‍රචලිතව ඇත. මේ කවුරුන් රවට්ටන්ට කරන දේවල් දැයි විමසීම හැර අපට අද කල හැකි වෙනත් දෙයක් නැත.

ආදර්ශමත්ව කිසිදු බාහිර අපේක්ෂාවක් හෝ මිල මුදල් එකතු කිරීමක් හෝ නැතිව, නිවැරදි "මාර්ග චරියාවම" පැහැදිලි කරදී චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගන්නටම උපකාර වන සේ ධර්ම දේශණා පැවැත්වීමෙන්ම පමණක් මේ ක්‍රමය ඉතා ඉක්මනින්ම වෙනස් කළ යුතුය.

අද ගුවන් විදුලි මාධ්‍යයන්හි, රූපවාහිනී මාධ්‍යයන්හි ප්‍රසිද්ධ දේශකයින් වහන්සේ කෙනෙකු ලවා ලෝකයටම ඇසෙන්නට ධර්ම දේශණා කරණ ක්‍රමයක් ඉතාම ජනප්‍රිය වී ඇත. මේ සඳහා විශාල මුදලක්ද ඒ ඒ ආයතන වලට ගෙවන්නට සිදුවෙයි. මෙහිදී තම මියගිය ඥාතියාට පිං අනුමෝදන් කිරීම කෙරෙහි හෝ තමන්ගේ නම් ගම් කියවා ප්‍රසිද්ධියක් ප්‍රචාරයක් සඳහා කරන ක්‍රියාවක් බවට පත් වීම නිසා විනාඩි හතලිස් පහක් හෝ ඊටත් අඩු කාලයදී දහම් දැනුමක් ලබා දීම කළ හැකි දැයි කල්පනා කළ යුතුය. සංනිවේදන මාධ්‍යයන් තුලින් කරන මෙවැනි බොහෝ දේවල් රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්ම කරන කියන හිතන දේවල් වන නිසාම ඒවාට සන්නිවේදන යන නමද යොදා ඇත. මේවා ද  ආගමේ නාමයෙන්ම කරන ව්‍යාපාරික  කොටසකටම අයත් මුදල් එකතු කරන්නට යෙදු උපායන්ය.

## සම්මුති සත්‍යයය හා පරමාර්ථ සත්‍යයය

මිනිසෙකුට පමණක්ම තේරුම් ගතහැකි සම්මුති සත්‍යයකුත්, නිවන් දකින්නට උපකාර වන පරමාර්ථ සත්‍යයකුත් කියා සත්‍යයන් දෙකක්ම ලොව පවතින බව යථාපරිදි තේරුම් ගැනීම නිවන් අවබෝධයටත් උපකාර වෙයි. පෘතග්ජන ලෝක සත්වයාට සම්මුති සත්‍යය මිස පරමාර්ථ සත්‍යය

යැයි දෙයක් ඇතැයි කියා සිතා ගන්නටවත් බැරිය. සම්මුති සත්‍යයෙහි පිහිටා ක්‍රියා කිරීම මෙලොව ජීවිතය යහපත් සේ දිගටම පවත්වාගෙන යාමට නම් බෙහෙවින්ම උපකාර වේ. මෙහිදී ලෞකිකත්වය තුල සිදුවන අතරමංවීම නොපෙනී යයි.

බුද්ධ දේශණාවේ විග්‍රහ කරන පරමාර්ථ සත්‍යය හා සම්මුති සත්‍යයය යන දෙක පසුකාලීනව අර්ථ කථා ලියූ බෞද්ධ උගතුන් හා පණ්ඩිතයින් විසින් වැරදි ආකාරයට අර්ථ කථනය කරන්නට ගත් උත්සාහයන් නිසා පිරිසිදු බුදු දහම විකෘති විය. "මෙලොව ජීවත් වීම එකම දුක් කඳකැයි" බුදුපියාණන් වහන්සේ නම් කිසිම තැනකදී දේශණාකර නැත. නමුත් පසුකාලීනව බුදු දහමට අර්ථ කථා ලියූ බොහෝ බෞද්ධ පඬිවරුන් මෙලොව මහා දුක් කඳකැයි, එකම දුක් කඳකැයි, අතිශයෝක්තියෙන්ම ලියා දක්වන්නට උත්සාහ ගත්හ. මෙයට හේතුව පරමාර්ථ සත්‍යයය හා නිරාමිස සුවය පිළිබඳව යථා භූත ඥාන දර්ශණයක් නැති කමයි.

පටිච්චසමුප්පාද විග්‍රහය නිවැරදිව තේරුම් ගත් කෙනෙකුටම පමණක් දුක් සැප කියා දෙකක්ම ලොව පවතින බවත්, ආමිස සැප හා නිරාමිස සැප යනුවෙන් දෙකක් පවතින බවත් තේරුම් ගත හැකිය. දුක මෙන්ම සැපද යන දෙකම නිර්මාණය කරගන්නේ තමන් කරන කියන හිතන හේතුන්ම පදනම් කරගෙන බවත් ධර්මතාවය තුලින්ම තේරුම් ගැනීමයි. මේ අනුසාරයෙන්ම නිවන යනු සංඛාර උපේක්ඛා ඥාණයෙන් අටලෝ දහම දෙසම බලා සියල්ල කෙරෙහි නොඇලී, නොගැටී, මුලා නොවී උපේක්ඛා සිතක් පවත්වාගෙන යාම බවත්, පරමාර්ථ සත්‍යය තේරුම් ගැනීමට සංඛාර උපේක්ඛා ඥාණය මුල්වන බවත් තේරුම් ගත යුතුය. අපට දුක සැප උරුම වන්නේ සිත තුල අපේක්ෂාවක් ඇති වූ නිසයි. ඒ තමන් අපේක්ෂාකල දේ ඒ ආකාරයෙන්ම සිදු නොවන නොපවතින නොනවතින එකක් වන නිසා දුක ඇති වේ. අපේක්ෂාව දැඩි වෙත්ම සිතේ උපදින නිච්ච, සුඛ, සුව, අත්ත යන නිශ්චිත තත්වයන් පිළිබඳවත් සිතින්ම බැඳෙන තරමටම දුක උරුම වෙයි. අනිච්ච, දුක්ඛ, අනත්ත යන නියත සත්‍යයතාව පසක් කොට දැක ගත්තේ නම් කිසිම දුකක් උරුම වන්නේ නොවේ. ඒ අනිච්ච වූ දුක්ඛ වූ අනත්ත වූ පංචස්කන්දයම උපාදානය කර නොගන්නා හෙයිනි.



මේ අනුව " සබ්බේ සංඛාරා අනිච්චාති, සබ්බේ සංඛාරා දුක්ඛාති, සබ්බේ ධම්මා අනත්තාති, යදා පඤ්ඤාය පස්සති, අතනිබ්බිංදති දුක්ඛේ ඒස මග්ගෝ විශුද්ධියා " යන මේ පරම සත්‍යය පසක් කොට දැකීම මෙම මාගධී පදවලින් විග්‍රහ කළ අර්ථයයි.

මේ අනුව පරමාර්ථ සත්‍යය ප්‍රඥාවෙන් දැකගත යුතු පසක් කොට දැක ගත යුතු(ජානතෝ, පස්සතෝ) එකකි. මේ සඳහා සම්මත සත්‍යය විනිවිද බලන්නට , විනිවිද බලා දකින්නට, තම මනසේම ශක්තියක් උපදවා ගත යුතුයි. එයම විමුක්ති ඥාණ දර්ශණයයි.

සම්මතය හැමවිටම, හැමතැනකටම, හැම කෙනෙකුටම එකසේ ගැලපෙන දෙයක් නොවේ. කාලාමා සූත්‍රයේත් සතර මහපදේශ සූත්‍රයේත්, චංකි සූත්‍රයේත් තවත් සූත්‍ර ධර්ම ගණණාවකමත් සම්මතය කඩා බිඳ හෙලිය යුතු තැන් දක්වා ඇත. පරමාර්ථ සත්‍යය දැකීමට බලවත්ම බාධකයක් වන්නේ සම්මත සත්‍යය නිච්චසේ දකින හෙයිනි. අත්තසේ දකින හෙයිනි. සංකාර, විසංකාර කරන්නටත්, සන්ධි, විසන්ධි කරන්නටත් සංසාර සම්බන්ධතා වලින් මිදෙන්නටත්(සම්මා) සංවට්ටයෙන් මිදී විවට්ටේ ඥාණ දර්ශණය ලබාගන්නටත් යමෙකු තුල ශක්තියක් ඇති කරගැනීම බලවත්සේම නිවන් මඟට උපකාර වන්නකි. මේ අනුව නිවන් දැකීම නැමැති පරමාර්ථ සත්‍යය දැකිය හැක්කේ සම්මතයෙන්ද මිදී නිදහස් වීමෙන්මය. එය විමුක්ති ඥාණ දස්සනයයි.

අපි එදිනෙදා ජීවත්වන, ජීවිතය පවත්වාගෙන යන ලෞකික භෞතික ලෝකය දිගින් දිගටම යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට නම් සම්මතයන්ද බලවත්සේම උපකාරවෙයි. සියලුම අදහන ආගම්වල මෙන්ම භෞතික, ලෞකික ලෝකයා යහපත් බවට පත් කරන ක්‍රියාමාර්ග යන්ටද මුල් තැන ලබාදීමද දක්නට ඇත. මේ අනුවම සමාජයක ජීවත්වන්නන් හැටියට අපි පිළිගත් සම්මතයන්ටද ගරු කල යුතුය. නමුත් එහිදී පරමාර්ථ සත්‍යයන් දැක ගන්නට එයම බාධාවක් වේ නම් එහිදි විමසා බැලිය යුතුය.

සම්මතයන් රටෙන් රටට, පුද්ගයාගෙන් පුද්ගලයාට කාලයෙන් කාලයට පාලකයාගෙන් පාලකයාට යුගයෙන් යුගයට වෙනස්වන දෙයකි. සම්මතය සදාකාලික සත්‍යයක් නොවන්නේ මේ නිසාය. එය සර්වසාධාරණ එකක්ද නොවන නිසාත් පරමාර්ථ සත්‍යයෙන් වෙනස් වේ. නමුත් පරමාර්ථ සත්‍යයන් කවදාවත්ම එසේ වෙනස් නොවේ. බුදු දහමෙහි හරය වූ පටිච්ච සමුප්පාද විග්‍රයෙන් පෙන්වා දෙන ලද පරමාර්ථ සත්‍යය විග්‍රහය හැම තැනකටම, හැම රටකටම, හැම යුගයකටම, හැම පුද්ගලයෙකුටම, හැම අවස්ථාවකටම, හැම ධර්මතාවයකටම, හැම ආගමක් අදහන්නෙකුටමත්, පොදුය. බුදුදහම යනු පරම සත්‍යයයි. මේ නිසා බුදු දහම ආගමක් නොවේ. කිසිම ආගමකින්ද බුදුදහමේ පෙන්වන පරම සත්‍යය දැක ගත හැකි නොවේ. පටිච්ච සමුප්පාද ධර්මයෙන් පෙන්වා වදාල හේතු ඵල දහම මොන රජෙකුටවත්, මොන ආගම් ශාස්තෘන් කෙනෙකුටවත්, මොන දෙවියෙකුටවත් අකුරකින් ඇලපිල්ලකින්වත් හෝ වෙනස්කර ඉදිරිපත් කල හැකි දෙයක් නොවේ.

## සංසාර දුක හා විමුක්ති මාර්ගය

"බුදු දහම" පිලිබඳව අද බටහිර උගුතුන්ට මෙන්ම පෙරදිග ලෝකයේ උගතුන්ටද ලබා දී ඇති දැනුම සම්පූර්ණයෙන්ම වාගේ වැරදි සහගත දැනුමකි.

"මෙලොව ජීවිතය, ජීවත්වීම එකම දුක් කන්දරාවකි" යන වැරදි මතයක් අද බුද්ධාගමෙහිත් සමහරු උගන්වයි. මෙය පසුකාලීන පණ්ඩිතයින් විසින් හෝ උගතුන් විසින් හෝ නිර්මාණය කරගත් වැරදි මතයක් මිස බුදුපියාණන් දේශණාකරන ලද දෙයක් නොවේ. බුදුපියාණන් දේශණා කලේ, "සබ්බේ මේ පියේහි මනාපේහි නානාභාවෝ විනාභාවෝ" "සංසාරෝ මහබ්බයා" යනුවෙනි. මෙහි අදහස වැරදියට විග්‍රහ කල පණ්ඩිතයින් බුදු දහමම විකෘති කලහ. "සං" යනු රාග, ද්වේශ, මෝහ යන කෙලෙස් ගතීන්ය. මේ කෙලෙස් ගති වටිනවා, හොඳයි, ප්‍රියයි, මනාපයි,



සාරයි යනුවෙන් තීරණය කිරීම "සං සාරයි" කියා උපාදානය කර ගැනීමයි. යමෙකු මේ කෙලෙස් ගති වටිනවා හොඳයි සාරයි කියා ගෙන, ඒ අනුව කටයුතු කරන්නේ නම් ඔහුට මේ පැවැත්ම මහා භයකට, රෝගයකට, විනාශයකට හේතු වීම නියතය. රාගය, ද්වේශය, මෝහය, බැහැර කල පුද්ගලයෙකුට භයට පත්වන්නට හේතුවක් නැත. නිච්ච සේ සුඛ සේ අත්ත සේ අල්ලාගෙන පවත්වන්නට, නවතාගන්නට දෙයක් නැත. මේ ලොව මම කියා මගේ කියා, මගේ ආත්මය කියා දෙයක් උපාදානය කර ගෙන පවත්වන්නටද නොහැක. සම්මුති සත්‍යයක් ලෙසින් "මම" කියා කෙනෙකු ඇත. නමුත් පරමාර්ථ සත්‍යයය හැටියට නිච්ච වූ සුඛ වූ අත්ත වූ මමෙක් පවතින්නේ නැත.

පෘථග්ජන ලෝකයා පංචස්කන්දයම උපාදානය කරගෙන සැප විඳින්නේ ලෝකයා ආශ්වාදය කරන්නේ (අස්සාසෝ) එහි අනිච්ච බව දුක්ඛ බව, අනත්ත බව තේරුම් නොගත් නිසාමය. පංචස්කන්ධ ලෝකයම පෘතග්ජන පුද්ගලයින් විසින් සත්වයින් විසින් උපාදානය කරගෙන අල්ලාගන්නේ එහි සැපයක්, සුවයක්, මිහිරක්, සාර බවක් දකින නිසාමය. මේ සාර බව, සැප බව, මිහිරි බව, ඒ ඒ පුද්ගලයාගේ දැක්ම, දෘෂ්ඨිය, මැනීම , මානය, මිම්ම අනුවම තීරණය වන්නකි. මේ මිම්ම ප්‍රියබව හා අප්‍රිය බව මුල් කොට ගෙනම බිහිවන්නකි. සිතක ප්‍රිය බව , අප්‍රිය බව උපත ලැබීමත්, ප්‍රිය දේට ඇලීමත් අප්‍රිය දේට ගැටීමත් යන මෙම හේතුව නිසාම සිතක අඳුරු දෘෂ්ඨියක්, මත් වීමක් ඇතිවන නිසාම ප්‍රිය අප්‍රිය දෙක අතර මුලාවීමක් ද සිදුවෙයි. මුලා වූ සිතක් යනු මෝහයෙන් ක්‍රියාත්මකවන සිතකි. මේ අනුව ප්‍රිය දේට ඇලීමත්, අප්‍රිය දේට ගැටීමත්, ප්‍රිය අප්‍රිය දෙක අතර මුලා වීමත් පටිච්ච වීමේ මුලික අවස්ථාවන්ය. පටිච්චවීම හේතුව කොට ගෙනම සමුදය උපත ලබයි. සංසාර සම්බන්ධතාවයක් ඇති වේ. මේ ධර්මතාවය නොදන්නා අස්සුතවත් පෘතග්ජන පුද්ගලයා සසරට බැඳෙන බැමි තුනම සකස් කර ගනී. බැමි නිර්මාණය කර ගන්නා අවස්ථාව ආමිස සුවයකි. නමුත් බැම්මට බැඳුනු පසු එයම දුකකි.

එසේ නම් මේ පැවැත්ම තුල ඇති සියළුම දුක් තමන් විසින්ම තම කැමැත්තෙන්ම නිර්මාණය කරගන්නා දුක් කඳකි. මේ අනුව මේ උපත ලැබූ මිනිස් "භව" ප්‍රයෝජනයට ගෙන මේ මහා දුක් කඳ තමන්ම නිර්මාණය

කරගත් එකක් බව තේරුම් ගෙන ඉන් මිදී නිදහස් වන්නට පෙන්වා වදාල "මාර්ග චරියාව" සම්පූර්ණ කර ගත යුතුය.

යථාවබෝධයෙන් මේ සත්‍යයන් දැක, දුකට හේතුව තේරුම් ගෙන ගිහිගෙය හැර ගොස් පැවිදි දම් පිරීම එකකි. එය පරමාර්ථ සත්‍යය සාක්ෂාත් කරගන්නට යන ගමනකි. ගිහි ගෙදර ප්‍රශ්ණවලින් මිදී නිදහස් වීමේ පටු චේතනාවෙන් මහණ වීමත්, කැළයකට ගොස් සමාජයෙන් සැඟව යාමත්, රුක් මුලකට, සුඤ්ඤාගාරයකට, ආරඤ්ඤයකට ගොස් ප්‍රශ්න වලින් මිදී නිදහස් වන්නට කල්පනා කිරීමත් නියම නිවැරදි පිලිතුරු නොවේ. ඒ පුද්ගලයා ආරඤ්ඤගත වුනේ, කැලයකට ගියේ, රුක් මුලකට ගියේ සිතේ දහසකුත් ප්‍රශ්න ඇතිව නම් ඒවා තාවකාලිකව යටපත් කර ගත්තත් පන්සලට හෝ ආරඤ්ඤ සේනාසනයත් උපාදානය කර ගැනීම නිසා එතැනත් අල්ලා ගැනීමට ක්‍රියා කරන නිසා නිවන ආවරණය වේ. තම සිත තුලම උපත ලබන රාග බැමි, ද්වේශ බැමි, මෝහ බැමි යථාභූත ඥාණ දර්ශනයෙන් දැක ඒ බැමි වලින් තමාම මිදී නිදහස් වීමම විමුක්ති මාර්ගයයි.

**ලෝකය, නිවන හා ප්‍රඥාව (පඤ්ඤා)**

නිවන් දැකීම යනු," ප්‍රඥාවෙන් ලෝකය, ඇති සැටියෙන් දැකීම" යැයි බොහෝ උගතුන් විද්වතුන් විසින් ලියා දක්වා ඇත. දේශණා කර පෙන්වා දෙති. මේ ප්‍රකාශණයේ අඩංගු පද තුනක් (3) පරමාර්ථ වශයෙන් තේරුම් ගත යුතුව ඇත.

1. ලෝක 2. නිබ්බාන 3. පඤ්ඤා

**1. ලෝකඃ-** ලෝක යනු අඳුරට නමකි. මෙහි විරුද්ධ පදය අලෝක යන්නයි. අඳුර අත්හැරීම අලෝක යන්නෙහි අර්ථයයි. මේ අඳුර (ලෝක) ඇති වන්නේත් ඒ අඳුරෙන් මිදී නිදහස්ව අලෝක තත්වයට පත් කර ගන්නේත් තම සිතමය. ලෝක අඳුර ඇති වන්නේත් රාග අඳුර, ද්වේශ අඳුර හා මෝහ අඳුර නිසාය. අලෝක තත්වයට පත්වන්නේ රාග අඳුරෙන් මිදී විරාග තත්වයට පත් වීමත්, ද්වේශ අඳුරෙන් මිදී අද්වේශ තත්වයට පත්වීමත්, මෝහ අඳුරෙන් සහමුලින්ම මිදී "නමෝ" යන තත්වයට පත්වීමෙනුත්ය. ඒ සඳහා අනුගමනය කල යුතු පසු කල යුතු පියවරයන් කිහිපයක්ම ධර්මයේ නිර්දේශිතය.



"චක්ඛු කරණී, ඥාණ කරණී, උපසමාය, අභිඥාය සම්බෝධාය නිබ්බානාය සංවත්තතී" යනු එක විග්‍රහයකි.

"චක්ඛුං උදපාදි, ඥාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි , අලෝකෝ උදපාදි" යනු තවත් විග්‍රහයකි.

මේ ප්‍රකාශණ දෙකම උපුටා ගත්තේ පළමු ධර්ම දේශණාව වූ ධම්මචක්කපවත්වන සූත්‍ර දේශණාවෙනි. මේ මාර්ග චරියාව අනුපූරක වූ, අනුපුබ්බංගමවූත් ක්‍රියාවලියකි. උදපාදි යනු උපදවා පහදා ගැනීම යන්නයි. පළමු කොටම ලෝක අඳුරෙන් මිදී දහම් ඇස උපදවා පහදවා ගත යුතුය. දෙවනුව ඥාණං උදපාදි යනු කළ යුතු කරණීය ධර්මයන් තේරුම් ගෙන නොකළයුතු අකරණීය ධර්මයන් අතහරින්නට ඥාණය උපදවා පහදා ගැනීමය.

තෙවනුව පඤ්ඤා උදපාදි යනු සිතේ උපදින උපදින කෙළෙස් මල දැක ඒ කෙළෙස් මල කඩා ඉවත් කිරීමේ ප්‍රායෝගික ක්‍රියාවලිය කරමින් සිත පිරිසිදු කර ගැනීමය. (රාග , විරාග කිරීමය)

විජ්ජා උදපාදි යනු (විරජං වීතමලං) සිතේ මෙතෙක් පැවති කෙලෙස් මල උදුරා දමා ලෝකය විනිවිද බලා පරමාර්ථ සත්‍යයය, චතුරාර්ය සත්‍යයන් දැක ගැනීමය. යථාභූත ඥාණ දර්ශණය ලබා ගැනීමය. ලෝකය විනිවිද දැකීමය.

අලෝකෝ උදපාදි යනු ලෝක තත්වයෙන් මිදී අඳුරෙන් මිදී පරමාතී සත්‍යය දැකීමය. නැවත කවදාවත්ම කෙලෙස් නමැති අඳුරු පටලයෙන් සිත කිලිටි නොවන ආකාරයටම සිතේ ඥාණ ලෝකය, ප්‍රඥාලෝකය ඇති වීමයි.

සම්මත වශයෙන් අපි දකින අඳුරත් , අලෝක තත්වයත්, යන දෙක පරමාතී වශයෙන් ගත් කල මසැස ආදී ඉන්ද්‍රියයන්ගෙන් කෙනෙකු දකින භෞතික ලෝකය අභිබවා යන අතීන්ද්‍රිය ඥාණයෙන් සම්මත ලෝකයත් පරමාතී සත්‍යයත් දෙකම දැකීමයි. අලෝකෝ උදපාදි තත්වයට පත්වීමයි. යලි කවදාවත් රාග අඳුරෙන්, ද්වේශ අඳුරෙන්, මෝහ අඳුරෙන් සිත අඳුරු නොවන තත්වයට පත්වීම අලෝකෝ උදපාදි තත්වයට පත් වීමයි.

**2. නිබ්බානඃ-** යනු නිවනයි. මෙහි විරුද්ධ පදය බාන, බැම්ම යනුයි. රාග බැම්මට, ද්වේශ බැම්මට, මෝහ බැම්මට බැඳුනු පුද්ගලයා තමා නිර්මාණය කර ගන්නා පැවැත්ම තුල අතරමං වෙයි. මේ බැමි තුනම එකට ගොතා ගත් කල සංසාර බැම්ම (බාන) නිර්මාණය වෙයි. මේ බැමි තුනම කපා බානෙන් නිදහස් වීම "නිබ්බාන" යන අර්ථයයි.

**3. පඤ්ඤාඃ-** නිවන වසා සිටින, සසරට බැඳ තබන, නිවන ආවරණය කරන, පංචකාම නීවරණ ධර්මයන්ම උපද්දවන්නේ කෙනෙකුගේ සිත තුලමය. "පඤ්ඤා" යනු අවියකි, ආයුධයකි. ප්‍රඥාව නැමැති ආයුධය මුවහත් කරගෙන, පණපොවා, පණතියාගෙන, කෙලෙස් බැමි තුනම එකවර කපා දමා බැම්මෙන් මිදී නිදහස් විය යුතුය. පඤ්ඤාව නමැති අවිය මොට්ට වන්නේ රාග මල, ද්වේශ මල, මෝහ මල නැමැති කෙලෙස් මල බැඳුනු පසුවය. බැමි කපා නිදහස් වන්නට උපකාර කරගත හැකි ආයුධය(පඤ්ඤා) තමා තුලම සැඟවී පවතී. ඒ ආයුධය මොට්ටවී පවතී. මේ ආයුධය සොයා දැන පණ පොවා මුවහත් කරගෙන කෙලෙස් බැමි තුනම කපා දැමීම "නිබ්බාන" තත්වයට පත් වීමයි. "සං" සාරයි කියා තීරණය කර මෙතෙක් කාලයක් පංචස්කන්ධයම උපාදානය කර ගත්තේ මේ රිය ගමන දිගටම පවත්වා ගෙන යන්නට උපකාර වන විඤ්ඤාණ ශක්තියෙනි. රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් සංඛාර කරන හැමවිටකම රිය ගමන යන්නට උපකාර වන විඤ්ඤාණ ශක්තියද උපත ලබයි. ඥාණ ශක්තිය වසා සිටින, ප්‍රඥාව මුවහකර දමන නිසාම විඤ්ඤාණ ශක්තිය යන නමින්ම මේ ශක්තිය නම් කළහ.

සමුදය උපත ලබන්නේම, සංසාර සම්බන්ධතාවයකට බැදෙන්නේම, විඤ්ඤාණ ශක්තියක් සිතේ උත්පාදනය වන නිසාමය. මේ අනුව කෙලෙස් ගති සිතේ පවතින තුරාවටම සමුදය උපදී. සමුදය උපත ලබනවාත් සමඟම විඤ්ඤාණ ශක්තියද උපත ලබයි. විඤ්ඤාණ ශක්තිය සසර රිය ගමන දිගටම පවත්වාගෙන යන්නට උපකාර වෙයි. විඤ්ඤාණ ශක්තියෙන් ක්‍රියාකරන සිතක සංඛාර පවත්වයි. සංඛාර පැවැත්වීම වටිනවා හොඳයි ප්‍රියයි මනාපයි කියා තීරණය කර ක්‍රියාකරන හැමවිටකම සමුදය උපත ලබයි. සසර ගමනට බැඳෙයි. බැමි තුනම සකස් වෙයි.



මෙසේ විග්‍රහ කරනු ලබන පටිච්චසමුප්පාද ධර්මය (හේතුඵල දහම) හේතුඵල වාදයක් ලෙස තේරුම් ගැනීම වැරදිය. මෙය දෘෂ්ඨිගත වීමක් හෝ දෘෂ්ඨිවාදයක් හෝ ලෙස ගැනීමත් වැරදිය. මෙම හේතුඵල ධර්ම විග්‍රහය තුල පටිච්චසමුප්පාද ධර්මය තුල හෝ පටිච්ච සමුප්පාද ධර්මය මගින් විස්තර කරන පරමාර්ථ සත්‍යය තුල හෝ කිසිදු අන්තවාදී දෘෂ්ඨියකට පත්වෙන කිසිවක් ද ගොනු වී නැත. ශාස්වත වාදය, උච්ඡේද වාදය, ආත්ම වාදය, අනාත්ම වාදය, සංඛත වාදය, අසංඛත වාදය , ඊශ්වර වාදය හෝ දේව වාදය ආදී වූ අන්තවාදී මතයන් මගින් පෙන්වා දෙන ආකාරයේ දෘෂ්ඨි ගතවීමක් නිවැරදි පටිච්චසමුප්පාද ධර්ම විග්‍රහයේ නම් නැත. මේ ධර්මතාවය කොයි කාලයටත්, කාටත්, කොතැනටත් සාධාරණය. පටිච්චවීමක් සිදු නොවුනොත් සමුදය බිහි නොවේ. පටිච්චවීම හෝ පටිච්ච නොවී ඉන් නිදහස් වීම හෝ තම තමන්ට කරගත හැකි දෙයකි. මෙසේ පටිච්චවීමෙන් ලබන ආමිස සුවය නිශ්චිත වූ සදාකාලික වූ, අත්ත සේ පැවැත්විය හැකි එකක්ද නොවේ. මේ ධර්මතාවය තේරුම් නොගත් අස්සු තවත් පෘතග්ජන පුද්ගලයින් විඤ්ඤාණයට වහල් වී ආස්වාදයක් ලබන්නට සංඛාර පැවැත්වීම යනු සංසාර දුක නිර්මාණය කර ගැනීමයි.

පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව පසුකාලීනව අර්ථ කථා ලියූ බොහෝ අටුවාචාරීන් වහන්සේලාත්, මධ්‍යකාලීන මහායාන පඬිවරුන්මෙන්ම මෑතකාලීන භෞතිකවාදීනුත් යන මේ කවුරුවත්ම උතුම් පටිච්ච සමුප්පාද ධර්මය නිවැරදිව තේරුම් ගත්තේම නැත. පටිච්චසමුප්පාද විග්‍රහයේ තිපරිවට්ටයක්ම බුදුපියාණන් වහන්සේ විසින් දේශණාකර වදාළ බව ඔවුන්ට දැකගන්නටම බැරිවිය. අවිද්‍යාමූල පටිච්ච සමුප්පාද විග්‍රහය පමණක්ම කියවා බලා එයින් තේරුම් ගත හැකි ධර්මයක් ඇත්තේද නැත. පටිච්ච සමුප්පාද ධර්ම විග්‍රහය අංග සම්පූර්ණව තේරුම් ගතහැකි එකක් බවට පත්වන්නේ එහි තිපරිවට්ටයම යථාපරිදි පසක් කොට දැකගත්තොත් පමණි.

“යෝ පටිච්චසමුප්පාදං පස්සති, සෝ ධම්මං පස්සති”
යෝ ධම්මං පස්සති සෝ මං පස්සති”

“යමෙක් අංග සම්පූර්ණව, තිපරිවට්ටයම සහිතව පටිච්ච සමුප්පාද ධර්මය පසක් කොට අවබෝධ කර ගත්තේද, ඔහු බුද්ධ ධර්මය දකී. යමෙක් බුද්ධ ධර්මය පසක් කොට දකී නම් ඔහු බුදුන් දකී, බුද්ධත්වයට පත්වෙයි” යන්න මෙහි තේරුමයි.

විශුද්ධි මාර්ගය ලියූ බුදුගොස් හිමියන්ගේ පටන් ඒ හිමියන් ලියූ පාලි අර්ථ කථා අනුගමනය කරමින් ඊට පසුකාලීනව අටුවා ටීකා ටිප්පනි ලියූ, පටිච්ච සමුප්පාද විවරණයන් ලියූ පෙර අපර දෙදිගම පඬිවරුන් මෙන්ම මහායාන බුද්ධාගමට සම්බන්ධව විවිධාකාර වූ අභිධර්ම විග්‍රහයන් ඉදිරිපත් කරමින් පොත් ලියූ පෙර අපර දෙදිගම පඬිවරුන්ද, භෞතිකවාදීන් ලෙස බුදු දහම දෙස බැලූ නූතන ලේඛකයින්ද යන කාටවත්ම පසුගිය වසර 1800 ක් හෝ ඊටත් වැඩි දීර්ඝ කාලයක් තුලම බුදුන් දේශණාකල උතුම් දහම දැක නිවන් දැක ගන්නට නොහැකි විය. මෙසේ වීමට පලමුවනම හේතුව වූයේ පටිච්චසමුප්පාද ධර්මයේ තිපරිවට්ටයම පසක් කොට දැක ගන්නට ඔවුන්ට බැරි වීමයි.

අවිද්‍යාමූල පටිච්චසමුප්පාද ධර්ම විග්‍රහයෙන් ඉදිරිපත් කර පෙන්වූයේ නිවනට බාධක වූ නිවන ආවරණය කර සිටින කෙලෙස් ගති සිතක උපත ලබන ආකාරය විග්‍රහ කිරීමයි. “සං භවං” යනු සමුදය බිහිවීමයි. අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, උපාදාන පච්චයා සං භවං, භව පච්චයා ජාති ආදී වශයෙන් ඉදිරිපත් කරණ ලද්දේ අවිද්‍යා මූල වශයෙන් භව සකස්වන ආකාරයයි. කුසලමූල පටිච්ච සමුප්පාද විග්‍රහයෙන් ගෞතම බුදුපියාණන් වහන්සේ විග්‍රහකර පෙන්වූයේ මෙම කෙළෙස් උපත ලබන කුණු මුල් උදුරා දමන ක්‍රමවේදය පෙන්වා දීම මගින් සමුදය නිරෝධ කර භව නිරෝධ කර ජාති නිරෝධ කරන ආකාරයයි. මේ අනුව අවිද්‍යා මූල පටිච්චසමුප්පාද විග්‍රහය පමණක්ම ඉගෙන ගෙන එහි එන පදවැල් ටික පමණක්ම අල්ලාගෙන කටපාඩම් කර ගත්තාට හෝ පටිච්චසමුප්පාද විවරණයක් ලියා දැක්වූ ගිහි පැවිදි මොනම



ලේඛකයෙකුටවත් පඬිවරයෙකුටවත් බුද්ධ ධර්මයේ හරය වූ කෙලෙස් මුල් සිතින් උදුරා දමන්නට උපකාර වන ප්‍රායෝගික මාර්ග චරියාව දැක තවත් කෙනෙකුට තේරුම් ගන්නට හැකිවන ආකාරයෙන්, එය අංග සම්පූර්ණව ලියා දක්වන්නට හෝ දේශණාකර ඉදිරිපත් කරන්නට හෝ නොහැකි වීම නිසාම මෙතුවක් දිගුකලක් නිවන් මඟ ආවරණය වී යාමට බලපෑ මූලිකම හේතුව විය.

මේ අතර අවිද්‍යාමූල පටිච්චසමුප්පාද විග්‍රහය පමණක්ම ඉදිරිපත් කරමින් පොත්පත් ලියා බුද්ධ ධර්මය ඉදිරිපත් කරන්නට උත්සාහ කල බුද්ධඝෝෂ හිමියන්ගේ පටන් සියළුම ගිහි පැවිදි උගතුන් මහ මුහුදේ පරක් තෙරක් නොදැන අතරමං වූවන් සේ ක්‍රියාකරමින් අවශේෂ ලෝකයාවද සංසාර සාගරයේ අතරමං කරන්නටම විවිධාකාර වූ පොත්පත් ලියා පළකළහ.

රේරුකානේ චංදවිමල නාහිමියන් විසින් ලියූ “පටිච්ච සමුප්පාද විවරණය” නමැති පොතේ ලියා දැක් වූ “පටිච්චසමුප්පාද විවරණය හා විග්‍රහය” සම්පූර්ණයෙන්ම වැරදි සහිත වූ අංග සම්පූර්ණ නොවූ මතවාදයක් ලෙසින් මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් ලියූ 1. දැනුම හා දැක්ම 2. බෞද්ධ දර්ශණය හා මාර්ගය 3. භව කර්ම විකාශය 4. සකස්කඩ යන පොත් හතරෙන්ම විස්තර වශයෙන් පෙන්වා දී ඇතත්, මාර්ටින් වික්‍රමසිංහ ශූරින්ද කිසිවිටෙකත් “කුසලමූල පටිච්ච සමුප්පාද ධර්මය යැයි” කියා දෙයක් ඇතැයි කියා හෝ දැන සිටියේ නැත. විශුද්ධි මාර්ගය ලියූ බුදුගොස් හිමියන් හෝ ඊට පසුව මේ රටේදී මෙන්ම පිටරටවලදීද විශුද්ධි මාර්ගය ගුරු කොට ගරු කොට පොත්පත් ලියූ අටුවා ටීකා ලියූ කිසිම කෙනෙකුටද මෙම කුසලමූල පටිච්ච සමුප්පාද ධර්ම විග්‍රහය තේරුම් කර පෙන්වා දෙන්නට නොහැකි වීම නිසාම නිවන් මඟ වැසී ගියහ.

වසර 1800කටත් වැඩි කාලයකට පසුව අවිද්‍යාමූල පටිච්චසමුප්පාද විග්‍රහයත්, අවිද්‍යාමූල නිරෝධයත්, කුසලමූල පටිච්චසමුප්පාද ධර්මයත් යන තුනම විග්‍රහ කරමින් මෙතෙක් කල් අඳුරේ අතපත ගෑ මිනිසුන්ට යලිත් නිවන් මඟ නිරාවරණය කර දෙන්නටම මේ

කරුණු මෙසේ ලියා දක්වමි. දේශණාකර පෙන්වා දෙමි. බුද්ධ ධර්මයේ පෙන්වූ අංග සම්පූර්ණ නිවන් මඟ = මාර්ග චරියාව ධම්මානු ධම්ම පටිපදාව පැහැදිලිව හා පිරිසිදුව එදා දේශණාකර ඇත. ත්‍රිපිටක පොත්වලද ලියා දක්වා ඇත. විභංගප්‍රකරණයේ පච්චයා උද්දේශ, නිර්දේශ, පටිනිද්දේශ වශයෙන් පටිච්ච සමුප්පාද විග්‍රහය නානා අයුරින් ලිඛිතවම ඉදිරිපත් කළ අයුරු අදටත් දකින්නට ඇත. මහාවග්ගපාලියෙහිත් තිපරිවට්ටයම පැහැදිලිවම විග්‍රහ කරමින් පටිච්ච සමුප්පාද විග්‍රහය ඉදිරිපත් කර ඇත. මේවා පැහැදිලිව හා පිරිසිදුව දේශණාකර ලෝකයාට ඉදිරිපත් කරන්නට නොහැකි වීම නිසාම මාර්ග චරියාව යටපත් වී ග්‍රන්ථධූර පමණක් වැදගත් කොට සලකන්නට පුරුදු වූ බව පෙන්වා දිය යුතුය.

අවිද්‍යාමූල පටිච්චසමුප්පාද විග්‍රහයත් කුසලමූල පටිච්චසමුප්පාද ධර්මයත් යන විග්‍රයන් දෙකම යථාභූතඥාණයෙන් මනාකොට තේරුම් නොගත් කෙනෙකුට මොන පණ්ඩිත උපාධි තිබුණත් මහාචාර්යය තනතුරු තිබුණත් චතුරාර්යය සත්‍යයන් අවබෝධ කරගත නොහැකිය. නිවන අහලකටවත් පැමිණෙන්නේද නැත.

රේරුකානේ චන්දවිමල නාහිමියන් හෝ මාර්ටින් වික්‍රමසිංහ ශූරින් හෝ යන දෙදෙනාම පටිච්ච සමුප්පාද විග්‍රහය යැයි තරයේ විශ්වාස කළේත් දැන ගත්තේත් කියවා තේරුම් ගත්තේත් අවිද්‍යාමූල පටිච්චසමුප්පාද විග්‍රහයම පමණකි. කුසලමූල පටිච්චසමුප්පාද ධර්මය යැයි කියා එකක් බුද්ධ දේශණාවේ ඇති බව පවා ඔවුන් බොහෝ දෙනෙකු නොදනිති. ඒ ගැන අසා දැනගත් හෝ තේරුම් ගත් මහාචාර්යවරුන් පවා අදටත් නැත.

පසුගිය වසර 1800ක් පමණ දිගුකාලයක් තුල බෞද්ධ පොත්පත් වල ලියූ විද්‍යාස්ථානවල හා මහා පිරිවෙන් වල හෝ විශ්වවිද්‍යාලවල හෝ බෞද්ධ දර්ශණය හෝ අභිධර්මය ඉගැන් වූ, මහාචාර්යවරුන් හෝ දේශකයින් හෝ විද්වතුන් හෝ බුද්ධ දේශණාවේ හරය වූ පටිච්චසමුප්පාද ධර්මය තිපරිවට්ටයම සහිතව ලියා එලි දක්වන්නට හෝ දේශණාකර ප්‍රකාශ කරන්නට හෝ නොදත් නිසාම නිවන් මඟ ඇහිරී ගියහ. ආගමක් මතු



වී පදවැල් සමූහයක් කටපාඩම් කරගැනීමට හෝ ගාථා පිරිත් ලෙස සජ්ජායනා කරන්නට හෝ පමණක් පුරුදු විය.

චතුරාර්යය සත්‍යයයන් අවබෝධයෙන් තොරව සිතේ මුල් බැස ගෙන පවතින කෙලෙස් මුල් කුණුමුල් තුන (රාග මූල, ද්වේශ මූල, මෝහ මූල) උදුරා සිතින් ඉවත් කර දමන්නට නොහැකිය. කුසල මූල පටිච්චසමුප්පාද විග්‍රහයෙන් විග්‍රහ කර පෙන්වූයේ මේ කුණු මුල් තුනම උදුරා ඉවත් කරන ක්‍රමවේදයයි. සමුදය නිරෝධ කළ හැකි බව අසා දැන තේරුම් ගෙන සමුදය නිරෝධ කිරීම ප්‍රායෝගිකවම ක්‍රියාත්මක කිරීම මෙතැනදී ක්‍රියාත්මක කළ යුතුය. එසේ සමුදය නිරෝධ කිරීමත්, අනුත්පාද වශයෙන්ම නිරෝධ කිරීමත් ධර්මාවබෝධය තුලින්ම ලබා ගතහැකි දැක්මකි.(ජානතෝ පස්සතෝ)

මෙතැනදී නිරෝධ කිරීම යන පදයෙන් අදහස් කරන්නේ නැති කිරීම යන තේරුමක් නොවේ. සිතින්ම සංඛාරයක් දිගේ කරන රෝද කිරීම නොකර, රෝද නිරෝධ කිරීමයි. මෙතැනදී මේ සඳහා සංඛාර උපේක්ඛා ඥාණය උපදවා ගත යුතුය. සිතේ උපදින සියලුම සංඛාරයන් යථාපරිදි තේරුම් ගෙන ඒවා ඉවසා විමසා බලා උපේක්ඛා සිතකින් ක්‍රියාකර ඒවාට නොඇලී, නොගැටී, මුලා නොවී ක්‍රියා කිරීමට පුරුදු වීම සංඛාර උපේක්ඛා ඥාණයෙන් ක්‍රියා කිරීමයි. අනිච්ච දුක්ඛ අනත්ත තේරුම් ගැනීමයි.

## පෘතග්ජන පුද්ගලයා සහ අරිය සාවකයා

සෑම පුද්ගලයෙක්ම, සත්වයෙක්ම පෘතග්ජන තත්වයට පත්වන්නේ තම ඉන්ද්‍රියයන් පිනවමින් යම් ආස්වාදයක් ලබන්නටත් ඒ ආස්වාදය දිගින් දිගටම අසීමිතව ලබන්නටත් ක්‍රියා කිරීම නිසාය. මේ නිසාම පංචස්කන්ද ලෝකයම උපාදානය කර ගන්නටත් සිදුවෙයි. "ඌනෝ ලෝකෝ අතිත්තෝ තණ්හා දාසයෝ" යන්නෙන් විග්‍රහ කලේ පෘතග්ජන පුද්ගලයා කොපමණම ඇස ,කණ, නාසය, දිව, කය හා මන යන ඉන්ද්‍රියයන් පිනවූවත් සෑහීමකට පත් නොවීම පිළිබඳවයි. අල්පේච්චතාවයක්, ලද දෙයින් සතුටුවීමක්ද නැත. පංචස්කන්ද ලෝකයම උපාදානය කරගෙන ලබන මේ ආමිස සුවය නිච්චසේ, සුවසේ, සුබසේ, අත්තසේ දැකීම වැරදි දැක්මකි. වැරදි දෘෂ්ඨියකි.

තමන්ගේම සිතේ උපන් මේ වැරදි කැමැත්තට “පටිච්ච වීම” නිසා මුළු මහත් සංසාරය පුරාම පංචස්කන්ද ලෝකයටම බද්ධ වෙවී බැඳී බැඳී මේ සංසාර රිය ගමන ආ බව තේරුම් ගත නොහැකි පුද්ගලයා අස්සුතවත් පෘතග්ජන පුද්ගලයෙකු හැටියට ධර්මයේ හඳුන්වනු ලබයි. චතුඅරිය සච්චයන් අවබෝධ කරගත් පුද්ගලයා මෙතෙක් කල් දැක්ක වැරදි දැකීමෙන් මිදී පරමාර්ථ සත්‍යය වූ “අනිච්ච බව දුක්ඛ බව, අනත්ත බව” පසක් කොට දැක ගත යුතුය. මේ පැවැත්ම තුල යමක් සාරයි සිතා තමන් උපාදානය කර ගන්නා කිසිවක් නිච්චසේ පවත්වා ගන්නට නවත්වා ගන්නට බැරිය. “යද නිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා ” යනු උපාදානය කරගත් යමක් නිච්චසේ පවත්වන්නට උත්සාහ කරන හැම විටම එය එසේ නවත්වන්නට, පවත්වන්නට බැරි ධර්‍මතාවයක් නිසා (විපරිනාමයක්) නවත්වන්නට බැරි ස්වභාවයක් පවතින නිසා බලාපොරොත්තුවූ සැපයම ද්වේෂයකට පත්වීම “දුක” නමින් ධර්මයේ පෙන්වා වදාළහ. සෝමනස්සබව බලාපොරොත්තු විය. දෝමනස්සබව උරුම විය. මෙසේ හැම බලාපොරොත්තුවක්ම දුකටම හැරවෙන දුකම උරුම කරදෙන ධර්මතාවයක් ලොව පවතී නම් එතැන ඇත්තේ අනාථ තත්වයට පත්වීමකි. අසාරබවට පත්වීමකි. මේ නිසා “අසාරකට්ඨේන අනත්තා” යනුවෙන් ධර්‍මයේම පැහැදිලි කරයි. සාරයි කියා සැප බලාපොරොත්තු වුනත් උරුම වූයේ දුකම නම් එය අසාර වූ අනාථ වූ නිස්සාර වූ තත්වයකි. මේ අනුව පංචස්කන්ධයම තදින් උපාදානය කරගන්නා පෘතග්ජන පුද්ගලයා තුල ඇති දැක්ම ඒ උපාදානය කරගන්නා දේ “නිච්චයි, සුඛයි, සුවයි, සුඛයි අත්තයි” යනුවෙන් ගත් වැරදි තීරණයකි. නිවැරදි තත්වය තේරුම් ගත් පුද්ගලයා මේ පංචස්කන්ද ලෝකයම දකින්නේ “අනිච්චයි, දුක්ඛයි, අනත්තයි ”කියාය. මේ පිරිසිදු දැක්ම දුකින් මිදී නිදහස් වන්නට උපකාර වන නිවැරදි වූ එකම දැක්මයි.

“අනිච්චයි, දුක්ඛයි, අනත්තයි” යන මාගධී පද තුන වෙනුවට “අනිත්‍යයයි, දුකයි, අනාත්මයි” යනුවෙන් අද වැරදියට සිංහල භාෂාවට පරිවර්ථනය කරගෙන, සිංහල බුද්ධාගම්කාරයෝ වැරදි ලෙසින් භාවිතා



කරන බව තේරුම් ගත යුතුය. මේ වැරදි සිංහල පරිවර්ථනය නිසා ත්‍රිලක්ඛණය යන්නෙහි සම්පූර්ණයෙන්ම අර්ථය විකෘති විය.

නිච්ච- අනිච්ච, සුඛ- දුක්ඛ, අත්ත - අනත්ත යන මාගධී පද යුගල තුන වෙනුවට නිත්‍ය - අනිත්‍ය, සැප - දුක, ආත්ම- අනාත්ම යනාදී වශයෙන් අද සම්මත බුද්ධාගමේ සිංහල පද යුගල තුනක් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම වැරදිය. වැරදී ධර්ම අර්ථය විකෘති කර ත්‍රිලක්ඛණ යන්නද ත්‍රිලක්‍ෂණය යනුවෙන් ලක්‍ෂණයන් තුනක් ලෙසින් වැරදියට භාවිතා කරති. තම සිතේ උපදින වැරදි ගති තුනක් දැනගෙන වැරදි කෙලෙස් කපා ඉවත් කර දැමීම යනු ත්‍රිලක්ඛන “ඛණ, ඛය , ඛීණ” වශයෙන් මාගධී භාෂාවේ පෙන්වා දුන් රාගක්ඛය, ද්වේශක්ඛය, මෝහක්ඛය කිරීමයි. ඛය යනු සහමුලින්ම සිතින් කපාහැර උදුරා අස්කර දැමීමයි. මේ අනුව “ඛණ සම්පත්තිය” යනු රාග, ද්වේශ, මෝහ ගති සිතින් කපා හැර සං පහදා ඉවත් කර දැමීමයි. “ඛය” යනු එසේ කපා දැමීමයි. ඛීණ යනු කපා අවසන් කළා යනුයි. ඛීනාශ්‍රවයන් වහන්සේ යනු අරහතුන් වහන්සේටම නමකි. “ඛිනාජාති” “ඛීනං පුරාණං” ආදී වශයෙන් පෙන්වූ හැම තැනකම කපා අවසන් කර ඇත්තේ තම සිතේම උපත ලබන කෙලෙස් ගතින් තුනය. (රාග, ද්වේශ, මෝහ)

ත්‍රිපිටකය සිංහලයට පරිවර්ථනය කිරීමේදී මේ හැම තැනකදීම පාහේ සංස්කෘත පද ආදේශ කිරීමෙන් උතුම් බුද්ධ දේශණාව විකෘති විය. විකෘති කර භාවිතා කිරීමෙන් නිවන් මාර්ගය වසා දැමූ බව දැන්වත් තේරුම් ගත යුතුව ඇත.

ධර්ම නියාමයට අනුව යමෙක් තම සිතේ උපන් කැමැත්තට බැඳුනොත් (පටිච්ච වුනොත්) ඒ කැමැත්ත ඒ ආකාරයෙන්ම දිගින් දිගටම පවත්වන්නට ක්‍රියා කලහොත් නිච්ච වීමටද, දුකටද, අනාථ වීමටද හේතු වෙයි. (අනත්තාතී) “අනත්ත” යනු අනාථ වීම - අතරමං වීම මිස අනාත්ම යන අදහස නොවේ. බුද්ධ දේශණාව කිසිසේත්ම ආත්ම වාදයක් හෝ අනාත්ම වාදයක් හෝ නොවේ.

"අසාරකට්ඨෙන අනත්තා" යන පදයෙහි තේරුම සාරයි කියා රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් උපාදානය කරගත් දේ (සංසාර) නිසා පුද්ගලයා අනාථ තත්වයට පත්වී සසර කොතැනක හෝ මතු මතුත් ඉපදෙමින් මැරෙමින් දුක් විඳවන බව ප්‍රකාශ කිරීමයි. යා යුතු මඟ නොදැක වල්මත් වූවෙකු සේ අනාථවීම "අනත්තා" යන්නෙහි තේරුමයි.

මේ අනුව "අනිච්ච" අනුපස්සනා කරමින් සිතේ උපදින "නිච්ච" සඤ්ඤාව දුරලන පුද්ගලයා "දුක්ඛානුපස්සනා" කරමින් සිතේ උපදින සුව, සුඛ, සුභ සඤ්ඤාව සිතින් උදුරා දමන පුද්ගලයා අනත්ත අනුපස්සනා කරමින් සිතේ උපදින අත්ත සඤ්ඤාව උදුරා දමන පුද්ගලයා අනිච්ච දුක්ඛ අනත්ත යන ත්‍රිලක්ඛන භාවනාවෙන් කෙලෙස් කපා දමා නිවන් දකින්නට සුදුසු පුද්ගලයෙක් බවට පත්වන්නේය.

මෙසේ අනිච්ච දුක්ඛ අනත්ත යන ත්‍රිලක්ඛනය යථාපරිදි තේරුම් ගෙන පටිච්චවීමෙන් මිදී, නිබ්බිදා තත්වයටත්, විරාගා තත්වයටත් පත්වූ පුද්ගලයාට පමණක් සමුදය නිරෝධ කිරීමෙන් උපාදානය කරගෙන තිබූ පංචස්කන්දයෙන්ම මිදී නිදහස් විය හැකිය. "සබ්බූපදි පටිනිස්සග්ගෝ" යනු මෙයයි. මෙය නිරෝධ ගාමිණී පටිපදාව සම්පූර්ණ කර ගැනීමයි. නිරෝධ කල යුත්තේ තමාගේම සිතේ උපදින සමුදය (කැමැත්තට බැඳීමයි) මිස වෙනත් කිසිදු බාහිර දෙයක් නම් නොවේ.

1. "නිබ්බිදානු පස්සී විහරති, අභිනන්දිං පජහති
   නිබ්බිදානු පස්සනාව මෙනෙහි කර සිතේ උපන් කැමැත්තට (නන්දි) අභිනන්දනයෙන් බැදෙන වැරදි ගති ස්වභාවයෙන් මිදී නිදහස් විය යුතුය.

2. "විරාගානු පස්සී විහරති රාගං පජහති"
   විරාගානු පස්සනාව මෙනෙහි කරමින් සිතේ උපදින රාගයෙන් මිදී තණ්හා උපාදානයෙන් බැදෙන වැරදි ස්වභාවයෙන් මිදී නිදහස් විය යුතුය.



3. "නිරෝධානු පස්සී විහරති, සමුදයං පජහති"
   නිරෝධානු පස්සනාව මෙනෙහි කරමින් සිතේ උපදින සමුදය නමැති වැරදි සම්බන්ධතාවයෙන් ගති ස්වභාවයෙන් සදහටම මිදී නිදහස් විය යුතුය.

4. "පටිනිස්සග්ගානු පස්සී විහරති, සබ්බූපදි පජහති"
   මේ අනුව පටිනිස්සාගානු පස්සනාව මෙනෙහි කරමින් පටිච්ච වීමෙන් වැලකී මෙතෙක් උපාදානය කරගෙන තිබූ පංචස්කන්දයම උපාදානය කරගැනීමෙන් වැලකී සිටීමයි.

මේ බුද්ධානුස්සතිය වැඩීමයි, නිවනට උපකාර වන බුද්ධ භාවනාවයි.

**සබ්බූපදි පටිනිස්සග්ගෝ**

මෙතෙක් කාලයක් සාරවත් සේ දැක වටිනවා යැයි සිතූ ප්‍රියයි මිහිරියි කියා තීරණය කරගෙන, පංචස්කන්ධයම උපාදානය කර ගන්නට ක්‍රියා කලේත් වැරදි දැක්මක් වැරදි දෘෂ්ඨියක් පැවති හෙයිනි. ඒ වැරදි දැක්ම සක්කාය දිට්ඨියයි, විඤ්ඤාණ චිත්තයේ කිලිටි වූ කැමැත්තයි (විචිකිච්චතාවයයි). ඒ අනුවම පටිච්චවී, සමුදය බිහිවී, පංචස්කන්දයම තම සිතින්ම තමාම උපාදානය කරගත් බව දැන් දැකිය යුතුය. පංචස්කන්ධයම උපාදානය කර ගැනීම හේතු කොට ගෙනම සියළු දුක් උරුම විය. "සංඛිත්තේන පංචුපාදානස්කන්දා දුක්ඛා " යන්නයි.

මේ තත්වය යථා පරිදි තේරුම් ගත්විට පමණක් උපාදානය කරගත් පංචස්කන්දයෙන්ම මිදී නිදහස් විය හැකිය. (සබ්භූපදි පටිනිස්සග්ගෝ). කුසලමූල පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය දැන, සිතක් තුලම ක්‍රියාත්මක වී සිතකම උපත ලබන රාග මුල්, ද්වේශ මුල්, මෝහ මුල් නමැති කෙළෙස් මුල් තුනම උදුරා අස්කර දමන ක්‍රියාපිලිවෙත කුසලමූල පටිච්ච සමුප්පාද ධර්මයයි.

කුණු මුල් සිතින් ගැලවී යාම තමාම තමා තුලින්ම දැක ගත යුතුය. කුණු මුල් ගැලවී ගිය පසු කෙලෙස්වලින් තොරවූ පිරිසිදු සිතක නිවුන බව

බානෙන් මිදී නිදහස් වූ බව (නිබ්බාන) තමන්ටම ප්‍රත්‍යක්ෂ වී අත්දැක ගත හැකි වනු ඇත.

පටිච්චසමුප්පාද විග්‍රහයේ පදවැල් ටික කටපාඩම් කර ගත්තාට හෝ මේ පදවල අර්ථය වෙනත් යම් ආකාරයකට තේරුම් ගත්තාට හෝ "නිබ්බාන" තත්වයට පත්විය නොහැකිය.

මෙම පියවර තුනම නැවත මතක් වීම සඳහා යලිත් සටහන් කර තබමි.

1. අවිද්‍යාමූල පටිච්චසමුප්පාද විග්‍රහයෙන් පෙන්වූ ධර්මතාවය යථාපරිදි තේරුම් ගත යුතුය. නිවන ආවරණය කරන සියලුම කරුණු එහි එකින් එක විස්තර කරමින් විග්‍රහ කර ඇති බවත් දැනගත යුතුය. සමුදය බිහිවීම නිසා සම්බන්ධතාවයට බැදී සසර ගමනට දිගින් දිගටම බැදෙන අයුරු මෙයින් පෙන්වා දුන් බව තේරුම් ගත යුතුය.

2. සමුදය නිරෝධ කළ හැකි බවත්, සමුදය නිරෝධ කරන්නට ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ගයන් හරි හැටි තේරුම් ගත යුතු බවත්, තම සිතේ උපදින සමුදය, උපදින මොහොතේම නිරෝධ කර සංසාර සම්බන්ධතාවයට බැදීමෙන් වළකාලීමත් දැක ගත යුතුය.

3. සිතේ උපත ලබන කෙලෙස් මුල් උදුරා ඉවත් කර දමා යලි කෙළෙස් නොඋපදීම (අනුත්පාද නිරෝධය) සඳහා උපකාර වන කුසල මූල පටිච්චසමුප්පාද විග්‍රහයෙන් පෙන්වා වදාල මාර්ගයම අනුගමනය කිරීමද යථාපරිදි කළ යුතුය.මේ පියවර තුනම චතුරාරක්ඛා භාවනා ක්‍රමයෙන් හා සතර සතිපට්ඨාන භාවනාවෙහි යෙදීමෙන්ම ප්‍රායෝගිකවම ඉෂ්ඨ සිද්ධ කරගත හැකි බවත් තේරුම් ගත යුතුයි. පටිච්චසමුප්පාද දහම් විග්‍රහය අළුතින් සොයා දැන යලිත් විග්‍රහ කිරීමෙන් පෙර නොඇසූ විරූ දහමක් ලෙසින් ගෞතම බුදුපියාණන් වහන්සේද එදා නිබ්බානගාමී මාර්ගය ලෝකයාට හෙළිකර වදාළ සේක. එය සියළුම බුදුවරුන්ගේත් බුද්ධ ශ්‍රාවකයින්ගේත් යුතුකමකි, වගකීමකි.

යළිත් දීර්ඝ කාලාන්තරයකට පසුව මේ උතුම් මාර්ග ප්‍රතිපදාව නිවැරදි ලෙසත්, පිරිසිදු ලෙසත්, ප්‍රාඥාවන්ත කුලපුත්‍රයින්ට අනුගමනය කළ



හැකි ප්‍රතිපදාවක් ලෙසත්, දිට්ඨධම්මවේදනීය ලෙසම අත්විද ගන්නට සුදුසු ලෙසත්, මෙසේ යලිත් දේශනා කරමින් ලියා පැහැදිලි කර දෙමි. ඒ නිස්සරණ ආධ්‍යාසයෙන්මය. මේ උතුම් දහම මෙසේ පැහැදිලිව පිරිසිදුව ලියා තබන්නේ මතු පරපුර වලත් උපදින පින්වත් කුලපුත්‍රයින්ට හා දෙවි මිනිසුන්ටද නිවන් මඟ විවෘත කරදීම සඳහාය. මේ මඟ අසා දැන මේ මඟ නිවැරදිව තේරුම් ගෙන මේ මඟ අනුගමනය කිරීමෙන්ම නිබ්බාන සුවය අත්විඳ ගැනීම ප්‍රඥාවන්ත මිනිසුන්ගේ යුතුකමය, වගකීමය.

## "සං" දේසනාව යලිත් දේශණා කිරීම

බුද්ධත්වයට පත් වූ සියළුම බුදුවරයන් වහන්සේලා යලි යලිත් ලෝකයාට සංදේශනාව දේශනා කරන සේක. සංදේශනාව යනු බුද්ධ ඥාණ පද හතරකි. චුලහත්ථිපදෝපම සූත්‍රයෙන් ඉතාම පැහැදිලිව බුද්ධ ඥාණ පද හතර දේශනාකර විග්‍රහ කර පැහැදිලිකර දී ඇත. "සං දෙස්සති, සංමාදපේති, සමුච්ජේදේති, සංපහන්සේති" යනුවෙන් බුද්ධ ඥාණ පද හතර විග්‍රහ කර ඇත.

1. "**සංදෙස්සති**" යනු සංසාර ගමනට සත්වයා, පුද්ගලයා සම්බන්ධ වන ආකාරය, සමුදය උපදින ආකාරය, සමුදය නිසා සංසාර ගමනට හිරවී ඉන් මිදී නිදහස් වන්නට බැරිව දුක් විදින ආකාරය විග්‍රහ කර දී සංඛාර, සංඥා ,සන්ධි, සංසාර, සංචේතනා, සංකිලිට්ඨේන, සංගණිකා දොස් ආදී වූ සසර ගමනට හේතුන් දේශණා කර විග්‍රහ කර දීමයි.

2. "**සංමාදපේති**" යනු "සං" වලින් මිදී නිදහස් වන්නට නිවැරදි මඟ පෙන්වා දෙති, දේශණා කරති යන අර්ථයයි. සංවර වීමෙන්, සංසිඳවීමෙන් හා සංමා අංග අට නමැති ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් සංසාර ගමනෙන්, සංසාර දුකෙන් මිදී නිදහස් වන මඟ තවත් ආකාරයකට පැහැදිලිව විග්‍රහ කර දෙයි. බොහෝ සූත්‍ර ධර්ම වල "සංතිට්ඨති, සංනිසීදති, ඒකොධි භාවං සංමාධියති" යනුවෙන්ද මේ සම්මා මාර්ගයම විග්‍රහ කරදී ඇත. "සංමා" යනු රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් මිදී නිදහස් වීමේ මාර්ගයයි. "සංමාපත්ති" යනු රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් මිදී නිදහස් වූ පසුව පත්වන තත්වයයි. "සම්මාද පේති" යනු

මාර්ග චරියාව, නිවනට උපකාර වන ආකාරයට පැහැදිලිව පෙන්වා විග්‍රහ කර දීමයි.

3. "**සමුච්ඡේදේති**", සං + උච්ජේදනය යන පද දෙකක් මෙහි අඩංගුය. උච්ජේදනය යනු යලි නොඋපදින ලෙසින් උදුරා අස්කර කපා ඉවත් කිරීමයි. මෙසේ උදුරා අස්කර ඉවත් කලයුතු වන්නේ රාග, ද්වේශ, මෝහ යන සමුදය උපදින කුණු මුල් තුනයි. මෙහිදී සිදුකර ගත යුත්තේ සිතක යලි යලිත් උපත ලබන කෙලෙස් ගති තුනම සහමුලින්ම ඉවත් කිරීමට සමුච්ජේදප්ප්‍රහාණයෙන් කටයුතු කිරීමයි.

4. "**සංපහන්සේති**", සියලු කෙළෙස් ගති ප්‍රහාණය කර සියලු කෙළෙස් මුල් උදුරා ඉවත් කළ පසු සිතක ඇතිවන පහන් වීම, නිවීම, නිබ්බාන තත්වය මේ පදයෙන් විග්‍රහ කෙරෙයි.

මේ බුද්ධ ඥාණ පද හතරෙන්ම චතුරාර්ය සත්‍යයන්ද ඉදිරිපත් කර ඇත. මේ අනුව චූලහත්ථිපදෝපම සූත්‍රයේ පැහැදිලිව විග්‍රහ කර පෙන්වන ආකාරයට මේ බුද්ධ ඥාණ පද හතර යමෙකුට තේරුම් ගන්නට බැරි වුනොත් උතුම් බුදු දහමම යටපත් වී යන්නේය. අද වන විට මේ විකෘති තත්වය ප්‍රායෝගිකවම දැකගත හැකිය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථවල මේ බුද්ධ ඥාණ පද හතර පදපරම ලෙසින් පරිවර්තනය කර සිංහලෙන් අර්ථ දක්වා ඇත්තේ, බලගන්වති, තෙද ගන්වති, මඟ පෙන්වා දෙති, ඔදගන්වති වැනි තේරුමක් නැති පදවලිනි. මේ නිසා සංදේසනාව අභාවයට ගියහ. "සං" යන පදය පවා නිපාත පදයක් සේ විග්‍රහ කර "සන්නිපාත" යක් ලෙසින් අද බොහෝ උගත් වියත් බුද්ධාගම්කාරයන්ම විග්‍රහ කරදෙති. බුද්ධ ධර්මය මෙසේ විකෘති කරමින් පිරිසිදු නිවන් මඟ වසා දමන්නට කොයිතරම් බලවත්සේ මේ වැරදි පරිවර්තනයන් හා වැරදි අර්ථ දැක්වීම් හේතු වී ඇතිදැයි තේරුම් ගත යුතුය. සංදේසනාවක් අංග සම්පූර්ණව ශ්‍රවණය කර මේ බුද්ධ ඥාණ පද හතරෙන් විග්‍රහ කර පෙන්වූ නිවන් මාර්ගය පැහැදිලිව පිරිසිදුව අවබෝධ කර ගැනීම චතුරාර්ය සත්‍යයන්ම අවබෝධ කර ගැනීම බවත් තේරුම් ගත යුතුය.



මිහිඳු මා හිමියන් ලංකා පුරයට (අනුරාධපුරයට) වැඩමකර උතුරුකුරු දීපවාසීන්ට දේශණා කර වදාළ සූත්‍ර ධර්මයන් 15 අතරින් පළමුකොටම චූලහත්ථිපදෝපම සූත්‍රය දේශණා කරමින්, දේශණා කර වදාලේ සංදේසනාවයි.

මේ අනුව අද සංදේසනාව යටපත් වී අභාවයට ගොස් උතුම් නිවන් මාර්ගයද සහමුලින්ම වැසී අදහන ආගමක් බවට පත්වී ඇත. දැන් මේ වනවිට යලිත් සංදේශණාව දේසනා කර, විග්‍රහ කර සංවර, සංසිඳීම, සම්මා, යන ත්‍රිශික්ඛා විග්‍රහ කර, බුද්ධඥාණ පද හතරම මතුකර පෙන්වා දී පින්වත් සද්ධස්ස කුලපුත්‍රයින්ට නිවන් දැකගන්නට උපකාරවන සේ මාර්ගය විවෘත කර දී ඇත. සංදේසනාවක් නොඅසා "සං" පදය තේරුම් නොගෙන උතුම් බුදු දහම තුල විග්‍රහ කරන "සංසාර" ගමන ගැන තේරුම් ගත නොහැකිය. සංසාර දුකෙන් මිදී නිදහස් වන්නට නම් බුද්ධ ඥාණ පද හතරම අර්ථ ධර්ම සහිතව තේරුම් ගෙන මාර්ග ප්‍රතිපදාව පූර්ණ කර ගත යුතුය. මාර්ග ප්‍රතිපදාව විග්‍රහ කලේ සංවර සීලය, සංසිඳීම නැමැති සමථ විපස්සනා හා සම්මා නමැති ආර්ය අශ්ඨාංගික මාර්ගය විග්‍රහ කිරීමෙන්ය.

ධර්ම සංඝායනාවක් පැවැත්වීම යනු බුද්ධ ඥාණ පද හතර විග්‍රහ කරමින් යලි සංදේශණාවක් අංග සම්පූර්ණ ලෙසින් දේශණා කිරීමයි. "සං"පද හතර විග්‍රහ කරන්නටම මුළු සංයුක්ත නිකායම උපයෝගී කරගෙන ඇත. සත්තිස්බෝධි පාක්ෂික ධර්මයන්ම සම්පූර්ණ කරගත හැකිවන්නේ සංවර, සංසිඳීම, සම්මා යන ත්‍රිශික්ඛා තේරුම් ගැනීමෙන්මය. සංඛාර, විසංකාර කරන්නට සමුදයන් නිරෝධ කරන්නට උපකාර වන සංදේශණාව සියලූම ලොව්තුරා බුදුන් වහන්සේලා විසින් දෙව් මිනිසුන්ගේ නිවන, විමුක්තිය, යහපත පිණිසම දේශනා කර වදාරන සේක. එදා අතීතයේ මෙන්ම, මෙදා වර්තමානයේත් ,මතු අනාගතයේත් සංදේශණාවක් යථාපරිදි දේශණාකර විග්‍රහ කරන්නට ධර්ම ඥාණයක් ලැබූ උත්තමයෙකු විසින්ම පටිච්චසමුප්පාද ධර්මය ලෝකයාට දේශණාකර නිවන් මඟ විවෘත කර දෙනු ලබයි. මේ අනුව පසුගිය වසර 1800ක් පමණ දිගු කලක් තුල සංදේශණාව යටපත් වී අභාවිතයට පත්ව තිබීම නිසා බොහෝ පිංවත් දෙව් මිනිසුන්ට නිවන් මඟ සාක්ෂාත් කර ගන්නට නොහැකි විය. දැන් ඉතා දිගු

කාල පරාසයකට පසුව යලිත් සංදේශනාව විග්‍රහ කර දේශනා කර පින්වත් දෙවි මිනිසුන්ගේ නිවන් මඟ, “මාර්ග චරියාව ” විවෘත කර දෙන්නට අවශ්‍ය සියළුම කරුණු කාරණාද සපුරා ඇත. දේශණාකර පෙන්වා දී ඇත.

**“නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස”**

මෙම පාඨය අද වන විට සම්මත වශයෙන් පිළිගෙන ඇත්තේත් භාවිතා කරන්නේත් නමස්කාර පාඨය ලෙසිනි. සම්මත වශයෙන් බෞද්ධයින් හැම හොඳ වැඩක්ම පටන් ගන්නේ මෙම පාඨය මුල්කොට ගෙනය. පන්සිල් සමාදන් වන්නට පෙරත් නමස්කාර පාඨය කියවති. ත්‍රිපිටක පොත් පෙලේ හැම පොතක්මත් ආරම්භ කරන්නේ මේ නමස්කාර පාඨය ඇතුලත් කිරීමෙනි.

ත්‍රිපිටක පොත්වල පවා මෙම පාඨය සිංහල භාෂාවට පරිවර්ථනය කරමින් පද පරම ලෙසින් මෙසේ ලියා ඇත. “ඒ භාග්‍යවත් අරහත්, සම්මා , සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.” යනුවෙනි. අද සම්මතයෙන් පද පරම ලෙස වැරදියට අර්ථ ගන්වා සම්මත බුද්ධාගමේ පින්වතුන්ට මෙම පාඨයේ තේරුම උගන්වා ඇති ආකාරයයි. මෙසේ පෙන්වා දුන්නේ අද උගත්, වියත්, මහාචාර්යවරුන් පවා පිළිගන්නා, ගරු කොට සළකන භාවිතා කරන එකම අර්ථයයි.

අටුවාචාරීන් වහන්සේලාද මේ පාඨය පිළිබඳව විවිධාකාර වූ ගාථා ගොතා විග්‍රහයන් ඉදිරිපත් කර ඇත. මෙහිදී ඒ අටුවාආචාරීන් වහන්සේලා දැක් වූ අර්ථයන් ගැන අපි සටහන් තබන්නට අදහස් නොකරන අතර මේ පාඨයේ සඳහන් පදවල පරමාර්ථය ධර්මානුකූලව විග්‍රහ කරන්නට පමණක් මෙහිදී අදහස් කරමු. නිවනට උපකාර මාර්ග චරියාව සම්පූර්ණ කර ගන්නට උපකාරවන අර්ථයෙන් මේ පාඨයේ අර්ථ, ධර්ම, නිරුක්ති, විග්‍රහ කිරීම මේ පොතෙහි මූලික පරමාර්ථයයි. පින්වත් ඔබ මෙය විමසිලිවත්ව කියවා තේරුම් ගන්නට උත්සාහ ගන්න.

මේ ගාථා පාඨයෙහි කොටස් 2ක් ඇත.

1. “නමෝ ”යන අකුරු දෙකෙන් මුල් කොටස විග්‍රහ කරයි.



2. භගවතෝ, අරහතෝ , සම්මා සම්බුද්ධස්ස යනුවෙන් දෙවන කොටස විග්‍රහ කරයි. මේ කොටස් දෙක සම්බන්ධ කරන පදය “තස්ස” යනුයි. “තස්ස” යන පදයෙන් හේතුඵල සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. ඡ ඡක්ක සූත්‍රයේ අවසාන කොටසේත් මේ හේතුව නිසා මේ ඵලය ඇතිවෙයි. මේ හේතු නැති කිරීම නිසා මේ ඵලය නො උපදියි, යන කරුණ ඉදිරිපත් කිරීමට “තස්ස” යන පදය භාවිතා කර ඇත. මාගධී භාෂාවේ හේතුඵල සම්බන්ධතාවයක් විග්‍රහ කරන්නට තස්ස යන පදය භාවිතා කළ බව පෙන්වා දිය යුතුය.

“නමෝ ” යනු පද දෙකකි. “මෝ” යන පදයෙන් මෝහය, මවු කුසකට ඇතුළු වීම යන අර්ථයත් “න” යනුවෙන් මෝහය නැති කිරීම නැවැත්වීම නතර කිරීම යන අර්ථයත් පෙන්නුම් කරයි. මේ අනුව “නමෝ” යනු මෝහය සහමුලින්ම නැති කිරීම, නැවත මවු කුසක උපතක් ලබන්නට හේතුවන සියලු කරුණු වලින් මිදී නිදහස් වීම යන අර්ථය ගෙන දෙයි. “නහි ජාතු ගබ්බ සෙයියං පුනරේතීති” යනුවෙන් දේශණා කලේද “නමෝ” යන පදයෙන් විග්‍රහ කරන ලද අර්ථයෙන්මය. “මො” යනු මවට නමකි. යම් සත්වයෙකු නැවත නැවතත් මවුකුසකට යන්නේ මෝහය නිසා පංචස්කන්දයම උපාදානය කරගන්නා නිසාය. මෝහය සහමුලින්ම සිතින් නැතිකර දැමූ මෝහය සිතේ යලි නොඋපදවන පුද්ගලයා යලි මවු කුසක පිළිසිඳ නොගනී. මේ අර්ථයෙන් “නමෝ” යන පදය මෙතැනදී භාවිතා කර ඇත.

“නමෝ” යන පදය පසු කාලයකදී නමස්කාර කිරීම යන අර්ථයෙන් ලියා දක්වන්නට හේතු වූයේ “නමස්තේ” යන සංස්කෘත පදයේ අර්ථය පදපරම ලෙසින් බුද්ධාගමට ආරෝපනය කර ගැනීමෙනි. මාගධී බුද්ධ භාෂාවෙහි “වන්දාමි” යන පදය වන්දනා කිරීම, නමස්කාර කිරීම යන අර්ථයෙන් භාවිතා කර ඇත. ආටානාටිය සූත්‍රයෙහි බොහෝ තැන්වලදීත් සත්බුදු වන්දනාවක් කල බව “වන්දාමි” යන පදය භාවිතා කරමින් විග්‍රහ කර ඇත. බුද්ධ දේශණාවේ හෝ මුල් යුගයේ බුද්ධ භාෂිතයේ හෝ “නමෝ” යන පද දෙක භාවිතා කලේ මෝහය සහමුලින්ම නැසූ , මෝහය නැතිකරගත් යන අර්ථය විග්‍රහකර පෙන්වන්නට මිස නමස්කාර කිරීමට හෝ වන්දනා කිරීමට හෝ නොවේ. මුළු බුදුදහමේම මාර්ග චරියාවේම

ඒකායන පරමාර්ථය සිතක උපදින මෝහය සහමුලින්ම නැති කර දැමීමයි. මෝහය නැති කර දැමූ අවස්ථාවකදී පමණක් පුද්ගලයා පූර්ණ විමුක්තියට පත්වන්නේය. "නමෝ" යන පදයේ ඇති ඉතා ගැඹුරු ධර්ම අර්ථය පදපරම ලෙස හරයක් අර්ථයක් නැති ආකාරයට අද භාවිතා කරන බව මෙයින් තේරුම් ගත යුතුය. ආගමක් යනු වැඳුම්, පිදුම්, පැතුම්, යැදුම්, මුල් කර ගත් භක්තියෙන් අදහන විශ්වාස කරන දෙයකි. මේ නිසා බුදු දහමේ පෙන්වා වදාළ ධර්ම පදයක් වන "නමෝ" යන පදයේ ධර්ම අර්ථය යටපත් කර ආගමට ගැලපෙන සේ වැඳුම් පිදුම් කරන්නට උපකාර වනසේ මේ පද පෙළත් යොදා ගත් බව පැහැදිලිය. නිවන් දැකීම යනු වැඳීමෙන් , පිදීමෙන් හෝ නමස්කාර කිරීමෙන් හෝ කරගත හැකි දෙයක් නොව මෝහය නැති කර දැමීමෙන්ම කරගත යුතු දෙයක් බව පසක් කොට දැක ගත යුතුය.

මේ ගාථාවේ දෙවන කොටස වූ භගවතෝ, අරහතෝ, සම්මා, සම්බුද්ධස්ස යනුවෙන් මූලික කරුණු හතරක් විග්‍රහ කර ඇත. මේ කරුණු හතරම සම්පූර්ණ කර ගැනීම නිසා එහි ඵලය ලෙසින් මෝහය සහමුලින්ම නැතිවිය යන අර්ථය මෙහිදී ඉදිරිපත් කර ඇත. මේ කරුණු හතරම නියත වශයෙන්ම පුද්ගලයෙකුගේම සිතක උපත ලබන මෝහය නැතිකර ගැනීම සඳහා උපකාර වන මූලික කරුණු හතරකි.

1.**භගවතො**:- යනු වත භාග කර බෙදා බැලීමයි. මුළු විභංග ප්‍රකරණයෙහිම දක්වා ඇත්තේ විවිධාකාරයෙන් "වත" භාග කර බෙදා බැලීමයි. වත යනු හිත ගත දෙකේම එකතුවකි. අපි පුද්ගලයෙකු, ද්‍රව්‍යයක්, වස්තුවක් කියා දකින දෙය කොටස් කර බෙදා බලන්නට පුරුදු විය යුතුය. ස්කන්ධ, ගොඩවල් පහක් ලෙසින් බෙදා බැලීම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ගොඩවල් පහක එකතුව බෙදා බලා යථාපරිදි තේරුම් ගැනීමත් නිසා මෙහි ඇති ඝන සඤ්ඤාව, ද්‍රව සඤ්ඤාව බිඳ වැටෙයි. චක්ඛු , සෝත, ඝාණ , ජිව්හා, කාය, මනෝ වශයෙන් බෙදා බැලීමෙන්ද ඝන සඤ්ඤාව බිඳ දැමිය හැකිය. ආපෝ, තේජෝ, වායෝ පඨවි, ආකාස, විඤ්ඤාණ වශයෙන්ද බෙදා බලා ඝන සඤ්ඤාව බිඳ දැමිය හැකිය. දෙතිස් කුණප කොටස් ලෙසින් බෙදා බැලීමෙන්ද ඝන සඤ්ඤාව, සත්ව පුද්ගල සඤ්ඤාව බිඳ දැමීම මගින්ද මෝහයෙන් මිදීමට මෙන්ම නිච්ච,



සුඛ, සුව, අත්ත යන වැරදි සඤ්ඤාවන්ගෙන් මිදී නිදහස් වීමටද බලවත් සේම උපකාර වෙයි. මේ අනුව මුළු පටිසම්භිදාමග්ගප්පකරණ විග්‍රහයේම කර ඇත්තේ මේ ආකාරයට වත භාග කර බෙදා බැලීමෙන් ඝණ සංඥාව දුරු කර ගන්නට උපකාර වන සේ කරන ලද විග්‍රහයකි. එමෙන්ම විභංගප්පකරණයම භාවිතා කර ඇත්තේ විවිධාකාරයෙන් මේ බඹයක් පමණ වූ වත (ගත හිත) බෙදා බලා භාගකර මෙහි ඇති යථාස්වභාවය තේරුම් කර දීමටයි. මේ නිසාම මුල් යුගයේ බුදු දහම විභජ්ජවාදය ලෙසින්ද එවකට හැඳින්විය. "ආචික්ඛනා දේසනා පට්ටපනා , පඤ්ඤපනා විභජනා විවරණා උත්තානිකම්මන්තා" යනුවෙන් "සච්ච විභංග" සූත්‍රයේ ද මේ දහම විභංග කර පෙන්වීය. මෙසේ විභංග කලේ බෙදා පෙන්වූයේ බඹයක් පමණ වූ මේ පුද්ගලයා සත්වයා යනුවෙන් හඳුන්වන ගත හිතය. මේ නිසා මෝහය නැති කර ගැනීමට මේ බෙදා බැලීම මහෝපකාරී වෙයි.

2.**අරහතෝ**:- පෘතග්ජන ලෝකයා පංචස්කන්දයම උපාදානය කරගන්නේ ලෝකය උරාබී පානය කර ලෝකය රස බැලීම සඳහාමය. ඇසින් රූපයක් දුටුවිට ඒ රූපය උරාබී පානය කර රස බලා ආස්වාදයක් ලබයි. කනෙන් ශබ්ධ රූපයක් ඇසුනු විට ඒ ශබ්ධ රූපය රස බලා උරාබී ආශ්වාදයක් ලබයි. නාසයෙන් , දිවෙන්, කයෙන්ද මේ ආකාරයටම ගඳ , සුවඳ රස හා පහස උරා බී ඉන් ආශ්වාදයක් ලබයි. මේ ආස්වාදය ලැබීම හේතුකොට ගෙනම විඤ්ඤාණ ශක්තියක්ද ජනිත වෙයි. විඤ්ඤාණ ශක්තියක් නිර්මාණය කර ගනී. මෙම රස බැලීමේ ක්‍රියාවලිය නිසා තුන් ලෝකයම දිගින් දිගටම මම මට මගේ ලෙසින් පවත්වා ගන්නට සිදුවෙයි. පංචස්කන්දයන්ම උපාදානය කර ගැනීමටද මෙම රස බැලීම් මුල් වෙයි. මේ හේතුකොට ගෙනම රාගයෙන් ප්‍රිය දේට බැඳීම , ද්වේශයෙන් අප්‍රිය දේට ගැටීම, මානයෙන් මුලා වී වැරදි සේ මැනීම යන සසරට බැඳෙන ක්‍රියාකාරකම් තුනමත් පෘතග්ජන පුද්ගලයෙකු අතින් සිද්ධ වෙන්නේ රස බැලීමේ ක්‍රියාවට පෙළඹෙන නිසාය.

මේ ආකාරයෙන් ලෝකය රස බැලීම යම් අවබෝධයකින් අත්හැරිය හැකි නම් තුන් ලෝකයෙන්ම මිදී නිදහස් විය හැකිය. කාමාවචර ලෝක, රූපාවචර ලෝක , අරූපාවචර ලෝක යන තුන් ලෝකය තුලම පෘතග්ජන

පුද්ගලයා අතරමං වන්නේ මේ රහබැලීමේ හේතුව නිසාමය. බුදු දහමෙන් උගන්වන්නේ මේ පංචස්කන්ද ලෝකයම, ඇස, කණ, නාසය, දිව, කය, මන නමැති සදොරින් උරාබී රස බැලීම නවත්වා දමා උපේක්ඛා සිතින් කටයුතු කරන්නට ඉගැන්වීමයි. ඒ සඳහා කළ යුතු  දේ මේ ආකාරයට පටිච්ච වීම නවතා, රස උරාබීම නවතා, ආස්වාදයක් ලැබීම නවතා දමා මේ පැවැත්මේ නියත ස්වභාවය වූ  අනිච්ච බව, දුක්ඛ බව, අනත්ත බව තේරුම් ගැනීමයි. මෝහය නැති කරගත හැක්කේ සහමුලින්ම ලෝකය රස බැලීම අතහැර සංඛාර උපේක්ඛා ඥාණයෙන් ක්‍රියාකරන්නට පුරුදු වීමෙනි. මේ තත්වය විග්‍රහ කලේ අරහං, අරහත් යන පදයෙනි. අද මේ අරහත් යන පදය වෙනුවට රහත්, රහතුන් වශයෙන් ආදී පදවලින් සිංහලට පරිවර්ථනය කරගෙන භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම වැරදිය. මාගධී ත්‍රිපිටකයේ හැම තැනකම ඇත්තේ අරහත්, අරහං යන පදයන්ය. එහි තේරුම පංචස්කන්ද ලෝකය උරා බීම නවතා දමා, ලෝකය රහ බැලීම අත්හැරී පුද්ගලයා යනුයි. මෝහය සහමුලින්ම නැතිවන්නේ ලෝකය රස බැලීම, පංචස්කන්දය උපාදානය කර ගැනීම, සහමුලින්ම නවතා දැමූ විටකදීය. ඒ අනුව අරහත් තත්වයට පත්වීමේදී කරගත යුතු වන්නේ ලෝකය රහ බැලීමේ තත්වයෙන් මිදී නිදහස් වීමයි. අරහත් යන මේ පදයෙන් විග්‍රහ කරදී ඇත්තේ මේ අර්ථයයි.

3. **සම්මා** ඃ- “සං + මා ” යනු පද දෙකකි. “සං” යන පදයෙන් මාගධී භාෂාවෙහි විග්‍රහ කලේ රාග, ද්වේශ, මෝහ යන (පද) තුනේම එකතුවෙන් සකස්වන කෙලෙස් ගතිය පිළිබඳවයි. “සං” යනු සංසාර ගමනට සම්බන්ධ කරවන ගති තුනයි. සමුදය යනු මේ “සං ගති” අලුතින් සිතක උපත ලැබීම විග්‍රහ කරණ පදයයි. “සං” වටිනවා ප්‍රියයි, මනාපයි, යන තීරණයට බැස ගැනීම “සංසාර” යන්නෙහි තේරුමයි. මේ කෙලෙස් ගති තුනම හේතුකොට ගෙන මිස වෙනත් කිසිදු හේතුවක් නිසා පුද්ගලයෙකු සත්වයෙකු සංසාර ගමනට සම්බන්ධ වන්නේම නැත.

මේ කෙලෙස් ගති තුනෙන්ම සහමුලින්ම මිදී නිදහස් වීම යන අර්ථයෙන් “සම්මා” යන පදය මාගධී භාෂාවෙන් විග්‍රහ කර දී ඇත. “මා” යනු යමකින් සම්පූර්ණයෙන්ම මිදී නිදහස් වීමයි. මෙය මීට කලින්



පරිච්ඡේදයකදීත් ඉතාමත්ම පැහැදිලිව මූලපරියාය සූත්‍රයේ විග්‍රහයන් ආශ්‍රයෙන් විග්‍රහකර පෙන්වා දී ඇත. “සම්මා” තත්වයට යම්කිසි කෙනෙකුට පත්විය හැක්කේ “සංවර වී සංසිඳවා” ලීමෙන් පසුවමයි. මේ නිසා සම්මා යනු රාගයෙන් මිදී නිදහස් වීමයි. ද්වේශයෙන් මිදී නිදහස් වීමයි, මෝහයෙන් මිදී නිදහස් වීමයි. නමෝ යන උතුම්  තත්වයට පත්වීමට මේ අනුව “සම්මා” තත්වයට පත්වීම අනිවාර්යය අවශ්‍යතාවයකි.

4. **සම්බුද්ධස්ස** ඃ- සං - බු - උද්ධස්ස යනු පද තුනකි. භව උදුරා දැමීම යන අර්ථය මෙහි දී (බුද්ධ) තේරුම් ගත යුතුය. එනම් හේතුං පටිච්ච සංභූතං යනුයි. “සං” භවං යනු රාග බව, ද්වේෂ බව , මෝහ බව යන කෙලෙස් මුල් තුනයි. මෙම කෙලෙස් මුල් තුනම සිතකම මුල්බැසගෙන පවතින, සිතකම යලි යලිත් උපදින, සංසාර  දුක නිර්මාණය කර දෙන වැරදි අධර්ම චරියාවට මුල්වන හේතුවයි. රාග මුල, ද්වේශ මුල, මෝහ මුල සිතින් උදුරා ඉවත් කර අස්කරන තුරුම සංසාර ගමනද ගමන් කරයි. ඒ කාම භව, රූප භව හෝ අරූප භව යන තුන්තරා භව වලින් එකකය. මෝහය සහමුලින්ම නැති කරගෙන යලි මෝහය නොඋපදින ලෙසින් අවසන් කල හැක්කේ මේ කෙලෙස් භව උදුරා දැමීමෙනි. උදුරා දැමිය යුතු “සං භව” තුනම යලි නූපදින ලෙසින් උදුරා අස්කර දැමීම මෝහය සහමුලින්ම නැසීමට හේතු වෙයි. සම්බුද්ධස්ස යන පදයේ පරමාර්ථ තේරුම මෙයයි. “භව උදුරා” අස්කර සමුදය යලි  නො උපදවීමයි.

මේ අනුව “නමෝ තස්ස භගවතෝ , අරහතෝ, සම්මා සම්බුද්ධස්ස” යන ගාථා පාඨයේ  ඉතාමත් ගාම්භීර අර්ථයක් අඩංගුව ඇත. සියළුම ලොවුතුරා බුදුපියාණන් වහන්සේලාද පසේ බුදුපියාණන් වහන්සේලාද අරහත් බුද්ධත්වයට පත් සියළුම උත්තමයින් වහන්සේලා ද මෝහය සහමුලින්ම නසා දමා යලි මෝහය සිතේ නොඋපදින ලෙසින්ම මෝහයෙන් මිදී නිදහස් වූ බවත්, එසේ මෝහය නැති කර ගත්තේ වත භාග කර බෙදා බලා යථාභූත ඥාණ දර්ශණයක් ලැබීමෙනුත්, ලෝකය රහ බැලීම සහමුලින්ම අතහැරීමෙනුත්, රාග, ද්වේශ , මෝහ ගති තුනෙන්ම මිදී නිදහස් වීමෙනුත්, යලි යලිත් කෙලෙස් ගති උපදින්නට හේතු වූ කෙලෙස් මුල් උදුරා අස්කර දැමීමෙනුත්ය. මෙය නිවන් අවබෝධ කරගත් සෑම ආර්යයන්

වහන්සේ කෙනෙකුගේම නියත නිකෙලෙස්තාවය විග්‍රහ කර විස්තර කර දීමකි. මේ ගාථාව යම් විශේෂිත පුද්ගලයෙකුට විශේෂ කොට වන්දනාමාන කිරීමක් සඳහා හෝ නමස්කාර කිරීමක් සඳහා හෝ යන පදපරම අර්ථයෙන් භාවිතා කළ පාඨයක් නොවන බවද තේරුම් ගත යුතුය. මෙසේ පදපරම ලෙසින්  මෙම ගාථාව නමස්කාර කිරීමට , වන්දනා කිරීමට භාවිතා කරන පාඨයක්, ගාථාවක් ලෙසින් පසුකළෙක භාවිතා කරන්නට පටන්ගත්තේ ආගමක් මතු වී භක්තියෙන් ආගම අදහන්නට පටන් ගැනීමත් සමඟමය. බුදු දහම ආගමක් බවට පෙරලාගත් පසුවය.

මේ අනුව උතුම් බුද්ධ ධර්මය නිවැරදිව තේරුම් ගන්නට උත්සාහ කරන සියළුම පිංවතුන් විසින් මෙම ගාථා පාඨයෙන් කියැවෙන්නේ තමන්ගේ සිතේ පවතින, උපදින මෝහය සම්පූර්ණයෙන්ම නැතිකර ප්‍රඥා විමුක්තියට පත්වන්නට අත්‍යාවශයෙන්ම සම්පූර්ණ කරගත යුතු කරුණු හතරක් පැහැදිලි කර පෙන්වාදීම බව තේරුම් ගත යුතුය.

## පින හා කුසලය

සබ්බ පාපස්ස අකරණං  -  කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං  -  ඒතං බුද්ධාන සාසනං

පින්වත්නි, අද මේ පින්වතුන් සැදී පැහැදී බණ අහන්නේ එදා ලොව්තුරා බුදුපියාණන් වහන්සේ විසින් ලෝකයාගේ නිවීම පිණිස, විමුක්තිය පිණිස, දේශණා කොට වදාළ උතුම් ධර්ම දේශණාවකට සවන් දී තමන්ගෙ සිත පහදා ගන්නටයි. තමන්ගේ සිතේ උපදින රාග, ද්වේශ, මෝහ ආදී වූ කෙලෙස් ප්‍රහාණය කරල හිත නිරෝධ කරල හිතේ විමුක්තියක් විරාගයක් ඇතිකර ගන්නටයි. මේ පින්වතුන් අද මනුෂ්‍යත්ව පටිලාභයක් ලැබූ අය හැටියට, මිනිසුන් හැටියට, මේ ධර්මය ශ්‍රවනය කරන පින්වතුන් හැටියට බොහෝ පින්කම් කරනවා. තවත් අය කුසල් කරනවා. මේ පින සහ කුසල් යන පද දෙකෙන් විග්‍රහ කරපු දේ බොහෝ දෙනෙක් අද පටලවාගෙන තියෙනවා. පින එකක්, කුසලය තවත් එකක්. බුදුහාමුදුරුවෝ නිවන් අවබෝධ කර ගන්නට උපකාර වන කාරණා විග්‍රහ කරපු ගාථාවක් තමයි මම දැන් ප්‍රකාශ කළේ. යළිත් මේ ගාථාව මෙනෙහි කළොත්,



සබ්බ පාපස්ස අකරණං  -  කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං  -  ඒතං බුද්ධාන සාසනං

මේ ගාථාවෙන් ප්‍රකාශ කරල තියෙන්නේ නිවනට පැහැදිලි, පිරිසිදු මාර්ගයක්. බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වන්නට පෙරත් මිනිස්සු පින්කම් කළා. එදා බුදුහාමුදුරුවෝ බ්‍රහ්ම ජාල සූත්‍රයේදී කියපු ආකාරයට ජෛන, උපනිශද්,  වේද , ශිව ආදී වූ විවිධාකාර පෙරදිග ආගම් 64ක් පමණ අදහමින් තිබුණා. ඒ හැම ආගමකම වාගේ මිනිස්සු යම් ආකාරයකට සම්මතයක් හැටියට, පිළිගත් සම්ප්‍රදායක් හැටියට පින්කම් කිරීමේ සිරිතක් එදාත් පැවතුනා. පින්කම් කිරීම බුද්ධොත්පාද, අබුද්ධොත්පාද කාලයන් දෙකේම  කරන්නට පුළුවන්. හැබැයි බුදු කෙනෙක් උපදින්නේ මිනිසුන්ට පින්කම් කරන්න පමණක් කියා දෙන්න නෙමෙයි. ඊට වඩා මේ කුසලස්ස උපසම්පදා කියන තත්වය තේරුම් ගෙන කුණු සලා හැර අස්කරලා හිතේ උපදින කෙළෙස් ගති සහමුලින්ම අයින් කරලා කෙලෙස් මුල්උදුරලා අස්කරලා දාන්න කියා දෙන්නයි. ඒ නිසා පින කියන එකත්, කුසලස්ස උපසම්පදා කියන එකත් බොහෝ ආකාරයකින් වෙනස් වූ ක්‍රියාකාරකම් දෙකක්. එකක්ම නොවෙයි. බුදු කෙනෙක් බුද්ධත්වයට පත්වෙලා දේශනා කරන මේ ධර්මය සහමුලින්ම පින්කම් කිරීමට එපා කියූ ධර්මයක්ද නොවෙයි. බුදුහාමුදුරුවෝ "නන්දා " කියන සූත්‍රයේ විශේෂයෙන්ම සඳහන් කරලා තියෙනවා "නන්දාවනි පින්කම් කළ යුතුමය" කියලා. බුදුහාමුදුරුවෝ පින්කම් කිරීම ප්‍රතික්ෂෙප කළේත් නෑ. බැහැර කළේත් නෑ. ඉවත් කළේත් නෑ. අස්කළේත් නෑ. හැබැයි බුදුහාමුදුරුවෝ පැහැදිලිවම පිරිසිදුවම දේශණා කළා පින්කමක් කරලා විතරක්ම නිවන් අවබෝධ කර ගන්නට, එහෙම නැත්නම් සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණ කර ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නෑ කියල. දැන් ඒ වෙනුවට අද තවත් ආකාරයක වෙන දෙයක් කියන්නටත් පුරුදු වෙලා තියෙනවා. පින්කම් කරලා හරියන්නෙත් නෑ. භාවනා කරලා විතරයි නිවන් දකින්නට පුළුවන් වෙන්නේ කියලා. මේ භාවනාව කියන එකත් හරියට තේරුම් නොගෙනයි මේ කථාව කියන්නේ, ඒ නිසා හැම කෙනෙක්ම කල්පනා කළ යුතුයි, පිනත්, කුසලයත්, ශීලයත්, සමාධියත්, ප්‍රඥාවත්, භාවනාවත් මේ සියළුම දේ නිවනට උපකාර වන ආකාරයට යම් ප්‍රතිපදාවකට අනුව  යොමු වෙලා  ඒ පිළිවෙත, ප්‍රතිපදාව,

සම්පූර්ණ කර ගන්න ඕන කියලා. ශීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්ඛාව සම්පූර්ණ වන ප්‍රතිපදාව තමා සංවර, සංසිඳීම, සම්මා කියන ප්‍රතිපදාව, එහෙම නැතිනම් සතර සංවර ශීලය, සමථ විපස්සනා භාවනා දෙක. ඒවාගේම ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියන මේ සියළු දේවල් නියත වශයෙන්ම උපකාර වෙනවා නිවන් අවබෝධ කර ගන්නට, මඟඵල ලබන්නට, ආසවක්ඛයා ඥාණය ලබන්නට, කෙළෙස් සහමුලින්ම ප්‍රහාණය කර දමා සිතේ කෙළෙස් යළි නූපදින ලෙස අනුත්පාද ලෙස නිරෝධ කරලා ඉවත් කර දමන්නට. ඒ නිසා බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ කාලයේ, ඒ යුගයේ, ඒ අවස්ථාවේ, නොයෙකුත් ආගම්වල තිබූ බොහෝ යහපත් හොඳ දේවල් උන්වහන්සේත් අතහැරියේ නෑ. ඒ සියළුම හොඳ දේවල් බුදුහාමුදුරුවෝ මේ නිවන් මඟට උපකාර වන ආකාරයට අළුතින් අර්ථ ධම් නිරුක්ති ඉදිරිපත් කරලා "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු", කියන න්‍යාය ධර්මයට අදාලව අලුත් අර්ථයක් ධර්මයක් මේ හැම එකකටම ඉදිරිපත් කළා, දැන් අපි කල්පනා කරනවා නම්, බුදුහාමුදුරුවන්ගේ දෙයක් නොවෙයි මේ මල් පූජා කිරීම, ජෛන ආගමේ දෙයක්. දේව ආගම්, සිව ආගම් ආදී සියලු ආගම්වලත් මල් පූජා කිරීම කළා. පහන්, සුවඳ දුම්, හඳුන්කූරු පත්තු කළා. මේවා ඒ ආගම්වලත් පැවතුනා. ඒවාගේම දානමාන දීම, දන්දීම පැවතුනා. මහණ බමුණන්ට, තීර්ථකයන්ට, නිගන්ඨයන්ට, පරිබ්‍රාජකයන්ට ආදී බොහෝ අයට බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වන්නට පෙරත් බුද්ධ ශ්‍රාවකයන් ඇතිවන්නට පෙරත්, බොහෝ රජවරු සිටුවරු දන්කද පැවැත්වූවා. ඒ නිසා මේ දානය බුදුහාමුදුරුවන් ආරම්භ කළ දෙයක් නොවේ. ඒවාගේම එදා මහාමායා දේවිය බෝසත්තුමා උපදින්නට පෙරත් සිල් සමාදන් වුනා. ඒ නිසා පන්සිල්, අටසිල්, දසසිල් මේ ආදී කොට ඇත්තාවූ සීල සමාදානය බුදු හාමුදුරුවන්ගේ දෙයක් නොවේ. ඒ කාලයේ බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වන්නට පෙරත් එදා ඒ පැවති බොහෝ ආගම් වලත් යම්කිසි සීලයක් ආරක්ෂා කළා. සීලයක් සමාදන් වුනා. සීලයක පිහිටියා. ඒවාගේම භාවනා කිරීමත් අතීතයේදීත් තිබුණා. නමුත් විපස්සනා භාවනාව කියලා එකක් දැනගෙන තිබුනේ නෑ. නමුත් සමථය, ප්‍රාණයාම භාවනාව හැටියට ආනාපාන භාවනාව වැනි නොයෙකුත් ආකාරයේ භාවනා ක්‍රම එදා ජෛන ආගමේත්, වේද ආගමේත්, ශිව



ආගමේත් තිබුණා. ඒවාගේම , සම්මා අංග අටකුත් නාමික වශයෙන් එදත් තිබුණා. මේ කිසිම දෙයක් බුදුහාමුදුරුවෝ අළුතින්ම හොයලා දැනගෙන දේශණා කළ දේවල් නොවේ. මේ කියන බොහෝ දේ පින්කම් ගණයට ගැනෙන දේවල්. නමුත් බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වන්නට පෙර ලෝකයා විසින් නොඇසූවිරූ ධර්මයක් එදා අලුතින්ම දේශණා කළා. ඒක තමයි මේ කුසලස්ස උපසම්පදා, එහෙම නැතිනම් කෙලෙස් මුල් උදුරා ගලවා ඉවත් කිරීමට උපකාර වන "සං" පහදා ඉවත් කිරීම, "උපසංපජ්ජ විහරති" කියන තත්වයට පත්වීම. ඒ නිසා කෙළෙස් කෙළෙස් හැටියට තේරුම් ගැනීමෙන් සිතේ උපදින කෙළෙස් මුල් තේරුම් ගැනීමත්, අකුසලය අකුසලය හැටියට තේරුම් ගැනීමත්, කුසලය කුසලය හැටියට තේරුම් ගැනීමත් බුදුහාමුදුරුවන්ගේ ධර්මයේ මූලිකම හරයයි.

කුසලං පජානාති - කුසල මූලං පජානාති
අකුසලං පජානාති - අකුසල මූලං පජානාති

මේ හතර තමා බුදුහාමුදුරුවෝ නිවන් මඟට උපකාරවන ආකාරයට දේශනා කළේ. හැබැයි මෙහෙම දේශනා කරපු බුදුහාමුදුරුවෝ පින්කම් කිරීම සම්පූර්ණයෙන් බැහැර කළේ නෑ. ඉවත් කළේත් නෑ. පින්කම් කරන්න එපා කීවෙත් නෑ. හැබැයි බුදුහාමුදුරුවෝ පැහැදිලිවම පිරිසිදුවම දේශනා කළා, පිනෙන් පමණක්ම නිවන් දකින්නට බැරි බව. මේ පින්වතුන්, මනසක් තියෙන අය හැටියට බොහෝ පින්කම් කරනවා. එදා බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වන්නට, පෙරත් මිනිස්සු පින්කම් කලේ තමන්ටම යම් ආකාරයක ප්‍රතිලාභයක් ආපසු ලබා ගැනීමටයි. බුදුහාමුදුරුවෝ "බ්‍රහ්මජාල" කියන සූත්‍රයේදී පැහැදිලිවම දේශනා කළා, බ්‍රහ්මත්වයට පත්වන්නට, දේවත්වයට පත්වන්නට, රජසැප සිටු සැප ලබන්නට මිනිස්සු එදත් පින්කම් කළ බව, ඒ හැම තැනකම පින්කම් කළේ තමන්ටම දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් මේ ජීවත්වන ආත්මභාවයේදී හෝ ඉන් පස්සේ උපදින තැනකදී හෝ යම් ආකාරයකට සැප සම්පත් සුව පහසුකම් ලබා ගැනීමේ චේතනාවෙන් සහ බලාපොරොත්තුවෙන්. ඒක සියලුම දේව ආගම්වල ඒකායන පරමාර්ථය වුණා. ඒ ආගම්වල නිච්ච වූ බ්‍රහ්මත්වයක්, එහෙම නැත්නම් දේවත්වයක්, එහෙම නැතිනම් ස්වර්ගයක්

විශ්වාස කරනවා. නමුත් බුදු හාමුදුරුවෝ දේශනා කරපු ආකාරයට නිච්ච වූ ස්වර්ගයක් දේවත්වයක් හෝ නිච්ච වූ බ්‍රහ්මත්වයක් හෝ නෑ. බුදුහාමුදුරුවෝ පින්කම් කරන්න කීවේ පුද්ගලයාගේ සිතේ උපදින කෙලෙස් ගති ප්‍රහාරණය කරලා අස් කරල ඉවත් කරල හිත පිරිසිදු කර ගන්නට උපකාරවන මාර්ගයක් මාධ්‍යයක් හැටියටයි. පින්කමක් කරගන්නේ නැතිව චිත්ත ප්‍රසාදයට පත්වෙන්න බෑ. ප්‍රසාදයක්, ප්‍රමෝදයක්, අධිමොක්ඛ කියන තත්වයට පත්වෙන්න බෑ. බුදුහාමුදුරුවෝ හැම අවස්ථාවකම පින්කම් කිරීම අනුදැන වදාළා. හැබැයි ඊට එහා ගිය තවත් නිර්දේශයක් නිර්දේශ කළා. ඒක තමා පින්කමක් කරන හැම අවස්ථාවකම ඒක කුසලයක් බවට පරිවර්ථනය කර ගන්නට අවශ්‍ය මාර්ගෝපදේශයකුත් කියා දුන්නා. බුදුහාමුදුරුවෝ බුද්ධත්වයට පත්වුන කාලයටත් වඩා අද පවතින, අදහන අපේ බොහෝ ආගම්වල මහායාන බුද්ධාගමේත්, හෙළබිමේ අදහන ථෙරවාදී කියා ගන්නා බුද්ධාගමේත් බොහෝ අය පින්කරලා දෙව් මිනිස් සැප පතන්නට, මතු බුදු වන මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නට විශාඛා, නන්දා, මල්ලිකා, සුමනා, සුනන්දා මෙන් රූප සම්පත්, ධන සම්පත්, බෝග සම්පත් ලබන්නට, පතන්නට ප්‍රාර්ථනා කරන්නට, යදින්නට, යාඥා කරන්නට උපකාර වන ආකාරයටයි පින්කම් කරන්නේ. ඒක දැන් සම්ප්‍රදායක් බවට පත් වෙලා. ඒ නිසා මේ පින්වතුන්ගේ ගෙදරක පින්කමක් කළොත් හාමුදුරුවෝ බැරිවෙලාවත් එහෙම පිං වාක්‍යයක් කියල දෙව් මිනිස් සැප ලබන්න මේ පින හේතු වාසනා වේවා කියලා පින් දුන්නේ නැතිනම් “අපොයි මේ පින්කමෙන් වැඩක් නෑ” කියලා හිතනවා. ඒ තත්වයට අපේම අය අද පත්වෙලා. නමුත් පින්වතුනි, අපි පින්කමක් කළ යුත්තේ මේ කරන පින්කමෙන් අපේ තුන් හිත පහදා ගෙන චිත්ත ප්‍රසාදයට පත්කරගෙන පින්කමෙන් උපයා සපයා ගත් පුණ්‍ය ශක්තිය මගින් පින් අනුමෝදන් කරන්නට, පින් පතුරවන්නට , පින් පිහිටුවන්නට උපකාර වන ආකාරයටයි. ඒ නිසා සෑම කෙනෙක්ම කල්පනා කළ යුතුයි අපි මේ පින්කම කරන්නේ සංසාරයේ කවදා කොතනකදී කාට හෝ ණයක් වුනා නම් ණය ගණුදෙනුවකට බැඳුණා නම්, සම්බන්ධයක් ඇති වුණා නම් අපට යමෙක් උදව්වක් උපකාරයක් කළා නම් පිහිට වුණා නම් පිළිසරණ වුණා නම්, ඒ හැම කෙනෙකුටම මේ පින් දීලා , පින් පවරල, පින් අනුමෝදන් කරල, පින්



පිහිටුවල, ඒ අය කළ උදව්ව වෙනුවට, ඒ අයටත් උදව්වක් කරල උපකාරයක් කරල මේ ණයෙන් මිදෙන්න ඕන, නිදහස් වෙන්න ඕන කියලා හිතාගෙනයි. ඒ නිසා මිනිසෙක් වුණ හැම කෙනෙක්ම කල්පනා කරන්න ඕන පින්කමක් කරල, ඒක අර්ථවත් විදියට කුසලයක් බවට පත්කර ගන්න. මේක හැම දෙනෙක්ම බොහොම අවධානයෙන් අහල දැනගෙන තේරුම් ගත යුතු දෙයක්. දැන් අපි හොඳටම දන්නව මේ ධර්ම දේශනාවක් කරන විටත්, දානයක් දෙන විටත් තවත් නොයෙක් ආකාරයේ පින්කම් කරන විටත් පින් ගන්නටත් බලාපොරොත්තුවන අති විශාල අමනුස්ස පිරිසක් මෙතනට පැමිණ සිටින බව.

මේකත් විග්‍රහ කරගත යුතු දෙයක්. කාටද පින් ගන්න පුලුවන්? කාටද පින් ගන්න බැරි? පින් ගන්න එන්නේ කවුද? පින් ගන්න නොඑන්නේ කවුද?. අතීතයේ තමන්ගේම අම්මල, තාත්තල වුණ, සහෝදර සහෝදරියන් වුණ, ගුරුවරු ඥාතීන්, සීයලා, ආච්චිල, ස්වාමි පුරුෂයන්, භාර්යාවන්, දූ දරුවන් මුනුබුරන් , අසල්වාසීන් මේ ආදී කොට ඇත්තා වූ තමන්ගේ සංසාරෙ ඥාති පරපුරේ බොහෝ දෙනෙක් මිය පරලොව ගිහින් තියෙනවා. අපි ඒ අය ගැනත් කල්පනා කරල හැම කෙනෙකුටම උදව් කරන්න, උපකාර කරන්න ඕනෑ. අම්මලා, තාත්තලා, ගුරුවරු, වැඩිහිටියෝ, ස්වාමිපුරුෂයන්, භාර්යාවන් මේ හැම දෙනෙක්ම කවදාහරි මිය යනවා. අතීතයෙත් මිය ගියා. ඒ නිසා අපි ඉපැදුන හැම අවස්ථාවකම මිනිසෙක් වෙලා ඉපදුනා නම් අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් අවශ්‍යයි. ඒවාගේම සහෝදර සහෝදරියෝ, ස්වාමී පුරුෂයෝ භාර්‍යාවෝ ඒ සියළු දෙනාමත් මිය පරලොව ගියාට පස්සේ නිවන් අවබෝධ කර ගත්තේ නැතිනම් ගති 31කට අදාලව තල 31ක් තුළ කොහේ හෝ උපතක් ලබනවා. මේ තල 31 ගැන දන්නේ මනුෂ්‍ය ලෝකයේ මිනිසත් බව ලැබූ අය පමණයි. තමන්ටම පින්කමක් කර ගන්න පුළුවන්, පින්කමකින් පුණ්‍ය ශක්තියක් මතුකර ගෙන පින් දෙන්නට, පින් පවරන්නට, පින් අනුමෝදන් කරන්නට, පින් පතුරවන්නට, පින් පතුරවා පින් පිහිටුවන්නට පුළුවන් වෙන්නෙ මිනිසුන්ටම පමණයි. අනිත් අයට මේ වගේ පින්කමක් කරල පින් දෙන්නට, පින් පතුරුවන්නට, පින් අනුමෝදන් කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නෑ. එමනිසා අද මේ මනුෂ්‍යත්ව

පටිලාභයක් ලබා ජීවත් වන හැම කෙනෙක්ම දෙස තමන්ගේ මිය පරලොව ගිය ඥාතීන් බලා ඉන්නවා. එහෙම මිය පරලොව ගිය අය යලි මනුෂ්‍යයින් වෙලා උපදින්නත් පුළුවන්, නැත්නම් තවත් යම් යම් තල වලට යන්නත් පුළුවන්. සතර අපායේ යන්නත් පුළුවන්. පව්කම් කළ ඥාතීන් තිරිසන් වෙලා භූත, ප්‍රේත වෙලා, නිරයට ගිහිල්ලා නිරි සත්තු වෙලා නිරය, අපාය, තිරිසන් අපාය, සතර අපාය ආදියෙහි ඉපදෙන්නත් පුළුවන්. ඒ වාගේම දෙව් දේවතාවුන් වෙලා දිව්‍ය ලෝක 6 තුල උපත ලබන්නත් පුළුවන්. වෘක්ෂ දේවතාවො වෙලා, භූමාටු දේවතාවුන් වෙලා හරි අර කිව්ව දිව්‍ය ලෝක හයේ හෝ කොහේ හරි උපදින්න පුළුවන්. ඒ වාගේම බ්‍රහ්ම ලෝක කිහිපයකත් උපදින්න පුළුවන්. මේ බ්‍රහ්ම ලෝකවල ඉපැදුන අයගෙන් කොටසකට විතරයි පින් ගන්න පුළුවන්. ශුද්ධාවාස 4 සහ අරූපී බ්‍රහ්මතල හතර තුල උපන් අයටත් පින් ගන්න බැහැ. ඒ ශුද්ධාවාස 4 උපදින්නේ අනාගාමී කියන අනාගාමී තත්වයට පත් වූ පුද්ගලයෝ. බ්‍රහ්මත්වයට පත් වුනාට ඒ අය අනාගාමී. ඒ නිසා ඒ අයට පින් අවශ්‍ය වන්නේ නෑ. ඒ අය පින්ගන්න එන්නෙත් නෑ. පින් අවශ්‍යත් නෑ. ඒවාගේම ආභස්සර බ්‍රහ්ම තලය ඊට වඩා වෙනස් තත්වයක්. එතන ඉපැදෙන අය නැවත ලෝක විනාශයේදී තමයි ආ පස්සට එන්නේ. ඒ නිසා එතන අයටත් මේ පින් ලබා ගන්න අමාරුයි.

නමුත් අපි පින්කමක් කළහම මේ දෙන පින් ලබා ගන්න පුළුවන් අමනුස්ස කොටස් බොහෝ ඉන්නවා. ඒ විධියට සතර අපායට ගිය අයගෙන් භූතයන්ට, පෙරේතයන්ට පින් ලබා ගන්න පුලුවන්. ඒ වාගේම දිව්‍ය ලෝක 06ට ගිය දෙව් දේවතාවුන්ට සහ සමහර රූපී බ්‍රහ්මතලවල ඉන්න රූපී බ්‍රහ්මයන්ටත් පින් ලබා ගන්න පුළුවන්. අනෙකුත් අයට අපි ලබාදෙන පින් ලබාගන්න ක්‍රමයක් නෑ. එතකොට මේ මනුෂ්‍ය ලෝකෙ ඉඳලා මිනිහෙක් හැටියට ජීවත්වෙලා මිය පරලොව ගිය කෙනෙක් අපායක ඉපදුනොත්, මනුෂ්‍ය ලෝකෙ ඉපදුනොත්, නිරි සතෙක් වෙලා නිරයෙ ඉපදුනොත් අර අරූපී බ්‍රහ්මතල 4 සහ අනාගාමී තලයේ හෝ ආභස්සර බ්‍රහ්ම තලයේ හෝ ඉපදුනොත් ඒ අයට අප දෙන පින් ලබා ගන්න බෑ. හැබැයි අපි පින්කමක් කරන කොට එහෙම පින් ගන්න බැරි අයයි, පින්



ගන්න පුළුවන් අයයි කියලා කොටස් 2කට වෙන් කරන්නෙ නෑ. එහෙම වෙන් කරන එක සුදුසු නෑ. මේ හැම කෙනෙක්ම මේ තල 31තුල කොතනක හෝ ඉපදුනත් පින් පිහිටුවා පින් පතුරුවන්න ඕන. පින් දෙන්න ඕන. පින් අනුමෝදන් කරන්න ඕන. මේක තමයි තේරුම් ගත යුත්තේ. අපි මේ සංසාර ගමනෙ යන අය හැටියට කවදා කොතැනකදී හෝ උදව් කළ, උපකාර කළ බොහෝ අයට අපි ණයයි. ඒ ණය වෙච්ච අයට ණය ගෙවා අවසන් වනතුරු තමන්ට නිවන් අවබෝධ කර ගන්නට, ණයෙන් මිදී නිදහස් වෙන්නට බැහැ. ඒ නිසා පින්කමක් කිරීමේ පළමුවනම පරමාර්ථය විය යුත්තේ, පින්කමක් කරල චිත්ත ප්‍රසාදයක් ඇති කරගෙන තුන් සිත පහදවාගෙන, අපට මේ සංසාර ගමනේ උදව් කළ, උපකාර කළ, මඟ පෙන්වූ, පිහිට වූ, සම්බන්ධ වූ සියලුම අයට වෙනසක් නැතිව, විශේෂයක් නැතිව, අඩුපාඩුවක් නැතිව, පින් දෙන්නට, පින් පවරන්නට, පින් අනුමෝදන් කරන්නට සුදුසුවන ආකාරයට ක්‍රියා කිරීමයි. ඒ නිසා පින් ගන්න පුලුවන් වුනත් බැරි වුනත් පින් ගත්තත් නැතත් අපට උදව් කළ උපකාර කළ සෑම කෙනෙකුටම සමසේ පොදුවේ තුන් සිත පහදාගෙන පින් දෙන්නට පින් පවරන්නට පින් අනුමෝදන් කරන්නට අවශ්‍යයි. එතකොට අපි පින්කමක් කරන්නේ යම් යම් අයට පින්දීල ඒ අතීතයේදි වෙලා තියෙන ණය ගෙවල ණයෙන් මිදී නිදහස් වීමේ පළමුවන චේතනාව හා පරමාර්ථය ඇතිවයි. දැන් තමන් පින්කමක් කරන කොට ඒ බව පින් අවශ්‍ය අයට දැනුම් දුන්නත් නැතත් ඒ අය ඒ සඳහා(පින් ගන්නට) ඇප කැප වෙලා බලා ඉන්නවා. බුදුහාමුදුරුවෝ “තිරොකුඩ්ඩ සූත්‍රයේ” පැහැදිලිව කීව පින් ගන්නට සුදුසු පින් ගන්න පුළුවන් භූත, පෙරේත, දෙව්, දේවතා ආදී කොට්ඨාශයන් පිළිබඳව. මේ පරදත්තූප ජීවීන් රස්සාවක් කරන්නෑ, උයන්වතු කෙත් වතු වවන්නේ නෑ, හරක් බලන්නේ නෑ කියල ඒ සූත්‍රයේ විස්තර කරලා තියෙනවා. අද මිනිසෙක් හැටියට උපතක් ලබල තියෙන, තමන්ගේ ඥාතී සම්බන්ධයක් තියෙන යම් කෙනෙක් යම් අවස්ථාවක පින්කමක් කරනවා නම් ඒ පින්කම් කරන හැම අවස්ථාවකම ඒ ඥාතියා පසුපස ඇවිල්ල පින් ගන්නට පේවෙලා බලාගෙන ඉන්නවා. විශේෂයෙන්ම භූත, පේත කොටස් දෙක ගොටු අල්ලගෙන ඉන්න හිඟන්නෝ වගේ පින් ගන්න බලාගෙන ඉන්නවා. දෙව් දේවතාවනුත් බොහෝ අය පින්ගන්නට බලාගෙන ඉන්නවා. ඒ නිසා අපි ඒක හොඳට තේරුම් ගෙන

පින්කමක් කරන අවස්ථාවේදී තුන් හිත පහදාගෙන පිරිසිදු චේතනාවක් ඇතිව පින් දෙන්නට, පින් පවරන්නට, පින් අනුමෝදන් කරන්නට ඕන. කාටද? ඒ පින් ගන්න බලාපොරොත්තු වූ සියලුම දෙනාටම.

"සබ්බේ පානා, සබ්බේ භූතා

සබ්බේ දේවා, සබ්බේ සත්තා

භවන්තු සුඛි තත්ථා"

කියලා වෙනසක් නැතිව පින් දෙන්නට ඕනැ.

පෘථග්ජන පුද්ගලයින් හැටියට ඔබ හැමට මේ පින් ගන්නට ආපු අය කාවවත්ම පේන්නේ නෑ. බලන්න බෑ. දකින්න බෑ. හැබැයි පින්කමක් කරන අවස්ථාවක ඒ අය සිය දහස් ගණනින් නොවෙයි, දස දහස් ගණනින් රැස් කකා ඉන්නවා පින් ගන්න. හැබැයි අපි පින්කමක් කරල මේ අයට තුන් හිත පහදාගෙන පින් දුන්නේ නැතිනම්, පින් පැවරුවේ නැතිනම්, ඒ පින් දෙන ක්‍රමය හරි නැතිනම්, පින් පැවරීම වැරදි නම්, පින් ගන්න පුළුවන් ආකාරයට පින් පතුරුවා පින් පිහිටුවා ඔවුන්ට පින් අනුමෝදන් කළේ නැතිනම් ඒ අයට පින් ගන්න බෑ. ඒ නිසා හොඳට තේරුම් ගන්න ඕන, අපි මේ පින්කමක් කරල, පින් අනුමෝදන් කරන අවස්ථාවේ පින් ගන්නට බලාපොරොත්තුවෙන් බොහෝ අය එන්න පුළුවන් නොයෙකුත් ආකාරයට. ඒ නිසා පැමිණි නොපැමිණි සියලුම දෙනාට අපි පින් දෙන්නට පින් පවරන්නට ඕන. සම මෙත පතුරා සම ලෙස පින් දෙන්න ඕන. එහෙම සමසේ පින් දුන්නේ නැතිනම් ඒ අය කොටසකට පින් ලැබෙන්නේ නෑ. ඒ නිසා පින්කමක් කරන විට ඒක හරියටම දැන ගෙන කළොත් ඒක කුසලයක් බවට පත්වෙනවා. නොදැන කළොත් ඒකම අකුසලයක් බවටත් පත් වෙනවා. අකුසලයක් විතරක් නොවෙයි, ඒක කරදරයක් බවටත් පත්වෙනවා. ගෙවල්වල පින්කම් කරන්න එපා. කියන කොටසක් අද මේ ලංකාවේ තවමත් ඉන්නවා. ගෙවල්වල පින්කම් කරන්න එපා, භූතයින්ට,ප්‍රේතයින්ට ගෙවල් වලදී පින් දෙන්න එපා, පින් පවරන්න එපා, ඊගොල්ලෝ ගෙවල්වලට අරක් ගන්නවා කියලා කියනවා. ඔව් එහෙම වෙනවා, ඒක වෙලා තියෙනවා. ඒ



මොකද වැරදි ආකාරයට වැරදි ක්‍රමයකට අද සම්මත ආගමේ, බුද්ධාගමේ පින් දෙන්නට පටන් අරගෙන තියෙන නිසා. ඒ නිසා හොඳටම කල්පනා කරන්න ඕන පින්කමක් කරන විට, හරි ක්‍රමයකට පින් ගන්න බලාපොරොත්තුවන අයගේ සිත සතුටුවන ආකාරයට, සිත පිරී ඉතිරී යන ආකාරයට තෘප්තිමත් වන ආකාරයට, ඒ අය මිදී නිදහස් වන ආකාරයට පින් දෙන්න. මේ ක්‍රමය තිරෝකුඩ්ඩ සූත්‍රයේ හරියටම පැහැදිලිව කියලා දීලා තියෙනවා. හැම කෙනෙක්ම කල්පනා කල යුතු විශේෂ දෙයක් තියෙනවා. අපි හාමුදුරුවන්ට දාන දීලා (සාංඝික දානයක් හෝ භික්ඛු දානයක් හෝ දීලා) හැමවෙලේම බලාපොරොත්තු වන්නේ අර දවස් 7කට, මාස 3කට, අවුරුද්දකට කලින් මියගිය තමන්ගේ ඥාතියාට පමණක්ම පින් දෙන්න, පින් පවරන්න, නම කියලා පින් අනුමෝදන් කරන්න පමණක් නම් ඒක වැරදියි. පින්කමක් කරලා පින් දෙන අවස්ථාවේ තුන් සිත පහදවාගෙන පිරිසිදු චේතනාවක් ඇතිව මේ පින් ගන්නට ආව සියලුම දෙනාට පින් දෙන්න, පින් පවරන්න, පින් අනුමෝදන් කරන්න අවශ්‍යයි. කාටවත් විශේෂයක් නැතිවම සමසේ පින්දිය යුතුයි.

එතනදී තුන්හිත පහදා ගන්නවා කියන්නේ අපි ඒ පින් දෙන මොහොතේ අඩුම වශයෙන් විනාඩි 5ක් විතරවත් කාලයක් පින් අනුමෝදන් කරන අවස්ථාවේ තුන් සිත පහදා ගත යුතුයි. අපේ සිතේ රාගය, ද්වේශය, මෝහය තිබුණොත් එතන තුන් සිත අපිරිසිදුයි, කිළිටියි. ඒ නිසා පින් දෙන්න, පින් පවරන්න, පින් අනුමෝදන් කරන්නත් බෑ. ඊනිසා පින් දෙන අවස්ථාවේ රාගයෙන් තොර වූ , ද්වේශයෙන් තොරවූ , මෝහයෙන් තොරවූ පිරිසිදු සිතක් සුළු මොහොතකට හෝ පවත්වාගෙන , එනම් තුන් සිත පහදවා ගෙන පිරිසිදු චේතනාවක් ඇතිව පින් දෙන්නට, පින් පවරන්නට, පින් අනුමෝදන් කරන්නට, පින් පිහිටුවන්නට හැම කෙනෙක්ම අධිෂ්ඨානයක් කර ගන්න ඕන. එහෙම තුන් හිත පහදා ගෙන පින් දුන්නොත් ඒ පින් ගන්නට පැමිණි අයට හිත පිරෙන්නට තෘප්තිමත්වන ආකාරයට පින් පැමිණ විය හැකියි. ඒ අයව මුදවා නිදහස් කරවන ආකාරයට, තමනුත් ඒ අයගෙන් මිදී නිදහස් වන්නටත් පුළුවන් වන ආකාරයට පින් දෙන්න, පින් පවරන්න පුළුවන්. ඒ නිසා පින්වතුනි, අපි කල්පනා කල යුතුයි, මේ පින් දෙනවා කියන එක පින් පවරනවා කියන එක හරියට තේරුම් අරගෙන කළොත් මිසක් ඒකෙන්

නියත ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැතිබව. කුසලයක් වෙන්නෙත් නැතිබව. ඒකෙන් තමන්ටත් අනුන්ටත් ප්‍රතිඵලය යහපත් වන ආකාරයට ඒ පුණ්‍ය ක්‍රියාව සිද්ධ නොවන බව.

අද සම්මත බුද්ධ ආගමේ කරන වැරදි කිහිපයක්ම මෙතනදිම පෙන්වා දෙන්නට තියෙනවා. මේ වැරදි ඇත්ත වශයෙන්ම කාගේත් යහපත සඳහා මතුකර පෙන්වන්නත් ඕන. මේක පෙන්නුවේ නැතිනම් තව තවත් භූතයෝ පෙරේතයෝ නොයෙකුත් අමනුස්සයෝ ඇවිල්ල ගෙවල්වලට අරක්ගෙන මිනිසුන්ට නොයෙකුත් කරදර කරනවා. ඒ නිසා මේ සම්මත අය කරන පළමුවන වැරැද්ද තමා දානමය පින්කමක් කරල පින් දෙන කොට ඒ පින්කම කරපු අයටම ආපසු ප්‍රතිලාභයක් හැටියට පින් දෙන, පින් පවරන වැරදි සම්මත සම්ප්‍රදායානුකූල පින් වාක්‍යයක් කියන එක. "අනේ මේ පින්වතුන් බොහොම හොඳ පින්කමක් සිද්ධ කර ගත්ත. බොහොම යහපත් චේතනාවෙන් පින්කමක් කර ගත්ත. මේ පින්කමට සහභාගී වූ සියලුම පින්වතුන්ට නන්දා, විසාකා, මල්ලිකා, සුනන්දා, සුමනා මෙන් රූප සම්පත් බෝග සම්පත් , ධන සම්පත් ලැබ දෙව්, මිනිස් සැප කෙළවර මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නට මේ පින මේ පින්වතුන්ට හේතු වාසනා වේවා" කියලා පින් දෙන ක්‍රමයක්, සිරිතක් අද හැම පින්කම් පලකම තියනවා. මේක වැරදියි. පැහැදිලිව, පිරිසිදුව මේ වරද පෙන්නල දෙන්න ඕන. මොකද හේතුව පින්කමක් කළේ පින් ගන්නට එන, පින් ගන්න බලාපොරොත්තුවෙන් ඉන්න තමන්ගේ ඥාති මිත්‍රාදීන්ට පින්කමින් උපයාගත් පින් පවරලා සංග්‍රහ කරන්න. පින් දීල පින් පවරන්න. නමුත් කලේ මොකද්ද, තිරෝකුඩ්ඩ සූත්‍රයේත් මේක පැහැදිලිව කියලා තියෙනවා, රස කෑමක ඉව්වේ ආරාධනා කරපු අයට සංග්‍රහ කරන්න, නමුත් මේ ඉව්ව කෑම ටික තමන්ම බෙදාගෙන, බදාගෙන කෑව වගේ වැඩක්. ඒ නිසා පින්කමක් කරන විට ඒ පින්කමේ ප්‍රතිලාභ තමන්ටම ආපසු පවරා ගන්නට, තමන්ටම ආපසු ලබා ගන්නට, තමන්ටම, අනුමෝදන් කර ගන්නට ප්‍රාර්ථනා කිරීම සුදුසු නෑ. මේක ජෛන ආගමේ මහායාන ආගමේ ක්‍රමයක්. ජෛන ආගමේ, මහායාන ආගමේ ක්‍රමයට අනුව නිවන් දකින්න බෑ. ඒ ආගම්වල කියන ආකාරයට බ්‍රහ්මත්වයට පත්වන්නට හෝ බෝසත් වෙන්නටයි ඕනෑ. ඒනිසා බෝසත්



තත්වයට පත් වෙන්න නම් තව තවත් පින්කම් කර කර පාරමිතා පුර පුර දෙව් මිනිස් සැප ලබල අවසානයේ තමා බුද්ධත්වයට පත්වන්නේ. ඒක මුල් බුදු දහමේ පෙන්වා දුන් දෙයක් නොවෙයි. ඒක ඔය මහායාන බුද්ධාගමේ බලපෑමක්. බොහොම තදින්ම මහායාන බලවේග මේ හෙළබිමටත් අද ඇවිත් තියෙනවා. ඒක බුරුමය, තායිලන්තය හරහාත් ඉන්දියාව හා, අනෙකුත් රටවල් හරහාත් ආවා. ඒ අනුව තමයි ඔය පින් වාක්‍යයක් කියන්නේ. දෙව්මිනිස් සැප බලාපොරොත්තු වන්නේ. මෛත්‍රී බුදුන් දැක, අලකේශ්වර අමිතාභය වගේ බෝසතුන් දැක මතු බුදුවන බුදු කෙනෙක්ගේ ශාසනයකදී නිවන් දකින්නට ප්‍රාර්ථනා කරන්නේ. ඒක බුද්ධ දේශණාවට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඒ නිසා අප කල්පනා කරගන්න ඕන පින් දෙන්නෙ, පින් පවරන්නේ අපි මේ සංසාර ණය ගනුදෙනුවෙන් අද අදම මිදී නිදහස් වන්නටයි. ඒ අප ලබා දුන් පින් අරගෙන අපේ ඥාතීන් යම් ආකාරයකම සෑහීමකට පත්වෙලා අතරමං වූ තැන් වලින් ඔවුන් මුදවා නිදහස් කරගන්නටත් උපකාර වන ආකාරයට ඒ අයට පින් දෙන්න, පින් පවරන්න ඕන. ඒ මිසක් අපිට මේ පින්කම කරලා පින් අල්ලගන්න, උපාදානය කර ගන්න, අයිති කරගන්න අපටම යලි යලිත් සැප සම්පත් ලබන්නට පමණක් නොවෙයි.

ප්‍රාර්ථනාවක් නැතත් අපි පින්කමක් කරල අවශ්‍ය අයට පින් දෙන විට ඒකෙ ප්‍රතිලාභය අපට නොලැබී යන්නේ නෑ. බැරි වෙලාවත් අපට නිවන් දකින්නට නොහැකි වුනොත් ඒ පින අපට නොලැබී යන්නෙ නෑ. මොකෙද, එතනදී අපි ප්‍රාර්ථනා කළොත් නියත වශයෙන්ම ඒක පුණ්‍යාභිසංකාරයක් වෙලා සංසාරය දික්වෙනවා. කුසලයක් වුනොත් අපේ හිතේ තියෙන කෙළෙස් අයින්වෙලා නිවනට උපකාරවන පින්කමක් බවට පත්වන බව හැම කෙනෙක්ම තේරුම් ගත යුතුයි. ඒ නිසා පින්කමක් කරන විට හොඳටම තේරුම් ගත යුතුයි, තමන් "තුන් සිත පහදාගෙන" ඒ පින්කම කරල ඒ පින්කමෙන් පින්ගන්නට බලාපොරොත්තුවන තමන්ගෙ ඥාති මිත්‍රාදීන් සිහිපත් කරල සියලු දෙනාට සමසේ, පොදුවේ වෙනසක්, අඩුවක් පාඩුවක්, විශේෂයක් නැතිව පින් දෙන්නට, පිං පවරන්නට, පිං අනුමෝදන් කරන්නට.

දෙවන කාරණය විශේෂයෙන්ම පින්කමක් කරන විට අද මිනිසුන් ක්‍රියා කරන්නේ ප්‍රසිද්ධියටයි, ප්‍රචාරයටයි, තරඟයටයි. බොහෝ ගුවන් විදුලි නාලිකාවල, රූපවාහිනී නාලිකාවල වාගේම ගෙවල්වලත් පින්කමක් කරනවිට තියෙන්නෙ තරඟයක්, තරඟයට පින්කම් කිරීම නුසුදුසුයි. ඒ පින්කම කරනවිට තරඟයක් වගෙම තමන්ගේ මිය පරලොව ගිය එක්කෙනෙකුට, දෙන්නෙකුට පමණක් නම කියලා පින් දෙනවා. ඒකත් වැරදියි. මේකත් අද ප්‍රායෝගිකව කරන වරදක්. දැන් මේක පැහැදිලිව තේරුම් ගත යුතුයි. අපි හිතමු මාස 3කට පෙර මිය පරලොව ගිය අම්මා යම් ආකාරයකට පින් ගන්න පුළුවන් තැනක ඒ කියන්නේ භූතයෙක්, පෙරේතයෙක්, දෙවි දේවතාවෙක් වෙලා ඉපදුනා බැරිවෙලාවත් අම්මගෙ නම කියල එයාට විතරක් සීමා කරල, විශේෂයෙන් අනිත් අය අතහැරල අමතක කරල පින් දුන්නම සිද්ධ වෙන වරද තමයි, පින් ගන්නට ආපු තමන්ගේම පසු ගිය ආත්මේ අම්මා, තාත්තා, ස්වාමි පුරුෂයා, භාර්යාව, දරු මුනුබුරෝ, සීයලා, ආච්චිලා බොහෝ දෙනෙක් මෙතන පින් ගන්න බලන් හිටියත්, අම්මගේ නම කියලා විතරක් පින් දුන්න නිසා අනිත් අයට ඒ පින් නොලැබීයාම. ඇයි? ඒ අයව සිහිපත් කළේ නැහැනෙ. ඒ නිසා පළමුවෙන් එක් කෙනෙකුගේ නම කියලා එයාට විතරක් විශේෂයෙන් පින් දෙන ක්‍රමය වැරදියි. හැබැයි මේ පින්වතුන් තාම පෘථග්ජන අය නිසා බොහෝ පින්කම් වලදි හිතන්න ඉඩ තියෙනවා මගේ මේ ආත්මෙ අම්මට විතරයි පින් ඕන කියලා. ඒකටත් ප්‍රතිකර්මයක් තියෙනවා. අපි පළමුකොටම අපේ නමින් මිය පරලොව ගිය අනන්ත අප්‍රමාණ ආත්ම භව වලදී උදව් උපකාර කළ සම්බන්ධ වූ පිහිට වූ මව් දෙමවුපියන් , ස්වාමි පුරුෂයන් භාර්යාවන්, දරු මුනුබුරන්, සීයලා, ආච්චිලා, සහෝදර, සහෝදරියන්, සේවක, ස්වාමීන් ආදී කොට ඇත්තා වූ හැම දෙනාවම සිහිපත් කරල ඒ හැම කෙනෙකුටම පළමු කොටම අසීමිත ලෙස පිරිසිදු චේතනාවක් ඇතිව පින් දීල පින් පවරන්නට ඕන. එහෙම පින් පවරල, දෙවනුව අපට තවදුරටත් අවශ්‍ය නම් අර පින්වතුන්ගේ හිතේ සතුටක් ඇතිකර ගන්න තමන්ගේ මේ ආත්මේ අම්මත් සිහිපත් කරල විශේෂයෙන් පින් අනුමෝදන් කිරීමේත් වරදක් නෑ. හැබැයි මුලින්ම එයාට විතරක් පින්දීල දෙවනුව සියලුම දෙනාට පින් දෙන එකේ වරදක් තියනව. අඩුවක් තියෙනවා. හේතුව දැන් පින් ගන්න ඇවිත්



තියෙන්නේ බොහෝම සියුම් රූප කායකින් යුත් භූත, පෙරේත, දේවි, දේවතාවන් වගේ අයයි. ඒ අය එක ක්ෂණයකින් මෙතනට ඇවිල්ලා පින් ගන්න මොහොත වෙනකන් ඉවසුමක් නැතිව පේවෙලා බලා ඉන්න අය. එක් අයෙකුගේ නම කියලා එයාට විතරක්ම පින් දුන්නම ඒ අය තීරණය කරනවා මට පින් දුන්නේ නෑ, දෙන්නේත් නෑ කියලා. ඒ අය ටිකක් උරණ වෙලා අයින් වෙනවා. එතකොට ඒ අයට පින් ලැබෙන්නේ නෑ. ඒ අයට ද්වේශය ඇති වෙනවා. ඒ නිසා මේක හොඳට තේරුම් ගන්න ඕන. පින් දෙන විට පළමු කොටම

සබ්බේ පානා සබ්බේ දේවා
සබ්බේ භූතා සබ්බේ සත්ථා

භවන්තු සුඛි තත්ථා කියලා සියලුම අයට සමසේ පොදුවේ පින් දීල, පින් පවරල, පින් අනුමෝදන් කරන්න ඕන. එහෙම නැති වුනොත් කොටසකට පින් නොලැබෙන්න පුළුවන්. පින් නොලැබුණු අය - විශේෂයෙන් භූත, පෙරේත කොටස් තමන් කෙරෙහි වෛරයක්, ද්වේශයක් ඇති කරගෙන තමන්ට කරදර කරන්න පුළුවන්. ඒක හොඳට තේරුම් ගන්න ඕන.

තුන්වන කාරණය තමා මෙතනදී අපි පින් දෙන විට හැම කෙනෙක්ම කල්පනා කළ යුතුයි තමන්ගේ ඥාතින් මිත්‍රාදීන්ට පමණක් නොවෙයි, මෙතනට පැමිණි අනුන්ගේත් සියළුම ඥාති මිත්‍රාදීන්ටත් පින් දෙන්න ඕන බව. ඒකයි කීවේ, "ඉදං මේ ඥාති - නං හෝතු" කියලා මුලින් කියලා. "ඉදං වෝ ඥාතී නං හෝතු" කියලා අවසාන වශයෙන් කියන්න කියලා."ඉදං මේ ඥාතී නං" කීවේ මට ඥාති සම්බන්ධකම් ඇති අය, "ඉදං වෝ ඥාතී නං" කියල කීවේ වෙනත් අයට ඥාති සම්බන්ධකම් ඇති අයයි. තමන්ට ඥාතිකම් ඇති නැති සියළුම ඥාතීන්ට සියළුම අයට පින් දෙන්න ඕන. එතකොට කාවවත් අතහැරිය වෙන්නේ නෑ. මේකත් අද තේරුමක් ඇතිව කියනවා නොවේ. "ඉදං මේ ඥාති නං" කියලා තුන් වරක් කියනවා. නමුත් "ඉදං වෝ ඥාති නං" කියලා එක සැරයක් හරි පැහැදිලිව පිරිසිදුව කියන්න ඕන. එතකොට කාටවත් අඩුවක් පාඩුවක් නැතිව පින් ලැබෙනවා. පින් ගන්න පුළුවන් වෙනවා.

තවත් අඩුපාඩුවක් තියෙනවා. මේක ටිකක් බරපතලයි. සම්මතයේ බොහෝ තැන්වල වැරදි සේ කරන දෙයක්. පින් අනුමෝදන් කරන විට වතුර ජෝගුවයි, කෝප්පයයි අරගෙන ලඟම ඥාතීන් වතුර ජෝගුවෙන් කෝප්පය පිරෙන්න පැන් වත් කරනවා. දානමය පින්කමකට සහභාගී වූ ස්වාමීන් වහන්සේලා

| | | |
|---|---|---|
| උන්න මේ උදකං වටටං | - | යථා නිනනං පවතතති |
| එවං මෙව ඉතො දිනනං | - | පෙතානං උපකප්පති |
| යථා වාරි වහා පුරා | - | පරිපුරෙනති සාගරං |
| එව මෙව ඉතො දිනනං | - | පෙතානං උපකප්පති |

මෙහෙම ගාථාවෙන් කියනවා. මේ ගාථාවල අර්ථය, ධර්මය තේරුම් අරගෙන දැනගෙන කියනවා නොවෙයි. කරන්නන් වාලේ කරන දෙයක්. මිනිස්සු මනසක් තියෙන අය. පින් දෙනකොට තුන් හිත පහදා ගත යුතුයි. නමුත් දැන් මෙහෙම වතුර ජෝගුවෙන් කෝප්පයට වතුර වත් කරන විට ගාථාවන් කියන ස්වාමීන් වහන්සේලාත් වතුර වත් කරන ඥාතීනුත් ඒ දිහා බලා ගෙන ඉන්න අනෙකුත් ඥාතීනුත් සියලුම දෙනාගෙ අවධානය මනස යොමුවෙලා තියෙන්නේ වතුර වත්කරන එක සහ කෝප්පය පිරෙන එක ගැනයි. දැන් අර පිං දෙන්නට අවශ්‍ය පිරිසිදු සිත එනම් තුන් සිත පහදා ගැනීමක් සිද්ධ වෙන්නේ නෑ. අනික එහෙම තුන්සිත පහදා ගන්නේ නැතිව වතුර කෝප්පයට යොමු කළ සිතකින් පින් දෙන්නත් බෑ.

| | | |
|---|---|---|
| උන්න මේ උදකං වටටං | - | යථා නිනනං පවතතතී |
| එවං මෙව ඉතො දිනනං | - | පෙතානං උපකප්පතී |

කියල කීවෙ ඉහල සිට පහළට වතුර වත් කරනවා වගෙ අපි තුන් සිත පිරිසිදු කරගෙන අර ගොටු අල්ලගෙන ඉන්න පින් බලාපොරොත්තුවන භූත, පෙරේත, දෙවි දේවතාවන්ට ගොටු පිරෙන්න පින් දෙන්න ඕන, පින් පවරන්න ඕන, පින් අනුමෝදන් කරන්න ඕන කියන එකයි. ඒ සඳහා අපගේ තුන්සිත පහදාගෙන සුදු කිරණ පතුරවලා පින් දෙන්න ඕන. නමුත් දැන් උපමාව තියෙනවා. පරමාර්ථ වැහිලා යටපත් වෙලා. ඒ නිසා මේක හොඳට තේරුම් ගන්න ඕන. අර උපමාව කළාට වරදක් නෑ. නමුත් හැම තිස්සේම



වතුර කෝප්පයට හිත යවන්නේ නැතිව හාමුදුරුවෝ කියන ගාථාවල අර්ථයක්, ධර්මයක් හරියට තේරුම් අරගෙන අපේ තුන් හිත පහදා ගෙන පින් ගන්නට බලාපොරොත්තුව සිටින සියළුම ඥාතී මිත්‍රාදීන්ට හිත පිරෙන විධියට පින් දෙන්න, පින් පවරන්න, පින් අනුමෝදන් කරන්න ඕන. පින්කමක් කරන විට සම්ප්‍රදායෙන් අපි පින්කම් කළාට ඒ ආකාරයේ බොහෝ පින්කම් වලින් පින් බලාපොරොත්තු වන අයට පින් ලැබෙන්නේ නෑ. ඒකට ඔන්න ඔය කියන සාමාන්‍ය සම්ප්‍රදායේ, ආගමේ කරන වැරදි දේවල් කිහිපයක්ම බලපානවා. ඒ නිසා හැම කෙනෙක්මත්, විශේෂයෙන්ම පින් අනුමෝදන් කරන ස්වාමීන් වහන්සේලාත් මේක අවධානයට යොමු කළොත් හොඳයි, අපි පින්කමක් කරන්නේ, අපේ සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වීම සඳහා  බව ණය ගෙවල ණයෙන් මිදී නිදහස් වීම පළමුවන පරමාර්ථයයි. ඒ දෙන පින් අරගෙන අපේ ඥාති මිත්‍රාදීන්ට, අපට සම්බන්ධයක් තියෙන, උදව් කළ, උපකාර කළ, පිහිට වූ අයට යම් යහපතක්, සහනයක් විය යුතුයි. එහෙම නැතිව අපිටම මේ පින් ආපසු එකතු කරගෙන අල්ල ගෙන අයිති කරගෙන දෙව් මිනිස් සැප ලබන්න නොවේ. බෝසත් තත්වයට පත්වෙන්න නොවේ. මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්න නොවේ. ඒ නිසා හැම කෙනෙක්ම කුසලස්ස උපසම්පදා කියන එකත්, සබ්බ පාපස්ස අකරණං කියන එකත් තේරුම් ගත්තොත් හොඳයි. ඒනිසා , අපි කල්පනා කර ගන්න ඕන, මෙවන් පින්කමක් කරන හැම අවස්ථාවකම පරමාර්ථ ධර්මය තේරුම් ගෙන පින්කම් කරල ඒ පුණ්‍ය ශක්තිය ඇතිව පින් පවරලා පින් පිහිටුවලා ඒ පුණ්‍ය ශක්තියෙන් අපට නිවනට උපකාර වන ආකාරයට හිතේ තියෙන කෙළෙස් සහමුලින්ම අයින් කරලා මේ පුන්‍ය ශක්තියෙන් “වාගෝ පටිනිසසගගො මුතති අනාලයො” කියන තත්වයට තමනුත් පත්වෙන්න. ඒ කරගත් පින් කමෙන්ද අපි නොඇලී මිදී නිදහස් වෙන්න ඕන. “පුණ්‍ය පාප පහීනසස” කළ යුතුයි. ඒ නිසා අද බොහෝ පින්කම් කරන අපේ හෙළබිමේ, ලංකාවේ බෞද්ධයෝ හැටියට ඉන්න උපාසක මහත්ම මහත්මීන් පින්කම් කරන්නේ, බෝධි පූජා පවත්වන්නේ දාන මාන දෙන්නේ වෙන මොකටවත් නොවේ. තමන්ටම දෙව් මිනිස් සැප ලබන්නට යාඥා කරන්නටයි. එහෙම නැතිනම් අපායෙන් බේරෙන්නටයි. දෙව් මිනිස් සැප පතන රජ සිටු සැප පතන හැම වෙලාවකම තමන් කල්පනා කරන්න ඕන, දුක් සහිත වූ සංසාරේ දික්

කරගන්න කරන වැරදි දෙයක් නේද මේ කරන්නේ කියලා. ඒ නිසා එය බුද්ධ දේශනාවට විරුද්ධයි. බුදුහාමුදුරුවෝ කීවේ. “අපපමාදෙන සම්පාදෙ තබ්බා”, එනම් ප්‍රමාදයක් නොවී මේ මොහොතේම අපේ සිතේ උපදින සං පහදා ඉවත් කරන්න ඕනෑ කියලා. “සං” කියන්නේ රාගය, ද්වේශය, මෝහය. හිතේ උපදින රාගය, ද්වේශය, මෝහය එහෙම නැතිනම් සංසාර සම්බන්ධතා සියල්ලෙන්ම මිදී නිදහස් වීමට මේ පුණ්‍ය ශක්තිය, මේ පින්කම්න් උපදවා පහදාගත් පින් අපි පවරන්න ඕන. දෙන්න ඕන. අනුමෝදන් කරන්න ඕන. ඒ නිසා මේ හැම කෙනෙක්ම කල්පනා කරන්න ඕන, ආපසු තමන්ටම ප්‍රතිලාභයක්, ප්‍රචාරයක්, ප්‍රසිද්ධියක්, ප්‍රණාමයක්, ප්‍රබෝධයක් ලැබෙන විධියට පින්කම් කරලා හරියන්නේ නැති බව.

අපේ රට වූ මේ ලංකාවේ විතර දන් දෙන පින්කම් කරන භක්තිවන්ත බෞද්ධයෝ ලෝකේ වෙන කොහේවත්ම නෑ. බෞද්ධ යැයි කියා ගන්නා රූපවාහිනී නාලිකා දෙස බැලුවත් කොයිතරම් මෝඩ භක්තිමත් බෞද්ධයෝ මේ රටේ ඉන්නවාද කියලා පේනවා. මොකද බොහෝ අය දෙව් මිනිස් සැප පතනවා. නමුත් පින්කමක් කරන විට අපි තුන් සිත පහදා ගන්න ඕන. උදාහරණයක් ගත්තොත් යම්කිසි කෙනෙක් ඉස්පිරිතාලයකට වාට්ටුවක් හදලා දෙනවා. නැතිනම් ඉස්කෝලයකට ගොඩනැගිල්ලක් හදලා දෙනවා. නැතිනම් පන්සලකට මොනවා හරි කරනවා. මේවා කවුරු කිවුවත් නැතත් තමන්ගේ මුදල් වියදම් කරලා කරපු නිසා පින්කමක්. ඒ පින තමන්ටම උරුම වෙනවා. කිසිම ප්‍රශ්නයක් නෑ. හැබැයි මේ පින්කම නිසා තමන් ආපසු තමන්ටම ප්‍රාර්ථනා කළොත් ඉල්ලුවොත් යමක්, ඒකත් ලැබෙනවා. දේශපාලකයෝ ඡන්දය ඉල්ලන්න පින්කම් කරනවා. ඒකත් හැබැයි පින්කමක්. ඒක ප්‍රාර්ථනාවක් විතරයි. ඒක නිවන වැහෙන, නිවන ප්‍රමාද වන පින්කමක්. ඒ වාගෙම කෙනෙක් පින්කම් කරලා කෙනෙකුට උදව්වක් උපකාරයක් කරලා තමන්ගේ නම යන්න, පරම්පරාවේ නම පවතින්න කියලා ප්‍රාර්ථනාවක්, අධිෂ්ඨානයක් ඇතිව ඒ පින්කම කළොත් එතන පිනක් සිද්ධ වුනත් තමන්ගෙ මානය නිසා කුසලයක් සිද්ධ වෙන්නේ නෑ. එනිසා ඒකත් කුසලයක් නැති පින්කමක්. එමනිසා කාම ලෝකවල සුගති ලෝකවල අතරමං වෙන බව තේරුම් ගන්න ඕන. තව බොහෝ අය පින්කම් කරන්නේ දේශපාලනයට ඡන්දය ඉල්ලන්න නොවෙයි. පරම්පරාවේ නම



පවතින්න නෙමෙයි. ඒ පින්වතුන් පින්කම් කරන්නේ පින් පොතක ඒ පින්කම ලියලා තමන්ටම මේ පින්කමේ ප්‍රතිලාභ මතු උපදින  උපදින අවස්ථාවල දෙව් මිනිස් සැප, රජ සැප, සිටු සැප, භෝග සම්පත්, ධන සම්පත් ලැබීමේ ඒකායන පරමාර්ථයෙන්. නමුත් ඒකත් වැරදියි. එතනත් චිත්ත ප්‍රසාදයක් වූ නිසා එවන් ප්‍රාර්ථනා කළහම ලැබෙන්න පුළුවන්. මේවා ලැබෙන හැම අවස්ථාවකම නිවන ප්‍රමාදවන, සසරට බැඳෙන සංසාරය දික්වෙන පින්කමක් බවටත් පත්වෙනවා. ඒ නිසා එතන කුසලක් සිද්ධ වෙන්නේ නෑ. කුසලස්ස උපසම්පදාවක් නෑ.

සංසාරය දික්වෙන නිසා ඒක අකුසලයක්. ඒකත් හොඳටම තේරුම් ගන්න ඕනෑ. ඒ වාගේම යම්කිසි පින්වතෙක් පින්කමක් කරලා නිස්සරණ ආධ්‍යාසයෙන් අනුන්ට උදවුවක් උපකාරයක් කරන අදහසින් තමන්ගේ සිතේ “චාගෝ පටිනිස්සග්ගෝ මුතති අනාලයො” කියන මේ අදහස සම්පූර්ණ වන ආකාරයට පිරිසිදු චේතනාවක් ඇතිව තුන් සිත පහදවා ගෙන පින්කමෙන් උපයා සපයා ගත්තා වූ පුණ්‍ය ශක්තිය තමන්ට උදවු කළ උපකාර කළ අයට පින් පවරලා පින් අනුමෝදන් කරලා පින් පිහිටුවලා පින් පතුරවන්නට පින්කමක් කලොත් ඒක කුසලයක් බවට පත්වෙනවා. ඒක නිවනට හේතුවෙනවා. උපකාර වෙනවා. මේ දේවල් සෑම කෙනෙකුම කල්පනා කළ යුතුයි. පින්කමක් කරන විට ප්‍රසිද්ධියකට, ප්‍රචාරයකට , ප්‍රතිලාභයකට, තරඟයකට,  විලාසිතාවකට පින්කම් කරනවානම් එක වැරදියි. අද බොහෝ අය කඨින පින්කම් කරන්නේ තරඟයට, ඒවා වැරදියි. ඒවා පව්කම්. ඒ නිසා අකුසල් සිදුවනවා විතරක්  නොවේ පව්කම් බවටත් පත් වෙනවා. ඒවා රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්, කරන දේවල්. ඒ නිසා හරියටම අපි පින්කමක් කරන්න නම් තුන් හිත පහදා ගන්න ඕන. සත්‍යක්‍රියා බලයක් පතුරන්න ඕන. සම මෙත පතුරවා තමන්ගේ අයට, තමන්ගේ නොවන අයට, හැම කෙනෙකුටම පින් දීලා පින් පවරන්නට, පින් දෙන්නට, පින් අනුමෝදන් කරන්නට අවශ්‍යයි. ඒ නිසා පින්කමක් නොකරමත් සල්ලි වියදම් නොකරමත් අපට පුළුවන්කමක් තියෙනවා, මෛත්‍රී සිතක් ඇති කරගෙන රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තොරව පින් දෙන්න. ඒක කුසලයක් බවට පත්කර ගන්න. හිතේ තියෙන කෙලෙස් මුල් උදුරා ගලවා දමා “සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා”

කියන තත්වයට පත්වෙන්න. ඒ නිසා හැම පින්වතෙක්ම කල්පනා කල යුතුයි. අපි අද පින්කමක් කරන විට සම්මතයෙන්, සම්ප්‍රදායෙන් බොහෝ වැරදි දේවල් කරන්නේ ජෛන ආගමේත් මහායාන බුද්ධාගමේත් බලපෑම් අපේ රටට, ථෙරවාදී බුදු දහමට වැද්දගත් නිසා බව. ඒ නිසා ඒවා පින්කම් විතරයි. ඒවායේ කුසල් සිද්ධ වෙන්නේ නෑ. ඒවා නිවන් දකින්නට උපකාර වන දේවල් නොවේ. ඒක හොඳටම තේරුම් ගත්තොත් ඕනෑම කෙනෙකුට, ඕනෑම පින්කමක් කරලා නිවනට උපකාර වන ආකාරයට තමන්ගේ හිතේ උපදින කෙළෙස් මුල් උදුරා ගලවා අස්කරන්නට මේ පුණ්‍ය ශක්තිය, මේ චිත්ත ශක්තිය උපකාර කර ගන්න පුළුවන්. ඒ නිසා සෑම කෙනෙක්ම මින් මතුවටත් පින්කම් කරන්න. හැබැයි කුසලස්ස උපසම්පදා කරන තත්වයෙන් එහෙම නැතිනම් කුසලය පූර්ණ කර ගන්න පුළුවන් වන ආකාරයෙන්. ඒ බව දැන ගෙන කළොත් පින්කම කුසලයක් වනවා. නොදැන කළොත් ඒක සසර දික්වන අකුසලයක් බවට පත්වන බව හැම කෙනෙක්ම තේරුම් ගත යුතුයි.

## තිරොකුඩ්ඩ සූත්‍රය දේශනාව

බුදුන් වහන්සේ තිරොකුඩ්ඩ සූත්‍රය දේශනා කළ වදාළේ අපට තුන්සිත පහදවාගෙන, එනම් රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් වෙන්වී, පිරිසිදු චේතනාවකින් පිංකමක් කළ යුතු ආකාරය හා එම පිංකම නිසා තමන්ටත්, එයට සහභාගි වන සියළු දෙනාටත්, තමන්ගෙන් පිං බලාපොරොත්තුව සිටින මියගිය ඥාති මිත්‍රාදීන්ටත් සිදුවන යහපත හා ප්‍රතිලාභය පිළිබඳව යථාවබෝධයක් ලබාදීමටයි. එනම්,

1. පිංදීම ඥාති ධර්මය යුතුකම ඉටු කිරීමකි. මෙය කාටත් නිදර්ශනයකි, ආදර්ශයකි.
2. අතීත සංසාරයේ තම ඥාතින් වූ ජේත, භූත ආදී අමනුෂ්‍ය කොටස් දුගතියෙන් මුදවා සුගතියට පත් කරන්නට උපකාර කිරීමකි.
3. දානමය පිංකමක් කිරීමේදී සිවු පසයෙන් යැපෙන නිවන් මඟ සොයන සිල්වත් භික්ෂූන් වහන්සේලාට ආයු, සැප, බල, වර්ණ, ප්‍රඥා යන බල ශක්තීන් පහක් ලබාදෙන පිනක් අත්කර ගැනීමකි.



4. ඔබද සංසාර ණය ගණුදෙනුවෙන් මිදී නිදහස් වන්නා වූ දුගතියෙන් ගැලවී සුගතියට යන්නට උපකාර වන්නාවූ තුන්සිත පහදින්නා වූ කුසලයක් සිදු කර ගැනීමකි.

පිංවත්නි, අද මේ පිංවතුන් දානමය පිංකමක් සූදානම් කරගෙන සැදී පැහැදී සැකසී සිටින්නේ විශේෂ ආකාරයක ධර්ම දානමය පිංකමකුත් සම්පූර්ණකර ගැනීමටයි. එවන් වූ ධර්ම දේශනාවකට සවන් දීමටයි. ත්‍රිපිටකයේ එන සූත්‍රයක් වන තිරොකුඩ්ඩ සූත්‍ර දේශනාව පිළිබඳව විග්‍රහයකට සවන් දී, පිං බලාපොරොත්තුවන, පිං අවශ්‍ය කරන, දේව, ජේත, භූත ආදී වූ අමනුෂ්‍ය කොට්ඨාශ වලට හා ඒවාගේම සංසාර ගමනේ තම තමන්ගේ ඥාතින් ලෙස අතීතයේ සම්බන්ධ වූ බොහෝ අයගේ සිත් සතුටු කරවන්නට, සිත් පිනවන්නට, සිත් පිරී යන ආකාරයෙන් පිං අනුමෝදන් කරන්නට, පිං පවරන්නට, පිං පතුරවා පිහිටුවා ඥාතීන්ට පින් දෙන්නටයි.

එදා තිරොකුඩ්ඩ සූත්‍රය බුදුන් වහන්සේ දේශනා කරල තියෙන්නේ බිම්බිසාර රජ්ජුරුවන්ට. බුදුන් වහන්සේ එදා රජගහ නුවර වැඩ ඉන්න මුල්ම සමයේදි බිම්බිසාර රජ්ජුරුවෝ බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝ රත්නයට බිම්බිසාර රජ මාළිගයේදී දානයක් පිරිනැමුවා. නමුත් ඒ දානයෙන් පස්සේ රජ මාළිගය තුළ පෙර නොවූ විරූ ආකාරයේ අමුතු ප්‍රශ්න ඇතිවන්න පටන් ගත්තා. නොයෙකුත් ජේතයින් භූතයින් හා විවිධ ආකාරයේ අමනුෂ්‍ය කොට්ඨාශ නොයෙක් ආකාරයෙන් මාළිගය තුල හොල්මන් කරන්න පටන් ගත්තා. ශබ්ද කරන්න පටන් ගත්තා. ඒ අතර බිම්බිසාර රජුටත් නොයෙක් ආකාර වූ හීන පෙනෙන්න පටන් ගත්තා. ඒ නිසා බිම්බිසාර රජ්ජුරුවෝ දානමය පිංකම කරණ ලද දිනයට පසු දිනයක බුදුන් වහන්සේ වෙත ගොස් මේ බව දැන්නුවා. එවිට බුදුන් වහන්සේ රජතුමාට පෙන්වා දුන්නේ ඒ දානය දීමෙන් යම් අඩුවක් සිදු වූ බවයි. මේ ආත්මයේදී ඥාතීන්ව සිට මිය පරලොව ගිය බොහෝ දෙනෙකුට පිං දීම සහ දැනට ජීවත්ව සිටින අයට ආශිර්වාද කිරීමක් පමණක් සිද්ධ කල බවයි. නමුත් දැන් මේ රජ මාළිගාව තුළ මේ ආත්මයේ අයට වඩා මින් පෙර ආත්මවල තමන්ගේම මව් දෙමවුපියන් වූ වැඩිහිටියන් වූ අතීත ඥාති සම්බන්ධකම් තියෙන බොහෝ

අය පිං ගන්නට, පිං අනුමෝදන් කරගන්නට බැරිවී ඉතාමත් අසතුටෙන් දුකෙන් සහ ද්වේශයෙන් යුතුව බලා ගෙන මාලිගය තුලම රැඳී සිටින බවයි. ඒ අය බලාපොරොත්තු වුනා තමන්ටත් කරන ලද පිංකමෙන් සිත පිරෙන්නට සුදුසු පරිදි රජතුමා පිං දෙයි, පිං අනුමෝදන් කරයි කියා. නමුත් යම් ප්‍රමාද දෝෂයක් නිසා ඒ බලාපොරොත්තු වූ පරිදි සියළුම ඥාති මිත්‍රාදීන්ට එසේ සිදුවූයේ නෑ. ඒ නිසා තමන්ට පිං ලැබුනේ නැති බව දැනුම් දීමක් වශයෙන් එසේ අමනුෂ්‍යයින් කරදර කල බව බුදුහාමුදුරුවෝ පෙන්වා වදාලා. ඒ එසේ කරදර කල සියලුම අය තම තමන්ගේම අතීත ඥාති මිත්‍රාදීන් බවත් පෙන්වා දුන්නා.

ඒ අනුව බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්නා නැවතත් ඒ ආකාරයෙන්ම දානමය පිංකමක් සිදුකර, ඒ සියළුම අතීත ඥාති ප්‍රේතයින්ට, භූතයින්ට, හිත පිරෙන ආකාරයට නැවත පිං අනුමෝදන් කරන්නට, පිං ගන්න පුළුවන් ආකාරයටම. ඒ පිංකම මගින් උපයා සපයා ගත් පුන්‍ය ශක්තිය ඔවුන්ට අනුමෝදන් කරන්නට කියා.

එදා මිහිඳු හාමුදුරුවෝ රජගහ නුවර සිට ලංකාපුරයට වැඩිය අවස්ථාවෙත් අනුරාධපුරයේ රජකළ සිංහල රජවරුන්ට මේ ආකාරයෙන්ම මේ ඥාති ප්‍රේතාදින්ට පිංදෙන ආකාරය සිහිපත් කරන්නට විමාන වස්තු, ප්‍රේත වස්තු සූත්‍රයන් හා තිරෝකුඩ්ඩ සූත්‍රය දේශණා කලා. ඒ වාගේම මේ සිරිත, තිරොකුඩඩ සූත්‍රයේ දේශනා කළ ආකාරයේ පිං අනුමෝදන් කිරීමක් සම්ප්‍රදායක් වශයෙන් අපේ හෙලබිමේ බෞද්ධ නිවෙස් වලත් අදටත් පවත්වනවා.

ඒ නිසා අද දින මේ ධර්ම දේශනාවෙන් බලාපොරොත්තු වෙන්නේ මෙවන් දානමය පිංකමක් කෙසේ සිදු කළ යුතුද, පිංකමක් කිරීමෙන් ඒ අයට පූර්ණ වශයෙන් පිං අනුමෝදන් කළ හැක්කේ කෙසේද යන්න ගැන කරුණු කාරණා විග්‍රහ කර දීමටයි. අද දින මේ පිංකමට සහභාගීවන සෑම පිංවතෙකුටම මෙම අවස්ථාව ආදර්ශයට ගත හැකියි. ඒ වාගේම පිංකමක් කරන විට ඒ පිංකමේ උපරිම ප්‍රතිලාභය තමන්ටත්, පිං බලාපොරොත්තු වන අයටත් ලබාගන්නා හැටි ඒත්තු ගත යුතුයි.



අපි දානමය පිං කමක් හෝ වෙනත් කුමන හෝ පිංකමක් හෝ කරමින් චිත්ත ප්‍රසාදයක්, සිත පිනායාමක් ඇති කරගත් විට එය පිං අනුමෝදන් කරන්නට පිං දෙන්නට, පිං පවරන්නට සුදුසු පරිසරයක් සිතේ හටගන්නා වූ අයුරින් යම් තුන් සිත පහදා ගැනීමක් වෙනවා.

අද බොහෝ බෞද්ධයින් පිංකම් කරන්නේ කරන්නන් වාලේ තරඟයකට මිසක ඉන් ලැබෙන ප්‍රතිලාභය ගැන අවධානයක් හෝ අවබෝධයක් හෝ ඇතිව නොවෙයි. සමහරු පිංකම් කරන්නේ තරඟයකට, ප්‍රසිද්ධියකට, සංදර්ශනයකට, සමහර විට කෙනෙක් මැරුණ විට දානයක් දෙන්නේ පරම්පරාවෙම අනිත් අය කරන නිසා හෝ එය ලෝකයාට ප්‍රකාශ කිරීමක් හැටියට මිස පිරිසිදු අවබෝධයකින් හෝ චේතනාවකින් නොවෙයි. සමහර මළ ගෙවල් වල, දාන ගෙවල් වල සිදුවන්නේ පිංකමට පැමිණෙන සමහර දෙනාත් සහභාගි කරගෙන මත්පැන් පානය කරමින් සිහිමුලා වූ සැපයක්, සතුටක්, සැනසීමක් ඒ දාන ගෙදරදීත් උදාකර ගැනීමටයි. මෙවැනි බාල මානසිකත්වයක් තුලින් පුණ්‍ය ශක්තියක් ගොඩනගා ගත හැක්කේ කෙසේද? යනු ප්‍රශ්නයකි. එමෙන්ම මෙයින් සිදුවන බලවත් හානිය වන්නේ මෙවැනි ක්‍රියා අනුමත නොකරන බහුතරයක් ඊට සහභාගී වන බැවින් ඔවුන් හටද සිතේ එකඟතාවයක් ගොඩනඟා ගත නොහැකි වීමයි. ඒ සියල්ලම වැරදියි. එසේ අපිරිසිදු චේතනාවක් සහිත වූ සිතකින් පිං දීමක් , පිං පැවරීමක් සිදුකළ නොහැකියි. ඒ නිසා කුමන පිංකමක් හෝ නිවැරදි ආකාරයටම පිරිසිදු චේතනාවක් ඇතිවම සිදුකළ යුතුයි. එය තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකමක් ඉටුකිරීමක් බවද සිතට ගත යුතුයි. එනම් පිං බලාපොරොත්තු වන සෑම දෙනාගේම සිතට පූර්ණ සතුටක් ලබාදී ඒ අය භූත, ප්‍රේත ආත්ම වලින් නිදහස් වී යන්නට හැකි ආකාරයටම පිං අනුමෝදන් කිරීමයි, පිං ලබා දීමයි, පිං පැවරීමයි, පිං පිහිටුවීමයි ඉටු කල යුත්තේ.

1. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිඞ්ඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං

2 පහුතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ,
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා

3 එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං
ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො

4. තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා
පහුතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ

5. චිරං ජීවන්තු නො ඤාති යෙසං හෙතු ලාභමසෙ
අම්හාකඤ්ච කතා පූජා දායකා ච අනිප්ඵලා,

6. නහි තත්ථ කසී අත්ථි කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති
වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං
ඉතො දින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං

7. උන්නමෙ උදකං වට්ඨං යථා නින්නං පවත්තති,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති

8. යථා වාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං,
ඒවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති

9. අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණං දජ්ජා පුබ්බෙ කතමනුස්සරං

10. න හි රුණ්ණං ච සොකො වා යා චඤ්ඤා පරිදෙවනා
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො



11. අයඤ්ච ඛො දක්ඛිණා දින්නා සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති.

12. සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො,
පෙතාන පූජාච කතා උළාරා,
බලඤ්ච භික්ඛුනමනුප්පදින්නං,
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පක න්ති

මෙම තිරොකුඩ්ඩ සූත්‍රය ඉහත සඳහන් ගාථා 12කින් සමන්විතයි. මුල්ම ගාථාවෙන් කියන්නේ තමන්ගෙ නමින් මිය පරලොව ගිය බොහෝ අය, ජීවත්ව සිටින කාලය තුල නැවත සුගතියක උපදින්නට හෝ මිනිස් බව හෝ දෙව් බව හෝ නිවන හෝ අවබෝධ කරගන්නට හෝ මඟඵල ලබන්නට හෝ ප්‍රමාණවත් වූ පිංකම් නොකළ නිසා බොහෝ දෙනෙක් භූත, ජේත වශයෙන් ඉපදෙනවා. ඒ ජේත, භූත අය පිං බලාපොරොත්තුවෙන් තම තමන්ගේ ඥාතීන්ගේ නිවෙස්වල, උළුවහු උඩ, බිත්ති උඩ හෝ ගෙදරට හැරෙන හන්දිවල ආදී තැන්වල නොයෙක් ආකාර ජේත, භූත වේශයෙන් අපට නොපෙනෙන ආකාරයෙන් රැදී ඉන්නවා. සමහර විට සමහර අයගේ ඇඟ ඇතුලටත් යම් බලපෑම් කරන්නට පුළුවන් ශක්ති තියෙන භූත, ජේත කියන කොටස් දෙකම ඉන්නවා. ජේත කියන්නේ ජේත වෙලා ඉන්න තත්ත්වය ඒ කියන්නේ යමක් ඉල්ලමින් සිටින ජීවින් කොටසක් යම් කිසි දෙයක් බිහි කරන්නට බලයක් ශක්තියක් ඇති කොටසක් තමයි මේ අමනුස්සයින් කියන්නේ.

ඒ නිසා තමුන් මිනිසුන් හැටියට ජීවත් වෙලා ඉන්න කාලෙදී, මේ බණ සම්පත්තිය ලබා ගත හැකි අවස්ථාවේදී තමන්ගේත් මේ අඩුව පවතිනවාද නැද්ද කියා සිතාබැලිය යුතුයි. මේ මිනිසත් බව ලබා ඉන්න කාලය තුළ නිවන් නොදැක්කත් අඩුම වශයෙන් යලිත් මිනිස් ආත්මයක් ලබන්නට හෝ සුගතියක උපදින්නටවත් ප්‍රමාණවත් පිංකම් කළ යුතුයි. නිවන් අවබෝධය සඳහා නම් කුසලස්ස උපසම්පදා කිරීම අවශ්‍ය නිසා බාහිර කාගෙන්වත් පිනක් බලාපොරොත්තු නොවිය යුතුයි. ඒ වාගේම සුගතියක ඉපදීමට පිංකම් කරනවා නම් එතැනදී අපට කාගෙන්වත් සුගතියක් ඉල්ලන්නටද

අවශ්‍ය නොවේ. ඒ වාගේම මිනිසෙකු ලෙසින් ජීවත්ව සිටින අවස්ථාවේදී යම් යම් දුශ්චරිතකම්, පහත් වැඩ, පාප වැඩ, අකුසල් වැඩ කරයි නම් එවන් අයගේ පාප කර්ම ගරුක කම්ම හැටියට බලවත් වෙනවා නම් එවැනි අයට තමන් කල පිං මදි සුගතියක ඉපදීමට හෝ මාර්ගඵල ලබා නිවන් අවබෝධ කරගන්නට, එවැනි අය සතර අපාගත වීම කාටවත් වැලැක්විය නොහැකිය. එවන් සතර අපායට පැමිණෙන කොටස් හතරෙන් කොටස් දෙකකි ජේත හා භූත. අනෙක් කොටස් දෙක තිරිසන් අපාය හා නිරයයි. තිරිසන් අපායේ හා නිරයේ ඉන්න අය භූත ජේත තත්ත්වයන්ට වඩා වෙනස් වන්නේ භූත, ජේත දෙකොටස මෙන් පිං ඉල්ලන්නේ හෝ පිං ඉල්ලමින් ඥාතීන් පසුපස නොඑන නිසයි.

ඒ නිසා අප ජීවත්ව ඉන්නා ජීවිත කාලයේ ප්‍රමාණවත් කුසල් හෝ පිංකම් නොකර අකුසල් හා පාප කර්ම කළා නම් මේ ආකාරයෙන් ජේත හෝ භූත හැටියට මතු ඉපදී අනුන්ගෙන් පිං ඉල්ලීමට සිදුවන බව හොඳින් ම තේරුම් ගත යුතුයි. මේ අය අනුන්ගෙන් යැපෙන්නටම බලාපොරොත්තු වන කොටස් දෙකකි. "යාපෙන්ති" යන පදයේ තේරුම අනුන්ගෙන් යැපෙන්නා යන්නයි.

ජීවත්ව ඉන්නා අය නොයෙක් ආකාරයේ රස බොජුන් අනුභව කරනවා. මඟුල් ගෙවල්, භෝජන සංග්‍රහ පවත්වනවා, දන්දෙනවා. නමුත් අර බලා ඉන්න භූතයින්ට ජේතයින්ට මේවා රස විඳින්නට කර්ම ශක්තියක් නැහැ. එහිදී ඔවුන්ට කර්ම ආවරණයක් වෙලා තියෙනවා. ඒ නිසා ඒ අයට "කප්පති" කියලා කැප කරලා ආහාර දුන්නේ නැත්නම්, කැප කරලා පිං පැවරුවේ නැතිනම් ඒ අයට ඒවා ලබාගත නොහැකි වෙනවා. ඒ නිසා එවන් අවස්ථාවලදී අනේ මගේ පුතා නේද? දුව නේද? මගේ අයනේද? මේ කන්නේ බොන්නේ කියා මේ අමනුෂ්‍ය කොටස් ඉතා දුකෙන් බලා ඉන්නා බව මේ සූත්‍ර දේශනාවේ පැහැදිලිවම විග්‍රහ කරලා තියනවා.

ඒ නිසා මිනිසුන් හැටියට දැන ගන්න ඕනෑ මේ වගේ පිංකම් කරණ අවස්ථාවලදි තමන්ගෙන් පිං බලාපොරොත්තු වන කොටසක් ඉන්න බව දෙනිකව ඒ අයට පිං දෙන්න ඕනෑ. ඒ අය නිදහස් කරන්න ඕනෑ. එතකොට ඒ සංසාර ගනුදෙනු ප්‍රශ්නේ විසඳන්නට පුළුවන්, ප්‍රශ්නේ විසඳෙනවා.



ඊළඟට කියනවා පිංකමක් සිදුකළ හැම මොහොතකම මේ සංසාරේ අනන්ත අප්‍රමාණ වූ ආත්ම වලදී තමන්ට උදව් කළ උපකාර කළ සියළු දෙනාවම සිහිපත් කර කිසිම වෙනසක් නොකර සමසේ පිං අනුමෝදන් කර, පිං දී, පිං පවරා පිං පිහිටුවිය යුතුයි. විශේෂයෙන් දැනගත යුතු කරුණක් තමයි මියගිය එක තැනැත්තෙකුට පමණක් විශේෂයෙන් පිං අනුමොදන් කිරීමෙන් යම් යම් ප්‍රශ්න ගැටළු ඇති වන බව. එයට හේතුව මේ ජේත, භූත කොටස් අතීත කල්ප 91 ක් තුල මනුෂ්‍යයන්ව උපත ලබා සිට එදා යම් ඥාතියෙකු සමඟ ඇති වූ ගණුදෙනුවක්, උදව් උපකාරයක්, සම්බන්ධයක් නිසා එම ඥාතියා පිටුපස පිං බලාපොරොත්තුව ගමන් කරනවා. එම ඥාතියා පිංකමක් කර චිත්ත ප්‍රසාදයක් ඇතිව පුණ්‍ය ශක්තියක් උපදවා පිං දෙන පිං පමුණුවන අවස්ථාවලදී අතීත ඥාතීන් වුවත් දැන් අමනුස්ස නම්, ඒ අය හරියට ගොටු අල්ලන් සිටින හිඟන්නන් පේලියක් වාගේ ඒ තැන්වල පිං ගන්නට බලා ඉන්නවා. මෙසේ බොහෝ මියගිය ඥාතීන් සමූහ වශයෙන් පිං ගන්නට පිං පමුණුවන තැන් වලට රැස්වන බව මෙම සූත්‍රයේ සඳහන් වෙනවා.

ඒ නිසා කෙනෙක් මියගිය විට එම ඥාතියා නමින් පමණක් පිංදීම වැරදියි. අප කළ යුතු වන්නේ පළමුව තම තමන් නමින් අතීත සංසාරයේ මිය පරලොව ගිය සියළුම ඥාතීන් මිත්‍රයින් සිහිපත් කර පිං දී දෙවනුව ඒ මියගිය ඥාතියා හටත් පිං දීමයි. උදාහරණයක් ලෙස හිතන්න, අම්මා මියගියා. නමුත් දැන් අම්මා ඉන්නේ පිං ගන්න බැරි තැනක නැත්නම් පිං අවශ්‍ය නැති තැනෙක. නමුත් පිං ලබාගත හැකි තමන්ගේම ඊටත් පෙර අතීතයේදී අම්මා, තාත්තා, දුව, පුතා හෝ යම්කිසි ගණුදෙනුවක් තිබ්ච්ච කෙනෙක් පිං ගන්නට බලා ඉන්නවා. නමුත් එයාට පිං දුන්නේ නැතිව වෙන කෙනෙකුට කප්පති කියලා කැප කරලා පිං දෙනවා. මේක බොහොම ලොකු අඩුපාඩුවක්. තිරොකුඩ්ඩ සූත්‍රයේ පැහැදිලිවම සඳහන් කර ඇත්තේ සෑම කෙනෙකුටම කැප කරලා පිං පවරල පිං අනුමෝදන් කළ යුතු බවයි. එනම් කාටවත් අඩු පාඩුවක් නොකළ යුතු බවයි.

මෙම සූත්‍ර දේශනාවේ සඳහන් වන තවත් කරුණක් තමයි, සමහර විට තමන්ගේ ඥාතීන් නොවන, කවදා කොතැනකදී හෝ වචනයකින්වත්

යම්කිසි පිහිටක් උපකාරයක් කළ හා නොකළ සියලු අයද භූත හෝ ජේත වී සිටී නම් ඒ අයද මෙවැනි අවස්ථාවලදී මිනිසුන් පිටුපස පිං ලබා ගැනීමට පැමිණෙන බව දැන, පිං අනුමෝදන් කල යුතුයි. එම නිසා ඒ ජේත , භූතාදින් විසින් තමන්ට හෝ තම ඥාතීන්ට උදව් උපකාර සිදුවී ඇත්නම් ඒ බව සිහියට නංවා ඒ අයටද යහපත හෝ පතා පිං දිය යුතුය.

මේ භූත, ජේත කොට්ඨාශ දෙකම නිදහස් කිරීමේ ක්‍රම දෙකක් තියනවා. එකක් තමයි පිංකමක් කරලා ඒ අයට පිං දීල, පිං පවරලා ඒ භූත, ජේත තත්ත්වයෙන් ඔවුන්ව නිදහස් කර පිංකමක් කරගත හැකි සුගතියකට ඔවුන්ව නිදහස් කිරීම. දෙවැනි ක්‍රමය තමයි, තමන්ගේ ණය ගණුදෙනුව ගෙවලා ඒ අයගෙ සම්බන්ධය අවසන් කරල ඒ ණයගනුදෙනුවෙන් තමන් නිදහස් වීම.

මේ පිංවතුන් දැකලා ඇති දානමය පිංකම් වලදී පැන් වඩන ආකාරය. මේ කටයුත්ත ඒ දවස් වල සිදුකලේ ධර්මය තේරුම් ගැනීමට අපහසු අයටයි. මේ පිං දෙන අයුරු පහසුවෙන් තේරුම් ගැනීමටයි. උඩින් වැටෙන වතුර සංකේතවත් කලේ පිරිසිදු සිතින් , පිරිසිදු චේතනාවක් ඇතිව පිංකමක් කිරීමයි. එසේ ම වැටෙන ජලයෙන් භාජනය පිරී ඉතිරී යන්නාසේ, ගංගා උතුරා සාගරයට ගලා යන්නා සේ අපි දෙන පිං ඒ පිං බලාපොරොත්තු වන සියළුම භූත, ජේත, දෙවි දේවතාවන් ආදී සියළු දෙනාටම නොඅඩුව පිහිටුවීමටයි. මේ නිසා ඒ අයගේ චිත්ත සංතානය පිනෙන් පිරිලා ඒ අයට ඒ ආත්මයෙන් නිදහස් වෙලා යහපත් ආත්මයකට යන්නත් පුළුවන් වෙනවා. එසේ නැතිනම් ඒ අය සතුටින් එතැනින් නික්මිලා යනවා. භූත, ජේත, කියන කොටස් දෙකම මේ ආකාරයට හිත සතුටු කරලා පිං දීලා නිදහස් කරලා මුදවා හැරිය හැකියි.

ඊළඟට මේ සූත්‍රයේ බොහොම හොඳ දෙයක් සඳහන් වෙලා තියෙනවා. මෙය තමා මේ සූත්‍රයේ මට පෙනෙන වැදගත්ම කොටස, කොයි කවුරුත් තේරුම් ගත යුතු වැදගත්ම ධර්මතාවය. අපි පිංකමක් කරලා යම් කිසි කෙනෙකුට පිංදෙන විට ඒ පිං දෙන තැන හැඬීම්, වැලපීම්, ශෝක පරිදේව කිරීම් කර, සිත ද්වේශයට පත්කර ගෙන සිත කලබල කර නොගත යුතුයි. හිතේ ඇති එකඟතාවය නැතිනම් පිරිසිදු බව නොනැසී පවත්වා ගත



යුතුයි. රුපියල් ලක්ෂයක් වියදම් කර ස්වාමීන් වහන්සේලා සිය නමකට දානයක් පිරිනැමුවත් සිත අපිරිසිදු නම් එහි ඵලයක් නැති බවයි, මෙහි තේරුම, මේ නිසා තුන් හිත පහදවා ගෙනම පිං දීම කළ යුතුමයි.

මියගිය පුද්ගලයා ගැන සිතමින් ඔහු හෝ ඇය ජීවත්ව සිටියා නම් කොයිතරම් උපකාර කරයිද, මට කොතරම් පාඩුවක්ද ආදී වශයෙන් සිතා මානයක්, රාගයක්, බැඳීමක් ඇතිකර නොගත යුතුය. පරිදාහය කියන්නේ මේ වගේ හැඟීමක්. සිතේ පිරිසිදු බව නැතිව නම් පිං දෙන්නත් බෑ. පිං ගන්නත් බෑ. පිං පවරන්න, පිං අනුමෝදන් කරන්නත් බැරි බව හොඳින්ම තේරුම් ගත යුතුයි.

අප මිනිසුන් වශයෙන් කෘෂි කර්මාන්තයෙන්, භෝග වගා කිරීමෙන් හා නොයෙකුත් ආකාරයෙන් ආහාර සපයා ගන්නවා. නමුත් භූත , ජේත අයට කිසිම හවුහරණක් නෑ. තමන්ගේ ඥාතින්ගෙන් හෝ අන් අයගෙන් හෝ මෙසේ ඔවුන් කරන පිංකම්වලින් පිං ඉල්ලා ගත්තේ නැතිනම් කිසිම කෑමක්, බීමක්, පිනක්, යහපතක් ලැබෙන්නේ නෑ. ඒ අය අන්ත අසරණයි. ඒ නිසා ඒ අසරණ ඥාතීන් වෙනුවෙන් කැප කිරීමක් සිදුකර දානමය පිංකම් කිරීමෙන් හෝ වෙනත් ආකාරයක පිංකම් කිරීමෙන් ඔවුන්ට පිං ලබා දෙන්නත්, ඔවුන්ගේ බඩගිනි නිවා දමන්නත් පුළුවන්. ඒ නිසා අප මිනිසුන් වශයෙන් සාධාරණව ධන ධාන්‍ය උපදවලා පිංකම් කරලා පිරිසිදු චේතනාවෙන් ම මේ අයට නිතරම පිං දිය යුතුයි. මෙවන් පිංකම් වලින් ඒ අය බඩගින්නෙන් නිදහස් වීම හා ඒ භූත, ජේත ආත්ම වලින් නිදහස් වීම, දුගතියෙන් මුදවා ගැනීම යන සියළුම දේ සිදුවෙනවා. දුකින් මුදවා ගැනීම සිදුවෙනවා. ඒ අයගේ බලාපොරොත්තුව ඉෂ්ඨ කිරීමක් මේ අනුව සිද්ධ වෙනවා.

එසේම මහා සංඝරත්නය විෂයෙහි තුන්සිත පහදා ගෙන දානයක් පිරි නැමීමෙන් ආයු, බල, සැප, වර්ණ, ප්‍රඥා යන බල ශක්තීන් පහක් ලැබෙනවා. මෙම භික්ෂූන් වහන්සේලා නියම සිල්වත් අය නම් මෙම පිංකම වඩා බලවත් පිංකමක් බවට පත් වෙනවා. එයට හේතුව ඒ ස්වාමීන් වහන්සේලා දානය වළඳන්නේ කෑදරකමකින්, උපාදානය කර ගැනීමේ එකතු කර ගැනීමේ බලාපොරොත්තුවකින් නොවන නිසයි. පිරිසිදු චේතනාවකින් ම නිසයි.

අවසන් වශයෙන් සඳහන් වෙනවා මෙසේ පිංකමක් සිදුකර ගෙන පිරිසිදු චේතනාවකින් පිං අනුමෝදන් කළ කෙනෙකුට මතු කිසි දිනක භූත, ප්‍රේත, වගේ අනුන්ගෙන් පිං ඉල්ල ඉල්ලා බලාපොරොත්තු වෙන්නට, අනුන්ගෙන් යැපෙන්නට සිදු නොවීමත්, එමෙන්ම සතර අපායකට පත්නොවී නිදහස් වෙන්නට මේ සිතම හේතුවන බවත්, තමන්ගේ මේ පුණ්‍ය ශක්තිය මේ සංසාර ගමනෙන් මිදී නිදහස් වන්නට කුසලස්ස උපසම්පදා කර ගන්නට උපකාර වන බවත් පැහැදිලිවම මේ තිරොකුඩ්ඩ සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා.

අපි බුද්ධ පූජාවක් පැවැත්වීමෙන් හෝ යම්කිසි දානමය පිංකමක් සිදුකර හෝ පිංදෙන පිං අනුමෝදන් කරණ විට ගාථාවක් කියනවා. “එත්තාවතාව අම්හේහි ” යන ගාථාවෙහි “සබ්බේ දේවා” පළමුවද “සබ්බේ භූතා” දෙවනුවද “සබ්බේ සත්තා” තෙවනුවද තුන් පාරකට ම  ගාථා තුනක් හැටියට කිය යුතුයි. එකම ගාථාවට මේ තුනම ඈඳා නොකිව යුතුයි. මේ අනුපිළිවෙළට කියන්නට හේතුවද දැන ගත යුතුයි. පළමුවෙනි අවස්ථාවේ දී දේව කියන කොටසට විතරයි පිං ගන්න පුළුවන්. දෙවන අවස්ථාවේදී භූත කියන කොටසට පිං ගන්න පුළුවන්. නමුත්  එහිදි දේව කියන කොටසට පිං ගැනීමට නොහැකි වූවා නම් මේ දෙවැනි අවස්ථාවේ දී දෙවියන්ටද පිං ගැනීමට හැකියි. ඊටත් වඩා වැදගත් තුන්වෙනි වරට “සබ්බේ සත්තා අනුමෝදන්තු” යන තුන්වැනි අවස්ථාව මෙහිදී භූත, ප්‍රේත, දෙවි දේවතා, තිරිසන් ,මිනිස් සියළුම කොටස් (අරහතුන් වහන්සේ හැර) සත්ව කොටසට අයත් වෙනවා. එනම් මුල් අවස්ථා දෙකේ පිං ගන්න බැරිවූවා නම්, ඇසුනේ නැත්නම්, තේරුම් ගත්තේ නැත්නම් ඒ තුන්වන වාරයේදී  හෝ සියළුම දෙනාට පිං ගැනීමට හැකි වෙනවා. එසේම “සම්භතං පුණ්‍ය සම්පදං” යනුවෙන් නිවැරදිවද එහි තේරුම දැනගෙන කිව යුතුයි. දැන් ඔබට වැටහෙනවා ඇති මේ ආකාරයට නිවැරදිවත් සිත පිරිසිදුවත් පිං නොදුන්නොත් පිං බලාපොරොත්තු වන සමහර කොටස් වලට මේ අවස්ථාව මඟ හැරී යන බව.

ඒ ආකාරයෙන්ම මිය ගිය ඥාතීන්ට පිං දීමේදී ඒ ගාථාවද තෙවරක් කිව යුතුයි. “ඉදංමේ ඥාතීනං හෝතු” යන ගාථාව දෙවරක්ද, “ඉදංවෝ



ඥාතීනං හෝතු ” යනුවෙන් එක පාරකුත් කිව යුතුයි. “ඉදංමේ” කියන්නේ මට සම්බන්ධයක් තියෙන, මට ණය තියෙන, මගෙන් පිං ගන්නට බලාපොරොත්තු වන ඥාතීන් කොටසයි. “ඉදංවෝ ඥාතීනං” කියන්නේ එහෙම සම්බන්ධයක් නැතිවුවත් යම්කිසි  වෙනත් කෙනෙකුගේ ඥාතියෙකු පිං ගන්නට බලාපොරොත්තු වෙනවා නම් ඒ බාහිර පුද්ගලයන් ඒ කොටසට අයිති වෙනවා.

ඒනිසා තේරුම් ගත යුතුයි, මේ සසර ගමනේදී යම් ගණුදෙනුවක් නිසා සම්බන්ධයක් ඇති වූ නෑයන් නොනෑයන් යන සියළුම පිරිසට වැඩි වියදමක් නැතිව හෝ මුදලක් වැය නොකරම හෝ පිරිසිදු චේතනාවකින් පමණක් පිං දීම සිදුකර ඒ අයව නිදහස් කල හැකි බව. තමනුත් මේ ණය ගණුදෙනුවෙන් මිදී නිදහස් විය යුතු බව.

චේතනාව පිරිසිදු වූ තරමටයි මතු වූ පුණ්‍ය ශක්තිය, ලබාදෙන පිං බලය වැඩි වෙන්නේ, පුණ්‍ය ශක්තිය පිහිටන්නේ. තමන්ට හැකි තරමක් ඥාතින්, හිතවතුන් සම්බන්ධ කරගෙන පිංකමක් සිදුකර පිරිසිදු චිත්ත කිරණ ශක්තිය පතුරුවා පිං දීමෙන් ඒ ඒකාබද්ධ චිත්ත කිරණ වල පුණ්‍ය ශක්තිය බලවත් කර වේගවත් කර ගත හැකි වෙනවා. ඒ වාගේම පිංකමට සහභාගී වූ පිරිසේ ප්‍රමාණය නොව, මෙහිදී වැදගත් වන්නේ, ඒ අයගේ පිරිසිදු චේතනාවයි. “චේතනාහං භික්ඛවේ කම්මං වදාමි” යන්නෙහි තේරුම එයයි.

**සියළු සත්ත්වයෝ නිවනින් නිවී සැනසෙත්වා!**

**සදහම් සිතුවිලි**

0 තමන්ගේ මෙන්ම සියලු සත්ත්වයින්ගේ ද, වටිනා ජීවත්වීමේ අයිතිය සුරකින්න.

0 ප්‍රියදේ ගැන ආශාවන් අඩුවන තරමට දුක අඩුවන බව සිතට ගන්න

0 අනුන් ගැන සෙවීමෙන් වැළකී තමන් ගැනම සොයා නිවැරදි වන්න

0 අනවශ්‍ය කටයුතු බහුල කර නොගෙන සරල දිවියකට හුරුවන්න

0 රහසේ වැරදි කළද, වැරැද්ද සුළු වුවද, ඵල විපාක උරුමවන බව සිතන්න

0 අනුන්ගේ දියුණුවට, සැපයට ඊර්ෂ්‍යා නොකරන්න

0 දේපල, තනතුරු මුදල් ආදිය ලද පමණින් උද්දාමයට පත් නොවන්න

0 යහපත් සිතුවිලි, යහපත් වචන, යහපත් ක්‍රියා සතුට, දියුණුව ගෙන දෙන බව සිතන්න

0 පවුලේ සමගිය දියුණුවේ, සතුටේ පදනම බව සිතන්න

0 අනුන්ගෙන් සිදුවන වැරදි සිතෙහි තබා නොගන්න. වරදට සමාව දෙන්න.

0 කරන දේ කියන , කියන දේ කරන අවංක සත්‍යවාදී අයෙකු වන්න.

0 පාප මිත්‍ර ඇසුර ඔබගේ පිරිහීමට මුල බව සිතන්න

0 අවංක සිතින් කරන දෙය ඉටුවන බව සිතන්න

0 සාර්ථක, නිරෝගී දිවියකට පාන්දරින් අවදිව වැඩ අරඹන්න

0 සුරාව, සූදුව වෛශ්‍යා ඇසුර, ධන විනාශයට මුල බව සිතන්න

0 දෙමාපියන්ගෙන්, වැඩිහිටියන්ගෙන්, ලැබෙන යහපත් අවවාද පිළිපදින්න.

0 රෝගීන්ට, අසරණවූවන්ට හැකි පමණින් පිහිට වන්න.

0 කතා කරන වචනයේ ඵල විපාක සිතා කතා කරන්න.

0 ඔබට පහළ වන සිතුවිලි පිළිබඳව සොයා බලන්න

0 කවර හේතුවකදී වුවද කිසිවකුගේ සිත නොරිද්දන්න

0 ලැජ්ජා- බය, ලෝක පාලන ධර්මතා බව සිතන්න

0 සිත, කය , වචනය තමන්ගේත් අනුන්ගේත් යහපත පිණිස යොදන්න

0 අලස නොවී උත්සාහයෙන් සුබවාදීව ධාර්මිකව තම දියුණුව සලසා ගන්න.

0 මුදලට, බලයට, කිසිම වස්තුවකට අධික සේ ආශාවීම දුක අසහනය ගෙන එන බව සිතට ගන්න.

0 කළ අතීත වැරදි ගැන පසුතැවිලි නොවී අනාගතය ගැන නොතැවී ලද දෙයින් සෑහීමට පත්ව ධාර්මිකව, සිහිනුවණින් වර්තමානය තුළ ජීවත් වන්න.

0 ලෝභය, ද්වේශය, මෝහය වැඩි වූ තරමට ඔබ දවාලන බවද එය  අඩු වූ තරමට ඔබ නිවාලන බවද සිතට ගන්න.

0 සත්‍ය වූ ධර්මය පවසන ගිහි පැවිදි උතුමන් අද අදම ඇසුරු කරන්න.

0 සද්ධර්මය නිරතුරුව ශ්‍රවණය කරන්න

0 අසන ධර්මය නුවණින් විමසා අනුගමනය කරන්න

0 ඉපදීම, ලෙඩවීම, වයසට යාම, මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රිය අය හමුවීම, බලාපොරොත්තු ඉටු නොවීම, යන දුක් සියල්ල සැමට පොදු ධර්මතා බව සිතට ගන්න.

0 බුද්ධ, ධම්ම, සංඝ, රත්නයන් කෙරෙහි වන්දනාවන්ට සීමා නොවී පරමාර්ථ ධර්මතාවයන් දැක අචල ශ්‍රද්ධාව ඇති කර ගන්න

0 නිවන පරම සැපය බව නිරතුරුව සිතට ගන්න

0 පරම සැපයට එකම මඟ ආර්ය අෂ්ඨාංගික මඟ බව සිතට ගන්න

0 දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කරන මඟ බුද්ධ දර්ශනය තුළින් අද අදම දැක ගන්න

0 ධර්මය පහුරක් කොට සසර සයුරෙන් එතෙර වන්න.

0 ජාති ආගම්, කුල, පක්ෂ භේද නොසලකා සියලු මිනිසුන් සමාන කොට සලකන්න

0 ධර්මය ගුරු කොට ගෙන සාර්ථක දිවියක් ගත කරන්න

**තමාට තමාම පහනක් වන්න**



මෙම පොත කියවන ඔබට
පරම සත්‍යය අවබෝධ කරගැනීමට
මඟ නැණ පහල වේවා !